73 වන කාණ්ඩය
7 වන කලාපය

බ්‍රහස්පතින්දා
1967 අගෝස්තු 10

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

නිල වාර්තාව

අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තී. 1285]

පළමුවන වර කියවන ලද පනත් කෙටුම්පත් [තී. 1294] :
රජයේ නිලධරයන්ගේ (ඇප) සංශෝධන පනත් කෙටුම්පත
ප්‍රසිද්ධ විභාග පනත් කෙටුම්පත

විසර්ජන පනත් කෙටුම්පත, 1967-68 [හය වන වෙන් කළ දිනය]
[තී. 1295] :
දෙවන වර කියවීම—විවාදය කල් තබන ලදී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 73
இல. 7

செவ்வாய்க்கிழமை
10 ஓகஸ்ட் 1967

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

அதிகார அறிக்கை

பிரதான உள்ளடக்கம்

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப. 1285]

முதன்முறை மதிப்பிடப்பட்ட மசோதாக்கள் [ப. 1294] :

அரசாங்க அலுவலர் (பிணை) (திருத்த) மசோதா

பொதுத் தேர்வுகள் மசோதா

ஒதுக்கீட்டு மசோதா, 1967-68 [ஒதுக்கப்பட்ட ஆறும் நாள்] [ப. 1295] :

இரண்டாம் மதிப்பு—விவாதம் ஒத்திவைக்கப்பெற்றது

---

Volume 73
No. 7

Thursday
10th August 1967

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS [Col. 1285]

BILLS READ THE FIRST TIME [Col. 1294]:

Public Officers' (Security) (Amendment) Bill
Public Examinations Bill

APPROPRIATION BILL, 1967-68 [Sixth Allotted Day] [Col. 1295] :

Second Reading—Debate Adjourned

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

## பிரதிநிதிகள் சபை

## *House of Representatives*

**1967 අගෝස්තු 10 වන බ්‍රහස්පතින්දා**

வியாழக்கிழமை, 10 ஓகஸ்ட் 1967

*Thursday, 10th August 1967*

---

**පූ. භා. 10ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. නියෝජ්‍ය කථානායකතුමා [එස්. සී. ෂර්ලි කොරයා මහතා] මූලාසනාරූඪ විය.**

சபை, மு.ப. 10 மணிக்குக் கூடியது. உப சபாநாயகர் அவர்கள் [திரு. எஸ். சீ. ஷேளி கொறயா] தலைமை தாங்கினார்கள்.

*The House met at 10* A.M., MR. DEPUTY SPEAKER [MR. S. C. SHIRLEY COREA] *in the Chair.*

---

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම

### சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்

### PAPERS PRESENTED

Supplementary Estimate No. 30 of 1966-67.—[මුදල් ඇමති වෙනුවට ගරු එම්. ඩී. එච්. ජයවර්ධන]

**සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.

*Ordered to lie upon the Table.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු

### வினாக்களுக்கு வாய்மூல விடைகள்

### ORAL ANSWERS TO QUESTIONS

**ඊ. අයි. ග්‍රේ මහතා: පිටරට මුදල් ගෙනයාමට තැත් කිරීම**

திரு. ஈ. ஐ. கிறே: வெளிநாட்டுப் பணத்தை எடுத்துச்செல்ல முயற்சி

MR. E. I. GRAY: ATTEMPT TO SMUGGLE FOREIGN CURRENCY

1. රත්නසිරි වික්‍රමනායක මයා. (හොරණ)

(*திரு. ரத்னஸிறி விக்ரமநாயக்க—ஹொறனை*)

(Mr. Ratnasiri Wikramanayaka—Horana)

මුදල් ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ලංකා "බොක්සිං" සංගමයේ ගරු ලේකම් වූ ඊ. අයි. ග්‍රේ මහතා පසු ගිය අවුරුද්දේ දෙසැම්බර් මාසයේදී ලංකාවෙන් පිටත්ව යද්දී පිටරට මුදල් වගයක් ගෙනයාමට තැත් කළාද? (ආ) එසේ නම්, මුදල් කොපමණද? (ඉ) ඔහුට මේ වෙනුවෙන් කුමන දඩයකට යටත් වන්නට සිදුවුනාද? (ඊ) මෙම දඩය ගෙවන ලද්දේ කවුරුන් විසින්ද? (උ) මොහු නැවත වරක් පිටරට යෑමට සූදානම් වන නිසා මෙවැනි දේ සිදු නොවීමට වග බලා ගන්නවාද?

*நிதி அமைச்சரைக் கேட்ட வினா: (அ) இலங்கைக் குத்துச்சண்டைக் கழகத்தின் கௌரவச் செயலாளர் திரு. ஈ. ஐ. கிறே கடந்த வருடம் டிசம்பர் மாதத்தில் இலங்கையிலிருந்து வெளியே செல்லும்பொழுது ஒரு குறிப்பிட்ட தொகையான வெளிநாட்டுப் பணத்தை எடுத்துச் செல்ல முயன்றாரா? (ஆ) அப்படியெனில், அத்தொகை யாது? (இ) அவர், இதற்காக எவ்வித அபராதத்திற்குட்படுத்தப்பட்டார்? (ஈ) இந்த அபராதத் தொகையைக் கட்டியது யார்? (உ) அவர் மீண்டும் வெளிநாட்டுக்குச் செல்ல ஆயத்தப்படுவதால், இவ்வித செயல் நடைபெறாதிருக்க, அவர் கவனமெடுப்பாரா?*

asked the Minister of Finance: (*a*) Did Mr. E. I. Gray, Honorary Secretary of the Ceylon Boxing Association, attempt to smuggle a certain amount of foreign currency when he was leaving Ceylon in December last year? (*b*) If so, what was the amount? (*c*) What was the fine imposed on him in this connection? (d) Who paid this fine? (*e*) As he is getting ready to go abroad again, will he see to it that a similar incident does not occur again?

**එන්. විමලසේන මයා. (මුදල් ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

(*திரு. என். விமலசேன—நிதி அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி*)

(Mr. N. Wimalasena—Parliamentary Secretary to the Minister of Finance)

(*a*) One Mr. E. I. Gray who described himself as an insurance executive was detected in an attempt to smuggle foreign currency out of



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විමලසේන මයා.]

the country on 12.12.66. (*b*) The amount was £26.10sh. in sterling and a cheque for £30. (*c*) The currency and the cheque were declared forfeit and a further penalty of Rs. 2,000 was imposed on him. (*d*) The fine was paid by Mr. Gray. (*e*) It is not known that Mr. Gray is getting ready to go abroad again. If a similar incident does occur, suitable steps will be taken under the provisions of the law.

**නියෝජ්‍ය කථානායකතුමා**

*(உப சபாநாயகர் அவர்கள்)*

**(Mr. Deputy Speaker)**

Question No. 2.

**වික්‍රමනායක මයා.**

*(திரு. விக்ரமநாயக்க)*

**(Mr. Wickramanayaka)**

මම මේ ප්‍රශ්නය අහන්නෙ නැහැ.

අවසර දෙන ලදුව, ප්‍රශ්නය ඉල්ලා අස් කර ගන්නා ලදී.

வினா அனுமதியுடன் வாபஸ் பெறப்பட்டது.

*Question by leave, withdrawn.*

**නියෝජ්‍ය කථානායකතුමා**

*(உப சபாநாயகர் அவர்கள்)*

**(Mr. Deputy Speaker)**

Question No. 5.

**විමලසේන මයා.**

*(திரு. விமலசேன)*

**(Mr. Wimalasena)**

The Hon. Minister wants one month's time to answer this Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

வினாவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்க கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*



**ඩබ්ලිව්. එම්. ගුණවර්ධන මයා., දඹකන ඇල්ල, මොණරාගල**

*திரு. டபிள்யு. எம். குணவர்தன, தம்பகனஅல்ல, மொனறாகல*

**MR. W. M. GUNAWARDHANA, DAMBAKANA-ELLA, MONARAGALA**

3. **එස්. බී. ලේනව මයා.** (කැකිරාව—ආර්. එම්. ධර්මදාස බණ්ඩා මයා.—බිබිලෙ—වෙනුවට)

*(திரு. எஸ். பி. லேனவ—கெக்கிராவ—திரு. ஆர். எம். தர்மதாச பண்டா—பிபிலை—சார்பாக)*

(Mr. S. B. Lenawa—Kekirawa—on behalf of Mr. R. M. Dharmadasa Banda—Bibile)

සමාජසේවා ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) මොනරාගල දිස්ත්‍රික්කයේ දඹකන ඇල්ල නමැති ස්ථානයෙහි පදිංචි වන්නි සිංහ මුදියන්සේලාගේ ගුණවර්ධන නමැති අයට 66.8.1 දින සිට ක්ෂයරෝග ආධාර මුදලක් ලබාගැනීම සඳහා සමාජ සේවා අධ්‍යක්ෂක විසින් 43440-ඇම්. ජී/452 දරණ අංකය යටතේ ගෙවීම් සහතික පතක් 66.8.28 දින නිකුත් කර ඇති බව එතුමා දන්නවාද? (ආ) මෙම දීමනාව මෙතෙක් ලැබී නොමැති බව එතුමා දන්නවාද? (ඉ) මෙය පසුගිය හිඟ මුදලත් සමග ඉක්මණින් ලැබෙන්ට සලස්වන්නේද? (ඊ) නොඑසේ නම් මන්ද?

*சமூகசேவை அமைச்சரைக் கேட்ட வினா: (அ) மொனறாகல மாவட்டத்தின் தம்பகன அல்ல என்னுமிடத்தில் இருக்கும் வன்னி சிங்க முதியன்சலாகே குணவர்தன என்பவருக்கு 66.8.1 ஆம் தேதியிலிருந்து கசநோய் உதவிப் பணத்தைப் பெறுவதற்காக சமூக சேவை அதிபரால் 43440/எம். ஜீ/452 ஆம் இலக்கத்தையுடைய பணம் செலுத்தும் பத்திரம் 66.8.28 ஆம் தேதி வழங்கப்பட்டதை அவர் அறிவாரா? (ஆ) இவ்வுதவிப்பணம் இதுவரை கிடைக்கவில்லையென்பதை அவர் அறிவாரா? (இ) இப்பணத்துடன் இதற்கு*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

முன் கிடைக்காத பணத்தையும் விரைவில் கிடைக்க ஒழுங்கு செய்வாரா? (ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Social Services (*a*) Is he aware that Wannisinghe Mudiyanselage Gunawardhana, residing at Dambakanaella in the Moneragala District, has been issued with a payment certificate bearing No. 43440| M.G/452 on 28.8.66 by the Director of Social Services enabling him to draw T. B. assistance from 1.8.66? (*b*) Is he aware that this allowance has not been received yet? (*c*) Will he take action to pay this with arrears early? (*d*) If not, why?

**ගරු එන්. එච්. ඒ. ඇම්. කරුණාරත්න (සමාජ සේවා ඇමති)**

*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன—சமூக சேவை அமைச்சர்)*

(The Hon. N. H. A. M. Karunaratne—Minister of Social Services)

(අ) ඔව්. (ආ) ඔව්, ක්ෂයරෝගියෙකු වන ඩබ්. ඇම්. කලුබන්ඩා වෙනුවෙන් රු. 80 ක මාසික ක්ෂයරෝගාධාර දීමනාවක් අනුමත කරන ලද අතර, ඩබ්. එම්. ගුණවර්ධන ඔහු වෙනුවෙන් බලයලත් ගෙවීම් ලබන්නා ලෙසින් පත් කරනු ලැබුවේය. මෙම ක්ෂයරෝගියාට ගෙවනු සඳහා 1966 අගෝස්තු මස සඳහා වූ පඩි ලැයිස්තුවෙහි රු. 80 ක මුදලක් ඇතුලත් කරනු ලැබුවේය. නමුත් ගෙවීම් ලබන්නා මෙම මුදල ලබා නොගැනීම නිසා පෝස්ට් මාස්ටර් ජනරාල් එය ආපසු එව්වේය. 1966 සැප්තැම්බර් මස සිට වෛද්‍ය සහතික නොලැබුණු බැවින් ආධාර දීමනාව අත්හිටුවනු ලැබුවේය. (ඉ) වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කරන ලෙස බුත්තල පෙණහළු චිකිත්සාගාරය භාර වෛද්‍ය නිලධාරියාට දන්වා ඇත. ක්ෂයරෝගයෙන් ඇනුදු පෙලෙන්නේ නම්, වෛද්‍ය සහතිකයක් ලැබුණු විහාම ආධාර දීමනාව ගෙවනවා ඇත. (ඊ) පැන නොනඟී.

**ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ බෝට්ටු අංශය : වංචාවක්**

ஆற்றுப்பள்ளத்தாக்கு அபிவிருத்திச் சபை, வள்ளப் பகுதி : மோசடி

**RIVER VALLEYS DEVELOPMENT BOARD, BOATS SECTION : FRAUD**

4. **ලේනව මයා.** (ධර්මදාස බණ්ඩාර මයා. වෙනුවට)

*(திரு. லேனவ—திரு. தர்மதாச பண்டார சார்பாக)*

**(Mr. Lenawa—on behalf of Mr. Dharmadasa Banda)**

ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ ඉඟිනියාගල පිහිටි සේනානායක සමුද්‍රයේ බෝට්ටු අංශයේ අංක 8121, 8127, 8128, 8112 දරණ රිසිට් පත්වලින් මණ්ඩලයට ලැබී ඇති ආදායම වෙන්වෙන්ව සඳහන් කරනවාද? (ආ) මේ ගෙවීම්වලින් මුදල් වංචාවක් සිදුවී ඇති බවට ලැබී ඇති පැමිණිලි පිළිබඳව ගත් පියවර එතුමා සඳහන් කරනවාද? (ඉ) මේ ගැන සම්පූර්ණ පරීක්ෂණයක් පවත්වා තිබේද? (ඊ) එසේ නම් හෙළිවී ඇති කරුණු සඳහන් කරනවාද? (උ) සම්පූර්ණ පරීක්ෂණයක් පවත්වා නොමැති නම්, ඉක්මනින් පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරනවාද? (ඌ) නොඑසේ නම්, ඒ මන්ද?

*காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா: (அ) ஆற்றுப்பள்ளத்தாக்கு அபிவிருத்திச்சபையின் இங்கினியாகல சேனநாயக்க சமுத்திர வள்ளப் பகுதியின் பற்றுச் சீட்டு இல. 8121, 8127, 8128, 8112 ஆகியவற்றில் குறிக்கப்பட்ட வருவாயை வெவ்வேறாகக் கூறுவாரா? (ஆ) இக்கொடுப்பனவு சம்பந்தமாக மோசடியொன்று ஏற்பட்டதாகப் புகார் செய்ததையிட்டு என்ன நடவடிக்கை எடுக்கப்பட்டதென அவர் கூறு*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලේනව මයා.]

வாரா? (இ) இதுபற்றி பூரண விசாரணை யொன்று நடாத்தப்பட்டதா? (ஈ) அவ்விதமாயின் அவ்விசாரணையின் முடிவைக் கூறுவாரா? (உ) பூரண விசாரணையொன்று நடை பெற்றிராவிடில் விசாரணையொன்றை நடத்துவதற்கு அவர் உடன் நடவடிக்கை எடுப்பாரா? (ஊ) இல்லையெனில் ஏன்?

asked the Minister of Land, Irrigation and Power: (*a*) Will he state separately the income received by the River Valleys Development Board as shown by receipts nos. 8121, 8127, 8128 and 8112 of the Board's Boats Section, Senanayake Samudraya, Inginiyagala? (*b*) Will he state what action has been taken regarding complaints that there has been a fraud in connection with these payments? (*c*) Has a full inquiry been held into this? (*d*) If so, will he state the findings of the inquiry? (*e*) If a full inquiry has not been held, will he take early action to hold one? (*f*) If not why?

ගාමිණී ජයසූරිය මයා. (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්—ඉඩම් වාරිමාර්ග හා විදුලිබල ඇමති වෙනුවට)

(திரு. காமினி ஜயசூரிய—கல்வி, கலாசார விவகார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரும் சபை முதல்வரும் சார்பாக)

(Mr. Gamini Jayasuriya—Parliamentary Secretary to the Minister of Education and Cultural Affairs—on behalf of the Minister of Land, Irrigation and Power)

(*a*) Receipt No. 8121 of 23.2.67—income earned Rs. 28; Receipt No. 8127 of 5.3.67—income earned Rs. 20; Receipt No. 8128 of 6.3.67—income earned Rs. 34; Receipt No. 8112 of 13.2.67—income earned Rs. 24. (*b*) Prompt action was taken on the complaint made and the investigation which is handled by the board's security service is proceeding. (*c*) A full inquiry will be held on the completion of investigations. (*d*), (*e*) & (*f*) Do not arise in view of (*c*) above.

## මිනුවන්ගොඩ මාබොදල වැව ප්‍රතිසංස්කරණය කිරීමේ කොන්ත්‍රාත්තුව

### மினுவாங்கொடை மாபோதல வாவியைத் திருத்தியமைக்கும் வேலை ஒப்பந்தம்

### CONTRACT FOR RECONSTRUCTION OF MABODALA WEWA, MINUWANGODA

6. එස්. ඩී. බණ්ඩාරනායක මයා. (ගම්පහ—එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා.—මිනුවන්ගොඩ—වෙනුවට)

(திரு. எஸ். டீ. பண்டாரநாயக்க—கம்பஹ—திரு. எம். பீ. டி சொய்சா சிறிவர்தன—மினுவாங்கொட—சார்பாக)

(Mr. S. D. Bandaranayake—Gampaha—on behalf of Mr. M. P. de Zoysa Siriwardena—Minuwangoda)

ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) මිනුවන්ගොඩ ඡන්ද කොට්ඨාශයේ "මාබොදල වැව" ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ටැන්ඩර් කැඳවීමක් නොකර පුද්ගලික කොන්ත්‍රාත්කරුවකුට පවරා දුන්නේ කෙසේද? (ආ) මේ සඳහා ටැන්ඩර් කැඳවීමක් රජයේ ගැසට් පත්‍රයේ පළ නොකළේ මන්ද? (ඉ) මෙම කාර්යය මාබොදල ගොවි කාරක සභාවට හෝ විවිධ සේවා සමුපකාර සමිතියට පවරා දීමට සුදුසු කම් තිබියදී, එම සමිතිවලින් නොවිමසා පුද්ගලික අයකුට පවරා දුන්නේ කෙසේද?

காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா: (அ) மினுவாங்கொடை தேர்தல் தொகுதியிலுள்ள "மாபோதல வாவி"யைத் திருத்தியமைக்கும் வேலை ஒப்பந்தங் கோரப்படாமல் தனிப்பட்ட ஒப்பந்தகாரரிடம் எப்படி ஒப்படைக்கப்பட்டது? (ஆ) இதற்காக ஒப்பந்தங் கோரும் அறிவித்தலை அரசாங்க வர்த்தமானியில் வெளியிடாததேன்? (இ) இப்பணியை மாபோதல விவசாயக்குழு விடமோ அல்லது பலநோக்குக் கூட்டுறவுச் சங்கத்திடமோ கையளிக்கக் கூடியதாயிருக்க, அச்சங்கங்களை விசாரிக்காமல் தனி நபரிடம் கையளித்ததேன்?

asked the Minister of Land, Irrigation and Power: (*a*) How is it that the reconstruction of "Mabodala Wewa" in the Minuwangoda Electorate was given to a private contractor without calling for tenders? (*b*) Why was not a tender notice published in the Gazette for this purpose? (*c*) How is it that this work was given to a private individual without making

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

inquiries either from the Mabodala Cultivation Committee or the multi-purpose co-operative society, who were competent to be entrusted with the work?

ජයසූරිය මයා. (ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමති වෙනුවට)

(திரு. ஜயசூரிய—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரும் சபை முதல்வரும் சார்பாக)

(Mr. Jayasuriya—on behalf of the Minister of Land, Irrigation and Power)

(*a*) The estimated cost of the work being Rs. 11,500 only, local small scale tenders were invited, according to approved departmental procedure. In the case of these tenders, notices are displayed in prominent places but not gazetted. It was therefore open to any interested local approved societies to offer their quotations. The only tender received was from a registered contractor for skilled work which was accepted. (*b*) Please see (a) above. (c) The practice of offering of works without inviting tenders, to approved societies has been discontinued in accordance with Treasury Circular No. 694. The job involved skilled work such as concrete structures and rubble masonry. Hence no inquiries were made from the cultivation committees for the purpose.

පර්සි වික්‍රමසිංහ මයා. (කඹුරුපිටිය)

(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ—கம்புறுப்பிட்டிய)

(Mr. Percy Wickremasinghe—Kamburupitiya)

රුපියල් 11,000 ක වැඩක් සම්බන්ධයෙන් ටෙන්ඩර් දැන්වීමක් ගැසට් පත්‍රයේ හෝ ප්‍රසිද්ධ පත්‍රවල පළ නොකර ටෙන්ඩර් බෙදා හැර මේ කටයුත්ත භාර දී තිබෙන බවයි, පෙනී යන්නෙ. එම නිසා රුපියල් 5,000කට වැඩි මුදලක් වියදම් වන කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවන විට රජයට පළාත් පාලන ආයතන ක්‍රියා කරන්නා වගේ අඩු වශයෙන් ප්‍රසිද්ධ පත්‍රවලවත් ඒ දැන්වීම් පළ කර මහජනයාට දැනුම් දෙන ලෙස මා ඉල්ලා සිටිනව.

ජයසූරිය මයා.

(திரு. ஜயசூரிய)

(Mr. Jayasuriya)

පිළිතුරේ සඳහන් වුණා, මේ දැන්වීම් ප්‍රසිද්ධ ස්ථානවල පළ කර තිබුණා කියා. මන්ත්‍රීතුමාගේ යෝජනාව ඇමතිතුමාට දැනුම් දෙන්නම්.

## කෙටුම්පත් පනත් පිළිගැන්වීම

## சமர்ப்பிக்கப்பட்ட மசோதாக்கள்

## BILLS PRESENTED

### රජයේ නිලධරයන්ගේ (ආප) (සංශෝධන) පනත් කෙටුම්පත

### அரசாங்க அலுவலர் (பிணை) (திருத்த) மசோதா

### PUBLIC OFFICERS (SECURITY) (AMENDMENT) BILL

"to amend the Public Officers' (Security) Ordinance."

පිළිගන්වන ලද්දේ මුදල් ඇමති ගරු යූ. බී. වන්නිනායක විසිනි. 1967 අගෝස්තු 11 වන සිකුරාදා දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතුයයිද නියෝග කරන ලදී.

நிதி அமைச்சர் கௌரவ யு. பி. வன்னிநாயக்க அவர்களால் சமர்ப்பிக்கப்பட்டது. 1967 ஒகஸ்ட் 11 ஆம் தேதி வெள்ளிக்கிழமை இரண்டாம் முறையாக மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் ஆணையிடப்பட்டது.

*Presented by the Hon. U. B. Wanninayake, Minister of Finance; to be read a Second time upon Friday, 11th August 1967, and to be printed.*

### ප්‍රසිද්ධ විභාග පනත් කෙටුම්පත

### பொதுத் தேர்வுகள் மசோதா

### PUBLIC EXAMINATIONS BILL

"to make more effective provisions for the proper conduct of public examinations, for the punishment of offences committed in connection with such public examinations, and for all matters connected therewith or incidental thereto."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**පිළිගන්වන ලද්දේ අධ්‍යාපන හා සංස්කෘතික ඇමති වෙනුවට—රාජ්‍ය ඇමති සහ අග්‍රාමාත්‍යතුමාගේත් ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේත් පාර්ලිමේන්තු ලේකම් ගරු ජේ. ආර්. ජයවර්ධන විසිනි. 1967 අගෝස්තු 11 වන සිකුරාද දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතුයයිද නියෝග කරන ලදී.**

கல்வி, கலாசார விவகார அமைச்சர் அவர்கள் சார்பில், இராஜாங்க அமைச்சரும் பிரதம அமைச்சரினதும், பாதுகாப்பு வெளிவிவகார அமைச்சரினதும் பாராளுமன்றக் காரியதரிசியுமான கௌரவ ஜே. ஆர். ஜயவர்தன அவர்களால் சமர்ப்பிக்கப்பட்டது. 1967 ஒகஸ்ட் 11 ஆம் தேதி வெள்ளிக்கிழமை இரண்டாம் முறையாக மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் ஆணையிடப்பட்டது.

*Presented by the Hon. J. R. Jayawardene, Minister of State and Parliamentary Secretary to the Prime Minister and Minister of Defence & External Affairs, on behalf of the Minister of Education and Cultural Affairs; to be read a Second time upon Friday, 11th August 1967, and to be printed.*

## විසර්ජන පනත් කෙටුම්පත, 1967-68

### *ஒதுக்கீட்டு மசோதா, 1967-68*

### Appropriation Bill, 1967-68

**කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. ඊට අදාළ ප්‍රශ්නය [ජූලි 25] :**

**"පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය"**—[ගරු වන්නිනායක]

**ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.**

ஜூலை 25 ஆம் தேதிய வினா மீதான ஒத்திவைக்கப் பெற்ற விவாதம் மீள ஆரம்பிப்பதற்கான கட்டளை வாசிக்கப்பட்டது.

"மசோதா இப்பொழுது இரண்டாம் முறை மதிப்பிடப்படுமாக".—[கௌரவ வன்னிநாயக்க].

வினா மீண்டும் எடுத்தியம்பப்பெற்றது.

*Order read for resuming adjourned Debate on Question—[25th July].*

"That the Bill be now read a Second time"—[*The Hon. Wanninayake*].

*Question again proposed.*

පූ. භා. 10.08

**ඩබ්ලිව්. පී. ජී. ආරියදාස මයා.** (හපුතලේ)

(திரு. டபிள்யூ. பி. ஜீ. ஆரியதாச—ஹப்புத்தளை)

**(Mr. W. P. G. Ariyadasa—Haputale)**

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු, එක්සත් ජාතික පක්ෂයට හා ආණ්ඩු පක්ෂයට අනෙකුත් පක්ෂවල ගරු මන්ත්‍රීවරු විරුද්ධ පක්ෂයේ සිටින අප ජාතිවාදී පිරිසක් හැටියට හඳුන්වන්නට උත්සාහ කරනවා. එහෙත් අප ආණ්ඩු පක්ෂය කියන විධියට ජාතිවාදී පිරිසක් නොවන බව ඔප්පු කරන්නට මා ඊයේ සවස කරුණු ඉදිරිපත් කළා. මේ රටේ ජාතිවාදී පිරිසක් සිටියා නම් ඒ ජාතිවාදී පිරිස අද එක තැනක එනම් වර්තමාන ආණ්ඩු පක්ෂය තුළ රොක් වී සිටින බව පමණක් මා මේ අවසථාවේදී ප්‍රකාශ කරනවා. තමුන්නාන්සේලාට මතක ඇති, එක්සත් ජාතික පක්ෂය විරුද්ධ පක්ෂයේ සිටින කාලයේදී එවකට හිටපු වැලිමඩ ගරු මන්ත්‍රීතුමා (කේ. එම්. පී. රාජරත්න මයා.) එක් පැත්තකිනුත් ෆෙඩරල් පක්ෂයේ සහෝදර ගරු මන්ත්‍රීවරුන් අනික් පැත්තකිනුත් බෝඩ් ලෑලිවල තාර ගෑමේ ව්‍යාපාරයක් ගෙන ගිය බව්. ඒ කාලයේදී ගෙන ගිය ජාතිවාදී ව්‍යාපාර ගැන මේ ගරු සභාවේ නොයෙක් විට කියා තිබෙනවා. එමනිසා, කාලය වැඩියෙන් ගත වන නිසා, ඒ සිද්ධීන් ඇතුළත් පත්‍ර වාර්තාවත්, හැන්සාඩ් වාර්තාවත් කියවන්නට මා මේ අවසථාවේදී බලාපොරොත්තු වෙන්නේ නැහැ. ජාතිභේදවාදී ගැටුම් ඇතිවූ ඒ අවසථාවේදී එව්කට විරුද්ධ පක්ෂයේ සිටි එක්සත් ජාතික පක්ෂය පවා ඉතාම අන්ත විධියට ජාතිවාදී කටයුතුවල යෙදෙන්නට පටන් ගත්තා. "සියරට" පත්‍රයේ පළ කළ ජාතිවාදය අවුස්සන ප්‍රකාශ මේ ගරු සභාවේ කියවා තිබෙනවා. "සිංහලයිනි, නැගිටිව්, මරව්, කපව්, කොටව්" යන වචන "සියරට" පත්‍රයේ හැර ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට අයිති මොනම පත්‍රයකවත් පළ කර තිබෙනවාය කියා මා කල්පනා කරන්නේ නැහැ. ඒ අනුව ජාතිභේද වාදය අවුස්සා තිබෙන්නේ කොයි පැත්තද කියා දැන් තමුන්නාන්සේට පෙනෙනවා ඇති.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙත්තානන්ද උන්නැහෙ ජාතිභේදය ඇවිස්සුවා. එක්සත් ජාතික පක්ෂය ජාතිභේදය ඇවිස්සුවා. ෆෙඩරල් පක්ෂය ජාතිභේදය ඇවිස්සුවා. අපේ වර්තමාන රාජ්‍ය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඇමතිතුමා මහනුවරට පයින් යන්නට උත්සාහ කළා. මේ සියලුම කොටස් එකතු වී, "අප හොඳ මිනිස්සු, උඹල තමයි ජාතිවාදීන්" ය කියා දැන් අපට පහර ගසන්නට පටන් ගෙන තිබෙනවා. එහෙත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රතිපත්තිය මේ රටේ සුළු ජාතීන්ට විරුද්ධකම් කිරීම නොවන බව මා පැහැදිලි වශයෙන් ප්‍රකාශ කරනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මේ රටේ ජාතීන්ට සම්පූර්ණයෙන්ම පක්ෂයි. මේ රටේ සිටින ද්‍රවිඩ ජාතිකයින්, සාමාන්‍යයෙන් ඔවුන් සිය රටියන් නම් ඔවුන් අපේ සහෝදරයින් හැටියට අප සලකන බව මා මේ අවසථාවේ දී අවධාරණයෙන්ම ප්‍රකාශ කරනවා. ඉතින් එවැනි තත්ත්වයක් තිබෙන විට, ජාතිවාදය ඇවිස්සුවත්ම අපට ජාතිවාදීන්ය කියා කියන විට අපට ටිකක් හිතට අමාරු වෙනවා නොවේද? අන්න ඒකයි මෙතැන තිබෙන ප්‍රශ්නය. තමුන්නාන්සේලා ජාතිවාදී කටයුතුවල නොයෙදුණා නම් මේවා කිව්වත් කමක් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ ඉතාම හොඳ මිත්‍ර මන්ත්‍රීවරයකු වන පදිරිප්පුවේ ගරු මන්ත්‍රීතුමා (රාසමානික්කම් මයා.) කවදත් බොහොම සාධාරණවයි කථා කරන්නෙ. එහෙත් එතුමා ඊයේ කථා කළේ කොහොමද? අප මේ රටේ සංවර්ධනයක් ඇති කරගෙන යනවාය, අප මේ රටේ සමගියක් ඇති කර තිබෙනවාය, මීට කලින් මෙවැනි සමගියක් තිබුණේ නැත, මීට කලින් ජාතිභේදය ඇවිස්සුවාය, අප කර ගෙන යන සංවර්ධන වැඩවලට තිබෙන බාධාව කුමක්ද ආදී වශයෙන් එතුමා නොයෙක් දේවල් කියා අවසානයේ දී අපේ පක්ෂය මහජනතාවට තිත්ත කරවීමට උත්සාහ කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතිවාදය ඇවිස්සූ නිසා විරුද්ධ පක්ෂය පරාජය වුණාය කියා ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් නොයෙක් විට ප්‍රකාශ කළා. ඒ ගරු මන්ත්‍රීවරුන්ට පිළිතුරක් වශයෙන් මා එක් කාරණයක් කිවයුතුව තිබෙනවා. එක්සත් ජාතික පක්ෂය විරුද්ධ පක්ෂයේ සිටින කාලයේදී එවකට තිබුණු අපේ ආණ්ඩුවට විරුධව නොයෙකුත් චෝදනා ඉදිරිපත් කළා. එක්සත් ජාතික පක්ෂයට ඒ සඳහා වුවමනා තරම් විවේකය තිබුණා. අපට විරුද්ධව ඉදිරිපත් කළ එක් චෝදනාවක් කුමක්ද? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඇමතිවරු මහේශාක්‍ය ලීලාවෙන් රජයේ ගෙවල්වල පදිංචි වී සිටිනවාය කියා කිව්වා. මැකාර්ති පාරේ කාමර කීපයක් සහිත ගෙයක් බැගින් ඒ කාලයේ ඇතැම් ඇමතිවරුන්ගේ වාසය සඳහා පාවිච්චියට ගෙන තිබුණු බව කොයි කාටවත් රහසක් නොවෙයි. උඩරට ප්‍රදේශවල හොඳ ආදායම් ලැබෙන, තරමක් විශාල තේ වතුවල කුලී කාරයින්ගේ වාසය සඳහා සාදා තිබෙන ලයින් කාමර යම් තත්ත්වයකට තිබෙනවා නම් ඒ තත්ත්වයට වඩා ඒ තරම් උසස් ගෙවල් හැටියට මේ ගෙවල් කීපය විස්තර කරන්නට බැරි තරමයි. ඒ ගෙවල සිටි ඇමතිවරුන් එදා මහේශාක්‍ය ලීලාවෙන් සිටි බවක් කී උදවිය අද වර්තමාන ආණ්ඩුවේ ඇමතිවරුන් හැටියට කාමර දහය, දොළහ, පහළොව, විස්ස තිබෙන විශාල මාළිගා වැනි ගෙවල ජීවත් වන ආකාරය දකින්නට ලැබෙනවා නොවෙයිද? එදා ඒ විධියට කී උදවිය අද ජීවත් වන්නේ කොහොමද?

ඊට පස්සේ තමයි බෙන්ස් කථාව පටන් ගත්තේ. යක්ෂයනට වුවත් එකමදෙය එක සිය අට වරක් කියාගෙන කියාගෙන ගියාම මොකද වෙන්නේ? ඔවුනුත් ටිකක් නමුත් මෙල්ල වෙනවාය කියන කතාවක් තියෙනවා. එදා රාජ්‍ය ඇමතිවරුන් බෙන්ස් කාර් පාවිච්චියට ගැනීමේ කථාවක් කියා ගෙන කියාගෙන ගියේ එකසිය අටවරක් එහෙම නොවෙයි, ඊටත් වැඩි වාර ගණනක්. ඔහොම එදා ආණ්ඩුවට විරුද්ධව යම් යම් චෝදනා එල්ල කිරීමෙන් ජනතාවගේ සිත් ඒ ආණ්ඩුවට විරුද්ධව හැඩ ගැසී ගියා. නොයෙක් විධියේ චෝදනා නංවා ඒ මගින් එදා ආණ්ඩුව පරාජයට පත් කරනු ලැබුවා මිස මේ රටේ ජනතාව නම් කවදාවත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ජාතිවාදී පක්ෂයක් හැටියට පිළිගෙන නැහැ. එසේ කියන්නේ විශේෂ හේතු ඇතිවයි. ජාතික ආණ්ඩුව වටා අද රොක්වෙලා ඉන්නෝ කවුරුද? ජාතික රජය ඇති කිරීම සඳහා එකතු කර ගන්නා ලද මූලික දේශපාලන පක්ෂයද ඇතුළු සියලුම කොටස් සහ පුද්ගලයන් මීට ඉහත එක්තරා කාලයක මේ රටේ ජාතිවාදය ඇවිස්සූ උදවිය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආරියදාස මයා.]

ගෙන් සමන්විතයි. භාෂා පෙරමුණ ඇති කළ අය, කර්මාන්ත ඇමතිතුමා ඇතුළු සෑම දෙනාම එකතු වී ජාතිවාදය අවුස්සන වැඩ කළේ නැද්ද? ඒ ගැන මීට වඩා කථා කරන්නේ නැහැ.

ආණ්ඩුවේ ගරු මන්ත්‍රීවරුන් බොහෝ දෙනකු එතුමන්ලාගේ කථා පවත්වද්දී පෙන්වන්නට උත්සාහ කළේ මේ රටේ යම් කර්මාන්තයක් ඇති කර තිබෙනවා නම්, ඒ සම්බන්ධයෙන් දියුණුවක් ඇති වුණා නම්, එය ඇති වුණේ මේ ආණ්ඩුව නිසාය යන්නයි. හැබැයි, මේ පැත්තෙන් ඒවාට නිසි පිළිතුරු සපයන්නට ඉස්සර ඒ පැත්තෙන්ම උත්තර ලැබෙන්නට පටන්ගත්තා. ඊයේ සවස බිංගිරියේ ගරු මන්ත්‍රීතුමා (ජේ. එල්. සිරිසේන මයා). කථා කරමින්, රුපියල් කෝටි හැට ගණනක් වැය කර ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවෙන් ඇති කරන ලද සංයුක්ත මණ්ඩල විස්සකින් ලැබෙන ආදායම, වැය කරන ලද මුදල් සම්භාරයෙන් සියේට දශම පහක් පමණයැයි සෞඛ්‍ය කටයුතු භාර ගරු ඇමතිතුමා ප්‍රකාශ කළ බවක් සඳහන් කළා. සංයුක්ත මණ්ඩලවල ආදායමින් ප්‍රයෝජන ගන්නට අදහස් කර තිබෙන බව ගරු මුදල් ඇමතිතුමා කියා තිබෙනවා. ඉතින් මේ අදහස් එකකට එකක් ප්‍රතිවිරුද්ධ නැද්ද? ඊයෙ නවාලපිටියේ ගරු මන්ත්‍රීතුමා (චන්ද්‍ර කරුණාරත්න මයා.) කළ කථාවෙනුත් ආණ්ඩු පක්ෂයට හොඳ පිළිතුරු ලැබී තිබෙනවා. එතුමා කියන හැටියට අද මේ ආණ්ඩුවේ වැඩ පිළිවෙළ අනුව රජය වැඩ කරන හැටියට මේ රටේ ඉන්න සිංහල බෞද්ධයකුට පොලිස් දෙපාර්තමේන්තුවට බැඳීමට පුළුවන්කමක් නැහැ. එතුමා කළ කථාවේ අඩංගු කරුණු ගැන රාජ්‍ය කටයුතු භාර ගරු ඇමතිතුමා සොයා බලනවා නම් බොහොම හොඳයි. ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරයකු කියන කථාවක් නිසා ඒ ගැන සොයා බැලීම හොඳයි. උන්නැහේ කියනවා, මේ රටේ අද තිබෙන තත්ත්වය අනුව පොලිස් දෙපාර්තමේන්තුවට බැඳෙන්නට අපේ සිංහල බෞද්ධයකුට ටිකක් අමාරු බවක්. උන්නැහේ කිව්වේ ඇත්තක්ම වෙන්නට ඕනෑ.

එතුමා තවත් ඇත්තක් කියනවා. විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීන් අදහස් කරන්නේ ජාතික ආණ්ඩුව මේ රටේ රැකීරක්ෂා ප්‍රශ්නය විසඳා නැති බවක් රටට හඟවන්නටලු. එසේ කීමෙන් උන්නැහේ පෙන්වන්නට අදහස් කරන්නේ තරමක් දුරටවත් මේ ආණ්ඩුව මේ රටේ රැකීරක්ෂා හිඟකමේ ප්‍රශ්නය විසඳා තිබෙන බව වෙන්නට ඇති. ආණ්ඩුවේ ඇමතිවරුන් නියෝජනය කරන ප්‍රදේශවල නම් බොහෝ දුරට මේ ප්‍රශ්නය නිරාකරණය වී තිබෙනවා වෙන්නට ඇති. ආණ්ඩුවේ මන්ත්‍රීන් නියෝජනය කරන කොට්ඨාශ තුළත් තරමක් දුරට නමුත් විසඳා තිබෙන වාදැයි දන්නේ නැහැ. උන්නැහේ කියනවා, විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීන් නියෝජනය කරන ප්‍රදේශවලත් මේ ප්‍රශ්නය නිරාකරණය කර තිබෙනවාලු. එසේ කරන්නට පුළුවන් වුණේ තමන්ගේ පක්ෂයේ අපේක්ෂක මහතුන් යම් යම් කොමිටිවලට ඇතුළු වී ඒ කොමිටි මගින් ඒ ඒ ප්‍රදේශවල වැඩ කරගෙන යාම නිසාලු. මේ කාරණය ඇත්තක් වෙන්නට පුළුවනි. එක්සත් ජාතික පක්ෂයෙන් ඉදිරිපත් වී පරාජය වූ අපේක්ෂකයන් ඒ ඒ ප්‍රදේශවල හුඟක් වැඩ කර තිබෙනවා. ඒ බව තමුන්නාන්සේත් දන්නවා ඇති. එක් කෙනෙක් කොමිටියකට බැඳිලා යකඩ බඩු වගයක් ගත්තාලු. ඒකට දැන් නඩු. ඒත් එක්සත් ජාතික පක්ෂයේ මහත්මයෙක්. තවත් කෙනෙක් ලෑන්ඩ් රෝවර් එකක් අරන් ගියාලු. රජයෙන් මිළයට ගත්තාය කියලයි කිව්වේ. ඒ ගැන කච්චේරියෙන් විමසා බලන විට කච්චේරියෙන් එවන ලද ලියමනකින් ජනතාවට දැනගන්නට ලැබී තිබෙන්නේ එය ආණ්ඩුවෙන් දී තිබෙන එකක් බවයි. එහෙම නැතිව මිළයට ගත් එකක් නොවන බවයි දැනගන්නට ලැබී තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක්සත් ජාතික පක්ෂයේ සමහර පැරදුණු අපේක්ෂකයන් නිසා අද මේ ආණ්ඩුවේ නම ටිකක් කැත වී තිබෙන බව මා කියන්නට කැමතියි. මේ රජයේ සමහර ඇමතිවරුන්ට ඒ විධියේ චෝදනා කරන්නට අපට කොහෙත්ම පුළුවන්කමක් නැහැ. අප එතුමන්ලාට චෝදනා කරන්නෙත් නැහැ, කෙරුවත් රට පිළිගන්නෙත් නැහැ. රාජ්‍ය ඇමතිතුමා සම්බන්ධව කල්පනා කර බලමු. රාජ්‍ය ඇමතිතුමා පගා ගත්තාය කියා අප උදේ සිට රෑ වන තුරු කිව්වත් මේ රටේ කිසිම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කෙනෙක් ඒක විශ්වාස කරන්නෙ නැහැ, එතුමා එහෙම දෙයක් නොකරන නිසා. එහෙත් අද එක්සත් ජාතික පක්ෂයේ සමහර පැරදුණු අපේක්ෂකයන් බ්‍රෝකර්වරුන් තබාගෙන, හපුතලේ, බදුල්ල, බණ්ඩාරවෙල වැනි ප්‍රදේශවල අසවල් ඇමතිවරුන්ට දී මේ මේ වැඩ කරවා ගන්නටය කියා අහිංසක මිනිසුන්ගෙන් කුට විධියට මුදල් ලබා ගන්නවා. ඒ අය මන්ත්‍රීවරුන් ළඟ තිබෙන ෆයිල්ස්වලට වඩා ලොකු ෆයිල්ස් තබාගෙන හයියෙන් වැඩ කරනවා. මේ රටේ මහජනතාව මුළා කරමින් ඔවුන් මුදල් ගරා ගන්නවා. ඇමතිවරුන්ට රජයේ උසස් සේවකයන්ට මේ මුදල් දිය යුතුය කියා මහජනයාගෙන් මුදල් ලබා ගනිමින්, හොඳ නමක් තිබෙන වැදගත් ඇමතිවරුන්ගේ නම් අද ඒ පැරදුණු අපේක්ෂකයන් කැත කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු මුදල් ඇමතිතුමා ගැන කල්පනා කර බලමු. අප කොයිම අවස්ථාවකවත් බලාපොරොත්තු වන්නේ නැහැ, එතුමා පගා ගන්න ඇමතිවරයෙක්ය කියන්නට. අප එසේ කිවත් මේ රටේ ඒ කථාව පිළිගන්න කෙනෙක් නැහැ. නොයෙක් විධියේ කොමිටිවලට පත් කර තිබෙන එක්සත් ජාතික පක්ෂයේ පැරදුණු අපේක්ෂකයන් ඒ විධියේ හොඳ නමක් ඇති ඇමතිවරුන්ගේ නම් කැත වන විධියට වැඩ කරනවා මිස රැකිරක්ෂා ප්‍රශ්නය නිරාකරණය කිරීමට කටයුතු නොකරන බව මා මතක් කරන්නට සතුටුයි.

ජීවන වියදම සම්බන්ධව දෙපාර්ශ්වයේම ගරු මන්ත්‍රීවරුන් කථා කළා. ආණ්ඩු පක්ෂයේ සමහර ගරු මන්ත්‍රීතුමන්ලාට ජීවන වියදම ඉහළ නැගීම පිළිබඳ භයානක තත්ත්වය ගැන දැන ගන්නට පුළුවන්කමක් ලැබී නැද්ද? එසේ නැත්නම් උන්නැහේලා ඒ කාරණය දැනගෙනත් ඒ ගැන කියන්නට අකැමැත්තෙන් සිටිනවාද කියා මා දන්නේ නැහැ. මට පෙනෙන හැටියට නම් ජීවන වියදම මේ තරම් බෙදජනක තත්ත්වයකට ඉහළ නැග තිබෙනවාය යන්න ගැන එතුමන්ලාට හොඳ අවබෝධයක් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද කඩයකට ගියොත් අපට මොනවාද ගන්නට පුළුවන්කම තිබෙන්නේ? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කර්මාන්ත ප්‍රතිපත්තිය නිසා සමහර සාප්පුවලට ගියාම මේ රටේ නිෂ්පාදනය කර තිබෙන යම් යම් දේ ගන්නට අපට පුළුවන්කම තිබෙනවා. ඊට අමතරව අද අපට මොනවාද ගන්න තිබෙන්නේ? අපේ ප්‍රදේශය වැනි ඈත පිටිසර ප්‍රදේශයකට මාළු ලබා ගැනීම බොහොම අමාරුයි. ඒ නිසා දුප්පත් ගෙදරකට මිත්‍රයකු හෝ නෑයකු ආ විට සංග්‍රහ කරන්නට මාළු රාත්තලක් ගන්නවා වෙනුවට සැමන් ටින් එකක් ගැනීමේ සිරිතක් තිබෙනවා. සැමන් ටින් එකක මිල අද රුපියල් 2 යි. එහෙත් රුපියල් දෙකටවත් අද සැමන් ටින් එකක් ගන්නට පුළුවන්කමක් නැහැ. ඒ නිසා එක හාල් පොතකට එක සැමන් ටින් එක බැගින් දෙන්නට වැඩ පිළිවෙළක් සකස් කරන්නට යනවාය කියා අපට ආරංචියක් ලැබී තිබෙනවා. පිටරට්ට ඇදී යන මුදල් නවත්වන්නට ඒ වැඩය කරනවාය කියන්නට පුළුවනි. එහෙත් ඒ වැඩය කළොත් බොහොම ලක්ෂණ දෙයක් සිදු වෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හපුතලේ ඡන්ද කොට්ඨාශයේ විශාල වතු තිබෙනවා. එක වත්තක සේවය කරන අයගේ පවුල්වල 5,000 ක්, 6,000 ක් පමණ ජීවත් වෙනවා. දැනට ඒ වත්තකට සැමන් ටින් 50 ක් නැත්නම් 100ක් වුවමනා වෙයි. එහෙත් පොතකට සැමන් ටින් එක බැගින් දෙන්නට ගියොත් සැමන් ටින් 5,000 ක් වුවමනා වෙයි. පොත්වලට දුන්නොත් ඒකයි, සිදු වන්නේ. එහෙම වුනොත් කලින් ගන්න සැමන් ටින් එකත් ගන්නට පුළුවන්කමක් නැති වෙනවා. අද පරිප්පු රාත්තලක් ගන්නට නැහැ; බොම්බයි ළූනු රාත්තලක් ගන්නට නැහැ; රතුළූනු රාත්තලක් ගන්නට නැහැ; මිරිස් රාත්තලක් ගන්නට නැහැ. පොතකට දෙන මිරිස් අවුන්ස තුන එකහමාර කරන්නට යනවාය කියා පත්‍රයක තිබුණා. එදා දුන් මිරිස් අවුන්ස තුන වෙනුවට දැන් මිරිස් අවුන්ස එකහමාරක් දෙන්නට යනවාලු. එසේ නම් මේ ආණ්ඩුව මෙතෙක් කල් කර තිබෙන්නේ කුමක්දැයි සාධාරණ ප්‍රශ්නයක් අසන්නට අපට සිදු වෙනවා. එදා අප අනෙක් පැත්තේ සිටියදී කරවල ටිකක් අඩු වුණ පමණින් "ශ්‍රී ලංකා කාරයෝ, කරවලයෝ; අන්න කරවලයෝ අන්න කරවලයෝ" යනුවෙන් මේ ගරු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආරියදාස මයා.]
සභාවේදීත්, පාරේ තොටේදීත්, හැම තැන කදීත් අපට අපහාස වශයෙන් කියන්නට පටන් ගත්තා. දැන් නම් කරවල තිබෙනවා තමයි. එහෙත් ඔය කියන ලද අනෙක් කිසිම දෙයක් අප නියෝජනය කරන ප්‍රදේශවල ඇත්තේ නැහැ. ලූනාවේ තානායම් පොළට ඊයේ පෙරේදා පොලී සියෙන් පැන්නා වගේ පසුගිය දවස්වල කඩා පනින හමුදාව හපුතලේ ඡන්ද දායක කොට්ඨාශයේ කඩවලට පැන්නා. එය නරක වැඩක් යයි මා කියන්නේ නැහැ. කඩා පනින හමුදාවට මා දොස් කියන්නේ නැහැ. එහෙත් ඒ හමුදාවේ උදවියටත් කාරණා නොපෙනෙන අවස්ථා තිබෙනවා. කඩයක විකිණීම සඳහා බඩු වර්ග සියයක් ඇත්නම් ඒ සියයේ මිළ ගණන් ලියන ලද ලැයිස්තු ප්‍රදර්ශනය කරන්නට ඕනෑ. පිටිකිරි ටින් තිබෙන තැන්වල සැමන් ටින් තිබෙනවා යයි අපි හිතමු. ඔය විධියට නොයෙකුත් බඩු එක ලඟම තබා තිබෙනවා. බැරිවෙලාවත් අර "බෝඩ්" එක පොඩ්ඩක් හැරවිලා තිබුණහොත්, වෙනත් පැත්තකට හේත්තු වෙලා තිබුණහොත් වෙළෙන්දා ඉවරයි. ඕවා ගැන ඔය තරම් පරීක්ෂාවෙන් ඉන්නට පුළුවන්කමක් නැහැ. ඕවා කරන්නට බැරි දේවල්. එසේ හෙයින් මේ වාගේ සුළු ප්‍රශ්න සම්බන්ධයෙන් වෙළෙඳුන්ට කරදර ඇති කරන්නට හොඳ නැහැ. මේ ආණ්ඩුවේ ඇමතිවරු මේවා ගැන ටිකක් කල්පනා කර බලන්නට ඕනෑ නැති කරදර ඇති කරන්නේ මොකටද?

පසුගියදා මා නියෝජනය කරන කොට්ඨාශයේ සිටින එක්තරා වෙළෙන්දකුට මුහුණ පාන්නට සිදු වූ දෙයක් ගැන මම කියන්නම්. ඒ වෙළෙන්දා එක් මාසයක තිස් වැනිදා බැටරි කෑලි තුනක් මිළයට ගත්තා. ඔහු ඒවා ගත්තේ තමන්ගේ ප්‍රයෝජනය සඳහායි, ඒ මාසයේ තිස් වැනිදා ගෙවී ගොස් උදා වුණු ඊළඟ මාසයේ පළමුවැනි දා මිළ පාලක නිලධාරියා ඒ වෙළෙන්දාගේ කඩයට පැන්නා. ඒ වෙළෙඳ මහතා ඒ නිලධාරී මහතා ගැන දන්නවාලු. ඒ මහතා අවංකව සේවය කරන කෙනෙක්. මා ඒ මහතාට චෝදනා කරන්නේ නැහැ. මේ රජයේ අදූරදර්ශී වැඩ නිසා අවංක නිල ධාරීන්ටත් අහිංසක වෙළෙඳ මහතුන්ටත් කරදර ඇති වන බවයි, මා කියන්නේ. ඉතින් අර වෙළෙන්දා තිස් වැනිදා අර බැටරි කෑලි ගත්තේ එකක් ශත 41 බැගිනුයි. මිළ පාලක නිලධාරි තැන අවුත් ඒ බැටරි කෑලි ගැන විමසූ විට, ඒවා තිබෙන්නේ තමන්ගේ පාවිච්චිය සඳහා වුවත් වුවමනා නම් තමන් ඒවා ගත් මිළ වූ ශත 41 ට ඒවා ගන්නැයි ඒ වෙළෙන්දා කීවා. ගිය මාසයේ තිස් වැනිදා ශත 41 ගණනේ ගත් බැටරි කෑලි මේ මාසයේ පළමුවැනිදා ශත 41 ගණනේ වික්කා. එහෙත් මින් ඇති වූ ප්‍රතිඵලය මොකක්ද? මේ මාසයේ පළමුවැනිදා සිට බැටරි කෑල්ලක මිළ ශත 40 යයි ගැසට් පත්‍රයේ තිබුණා. එසේ හෙයින් වැඩි මිළට බැටරි කෑලි විකිණීමේ චෝදනාව උඩ අර වෙළෙන්දාට විරුද්ධව නඩු පවරා තිබෙනවා. මේවා කොතරම් අදූරදර්ශී වැඩද? වෙළෙඳුන්ට හැමදාම ගැසට් පත්‍ර බලන්නට පුළුවන්ද? අහිංසක සුළු වෙළෙඳුන්ට මේ විධියට කරදර හිරිහැරවලට මුහුණ පාන්නට සිදු වී තිබෙන්නේ කඩා පනින හමුදාවේ නිලධාරීන්ගේ වරද නිසා නොව ආණ්ඩුවේ ප්‍රතිපත්තිවල ඇති වරද නිසයි. ඊයේ මුල්කිරිගල ගරු මන්ත්‍රීතුමා (ජෝර්ජ් රාජපක්ෂ මයා.) කීවා සේ ඉඩම් දීමේදී ගොවියාගේ භාර්යාවගේ උස, මහත, දිග, පළල, බර ගැන විමසන්නා වාගේ කොතෙකුත් අනවශ්‍ය දේවල් කරන නිසා නොයෙකුත් කරදර හිරිහැරවලට මුහුණ පාන්නට ජනතාවට සිදු වී තිබෙනවා. වුවමනා නැති දේවල් හුඟක් කරනවා. ඒ නිසා කරදර වැඩි වී තිබෙනවා.

ඊළඟට ගරු රාජ්‍ය ඇමතිතුමාට වචනයක් කියන්නට කැමතියි. මේ අවස්ථාවේදී ගරු ඉඩම් ඇමතිතුමාත් පැමිණීම ගැන මා සතුටු වෙනවා. මා මේ කියන කාරණය එතුමාටත් සම්බන්ධයි. පසුගියදා රාජ්‍ය ඇමතිතුමා ආකෘති පත්‍ර වගයක් අපට එව්වා. මටත් ආකෘති පත්‍ර දෙකක් තුනක් ලැබුණා. අනෙක් මන්ත්‍රීවරුන්ටත් ලැබෙන්නට ඇතැයි මා කල්පනා කරනවා. තම තමන් නියෝජනය කරන ඡන්ද කොට්ඨාශවල සංවර්ධනය සඳහා ඉදිරිපත් කරන්නට තිබෙන යෝජනා ඒ ආකෘති පත්‍රවල ඇතුළත් කොට ඉදිරිපත් කරන ලෙස දන්වා තිබුණා. ඒක හොඳ වැඩක්. අප නොයෙකුත් යෝජනා සඳහන් කොට ආකෘති පත්‍ර ඉදිරිපත් කළා. අපේ ප්‍රදේශ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වල අලුතෙන් ආහාර වගා කිරීමට පටන් ගත්තා යයි මා කියන්නෙ නැහැ. මේ රජය අර්තාපල් වවන්නට අදහස් කරන්නට පෙර අපේ ප්‍රදේශවල අර්තාපල් වවන්නට පටන් ගත්තා. ඒ ප්‍රදේශවල එදත් අර්තාපල් වැව්වා. අදත් විශාල පිරිසක් ඒ ප්‍රදේශවල අර්තාපල් වවනවා. ඒ අනුව එම ප්‍රදේශවල මේ මේ කටයුතු කරන්න පුළුවනැයි කියා ආකෘති පත්‍රයෙහි සඳහන් කර යැව්වා. එම අවස්ථාවේදී ඒ ප්‍රදේශයේ අර්තාපල් වගාවක් ඇති කිරීම පිළිබඳව රජය අදහසක් ඇති කර ගෙන තිබුණේ නැතැයි කියා මා සිතනවා. එහෙත් හපුතලේ ඡන්දදායක කොට්ඨාශයේ අර්තාපල් වගාව පිළිබඳව යම්කිසි වැඩ පිළිවෙළක් අප විසින් ඇති කරන්නට යෙදුණා. දැන් ඒ ප්‍රදේශයේ අර්තාපල් වගාව කෙරෙනවා.

ආහාර ඇමතිතුමා දැන් මෙහි නොසිටියත් එතුමාගේ දැනගැනීම සඳහා මා එක්තරා කාරණයක් සඳහන් කරන්නට කැමතියි. එම ප්‍රදේශයේ දැනට කෙරීගෙන යන අර්තාපල් වගාව හේතුකොටගෙන අනාගතයේදී ලංකාව අර්තාපල් අතින් ස්වයංපෝෂිත වෙනවාට කිසිම සැකයක් නැහැ. ඒ කියමන ආණ්ඩුව නොවෙයි, මා කියනවා. 1965 අවුරුද්දේ අර්තාපල්වලට නියම මිලක් දෙනවායැයි ආණ්ඩුව ප්‍රකාශ කළ නමුත් දුන්නේ නැහැ. එම නිසා එම ප්‍රදේශයේ අර්තාපල් අඩු මිලට විකුණන්නට සිදු වුණා. අර්තාපල් වැවිල්ල දියුණුවට පත් වේගෙන එන නිසා අර්තාපල් රාත්තල ශත 3ට 4ට විකුණන්නට සිදු වුවහොත් ගොවීන් සම්පූර්ණයෙන්ම අධෛර්යයට පත් වෙනවා. එම නිසා අර්තාපල් වගා කරන ගොවි ජනතාව ධෛර්යමත් කිරීම සඳහා අර්තාපල්වලට නියම මිලක් ඇති කරන ලෙස මා ආහාර ඇමතිතුමාට කියා සිටිනවා. එසේ කළොත් එම ගොවීන් හේතුකොටගෙනම මේ රටට වුවමනා කරන අර්තාපල් ප්‍රමාණය සපයා ගන්නට පුළුවන් වෙනවා ඇති.

රාජ්‍ය ඇමතිතුමාගේ ආකෘති පත්‍රයේ පිළිවෙළට එම ප්‍රදේශයේ අර්තාපල් වගාව දියුණු කිරීම සඳහා පහසුකම් සලස්වා දෙන හැටියට මතක් කරමින් යවන ලද ලිපියකට ඉඩම් ඇමතිතුමාගෙන් ලැබුණු පිළිතුර වූයේ, "ඔබ විසින් ඉදිරිපත් කළ යෝජනා ලැයිස්තුවට අයත් හපුතලේ මැතිවරණ කොට්ඨාශයේ අර්තාපල් පලතුරු හා අනෙක් අතිරේක භෝග වර්ග වගා කිරීමේ යෝජනාව සම්බන්ධව වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් පහසුකම් නැති බැව් ප්‍රකාශ කර තිබෙන නිසා මෙය කිරීමට අපහසු බව ඔබට දැනුම් දෙමි" යන්නයි. මෙම ලිපිය 1967 ජූනි මස 28 වන දින ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල අමාත්‍යාංශයේ සිට එවන ලද්දක්.

**ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති හා සභානායක)**

*(கௌரவ சீ. பீ. டி சில்வா—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரும் சபை முதல்வரும்)*

(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)

වතුර වුවමනා කරනවා.

**ආරියදාස මයා.**

*(திரு. ஆரியதாச)*

(Mr. Ariyadasa)

එහෙනම් දැන් අර්තාපල් වැවෙන්නෙ? මාත් අර්තාපල් හොණ්ඩර 25ක් සිටුවා තිබෙනවා. දැනුදු ඒ ප්‍රදේශයේ අර්තාපල් වවාගෙන යනවා. තමුන්නාන්සේලාගේ නිලධාරීන් බැරිය කියනවා. මේ සම්බන්ධයෙන් සෝදිසි කර බලන ලෙස රාජ්‍ය ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. තමුන්නාන්සේලා ඒ කාරණය ගැන සෝදිසි කර බැලීම වටිනවා. සමහරවිට වතුර නැතිකම නිසා ගොවිතැන් කිරීම දුෂ්කර වෙන්නට පුළුවනි. එම නිසා ගොවිතැන් සඳහා වතුර සපයා දීම අවශ්‍ය කරනවා. ඒ ගැන සොයා බලන ලෙස මා කියා සිටිනවා. එම ප්‍රදේශය ගොවි ප්‍රදේශයක්. එම ප්‍රදේශයේ ගොවීන් මුහුණ පා සිටින දුෂ්කර තත්ත්වය මගහරවා ගැනීමට තමුන්නාන්සේලා උදව් දිය යුතුයි. තමුන්නාන්සේලාගේ රජය අද මුහුණ පා තිබෙන ආර්ථික ප්‍රශ්නවලින් මිදීමටත් එම ප්‍රදේශය උපකාරී වෙනවා ඇති. එම නිසා ඒ ප්‍රදේශයේ ගොවීන්ට නිසි පරිදි ආධාර උපකාර කළොත් තමුන්නාන්සේලාට වුවමනා කරන ද්‍රව්‍ය බොහොමයක් පහසුවෙන් නිෂ්පාදනය කර ගන්නට හැකි වෙනවා ඇති.

මේ රටේ ඉඩම් සංවර්ධනයක් ඇති නොකළොත් අනාගතයේදී නො අමාරු තත්ත්වයකට මුහුණ පාන්නට සිදු වන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආරියදාස මයා.]

බව මේ ම රජයේ ඇමතිවරු නිතරම කියනවා. ඒ බව ආණ්ඩු පක්ෂයට විතරක් නොවෙයි, අපටත් කියන්න සිදු වෙලා තියෙනවා. වැඩි කල් යන්නට මත්තෙන් මේ ආණ්ඩුවට ඉතිරි හාල් සේරුවත් දිගන්න බැරි තත්ත්වයකට මුහුණ දෙන්නට සිදු වන බවක් පෙනෙන්නට තිබෙනවා. අද රටේ කොත්තමල්ලි පොඩ්ඩක් ගන්නට ඇත්තේ නැහැ. මේවා ගැන නිතරම ප්‍රකාශ කරනවා. දැන් මේ කරුණු කියා පල්වෙලයි තියෙන්නේ. ජනතාවට අවශ්‍ය කරන අනිකුත් ද්‍රව්‍ය ටික සපයා ගැනීමටත් මේ ආණ්ඩුවට බැරි වී තිබෙන නිසා හාල් සේරුවත් දී ගන්නට බැරි වේයැයි අප සිතනවා. මේ රටේ මහ ජනයාට වුවමනා කරන ආහාර ටික සපයා දීමටවත් ආණ්ඩුවට පුළුවන්කමක් ඇත්තේ නැහැ. එම නිසා මේ රටේ සාමාන්‍ය මහජනතාව ආණ්ඩුව ගැන බලා පොරොත්තු නොවී තමතමන්ට වුවමනා කරන දේ තම තමන් විසින්ම නිෂ්පාදනය කර ගැනීමට ඉදිරිපත් විය යුතු යැයි ප්‍රකාශ කිරීම වරදක් නොවෙයි. "අල්ලපු කඩේ තම්බිත් ඉවරයි" කියන කතාව අප අසා තිබෙනවා. ඉදිරි කාලයේදී එවැනි තත්ත්වයකට මුහුණ පාන්නට සිදු වන නිසා රට සංවර්ධනය කර ගැනීම අවශ්‍යයි. කියන තරමට මේ ආණ්ඩුවේ කෙරුවාව තියෙනවද කියන එක නම් ප්‍රශ්නයක්.

අද මේ රටේ සමහර ප්‍රදේශ සංවර්ධනය වේගෙන එන බව පෙනෙනවා. එහෙත් ඔය ගෙන යන වැඩ පිළිවෙල යටතේ ඔය කියන අන්දමේ සංවර්ධනයක් ඇති වේයැයි මා සිතන්නේ නැහැ. මා ඒ පිළිබඳව වැඩි දුර කතා කරන්නට අදහස් කරන්නේ නැහැ. අයවැය ලේඛනය පිළිබඳව නව කරුණු දෙක තුනක් පමණක් සඳහන් කොට මගේ කතාව අවසාන කරන්නට මා බලාපොරොත්තු වෙනවා.

**ගරු සී. පී. ද සිල්වා**
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

අර ලියමනේ නොම්මරය දෙන්න පුළුවන්ද?

**ආරියදාස මයා.**
(திரு. ஆரியதாச)
(Mr. Ariyadasa)

I will give the letter.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රජය ඉතාම හොඳ වැඩක් කර තිබෙනවා. එනම් හරක් හොරකම නැති කිරීම සඳහා **යම්කිසි වැඩ පිළිවෙළක්** අරගෙන තිබීමයි. මේ පියවරට විරුද්ධව රජයට ලොකු තර්ජනයක් කරගෙන හරක් මරණ පිරිස ඉදිරිපත් වී සිටිනවා. ඔවුන්ගේ ඒ තර්ජනයට මේ ආණ්ඩුව යට වුණොත් මේ කරන්නට සූදානම් වී ඇති වැදගත් කටයුත්ත නැත්තටම නැති වෙන්නට පුළුවන්. "No beef if Gazette notification is not suspended." කියා තිබෙනවා. එවැනි තර්ජනවලට ඉඩ නොදෙන ලෙස මා ඉල්ලනවා. තමුන්නාන්සේලා මේ කරන්නට අදහස් කර තිබෙන්නේ ඉතාම වැදගත් කටයුත්තක්. මේ අනුව ලයිසන් එකක් නැතිව හරකෙක් ගෙනයන්නට බැහැ. එමෙන්ම හරක් මරණ පිරිස විසින් ගෙනෙනු ලැබූ හරකුන්ගෙන් සියයට 75 ක් ගෙනාවේ ලයිසන්ස් නැතිවය කියා ඒ අය පිළිගෙන තිබෙනවා.

"The butchers have admitted that about 75 per cent. of the cattle they transport for slaughter are without permits."

ඒ අය පිළිගන්නවලු. ලංකාවේ පමණ අඩු මිලකට හරක් මස් විකුණන රටක් මුළු ලෝකයේම නැහැ. මා නම් මගේ ජීවිත කාලයේ මස් කාලත් නැහැ; කන්නෙත් නැහැ. එංගලන්තයේ නම් කුකුල් මස් රාත්තලට වඩා හරක් මස් රාත්තල මිල වැඩිලු. ලංකාව ගොවි රටක්. ගොවිතැන සඳහා මී හරකුන් ඕනෑ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම එක්තරා සිද්ධියක් කියන්නම්. දිනක් මා කොළඹ සිට හපුතලේ යන විට බස් එකකුත් ලොරියකුත් හැප්පුණා. ඒ දෙක හැපෙනවා මා දැක්කා. එසේ හැපුණු අවස්ථාවේ අර ලොරියේ තට්ටුව කඩාගෙන හරක් පැටියෙක් ඇතුළට වැටිලා රත් වී තිබුණු සයිලන්සරයට බෙල්ල හිර වී හංවඩු ගහනවා වගේ පිච්චුණා. ඌට හෙල්ලෙන්නවත් ඉඩක් තිබුණේ නැහැ. ඔය සිද්ධිය සම්බන්ධව එවකට සිටි පාර්ලිමේන්තු ලේකම්වරයෙක් හැටියට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මා විසින් දෙපාර්තමේන්තුවට ලියුම් කිපයක්ම ලිව්වා. එහෙත් කිසිවක් කෙරුණේ නැහැ. මා මේ ආණ්ඩුවට පමණක් දොස් කියන්නේ නැහැ. අපේ ආණ්ඩුව තිබියදීත් ඔහොමයි. මේ ආණ්ඩුව හරක් හොරකමට විරුද්ධව අරගෙන ඇති ඔය ක්‍රියාමාර්ගයට විරුද්ධව එන බලවේගය බොහොම සැරයි. ඒ නිසා ඒ ගැන ප්‍රවේශ මෙන් කටයුතු කළ යුතුව තිබෙනවා.

මේ ආණ්ඩුව තවත් හොඳ වැඩක් කළා. හොර බුකිවලට පොලිසියෙන් පැන්නා. ඒ අවස්ථාවේ පොලිසියට බුකිකාරයෝ කිව්වා "ඔය වැඩේ වැඩි කල් කරන්න දෙන්නෙ නැත, අපි බුකි ලයිසන්ස් කර ගන්නවා" කියල. දැන් ඇමතිවරුනුත් කථා කරනවා හොර බුකි නීතිගත කරන්නට. ඒ බලවේග යට රජය යට වුණා.

ඒ වගේ හරක් පිළිබඳව ගත් පියවරත් පස්සට ගෙන ඒ බලවේගයටත් යට වේද කියා මා දන්නේ නැහැ. මේ ගත් පියවර ගොවි රටක් වන මේ රටට විශාල යහපතක් නිසා ඒ තර්ජනවලට යට නොවී ගොවියා බේරා ගන්නය කියා මා රජයට කියනවා. එසේ කළොත් ඒ පියවර මේ රටේ සංවර්ධනයට ප්‍රයෝජනවත් වෙනවා. ඒ නිසා ඒ ගත් ක්‍රියාමාර්ගය ඉතාමත්ම හොඳ එකක් බව මා කියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජයේ ගරු මැති ඇමතිවරුන් කිප දෙනකුගේම කථාවලට මා ඇහුම්කන් දීගෙන හිටියා. අද කර්මාන්ත දියුණු වී තිබෙන තත්ත්වය සම්බන්ධව සමහර ගරු මන්ත්‍රීවරුන් කථා කළා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අදුර දර්ශී කර්මාන්ත ප්‍රතිපත්තිය නිසා මේ රටට හානියක් සිදු වී තිබෙනවාය කියා තවත් මන්ත්‍රීවරුන් පිරිසක් කිව්වා. මීගමුවේ ගරු මන්ත්‍රීතුමාත් (ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.) තවත් තර්කයක් ඉදිරිපත් කළා. සල්ලි මහ ගොඩක් සමග 1956 දී ආණ්ඩුව මේ පැත්තට බාර දුන්නාලු. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. 1956 තිබුණු එක්සත් ජාතික පක්ෂයත් දැන් තිබෙන එක්සත් ජාතික පක්ෂයත් අතර යම් කිසි වෙනසක් තිබෙනවා. එදා ඒ උදවියගේ තිබුණු මහේශාක්‍ය ලීලාවෙන් සියයට 50ක් පමණ දැන් අඩු වී තිබෙනවා. එදා තිබුණු එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව මේ රටේ කර්මාන්ත යුගයක් ඇති කිරීම ගැනවත් ඉඩම් සංවර්ධනය කිරීම ගැනවත් කල්පනා කෙළේ නැහැ. ඒ උදවියට වුවමනා කෙළේ මුදල් ගලාගෙන එන භාණ්ඩාගාරයක් පමණයි. එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්ති උඩ මුදල් එකතු කිරීමේ අදහස අනුව පමණයි එදා ඔවුන් කටයුතු කෙළේ.

එදා ඒ විධියට මුදල් එකතු වීමට හේතුව තුන් තිබුණා. කොරියාවේ යුද්ධය නිසා එදා අපේ රටේ තේ රබර් ආදී ද්‍රව්‍යවල මිල වැඩි වුණා. එයින් විශාල මුදලක් එකතු කර ගන්නට ඒ ආණ්ඩුවට පුළුවන් වුණා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව කෙළේ එසේ එකතු වී තිබුණු මුදල් පාවිච්චි කිරීමයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙ ආණ්ඩුව මේ රටේ භාණ්ඩාගාරය හිස් කළාය යනුවෙන් ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරුන් කී කථාවට උත්තරයක් වශයෙන් නොව තර්කයක් වශයෙන් මා එතුමන්ලාගෙන් එක් ප්‍රශ්නයක් අහනවා. කොරියාවේ යුද්ධය නිසා මේ රටේ රබර් මිල වැඩි වීමෙන් අපට ලැබුණු මුදල් යොදවා අපේම රබර් වලින් ටයර් එකක් හදා ගන්නට එදා එතුමන්ලාගේ රජය කල්පනා කළාද? පළමුවැනි වරට මේ රටේ ටයර් කර්මාන්ත ශාලාවක් ඇති කිරීම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අදුරදර්ශී අදහසක්යයි එතුමන්ලාට කියන්නට පුළුවන්ද?

විරුද්ධ පක්ෂයේ නායිකාව යකඩවලත් වානේවලත් වෙනස දන්නේ නැතැයි එතුමියගේ කථාවකට පිළිතුරු දුන් කර්මාන්ත ඇමතිතුමා කියා තිබෙන බවක් මා ඊයේ පෙරෙයිදා දැක්කා. හොඳයි, එතුමිය ඒ දෙකේ වෙනස දැනගෙන සිටියේ නැතැයි අපි හිතමු. එහෙත්, ඒ දෙවර්ගයම නිෂ්පාදනය කරන්නට කර්මාන්ත ශාලාවක් පළමුවැනි වරට මේ රටේ ඇති කෙළේ එතුයමිනේ. කර්මාන්ත ඇමතිතුමා නාකි වනතුරුත් මෙතන බොරුවට කෑගගහ සිටියා මිස ඒ විධියේ කර්මාන්ත ශාලාවක් ආරම්භ කරන්නට එතුමාට පුළුවන් වුණාද? එහෙම දෙයක්වත් කර ගන්නට බැරි වුණු කර්මානත ඇමතිතුමා දැන්, විරුද්ධ පක්ෂයේ නායිකාව නිපදවූ යකඩත් වානෙත් අතට අරගෙන, "මේ දෙකේ වෙනස විරුඬ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආරියදාස මයා.]

පක්ෂයේ නායිකාව දන්නේ නැහැ" යි කියනවා. මේවාට උපමා වශයෙන් කියන්ට නම් හොඳ ලස්සන කථා තියෙනවා. ඒවා කියන්නට මා කැමැති නැහැ. ඊරියගොල්ල ඇමතිතුමා නම් එවැනි කථාවලට බොහොම ආසාවෙන් අප්පුඩි ගසනවා මා දැක තිබෙනවා.

ජපානය යකඩ නිෂ්පාදනය සඳහා වුවමනා කරන අමු ද්‍රව්‍ය සම්පූර්ණයෙන්ම ගෙන්වා ගන්නේ පිටරටවලින්. එසේ කරලත් අද ඒ රට ඉතා දියුණු කාර්මික රටක් බවට පත් වී තිබෙනවා. රටේ සෑම කර්මාන්තයකටම අවශ්‍ය යකඩ අද එහිම නිෂ්පාදනය කෙරෙනවා. රේල් පීලි ආදී හැම දෙයක්ම නිපදවෙනවා. මාත් කර්මාන්ත අමාත්‍යාංශයෙහි සිටි නිසා අපේ යකඩ කර්මාන්තය ගැන කරුණු කියන්නට මට පුළුවනි. යකඩ නිෂ්පාදනයට වුවමනා කරන අමු ද්‍රව්‍ය අපේ රටේ ඕනෑ තරම් තිබෙනවා. කොළඹ සිට මිනිපේ ආදී ප්‍රදේශ දක්වා දිගටම, මේ රටේ අවුරුදු දහස් ගණනක් තිස්සේ යකඩ නිෂ්පාදනය කිරීමට වුවමනා කරණ අමු ද්‍රව්‍ය තිබෙන බව ඒ පිළිබඳව සොයා බැලීමට පැමිණි විශෙෂඥයන් ප්‍රකාශ කර තිබෙනවා. සියයට 0.1 ක ලාභ ලැබෙන කර්මාන්ත ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව විසින් ආරම්භ කළ බවත් යටියන්තොට ගරු මන්ත්‍රීතුමා විසින් එම කර්මාන්ත "සිනිබෝල කර්මාන්ත" වශයෙන් හඳුන්වනු ලැබූ බවත් ගරු සෞඛ්‍ය ඇමතිතුමා කියා තිබෙනවායයි බිංගිරියේ ගරු මන්ත්‍රීතුමා (ජේ. එල්. සිරිසේන මයා.) කිව්වා. සෞඛ්‍ය ඇමතිතුමා මේ කර්මාන්ත ගැන වැඩි විස්තරයක් නොදන්න නිසා එවැනි ප්‍රකාශයක් කරතැයි මා නම් හිතන්නේ නැහැ.

කර්මාන්ත ආදී තවත් නොයෙක් දේවල් සම්බන්ධයෙන් තවදුරටත් කරුණු විස්තර කිරීමට තිබෙන නමුත්, කාල වේලා ඉක්ම ගිය නිසා මගේ කථාව මෙයින් අවසන් කරමින් මේ වචන ස්වල්පය කථා කිරීමට මට අවසථාව සලසා දීම ගැන තමුන්නාන්සේට මගේ කෘතඥතාව පළ කරනවා.

පූ. භා. 10.43

විමලා කන්නන්ගර මිය. (සෞඛ්‍ය ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)

(திருமதி விமலா கன்னங்கரா—சுகாதார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)

(Mrs. Wimala Kannangara—Parliamentary Secretary to the Minister of Health)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉදිරි වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇති මෙම අය වැය ලේඛනයෙන් මොන විධියේ යුගයක් උදාවනවාද, මොන විධියේ සම්පතක් ලැබෙනවාද යන හැඟීම උඩ අද ලක් වැසි පොදු මහජනතාව මේ සභා ගර්භය දෙස බලා සිටින්නේ කෙසේද කිවහොත් අවුරුද්දක් ගෙවී තවත් අලුත් අවුරුද්දක් උදා වන අවසථාවේදී තමන්ගේ ඉෂ්ට දෙවියන් වැඳ පුදාගෙන ඒ ඒ අවසථාවට නියමිත වර්ණවලින් යුත් ඇඳුම් පැළඳුම් ඇඳගෙන සුභ මොහොතින් ගනු දෙනු කර තම තමන්ගේ ගොවිතැන් රැකී රක්ෂා ආදියටද සෙතක් වේවාය යන හැඟීමෙන් යුක්තව සිටින්නා වාගේයි.

එවැනි අවසථාවකදී නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ මහජන නියෝජිතයන් මෙම මන්ත්‍රී මණ්ඩලය උසාවියක් මෙන් පරිවර්තනය කරගෙන ඒ පැත්තෙන් මේ පැත්තටත් මේ පැත්තෙන් ඒ පැත්තටත් මඩ ගැසීමට බොහෝ වේලාවක් ගත කළ බව අපට පෙනී ගියා. ආණ්ඩුව පැත්තෙන් කියන සෑම දේම විරුද්ධ පැත්තේ මන්ත්‍රීවරුන් විසින් බොරුය අසත්‍ය කියන්නත්,, විරුද්ධ පැත්තේ මන්ත්‍රීවරුන් කියන සෑම දේම ආණ්ඩුව පැත්තේ මන්ත්‍රීවරුන් විසින් බොරුය අසත්‍ය කියන්නත් කොතෙකුත් තර්ක කළ අවසථාවේදී මට ප්‍රථම කථා කළ හපුතලේ ගරු මන්ත්‍රීතුමා (ආරියදාස මයා.) ඇත්ත ඇති හැටියට පෙන්වා දෙන්නට උත්සාහ කිරීම ගැන මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ රට ගොවි රටක්ය, එම නිසා ගොවි රටක් වශයෙන් මේ රටේ ඉදිරි කටයුතු ගෙන යා යුතුය කියන අදහසට ඇත්ත වශයෙන් විරුද්ධ පක්ෂයෙන් ස්වල්ප දෙනයි එකඟ වී තිබෙන්නේ. මේ රටේ වැඩි වශයෙන් ගොවිතැනම දියුණු කළ යුතුය කියන අදහසට හපුතලේ ගරු මන්ත්‍රීතුමා එකඟ වීම ගැන අප සන්තෝෂ වෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අර්තාපල් වගාව මේ රටේම දියුණු කළ යුතුය කියන අදහස උඩ දැන් මේ රජය මගින් කටයුතු කරගෙන යනවා. අල නැතැයි කියා ඒ පැත්තේ මන්ත්‍රීවරුන් කොතකේ කිව්වත්, වැලිමඩ නුවරඑළිය ආදී ප්‍රදේශවල දැනට කරගෙන යන අර්තාපල් වගාකිරීමේ ව්‍යාපාරය නිසා තව කලක් යන විට අර්තාපල්වල මිල සීමා නොකළොත් රාත්තල ශත 3ට යන්න ඉඩ තිබෙනවාය කියා ඒ මන්ත්‍රීතුමාම ප්‍රකාශ කළා. අර්තාපල් වගාව නිසා ලංකාවෙන් පිට වූ කෝටි දෙකක පමණ විදේශ විනිමයක් මේ රටේ ඉතුරු කර ගැනීමට අපට පුළුවන්වනවා ඇති. ඔය විධියට ගොවිතැන් දියුණු කිරීමෙන් රටටත් දුප්පත් ගොවියාටත් සෙතක් කිරීම සඳහා කෘෂිකර්ම ඇමතිතුමා සහ අගමැතිතුමා අර ගෙන තිබෙන පියවර ගැන විරුද්ධ පක්ෂයේ ප්‍රශංසාවත් හිමිවිය යුතුයි. ඒ වාගේම මෙම අයවැය ලේඛනය සකස් කිරීමේදී අපේ මුදල් ඇමතිතුමා ආර්ථික සංවර්ධනය ස්ථිර පදනමක් උඩ ගොඩ නැංවීමට හැකි වන පරිදි මෙය සකස් කර තිබීම ගැන එතුමාට අපේ ප්‍රශංසාව හිමිවිය යුතුයි.

මෙවර ඉදිරිපත් කර ඇති අයවැය ලේඛනය, විශේෂයෙන්ම රැකී රක්ෂා ප්‍රශ්නය විසඳීම සඳහාත්, මේ රටේ තිබෙන ස්වාභාවික ධන නිධාන සම්පත් මේ රටේ සංවර්ධනයට එකතු කර ගැනීම සඳහාත්—නොවරදින එකම මාර්ගය වන ආර්ථික සංවර්ධනය වැඩි දියුණු කිරීම සඳහාත්—හේතු වන බව කාටත් වැටහෙනවා ඇති. ඉතාමත් භයානක ආර්ථික පරිහානියකට අපේ රට මුහුණ පා සිටින මේ අවස්ථාවේදී, අපේ මූලික නිෂ්පාදන ද්‍රව්‍ය වන තේ පොල් රබර් මිල බැසගෙන යන මේ අවස්ථාවේදී, ගරු මුදල් ඇමතිතුමා විසින් ආහාර සංවර්ධන ව්‍යාපාරවලට වෙන කොයිම වර්ෂයකටවත් වඩා වැඩි මුදලක් නොහොත් රුපියල් 78,30,00,000ක් වෙන් කර තිබෙනවා. එයින් රු. 24,00,00,000 ක්ම වෙන් කර තිබෙන්නේ කෘෂිකර්ම ව්‍යාපාරවලටයි. එය ඉතා වැදගත් කරුණක්.

1964 ලංකා බැංකු වාර්තාවෙහි සඳහන් කර තිබෙනව, අපේ රටට යෝග්‍ය වන්නෙ කෘෂිකර්මය දියුණු කිරීම මිස කාර්මික නිෂ්පාදනය දියුණු කිරීම නොවේය කියා. එමෙන්ම අපේ මූලික නිෂ්පාදන ද්‍රව්‍ය විශාල තොග පිටරට යවා මුදල් උපදවා ගන්නා නමුත් ආහාර ද්‍රව්‍ය ගෙන්වීම සඳහා ඒ මුදලෙන් විශාල ප්‍රමාණයක් වැය වෙනවා. 1967 අවුරුද්දේදී මේ රටට ආහාර ද්‍රව්‍ය ගෙන්වීම සඳහා වෙන්වී තිබෙන මුදල රුපියල් 83 කෝටි 40 ලක්ෂයක් වෙනවා. එයින් 32 කෝටි 80 ලක්ෂයක් සහල්වලට; 25 කෝටි 50 ලක්ෂයක් තිරිඟු පිටිවලට; 6 කෝටියක් සීනිවලට. සෙසු ආහාර ද්‍රව්‍ය සඳහා රුපියල් 28 කෝටි 20 ලක්ෂයක් වෙන්කර තිබෙනවා. මෙයින් අපට හොඳින්ම පෙනී යනවා, අපට ලැබෙන මුළු ආදායම එකසිය හැත්තෑ දෙකෝටි තිස් ලක්ෂයක් වන අතර එයින් සියයට පනහක් පමණ පිටරටින් ආහාර ද්‍රව්‍ය ගෙන්වීමට වියදම් කරන්න සිදු වී ඇති බව.

අපේ වැඩ පිළිවෙල අනුව හාල්, රතුළූණු සීනි, මිරිස්, පිටිකිරි වර්ග ගෙන්වීම සඳහා වැය කරන විදේශ විනිමය අපේ රටේම රඳවා ගැනීමට හැකි වනවා පමණක් නොවෙයි, රටේ ගොවිජනතාවට ප්‍රයෝජනවත් වන යන්ත්‍ර උපකරණ ගෙන්වා ගැනීමට එම විදේශ විනිමය යෙදවීමටත් පුළුවන් වෙනවා. එම නිසා ගොවි ජනතාවට තමන් දුක සේ කරන රැකියාවෙන් දැනට වඩා ආදායමක් ගත හැකි පිළිවෙළක් යෙදීම හේතුකොටගෙන විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් කොයි අන්දමින් විරුද්ධ ප්‍රචාරයන් ගෙන ගියත්, අවසානයේදී මෙම ජාතික රජයට මහජනතාවගේ ප්‍රශංසාව හිමි වෙනවාට අනුමානයක් නැහැ.

දෙඩම්ගස්ලන්ද මන්ත්‍රීතුමියත්, (ලෙටීෂියා රාජපක්ෂ මිය.) මුල්කිරිගල මන්ත්‍රීතුමාත් (ජෝර්ජ් රාජපක්ෂ මයා.) තවත් විරුද්ධ පක්ෂයෙ මන්ත්‍රීවරුන් කිප දෙනෙකුත් අගමැතිතුමාගෙ කෘෂිකර්ම ව්‍යාපාරය ගැන සැක උපදවමින් කථා කළා. සමහරු කිව්වා, අගමැතිතුමා රජයේ නිලධාරීන්ට මුළා වෙලාය, ගරු අගමැතිතුමාව "ජෝයි රයිඩ්" එහෙකට ගෙන යනවාය, මේ කියන දේවල් එකක්වත් කෙරෙන්නෙ නැත කියා. දොඩම්ගස්ලන්දෙ ගරු මන්ත්‍රීවරිය කිව්ව, එක් කන්නයකදී අස්වැන්න පාලුවුණාම අනික් කන්නයේදී එයට වඩා වැඩි වී අස්වැන්නක් ලැබෙනවාය කියා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1942 සිට මහජන සේවිකාවක් වශයෙන් සිට, 1952 සිට ගම්කාර්ය සභාපතිණි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විමලා කන්නන්ගර මිය.]

යක වශයෙන් සේවය කළ නිසා මෙහි නියම සත්‍යය මා හොඳාකාර දන්නවා. බෙලිගල් කෝරලය පළමුවෙන් තිබුණේ දැදිගම ආසනය වශයෙනුයි. දැන් බෙලිගල් කෝරලය දෙකට බෙදා එකක් දැදිගම ආසනය වශයෙනුත් අනික ගලිගමුව ආසනය වශයෙනුත් වෙන් කර තිබෙනවා. මේ ප්‍රදේශවල කෙරෙන කෘෂිකර්ම කටයුතු ගැන මා හොඳින්ම දන්නවා. ගොවිකම් ප්‍රදර්ශනවලදී, කෘෂිකර්ම තරගවලදී, රැස්වීම්වලදී, කෘෂිකර්මය ගැන උපදෙස් දෙන්න පවා හොඳ වැටහීමක්, දක්ෂකමක්, පළපුරුද්දක් අපේ අගමැතිතුමාට ඇති බව සෑම කෙනෙක්ම අවබෝධ කරගෙන තිබෙනවා. එම නිසා රජයේ සේවකයින්ට, අගමැතිතුමාගෙ කාෂිකම් ව්‍යාපාරයේදී, අගමැතිතුමා මුළා කරන්න බැරි බව, මුළා කරන්න ගියොත් මුළා වෙන්නෙ තමන්ම බව කාටත් පැහැදිලිව පෙනී යනවා ඇති.

අපේ රටේ මූලික ආහාරය බත් නම්, සෑම ආසියාතික රටකම සහල් නිපදවනවා නම්, අපේ රටට සමාන බෞද්ධ සංස්කෘතියක් ඇති බුරුමය, වියට්නාමය, තායිලන්තය වැනි රටවලින් හා ඉන්දුනීසියාව, පකිස්තානය ආදී රටවලින් සහල් ගෙන්වීමට අපට සිදු වී තිබෙනවා නම්, ඒ හා සමාන ආසියාතික රටක් වන අපට අවශ්‍ය සහල් නිපදවා ගන්න බැරි වුණේ, ඒ රටවලින් සහල් ගෙන්වීමට සිදු වී තිබෙන්නෙ මොන කාරණයක් නිසාද කියා මම පැහැදිළි කර දෙන්නම්. මේ කාරණයේදී, අප ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටවත්, සමසමාජ පක්ෂයටවත්, එහෙම නැතිනම් එක්සත් ජාතික පක්ෂයටවත් දොස් නැඟීමෙන් වැඩක් නැහැ. අවුරුදු සිය ගණනාවක් වහල් ජාතියක් වශයෙන් සිටි අපට, අපේ රජදරුවන්ගේ කාලයෙහි තිබුණු වැව් අමුණු නටබුන් වී අපට නැතිව ගොස් තිබෙනවා. අපේ මෙතරම් සාරවත් පොළවක් තිබෙද්දී, වතුර සෑම පැත්තකින්ම තිබෙද්දි අපේ ගොවිජනතාවට තිබුණු ඒ වතුපිටි ඔවුනට අහිමි කොට අප වහල් ජාතියක් බවට පත් කළා පමණක් නොවෙයි, හාල් සේරුව ශත හයට දී ජනතාව නිකමුන් බවට පත් කළා; වහල් තත්ත්වයකට දැම්මා. අපේ රටේ ඇති වූ යුද්ධයක් නිසා නොව, ජර්මනිය, එංගලන්තය අමෙරිකාව ආදී රටවල ඇති වූ යුද්ධයක් නිසා මීට අවුරුදු 22 කට පමණ පෙර අපේ රටට සලාක ක්‍රමය හෙවත් කූපන් ක්‍රමය බෝ කළා. සිංහල යන් වශයෙන්, ප්‍රෞඪ ඉතිහාසයක් ඇති ජාතියක් වශයෙන්, පුරාණ කාලයේ "පෙරදිග ධාන්‍යාගාරය" යනුවෙන් හැඳින්වුණු රටක් වශයෙන්, පිටරටවලට පවා සහල් යැවූ රටක් වශයෙන් අප ලජ්ජා විය යුතුයි නේද, තවමත් ඒ කූපන් පොත් ක්‍රමය— සලාක ක්‍රමය— අත්හැර දමන්නට බැරි වීම ගැන. අද දේශපාලන පක්ෂ මැතිවරණ ව්‍යාපාරය සඳහා මේ කූපන් පොත තුරුම්පුවක් කරගෙන තිබෙනවා. "අප හාල් සේරු දෙකම දුන්නා, ඒ අය එක සේරුවක් කැපුවා, හාල් සේරුවක් නොමිලයේ දුන්නේ කවුරුන්ද" යනාදි වශයෙන් ඒ ඒ පක්ෂ දේශපාලන තුරුම්පු වශයෙන් කූපන් පොත යොදාගෙන තිබීම අපට ලජ්ජාවක්. මීට අවුරුදු 20 කට පමණ පෙර ස්වාධීනත්වය ලබා ගත් අප නිදහස් ජාතියක් වශයෙන් ජීවත් වීමට නම්, ස්ත්‍රී, පුරුෂ, ළමා-ළපැටි හැම දෙනාම දේශප්‍රේමී, පරිත්‍යාගශීලී ජනතාවක් වශයෙන්, ආගම් භේද, ජාති භේද, කුල භේද, පක්ෂ භේද පැත්තකට දමා අපේ රට දියුණු කරන්නට ඕනෑ. ඒ සඳහා ඇති ඒකායන මාර්ගය නම් ශීඝ්‍ර ආර්ථික සංවර්ධනයක් සඳහා කටයුතු කිරීමයි. මුදල් අතින් රට ඉතා අමාරු තත්ත්වයකට පත් වී තිබෙන මෙවැනි අවස්ථාවක පවා මේ රට ආහාරයෙන් ස්වයංපෝෂණය කිරීම සඳහා රුපියල් 24,00,00,000 ක් වෙන් කිරීම, මේ රටේ ශීඝ්‍ර ආර්ථික සංවර්ධනයක් ඇති කිරීමට දරන ප්‍රයත්නයක් නොවෙයිද?

"ආණ්ඩු පක්ෂයේ උදවිය බොරු කියනවා, මේ විධියේ අස්වැන්නක් ලැබෙන්නේ නැහැ, අද ඉස්පිරිතාලවල බත් නැහැ, හාල් සේරුවක් ගන්නට ශත 85ක් යනවා, මහජනයා අද හාමතේ" යනුවෙන් විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් රජයට චෝදනා කළා. මහජනයා හාමතේ ඉන්නේ නැහැ. ඔවුන් කීයක් හෝ දී හාල් ගෙන බත් කනවා. දැන් අපේ උදවිය පාන් කනන්නටත් පුරුදු වී තිබෙනවා. ඉස්පිරිතාලවල ප්‍රතිකාර ලබන ලෙඩුන්ට හාල් සේරු දෙකක් නොමිළයේ දෙන්නේ කොහොමද, නීරෝගී මිනිසුන්ටත් හාල් සේරුවකට වඩා දෙන්නට බැරි කොට? ඒ රෝගීන්ටත් හිමිකම ඇත්තේ එක සේරුවකටයි. තමන්ගේ හාල් පොත ගෙනා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වොත්, එහෙම නැත්නම් හාල් ටික ගෙනාවොත් ඒ අයට බත් දෙනවා. එහෙම නැතිව විශේෂයක් කරන්නට බැහැ. ලෙඩුන්ට සම්පූර්ණ ප්‍රතිකාර ලබා දෙන්නට අප සතුටු වනවා වාගේම, පුළුවන් කමක් තිබෙනවා නම් ඔවුන්ට සම්පූර්ණ ආහාරයම සැපයීමටත් අප සතුටුයි. ඊට අවස්ථාව ලබා ගැනීමට තමයි, අප මේ ධෛර්යයෙන් යුතුව කටයුතු කරන්නේ. ආණ්ඩු පක්ෂයේ අය පමණක් නොව ජාතියක් වශයෙන් සියලු දෙනාම ඒ ධෛර්යයෙන් යුතුව කටයුතු කරන්නට ඕනෑ.

මා මීට පෙරත් කිව්වා, "අපේ ගොවිතැන සඳහා පෝර ටික ඕනෑ, වතුර ටික ඕනෑ" කියා. ගොවිතැන් කිරීම සඳහා අපට තිබෙන බිම් ප්‍රමාණය හොඳටම ප්‍රමාණවත්. ඉදිරියට වැඩි වන ජනගහණයට පවා ප්‍රමාණවත් ආහාර සැපයීමට දැනට තිබෙන කුඹුරු අක්කර ප්‍රමාණය හොඳටම සෑහෙන බවටත්, දැන් මෙන් හතර ගුණයක් පෝර යොදනවා නම්—පස්වල තිබෙන රසායනික කොටස්වලට දැනට සපයන පෝර මදි—වැඩි කල් යන්නට පෙර මේ රට ආහාරයෙන් ස්වයංපෝෂණය කරන්නට—මේ රටේ සෑම කෙනකුටම සිංහල හාල් සේරු දෙක ගණනේ සපයන්නට—පුළුවන් බවටත් විශේෂඥ ප්‍රතිඥ ලැබී තිබෙනවා. එසේ රට ස්වයංපෝෂණය කරන්නට තමයි, දැන් අප ක්‍රියා මාර්ගය ගෙන තිබෙන්නේ. එය එසේ නොවේයැයි කියන නිසා, ඒ බව ඔප්පු කිරීමටයි, මා දැන් සූදානම් වන්නේ. ඒ සඳහා සඟරාවකින් කරුණු උපුටා දක්වනවා :

"ගොවිකම් සඟරාව", 10 කාණ්ඩය—ජයන්ති කලාපය—1966 ජනවාරි මාර්තු".

එහි මාතෘකාව මෙසේ සඳහන් වෙනවා :

"ලංකාවේ මෑතකදී සිදු කරන ලද කෘෂිකාර්මික පර්යේෂණ"

ඒ ලිපිය සපයා තිබෙන්නේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) ආචාර්ය ජේ. ඩබ්ලිව්. එල්. පීරිස් මහත්මයායි. සුදුසු අස හා වී වර්ග ගැනත්, ඒවායින් ඒ ඒ පළාත්වල ලැබී තිබෙන අස්වැන්න ගැනත් එහි සඳහන් කර තිබෙනවා. දැන් මා එය කියවනවා :

"මෙම වර්ග බෝ කිරීමේ වැඩ පිළිවෙළ අනුව එච්—4 වී වර්ගය බිහි වී ඇත. විශාල වශයෙන් පඳුරු ගැසීමේ ශක්තියක් ඇති මෙම වර්ගය "ඉන්ඩිකා" වර්ගයට අයත් ඉතාමත්ම හොඳ වර්ගයන්ගෙන් එකකි. පොහොර විශාල වශයෙන් ඇද ගැනීමේ ශක්තියක් හා කොළ පාළුවට ඔරොත්තු දීමේ ශක්තියක්ද, අක්කරයකට වී බුසල් 160 ක් දීමේ බලයක්ද මෙම වර්ගයට ඇත. මෙම බලය පිළිබඳව නිගමනය ශාස්ත්‍රීය එකක් පමණී. එක් එක් පළාත්වලට සුදුසු වෙනත් වර්ගවලින් විශාල අස්වනු ලබා ගැනීමට හැකි වුවද, එච්—4 සෑම පළාතකම දේශගුණික බලපෑම්වලට ඔරොත්තු දෙමින් සෑම කුඹුරකම පාහේ උසස් අස්වනු දෙමින් වගා වෙයි—"

හම්බන්තොට දිස්ත්‍රිකක්යේ බෝකරන ලද එච්—105 අක්කර 2300 ක වපසරියේ වගා කිරීමෙන් පසු අක්කරයකට බුසල් 78.5 ක අස්වැන්නක් ලබා දී ඇත. ගාළු දිස්ත්‍රික්කයේ ජලය බැස නොයන ඉඩම්වලට සුදුසු යයි සම්මත එච්—501 වර්ගය නිසා දිස්ත්‍රික්කයේ අක්කරයකින් ලැබෙන අස්වැන්න දෙගුණ වී ඇත. එම වර්ගයෙන් ලබා ගත හැකි සාමාන්‍ය අස්වැන්න අක්කරයකට බුසල් 50 ක් පමණ වෙයි. මාස 5-6 දක්වා වී වර්ගයන් අතර (පඳුරු වීXමාස්) දෙමුහුන් වී හා (පඳුරු වී XVI) නූවුහන් වී වලින් ලැබී ඇති අස්වැන්න අනිතයේ උසස් යයි සම්මත පී.ටී.බී.—16 ලැබෙන සමාන්‍ය අස්වැන්නට වඩා සියයට 15 කින් වැඩි වී ඇත.

මේ විධියට මේක කියවන්ට ගියොත් බොහෝ වෙලාවක් ගත වෙනවා.

**එච්. ජී. ඒ. කාරියවසම් මයා.** (බෙන්තර-ඇල්පිටිය)

*(திரு. எச். ஜீ. ஏ. காரியவசம்—பெந்தர-எல்பிற்றிய)*

(Mr. H. G. A. Kariyawasam—Bentara-Elpitiya)

ඔකෙ තියෙන්නෙ හුඟක් බොරුනෙ.

**විමලා කන්නන්ගර මිය.**

*(திருமதி விமலா கன்னங்கர)*

(Mrs. Wimala Kannangara)

බොරුව ගැන මම තමුන්නාන්සේට කියන්නම්. පසුගිය මාසයේ බෙලිගල් කෝරලයේ ගොවි තරඟයට ඉදිරිපත් වුණු දැදිගම ආසනයේ එක්තරා ගොවි මහත්මයෙකුට එච්—4 වී වගා කිරීමෙන් අස්වැන්න 1 ට, 150ක් ලැබී තිබෙනවා. ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විමලා කන්නන්ගර මිය.]
ගොවි මහත්මයා ඒ සඳහා අගමැතිතුමා ගෙන් සහතික ලබා ගත්තා. මීට ඉස්සර බෙලිගල් කෝරලයේ අස්වැන්න ප්‍රමාණය 1 ට, 35 ටත් 40 ටත් අතර ගණනක් ලැබුණෙ. කලින් 30, 40 ලැබුණු තැන් වලින් 150ක් ලැබෙන්න පටන් ගත් තොත් අපේ රට හාල්වලින් ස්වයං පෝෂිත වෙන්නෙ නැද්ද කියා තර්ක පැත්තකට දමා කල්පනා කරන්න ගරු මන්ත්‍රීතුමනි. අන්න ඒ කාරණයයි මා පෙන්වන්නේ. ඒ නිසා බොරු වාද භේද ඉවත දමා දෙපැත්තේම සිටින ගරු මන්ත්‍රී වරුන් තමන්ගේ යුතුකම් හරිහැටි ඉටු කරනව නම් අපේ රට දියුණු කරන්න පුළුවනි.

මේ අයවැය ලේඛනයෙන් ගොවියාගේ දියුණුවට මොකද කළේ කියා ඇහුවා. ඒවාට පිළිතුරු මෙන්න. ගොවීන්ට දෙන වගා ණය රුපියල් 175 සිට 225 දක්වා වැඩි කළා. අපේ ගොවි මහත්වරුන්ට කලට වේලාවට පෝර ටික වුවමනායි. පෝර යෙදීමෙන් තමයි අස්වැන්න වැඩි කර ගන්ට පුළුවන්කම තිබෙන්නේ. මීට පෙර ඒ පෝර ටික සොයාගෙන කරත්ත එහෙම බැඳගෙන හැතැප්ම දහය-පහ ළොහ මග ගෙවා නගරවලට එන්න ගොවීන්ට සිදු වී තිබුණා. දැන් පෝර ටික පහසුවෙන් ගොවීන්ට ලබා දෙන්ට ගබඩා රාශියක් රටපුරා පිහිටුවා තිබෙනවා. සම හරවිට ඒ කටයුතුවල යෙදී සිටින නිල ධාරීන් හරියාකාරව ක්‍රියා කරන්නෙ නැහැ. මගේ ආසනයේ නිලධාරීනුත් හරියාකාර ක්‍රියා කළේ නැහැ. මම කළේ "පොලිටිකල් ඉන්ටර්ෆියරන්ස්" කියන එක පැත්තකට දමල ඒ ගැන අධ්‍යක්ෂ තුමාට පැමිණිලි කර පෝර ගබඩා ලබා ගැනීමයි. මේ පෝර ගබඩා පිහිටුවීම සඳහා එක ග්‍රාම සේවක කොට්ඨාශයකට රුපි යල් පන්දාහේ සිට දහ දාහ දක්වා මුදලක් හා පර්චස් 20 ක ඉඩම් කැබැල්ල කුත් දෙනවා. මේවා තමයි, රජය ගොවි යාට දෙන ආධාර. ගමනාගමන අපහසු කම් තිබෙන ග්‍රාම සේවක කොට්ඨාශවලට පෝර ගබඩා දෙකක් වුණත් දෙනවා.

මීට පෙර උදැල්ලක් ලබා ගැනීම සඳහා ඩී. ආර්. ඕ. මහත්වරුන්ගෙන් සහතික ලබා ගැනීමට දවස් දෙක—තුන රස්තියාදු වෙමින් තමන්ගේ රුපියල් දෙක—තුන වියදම් කර ගත් ගොවි මහත්වරුන්ට පහසුවෙන් උදලු ලබා දීම සඳහා උදලු ලක්ෂ 450ක් ගෙන්වීමට මේ අයවැය ලේඛනයෙන් මුදල් වෙන් කර තිබෙනවා. තමුන්නාන්සේලා පිහිටුවූ ලෝහ භාණ්ඩ සංස්ථාවෙන් පිට කරන උදලුවලට අමතර වයි, මේ ප්‍රමාණය ගෙන්වන්නෙ. තමුන් නාන්සේලා ගොවියා රජ කරනවාය කිව් වට උදලු නොදී ගොවියා රජ කරවන්නෙ කොහොමදැයි මා අහනව. අපි ගලිගමුවේ සමුපකාර සමිතියෙන් ලැබුණු ලාභ මුදල් වලින් ගොඩනැගිල්ලක් සාදා එහි මහ ජන බැංකු ශාඛාවක් පිහිටුවන ලෙස මහ ජන බැංකුවේ සභාපති තැන්පත් ටී. බී. පානබොක්කේ මැතිතුමාගෙන් ඉල්ලා සිටි පමණින් එතුමා එය අපට ලබා දුන්නා. අස්සක, මුල්ලක පිහිටි ගමක් වන ගලිගමුවේ දැන් මහජන බැංකුවේ ශාඛාවක් ලැබී තිබෙනව. එයින් ණය ලබා ගැනීමේ පහසුකම් අද ගොවීන්ට සැලසී තිබෙනව. රටේ අවශ්‍යතාවන් සඳහා මාස 10කට ප්‍රමාණවත් වන තරම් රතු ලූනු ප්‍රමාණයක් දැන් යාපනය ප්‍රදේශයේ නිපදවනව. ඒ සැම මුදලක්ම දැන් ලැබෙන්නෙ ගොවි මහත්වරුන්ටයි. දැන් බතල රාත්තලක් සත 25 යයි කිය වුණා. අද සැම මහත්මයෙක්ම—ගොවියෙක් හෝ ඉස්කෝල මහත්මයෙක් හෝ; ඔහු නිරෝගි මහත්මයෙක් නම්—තමන්ගේ බිම් කොටස්වල අල, බතල, මඤ්ඤොක්කා ආදිය වගා කරනව. ඒ මොකද? එදා ශත දෙකටවත් විකුණන් නට බැරිව තිබුණු මංඤොක්කා රාත්තල අද ගම්බද ප්‍රදේශවල පවා ශත 15 ට 20 ට විකුණන්නට පුළුවන් වී තිබෙනවා. අර "ෆාර්ම් ස්ටෝර්ස්" කියන එකේ පොලොස් ගෙඩියක් රුපියලයි. කොස් ගෙඩියක් 1.50 යි. මේ මුදල් කාටද යන් නෙ? පරදේශක්කාරයන්ටද, නැත්නම් අපේ ගම්බද ප්‍රදේශවල දුක් විඳින ගොවි කම්කරු ජනතාවටද කියා මා ප්‍රශ්න කර නවා. එම නිසයි අප ප්‍රීති වෙන්නෙ. දහ ඩිය මහන්සියෙන් වැඩ කරන ගොවි මහත්මයාට තැන ලබා දුන්නේ මේ ආණ්ඩුවය කියා ඉතිහාස ගත වෙනවා ඇති. අපේ අගමැතිතුමා පරාක්‍රමබාහු රජ තුමාගේ අවතාරය මෙන් ක්‍රියා කරනවා. ගොවිතැන පිළිබඳව අතීතයේ තිබුණු පැරණි ශ්‍රී විභූතිය නැවතත් මේ රටේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඇති කරන්නට අපේ අගමැතිතුමා ක්‍රියා කරගෙන යනවා. කාලය නොමැතිවීම නිසා විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා ඉදිරිපත් කළ සෑම කාරණයක් ගැනම මා උත්තර දෙන්නට අදහස් කරන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රුපියල් 300 ට අඩු පඩි ලබන රජයේ හා පළාත් පාලන සේවකයන්ටත් විශ්‍රාම වැටුප් ලබන්නන්ටත් අතුරු දීමනාවක් ගෙවන්නට අපේ රජය ගත් පියවර ගැන දැන් විරුද්ධ පක්ෂය බොහොම කලබල වී තිබෙනවා. රුපියල් 100 ට අඩු පඩි ලබන සේවක මහත්වරුන්ට රුපියල් 20ක දීමනාවකුත් රුපියල් 300 ට අඩු පඩි ලබන සේවක මහත්වරුන්ට රුපියල් 10ක දීමනාවකුත් ගෙවන්නට මේ අයවැය ලේඛනයෙන් මුදල් වෙන් කර තිබෙනවා. ඒවාගේම වයස් ගතවී ගෙවල්වල සිටින විශ්‍රාම වැටුප් ලබන මහත්ම මහත්මියන්ටත් අතුරු දීමනාවක් ගෙවන්නට මුදල් වෙන් කර තිබෙනවා. කම්කරු නායකයකු වන යටියන්තොට ගරු මන්ත්‍රීතුමාත් (ආචාර්ය එන්. එම්. පෙරේරා) මේ රටේ මුදල් ඇමතිවරයකු වශයෙන් කටයුතු කළා. එතුමා මුදල් අමාත්‍ය ධුරයට පත් වෙන්නට කලින් එවකට තිබුණු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවට ඉල්ලීම් 21ක් ඉදිරිපත් කළා. ඒ ඉල්ලීම් 21න් එක් ඉල්ලීමක් තමයි වැඩි වැටුප් ඉල්ලීම. එහෙත් එතුමා 1964 දී මුදල් ඇමති වශයෙන් පත් වූවාට පසුව මොකද කළේ? එතුමා රුපියල් 2.50 යි වැඩි කළේ. කම්කරු නායක මුදල් ඇමතිතුමා 2.50 යි වැඩි කළේ. එහෙත් වන්නි හත් පත්තුවෙන් පැමිණි ගොවි පුතා, අපේ මුදල් ඇමතිතුමා, ඒ කම්කරු නායකයා පරාජය කරමින් එමෙන් අට ගුණයකින් වැඩි පඩි වැඩිවීමක් කිරීම ගැන ඇත්ත වශයෙන්ම එතුමාටත් මේ ජාතික ආණ්ඩුවටත් ප්‍රශංසා කළ යුතුයි. එම නිසා පන්ති භේදයක් නැතිව මේ ආණ්ඩුව පොහොසතාගෙන් මුදල් අරගෙන දුප්පතාට බෙදා දෙන බව තමුන්නාන්සේලාට පෙනෙනවා ඇති. මගේ තර්කය වැරදි නම් මට පසුව කථා කරන ගරු මන්ත්‍රීවරුන්ට එය පෙන්වා දෙන්නට පුළුවනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආනයන බලපත්‍ර ගාස්තුව සියයට 10 කින් වැඩි කළාය, එමනිසා ගෘහණියටත් පොදු මහ ජනතාවටත් බලපාන පරිද්දෙන් ජීවන වියදම තවත් වැඩිවේවිය කියා රට සෑම තැනම ප්‍රචාරයක් ගෙන යනවා. මෙරටට අත්‍යවශ්‍ය බඩු ගෙන්වන සමුපකාර තොග වෙළඳ ආයතනය අපේ රාජ්‍ය ඇමතිතුමාටයි භාරව තිබෙන්නේ. ආහාර කොමසාරිස් ඇතුළු රජයේ දෙපාර්තමේන්තු මේ බලපත්‍ර ගාස්තුවෙන් නිදහස් බව අප හොඳාකාරවම දන්නවා. එමනිසා සූදුරු, කොත්තමල්ලි, සියඹලා ආදී ද්‍රව්‍යවලට වැඩි කරන ලද මේ බලපත්‍ර ගාස්තුව බලපාන්නේ නැහැ. අමුතුවෙන් මහජනතාව පිට බරක් වැටෙන්නේ නැහැ. මිරිස්, කුළු බඩු ආදී ඒ සෑම ද්‍රව්‍යයක්ම පළමු මිළට මහජනතාවට ලැබෙනවා ඇති. අද මේ රටට අවශ්‍ය රෙදිපිළි ගෙන්වන්නෙත් සමුපකාර තොග වෙළඳ ආයතනය මාර්ගයෙනුයි. එම නිසා රෙදිපිළිවලටත් මේ වැඩි කරන ලද බලපත්‍ර ගාස්තුව බලපාන්නේ නැහැ. එසේ නම්, සියයට 10 කින් ආනයන බලපත්‍ර ගාස්තුව වැඩි කළාට, පොදු මහජනතාවගේ රෙදිපිළිවල මිළෙහි වෙනසක් නොවෙනවා නම්, සූදුරු කොත්තමල්ලි ආදී කුළු බඩුවල මිළෙහි වෙනසක් නොවෙනවා නම්, භූමිතෙල්, පෙට්රෝල්වල මිළෙහි වෙනසක් නොවෙනවා නම් ජීවන වියදම වැඩි වන්නේ කෙසේද කියා මා ප්‍රශ්න කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාන්තා පක්ෂයටත් ළදරුවන්ටත් නොරිදෙන ආකාරයට, අමුතු බරක් නොවැටෙන ආකාරයට අයවැය ලේඛනයක් ඉදිරිපත් කළේ මේ මුදල් ඇමතිතුමා පමණයි. මීට කලින් පැවති ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවලින් ඉදිරිපත් කළ සෑම අයවැය ලේඛනයකින්ම එක්කො පිටි මිළ නැත්නම් සීනි මිළ, සාරි මිළ, භූමිතෙල් මිල නැත්නම් ගිනි පෙට්ටියක මිළ වැඩි කර තිබෙනවා. එහෙත් මෙදා ඉදිරිපත් කළ අයවැය ලේඛනයෙන් ලංකාවේ ස්ත්‍රී පක්ෂය සියයට 1 ක්වත් භාවිතා නොකරන සිගරෙට්වලට ගන්නා දුම්කොළ මිළ වැඩි කර තිබෙනවා. දුම්කොළ රාත්තලක මිළ රුපියල් 4.50 කින් වැඩි කර තිබෙනවා. එම නිසා සමහර වර්ගවල සිගරෙට්වල මිළ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විමලා කන්නන්ගර මිය.]

පමණක් ශතයකින් වැඩි කර තිබෙනවා. ඒ වියදම දරන්නට සිදු වන්නේ පුරුෂ පක්ෂයටයි. ඒ අය සිගරට් උරන්නට කැමති නිසා එයින් ලැබෙන ආදායම ජනතාවට බෙදන්නට හැකි වෙනවා. එයිනුත් කාන්තාවට සෙතක් වන නිසා කාන්තාවක වශයෙන් ඒ ගැන මගේ කැමැත්ත පළ කරනවා. ඔය කරුණුවලින් පෙනී යන්නේ, මේ අයවැය ලේඛනයෙන් මහ ජනයාගේ සුභ සිද්ධියට වැඩක් කර තිබෙන බවයි.

හමුදාව ගැන කියා තිබෙනවා. පුරුෂයන් පමණක් නොව, කාන්තාවනුත් ගොවි හමුදාවට බඳවා ගැනීමට අදහස් කරන බව ආණ්ඩුව කියා තිබෙනවා. එහෙම නම් මේ රටේ කාන්තාවට තවත් වරක් විශේෂ තැනක් දෙන්නට මේ ආණ්ඩුව අදහස් කරන බව කියන්නට පුළුවනි. පුරුෂ පක්ෂය පමණක් නොව, ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම මේ රටේ එක හා සමාන අයිතිවාසිකම් ලබන්නන් හැටියට සලකා කටයුතු කරන්නට අපේ ආණ්ඩුව ක්‍රියා කරන බව පෙන්වන්නට පුළුවනි. ඒ ගැන තවත් වරක් අපේ ගරු මුදල් ඇමතිතුමාට ස්තුති කරන්නට ඕනෑ.

මීරිගම ගරු මන්ත්‍රීතුමිය (ඔබේසේකර මිය.) ඉතාමත් වැදගත් කථාවක් කරමින් තුල්හිරියේ පිහිටුවන්නට බලාපොරොත්තු වන විදුලි බල පේසකර්ම මධ්‍යස්ථානය ගැන කිසිම දෙයක් එතුමියට දැන ගන්නට ලැබී නැතැයි ප්‍රකාශ කළා. ඒ නිසා ඒ ප්‍රශ්නය පිළිබඳව එතුමියට පිළිතුරු දෙන්නට මා අදහස් කරනවා. තුල්හිරිය අයිති, මා අද නියෝජනය කරන ඔතර පත්තුව ගම්කාර්ය සභාවට අයිති ප්‍රදේශයටයි. දැදිගම කොට්ඨාශයේ නාංගල්ල ගමෙන් අක්කර පණහක් පමණ එළිකර ජාතික පේසකර්ම සංස්ථාව මගින් විශාල ජලවිදුලි පේසකර්ම මධ්‍යස්ථානයක් එහි ඇති කරන්නට බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා අවශ්‍ය මුදල් නැගෙනහිර ජර්මණියෙන් ලබා ගැනීමට ක්‍රියා කරගෙන යනවා. ඇත්තෙන්ම මෙහි වැඩ අවසන් වුණාම දැනට අත්යන්ත්‍රවලින් වැඩ කිරීමෙන් සාදන සාරිවල ඔපය නැති නිසා ඒ සාරිවල නිමාව ඉතා හොඳට ඇති කර ගන්නට පුළුවන් නවීන වැඩපොළක් බවට එය හැරෙනවා. ආසියාවේ තිබෙන වටිනාම පේසකර්ම මධ්‍යස්ථානය තුල්හිරිය ජලවිදුලි පේෂ කර්ම මධ්‍යස්ථානය වෙනවා ඇති. එයින් තවත් වැඩිපුර දහස් ගණනකට රැකී රක්ෂා වල් ලැබෙන බවත් සඳහන් කරන්නට කැමතියි.

අපේ ගරු අග්‍රාමාත්‍යතුමා කාන්තාවන් ගැන වැඩි නොදන්නා, කාන්තාවන්ගේ ශුභසිද්ධිය තකා වැඩ කරන්නට නොදන්නා කෙනකු හැටියට පෙන්වා දී තිබෙනවා. එහෙත් ගරු අගමැතිතුමා දැන් නියෝජනය කරන ආසනය අවුරුදු විසි පහක් තිස්සේ නියෝජනය කර තිබෙන නිසා එතුමා ඒ ප්‍රදේශයට කියන්නේ දැදිගම මනාලියා කියායි. එතුමා කාන්තාවන්ගේ දුක් ගැන හොඳාකාර දන්නවා. දැනුත් අපේ ගරු අග්‍රාමාත්‍යතුමා ඉන්නේ කාන්තාවන් තුන්දෙනකු වටකරගෙනයි. ඒ තුන් දෙනා කවුරුද? අත්තනගල්ල ආසනය එක් පැත්තකින් තිබෙනවා. මීරිගම ආසනය තවත් පැත්තකින් තිබෙන අතර නුවර පාරෙන් ආවොත් මේ කථා කරන මා නියෝජනය කරන ගලිගොමුව ආසනය තිබෙනවා. මේ කොට්ඨාශ තුනම නියෝජනය කරන්නේ කාන්තාවන් තුන් දෙනකු විසින් බව තමුන්නාන්සේ දන්නවා. ඒ ආකාරයට කාන්තාවන් තුන් දෙනකු වටකරගෙන තිබෙන ප්‍රදේශයේ විදුලි බල පේසකර්ම මධ්‍යස්ථානයක් ඇති කරන්නට යාමෙන් පෙනී යන්නේ කාන්තාවන් වෙනුවෙන් සේවය කරන්නට නිසා ඒ විධියට එතුමාට පහර ගහන්නට වුවමනාවක් නැහැ. එතුමා අප සියලු දෙනාටම සේවය කරන්නට ඒ ආකාරයට උත්සාහ කරන බව පෙනී යනවා. ස්ත්‍රී පක්ෂයට ජයට අඳින්නට රෙදි ලබා දෙන්නට වැඩ කරගෙන යන එතුමා කාන්තාවන් තුන් දෙනාටම වඩා ජයට වැඩ කරගෙන යනවා.

උකු කළ කිරි කර්මාන්ත ශාලාව —Condensed Milk Factory—ගැන කිව්වා. එහි වැඩ කටයුතු කවදා අවසන් වේදැයි ඇහැව්වා. එය වහලායයි තවත් කෙනෙක් කිව්වා. එය වහලා නැහැ. මම ඒ ගැන කියන්නම්. මේ කොන්ත්‍රාත්තුව ගත්තේ ජයකොඩි මහත්මයා. ඒ මහත්මයා ඉන්නේ මගේ වත්තට අල්ලපු වත්තේ. ඒ මහත්මයාත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගලිගොමුව ආසනයේ ඡන්දදායකයෙක්. ඒ මහත්මයාට මේ කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් දී තිබෙන කරදර ගැන මට අසන්නට ලැබුණා. ඒ කරදර ගැන කල්පනා කර බලනවිට ජාතික සේවයක් කරන්නට කෙනෙකු ඉදිරිපත් වේදැයි කියාත් හිතනවා. වින්කිරි කර්මාන්ත ශාලාව සෑදීම සම්බන්ධව තුන් වරක් ටෙන්ඩර් පත්‍ර කැඳවා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් දැන් වැටී තිබෙන තත්ත්වය නිසා මේ කාරණයට අදාළ කඩදාසි ස්ථිර ලේකම් තුමාට ඉදිරිපත් කරන්නට යෙදුණා මගේ ඡන්දදායකයකු වශයෙන්. කොන්ත්‍රාත්තුව දෙන කාලයේදී එය භාරව සිටි අය මේ මහත්මයා කැඳවා තිබෙනවා. ඒ මහත්මයා කැඳෙව්වේ තුන් වරක් ටෙන්ඩර් කැඳවීමෙනුත් ප්‍රයෝජනයක් නොවූ නිසයි. අඩගහල කිව්වලු, අනේ මේ වැඩේ ඇස්තමේන්තු ක්‍රමයට කව්රුවත් ගන්නෙ නැහැ, කැමති ගණනකට ගිවිසුම අත්සන් කරලා මේ වැඩය භාර ගන්නය කියා. ඒ කොන්ත්‍රාත්කාර මහත්මයා—කෑගල්ලේ මන්ත්‍රීතුමා (කලුගල්ල මයා.) රජයේ වැඩ ඇමති වශයෙන් සිටින විට රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ කෑගල්ලේ කොන්ත්‍රාත් කීපයක් අරගෙන තිබුණු ඒ මහත්මයා—එතැනට ගිහින් බලන්නෙත් නැතිව කිව්වලු, කොන්ත්‍රාත් එකේ සඳහන් ගණනට වඩා රුපියල් 45,000 ක් වැඩියෙන් දෙනවා නම් වැඩය කරන්නම් කියා. කව්රුත් කරන්නෙ නැති නිසයි, එහෙම කියා තිබෙන්නේ. ඒකට කැමති වෙලා අත්සන් කරන්නය කිව්වම ඒ මහත්මයා ඒකට අත්සන් කළාලු. කොන්ත්‍රාත්තුවේ වැඩ අවසාන වෙලා දැන් මාස 4 ක් පමණ ගත වී තිබෙනවා. මේ අවුරුද්ද අවසානයේදී ඒ කිරි ෆැක්ටරිය විවෘත කරන්නට කටයුතු කර ගෙන යනවා. එහෙත් ඒ කොන්ත්‍රාත්තුව ගැන දැන් නොයෙක් ප්‍රශ්න පැන නංවා තිබෙනවා බැංකුවලින් පොළියට මුදල් අරගෙන, භයානක අලි, කොටි, වලසුන් ඉන්න මහා ඝන වනාන්තර මැදින් ගිහිල්ලයි, ඒ මහත්මයා මේ වැඩේ කළේ. එහෙත් අද නොයෙක් ප්‍රශ්න ඉදිරිපත් කොට ඒ මහත්මයාට මුදල් ගෙවන්නෙ නැතුව ඉන්නවා. ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරන්නට ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා පොරොන්දු වී තිබෙනවා. ඒ සම්බන්ධව දැනුමක් නැති මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම පිණිසයි, මා ඒ කාරණය මතක් කළේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා නියෝජනය කරන ගලිගමුව ආසනය ගැනත් වචනයක් කියන්නට ඕනෑ. ඒ ආසනයේ තේ වතු සහ රබර් වතුයි, වැඩි පුර තිබෙන්නේ. කුඹුරුත් තරමක් තිබෙනවා. කුඹුරුවල වැඩ කරන ගොවී මහතුන්ට නම් දැන් තරමක සෙතක් සැලසී තිබෙනවා. එහෙත් අද රබර් මිළ භයානක ලෙස පහත බැස තිබෙනවා. 1955 දී රබර් රාත්තලක මිළ රු. 1.56 යි. එහෙත් අද ඒ රබර් රාත්තලක මිළ ශත 75 ට බැහැලා තියෙනවා. තේ වතුවල නම් අද වැඩ කෙරෙන්නෙම නැහැ. අද තේ වතු වසා දමා තිබෙනවා. වතු හිමියන්ට ආදායම් නැති වන විට ඒ සේවක පිරිස අස් කරනවා. ඒ නිසා අද රැකීරක්ෂා නැති තත්ත්වයට පත් වී සිටින වතුවල වැඩ කරන කම්කරු මහතුන් සහ කම්කරු මහත්මීන් ගැන අනුකම්පා කර ඔවුන් වැටී සිටින භයානක තත්ත්වයෙන් ඔවුන් මුදා ගැනීම ගැන හිත යොමු කර කටයුතු කරන ලෙස මා ගරු මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මීරිගම ගරු මන්ත්‍රීතුමී (ඔබේසේකර මිය.) පේසකර්ම මධ්‍යස්ථාන ගැන හොඳ වැඩපිළිවෙළක් ඉදිරිපත් කළා. දැනට සති දෙකකට පමණ පෙර කෑගලු දිස්ත්‍රික්කයේ පේසකර්ම සේවක සංගමය අගමැති තුමා කැඳවා ඒ විධියේම කරුණු ඇතුළත් සන්දේශයක් දුන්නා. නූල් නැතිකම නිසා, නිෂ්පාදන ද්‍රව්‍යවලට ස්ථිර මිළක් නැති නිසා, නිෂ්පාදනය කරන රෙදිපිළි විකුණා ගන්නට බැරි නිසා, පේසකම් මධ්‍යස්ථානවල සේවයේ යෙදී සිටින අය අද විශාල අමාරුවකට මුහුණ පා සිටිනවා. ඒ අයට සහනයක් සලසා දෙනවාය කියා ගරු අගමැතිතුමා පොරොන්දු වී තිබෙනවා. ඒ පොරොන්දුව හැකි ඉක්මනින් ඉටු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ආණ්ඩු පක්ෂයේ සිටින්නේ එක කාන්තාවක් පමණය, ආණ්ඩු පක්ෂයේ වැඩි පුර කාන්තාවන් සිටිනවා නම් මේ අංශයේ වැඩ රාශියක් කරන්නට පුළුවන්ය කියා මීරිගම ගරු මන්ත්‍රීතුමී ප්‍රකාශ කළා. විරුද්ධ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විමලා කන්නන්ගර මිය.]

පාර්ශ්වයේ නම් කාන්තාවන් 5 දෙනකු සිටිනවා. ආණ්ඩු පක්ෂයේ සිටින එකම කාන්තාව මමයි. සංචාරක ව්‍යාපාරය ගැනත්, අත් යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදනය ගැනත් ඉතා හොඳ අවබෝධයක් සහ දැනීමක් තිබෙන මිරිගම ගරු මන්ත්‍රීතුමී ඉතා ලක්ෂණ කථාවක් කළා. මා සමග එක පාසලේ ඉගෙනීම ලැබූ ඒ මහත්මිය, මේ මන්ත්‍රණ සභාවට එන්නටත් පෙර සිට මා හොඳින් දන්නවා. මේ පැත්තට ඇවිත් අප කරන වැඩ රාශියට උදවු වන ලෙස මා හිත මිත්‍ර ඒ මන්ත්‍රීතුමියගෙන් මා ඉල්ලා සිටිනවා. එතකොට තැග්ගෙන් තැග්ග උතුම් තැග්ගය කියා අපට කියන්නට පුළුවන්.

පිස්සු බලු රෝග මර්දන ව්‍යාපාරය පිළිබඳව සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වැඩ පිළිවෙළ කුමක්ද කියා විස්තර කරන ලෙස මීරිගම ගරු මන්ත්‍රීතුමී විසින් ඉල්ලන්නට යෙදුණා. සෞඛ්‍ය අධ්‍යාපනය ගැනත් යමක් ගරු ඇමතිතුමාගේ කථාවේදී කිව්වේ නැතැයි කියන්නට යෙදුණා. පිස්සු බලු රෝග මර්දනය සඳහා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ගෙන තිබෙන වැඩ පිළිවෙළ ගැන දැන්වීමට මේ ලිපිය කියවන්නට සතුටුයි :

"පිස්සු බලු රෝග මර්දනය කෙරෙහි සෞඛ්‍ය ඇමති අංශයේ අවධානය යොමු වී තිබේ. 1965 වර්ෂයේදී බස්නාහිර පළාතේ බල්ලන්ට ප්‍රතිශක්ති කරණ බෙහෙත් විදීම සඳහා මහා ව්‍යාපාරයක් අරඹන ලදී. බස්නාහිර පළාතේ පිස්සු බලු රෝගය අධිකව පවත්නා හෙයින් මාස 10 ක් ඇතුළතදී සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාශ 18 ක සුනඛයන් 1,07,000 කට පමණ ප්‍රතිශක්ති බෙහෙත් විදින ලදී. මේ සංඛ්‍යාව බස්නාහිර පළාතේ සුනඛ ජනගහණයෙන් සියයට 65 ක් වේ. මේ ව්‍යාපාරයෙන් පසුව සියයට 28 කින් පමණ මේ රෝගය ඇති වීම අඩු වී තිබේ. දකුණු පළාතේද බල්ලන්ට බෙහෙත් විදීමේ මහා ව්‍යාපාරයක් දැන් සංවිධානය කරගෙන යනු ලැබේ. මුළු දිවයිනේ බල්ලන්ට ප්‍රතිශක්තිකරණ බෙහෙත් විදීමේ ව්‍යාපාරයක් ඇති කිරීමට සෞඛ්‍ය අංශය යෝජනා කර තිබේ. මේ ව්‍යාපාරය සාර්ථක ලෙස කරගෙන යෑමට ඇමෙරිකා එක්සත් ජනපදයෙන් ආධාර ලබා ගැනීමේ ගිවිසුමකට අත්සන් තැබීමට විධිවිධාන යොදා ඇති බව සඳහන් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙපමණ වේලාවක් මෙම අයවැය ලේඛන විවාදයට සම්බන්ධ වීමට මට අවස්ථාව සලසා දීම ගැන ඔබතුමාට මගේ ස්තූතිය හිමි වෙනවා. ඉදිරි වර්ෂයේදී වඩා වේගවත් පදනමක් උඩ ක්‍රියා කොට මේ රටේ ධන සම්භාරයක් ඉතිරි කිරීමට අඩිතාලම දමා තිබෙන නිසා, අපේ ගොවි ජනතාවටත්, දුප්පත් කම්කරු ජනතාවටත් නියම මඟ පෙන්වීමට අඩිතාලමක් දමා තිබෙන නිසා, කෘෂිකර්ම සංවර්ධන වැඩ පිළිවෙළේ ප්‍රතිඵලයක් වශයෙන් අපේ කොට්ඨාශවල අස්වැන්න වැඩි වන නිසා එක හාල් සේරුව වෙනුවට හාල් සේරු දෙකක්ම දීමට භාග්‍යය උදා වේවායි ප්‍රාර්ථනා කරමින්ද, මෙම සංවර්ධන කටයුතු සඳහා සියලුම දෙනාගේ සහයෝගය ලැබේවායි ප්‍රාර්ථනා කරමින්ද මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

පූ. භා. 11.20

**ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.** (මුතූර් දෙවන මන්ත්‍රී)

*(ஜனப் ஏ. எல். அப்துல் மஜீது—மூதூர் இரண்டாவது அங்கத்தவர்)*

(Mr. A. L. Abdul Majeed—Second Mutur)

*கௌரவ உபசபாநாயகர் அவர்களே, நிதியமைச்சர் அவர்களுடைய வரவுசெலவுத் திட்டவிவாதத்தை அவதானிக்கும் பொழுது எனக்கே ஆச்சரியமாக இருக்கின்றது. ஏனென்றால், உணவுப் பிரச்சினை அரசாங்கக் கட்சிக்கு மட்டுமல்ல, எதிர்க்கட்சிக்கும் கூடப் பொதுவானதாகும். அரசாங்கத்தை ஆதரிக்கின்ற மக்கள் உணவுப் பிரச்சினையிற் சிக்கி தத்தளித்துக் கஷ்டப்படுகின்றதைப் போல, எதிர்க்கட்சியை ஆதரிக்கின்ற மக்களும் உணவுப் பிரச்சினையாற் கஷ்டப்படுகின்றார்கள். எனவே, இந்த உணவுப் பிரச்சினை அரசாங்கத்துக்கும் எதிர்க்கட்சிக்கும் பொதுவானதாகும். இந்தப் பொதுவான பிரச்சினையில், எதிர்க்கட்சி இந்த வரவுசெலவுத் திட்டத்தைப் பலமாகப் பலகோணங்களில் வைத்துத் தாக்கிக் கொண்டிருப்பதை எண்ணும் பொழுது கவலையடைகிறேன். ஏனென்றால், இந்த ஆண்டின் நிதிநிலை அறிக்கையில் ஏதோ நாட்டுக்குப் பொருத்தமற்ற சில குறைபாடுகள் இருப்பதன் காரணமாக எதிர்க்கட்சியினர் அதைப் பற்றி அப்படி விமரிசனம் செய்துகொண்டிருக்கின்றார்கள். என்னைப் பொறுத்த அளவிலே இந்த வரவுசெலவுத் திட்டத்தைப் பொதுவாக அவதானிக்*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

கும்பொழுது நமது நாட்டிலே நாம் ஏற்படுத்த வேண்டிய மாறுதலை, புரட்சிகரமான மாறுதலை, மக்களுடைய சுயதேவைகளைப் பூர்த்திசெய்யக்கூடிய ஒரு மாறுதலை இந்த வரவுசெலவுத் திட்டம் ஏற்படுத்தாதெனினும், இந்த வரவுசெலவுத் திட்டத்தில் அதிகப்படியாக விவசாயிகளுக்கும் உற்பத்திப் பெருக்கத்துக்கும் இடமளிக்கப்பட்டிருப்பதைக் காண நான் மகிழ்ச்சியடைகிறேன்.

இந்த வரவுசெலவுத் திட்டத்தில் இரு முக்கிய அம்சங்களை நான் அவதானிக்கிறேன். முதலாவது உள்நாட்டுத் திட்டம்; இரண்டாவது வெளிநாட்டுத் திட்டம். இந்த வெளிநாட்டுத் திட்டத்தில், எப்படி வெளிநாட்டுச் செலாவணியைப் பாதுகாத்து நம் நட்டு மக்களுக்கு வேண்டிய உப உணவுப் பொருள்களைப் பெறலாம் என்ற வகையில் கௌரவ நிதியமைச்சர் ஒரு சில கருத்துக்களைக் கூறியிருக்கிறார். இந்த நாட்டின் ஏற்றுமதிப் பொருள்களாகிய தேயிலை, றப்பர், தெங்குப் பொருள்கள் போன்றவற்றை வெளிநாடுகளுக்கு ஏற்றுமதி செய்து அதனல் வருகிற வெளிநாட்டுச் செலாவணியைப் பாதுகாத்து இந்த நாட்டு மக்களுக்குத் தேவைப்படுகின்ற உப உணவுப் பொருள்களை வாங்கக் கூடிய ஒரு நிலையை இந்த வரவுசெலவுத் திட்டத்தில் கௌரவ நிதியமைச்சர் வலியுறுத்தியிருக்கிறார். ஆனல், உள்நாட்டுத் திட்டத்தை எடுத்துக் கொள்ளும் பொழுது, இந்த உள்நாட்டுத்திட்டத்திலே சாதி, மத பேதமற்ற முறையில், வர்க்க பேதமற்ற முறையில் இந்த நாட்டு மக்கள் ஒன்றுபட்டு விவசாயத்தைப் பெருக்க வேண்டும், விவசாயத்தின் மூலமாகத்தான் நாம் இந்த நாட்டின் பொருளாதார சுதந்திரத்தை அனுபவிக்க முடியும் என்ற கருத்தை அவர் தெரிவித்திருக்கிறார். இக் கருத்துக்களைப் பொதுவாக நோக்கும்பொழுது உண்மையாகவே இந்த நாட்டில் வாழுகின்ற, உழைத்து உழைத்து உருக்குலைந்து போயிருக்கின்ற விவசாயக் கூட்டத்தின் மத்தியில் அவை ஒரு மாறுதலை ஏற்படுத்தும் என்பதிற் சந்தேகமில்லை.

ஆனல், இந்த வரவு செலவுத் திட்டத்தில் முதலாளித்துவத் தன்மைக்கும் முதலீட்டுக்கும் முக்கியத்துவம் அளித்திருப்பதைக் காணும் பொழுது சாதாரணமான பாட்டாளி மக்கள், பாமர மக்கள் பிரயோசனமடைய மாட்டார்கள் என்றுகூட நினைக்கக்கூடியதாக இருக்கின்றது. இருந்தாலும் இந்த நாட்டிலுள்ள முக்கியமான தொழில்களாகிய கமத் தொழில், கைத்தொழில், மீன்பிடித் தொழில் ஆகிய துறைகளிலும் எங்கள் நாடு வளர்ச்சியடைய வேண்டும் என்பதில் எந்தவிதமான சந்தேகமுமில்லை. எதிர்க் கட்சியைப் பொறுத்த அளவில் நான் கூற ஆசைப்படுகிறேன், இந்த நாட்டிலுள்ள எல்லாத் தமிழ்ப் பாராளுமன்ற அங்கத்தினர்களும் அரசாங்கத்தை ஆதரிக்கிருர்கள். நான் மட்டும் எதிர்க் கட்சியில் இருக்கிறேன். ஆனல், என்னைப் பொறுத்த அளவில், இந்த வரவு செலவுத் திட்டத்தை இந்த நாட்டு மக்களுக்கு வேண்டிய ஒரு பயனுள திட்டமாக அவதானிக்கும் முறையிலே நான் சில உண்மைகளைக் கூருமலிருக்க முடியாது.

மீன்பிடித் தொழிலை எடுத்துக் கொள்ளும் பொழுது இந்தத் தொழிலிலே திட்டவட்டமாகத் தன்னிறைவு காண முடியும் என்று நான் கூறுவேன். மீன்பிடித் தொழில் உண்மையாக, நியாயமான முறையிலே, நீதியான முறையிலே செயலாற்றக் கூடிய தன்மை படைத்த அமைச்சர் கையில் இருப்பதையிட்டு நான் களிப்படைகிறேன். ஆனல், மீன்பிடித் தொழில் மூலமாகத் தன்னிறைவு காண வேண்டிய நாம் இன்று தன்னிறைவு அற்ற முறையில் கஷ்டப்பட்டுக் கொண்டிருக்கிறோம். எத்தனையோ இடங்களில் மீன்பிடித் துறைமுகங்களைத் திறக்க வேண்டியிருக்கிறது. உதாரணமாக, மூதூர், மட்டக்களப்புப் பகுதிகளில்—

**වි. ධර්මලිංගම් මයා. (උඩුවිල්)**
*(திரு. வீ. தர்மலிங்கம்—உடுவில்)*
(Mr. V. Dharmalingam—Uduvil)
*யாழ்ப்பாணம்—*

**ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.**
*(ஜனுப் ஏ. எல். அப்துல் மஜீது)*
(Mr. A. L. Abdul Majeed)

நான் கிழக்கு மாகாணத்தைப் பொறுத்த அளவில் கூறுகிறேன். மூதூர், மட்டக்களப்பு போன்ற பகுதிகளில் வாழ்கிறவர்களில் அதிகமானேர் மீனவர்கள். இத்தொழிலில் அக்கறை கொண்டவர்கள். ஆனல் அவர்களுக்கு இது வரை போதுமான வசதிகள் செய்து கொடுக்கப்படவில்லை. மூதூரில் அருமையான மீன்பிடித் துறைமுகம் ஒன்றை அமைக்க முடியும்.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.]

இது வரை அதற்காக எந்தவிதமான நட வடிக்கையும் எடுக்கப்படவில்லை. அது போல, ஆழ் கடலில் மீன்பிடிப்பதற்கான வச திகளும் ஏற்படவில்லை. அத்துடன் இந்தத் தொழிலில் ஈடுபட்ட மக்களுக்குத் தேவை யான வசதிகளெதுவும் செய்துகொடுக்கப் படவுமில்லை.

**ධර්මලිංගම් මයා.**

*(திரு. தர்மலிங்கம்)*

(Mr. Dharmalingam)

Why did you not ask your Government to do it?

**ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.**

*(ஜனுப் ஏ. எல். அப்துல் மஜீது)*

(Mr. A. L. Abdul Majeed)

I asked them but they did not do it. Therefore, I am asking your people to do it.

ஆகையால், என்னைப் பொறுத்த அளவில் நான் கூறுகிறேன். மீன்பிடித் தொழிலை இந்த நாட்டிலே நல்ல முறையில் அபிவிருத்தி செய்ய முடியும். அதற்கான சூழ்நிலை நம் நாட்டில் இருக்கிறது. அதற்கான வசதிகள் இருக்கின்றன. கெட்டிக்காரர்களான மீனவர் கள் இருக்கிறார்கள். அவர்களுக்குப் போதிய அளவு வசதிகள் செய்து கொடுக்கப்பட்டால் அதி விரைவில் திட்டவட்டமாக மீன்பிடித் தொழிலில் தன்னிறைவு காண முடியும் என்று நான் கருதுகிறேன்.

கைத்தொழில்களை எடுத்துக் கொண்டால் அவற்றுக்கு இந்த வரவு செலவுத் திட்டத்தில் அதிக மானியம் ஒதுக்கப்படவில்லை. இன்று இந்த நாட்டில் கைத்தொழில் முறைகள் அபிவிருத்தி செய்யப்படக் கூடிய அளவில் இருந்தாலும் அரசியல் காரணங்களுக்காக, அல்லது வேறு காரணங்களுக்காக பொருத்த மற்ற இடங்களில் தொழிற்சாலைகளை அமைப் பதன் காரணமாக இன்று அத் தொழிற்சாலை கள் மூலம் ஓரளவு நஷ்டமேற்பட்டுக் கொண்டிருக்கிறது. இந்த இடத்தில் ஒன்று கூற ஆசைப்படுகிறேன். மூதூரைப் பொறுத்த அளவில் மூதூரிலுள்ள மண், செங்கல், ஓடு முதலியன செய்வதற்கு மிகவும் பொருத்த மானது. ஆனால் அந்தப் பிரதேசத்தில் இது வரை ஓட்டுத் தொழிற்சாலையோ, செங்கல் தொழிற்சாலையோ அமைக்கப்படவில்லை. இத் தொழிற்சாலைகள் அமைக்கப்பட்டிருந் தால் திட்டவட்டமாக நான் எண்ணுகிறேன், அதிகமான இலாபத்துடன் அத் தொழிற் சாலைகள் இயங்கியிருக்க முடியும் என்று.

விவசாயத் துறையை எடுத்துக் கொள்ளும் பொழுது நான் ஒரு சில கருத்துக்களைக் கூறாமல் இருக்க முடியாது. விவசாயம் என்று கூறும்பொழுது நெற்சாகுபடியை மட்டும் நான் கருதவில்லை. உப உணவுப் பொருள் களின் உற்பத்தியையும் கூடத்தான் நான் கருதுகிறேன். நெற்சாகுபடியை அதிகரிப்ப தற்காகவும் உப உணவுப் பொருள்களை உற்பத்தி செய்வதற்காகவும் அரசாங்கம் எடுத்துள்ள நடவடிக்கைகள் பொதுவாக மக்களுக்கு நன்மையளிக்கக்கூடியனவா, அல்லவா என்பதைச் செயல் முறையில்தான் நாம் அறியக்கூடியதாக இருக்கும். இருந்தா லும் நெற்சாகுபடியிலும் உப உணவுப் பொருள்களை விளைவிப்பதிலும் இன்று ஈடுபட் டுள்ள விவசாயிகளுக்கு அரசாங்கம் போதிய அளவு கடன் வசதிகளை அளிக்காமல் இருப்ப தையிட்டு நான் மிகவும் கவலையடைகிறேன்.

இதை நான் ஏன் வலியுறுத்துகிறேன் என்றால் எனது தொகுதியிலே ஒரு முக்கிய மான சம்பவம் இன்று நிகழ்ந்து கொண்டிருக் கிறது. அதாவது, கிண்ணியா—தம்பலகாமம் வீதிக்கும் அல்லை—கந்தளாய் வீதிக்கும் மத்தியிலே கிண்ணியாவிலும் ஆலங்கேணி யிலும் உள்ள காணியற்ற ஏழை விவசாயிகள் சுமார் பதினைந்து ஆண்டுகளுக்கு முன்னர் குடியேறி ஏறக்குறைய மூவாயிரம் ஏக்கர் நிலத்தை விவசாய நிலமாக உருவாக்கினர் கள். இம் மூவாயிரம் ஏக்கர் விவசாய நிலங் களுக்கும் இதுவரை உத்தரவுப் பத்திரங்கள் வழங்கப்படாதிருந்தபோதிலுங்கூட, கௌரவ காணி அமைச்சர் இப்பகுதி மக்களின் கெட்டித்தனத்தை உணர்ந்து உடனடியாக அவர்களுக்கு விவசாயக் கடன் உதவி அளிக்க வேண்டுமென்று கூறியிருந்தார். இதன்பிரகாரம் வான்று என்னும் பகுதியில் உள்ள மூவாயிரம் ஏக்கர் நெற்காணி நிலங் களுக்கு விவசாயக் கடன் கொடுக்கக்கூடிய தான ஒரு சூழ்நிலையை கௌரவ அமைச்சர் உருவாக்கினர். ஐந்து பலநோக்குக் கூட்டுற வுச் சங்கங்கள் அங்கு அமைக்கப்பட்டன. ஆனால், இந் நெற்காணிகளுக்கு அனுமதிப் பத்திரங்கள் மட்டும் அளிக்கப்படவில்லை.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

எனினும் இப்பகுதி மக்கள் பதினைந்து ஆண்டுகளாக வேளாண்மை செய்து வந்ததன் காரணமாக அவர்களுக்குப் பல நோக்குக் கூட்டுறவுச் சங்கங்கள் அமைப்பதற்கான வசதி மட்டும் வழங்கப்பட்டது. இதே நேரத்தில் ஐந்து பல நோக்குக் கூட்டுறவுச் சங்கங்கள் மூலமாக விவசாயிகள் கடன் உதவி பெற்றுக்கொண்டு வந்தார்கள். அவர்கள் தாங்கள் விவசாயம் செய்து வந்த மூவாயிரம் ஏக்கர் நெற்காணியிலும் ஏராளமான புசல் நெல்லை விளைவித்து வருடாவருடம் அரசாங்கத்திற்குக் கொடுத்துக் கொண்டு இருந்தார்கள். ஆனால் சமீபத்தில், அதாவது போன வாரம், இப்பலநோக்குக் கூட்டுறவுச் சங்கங்களுக்குக் கடன் வழங்க முடியாதென்ற உத்தரவை கௌரவ விவசாய, உணவு அமைச்சர் பிறப்பித்திருப்பதாக அறிகிறேன். அவ்வாறாயின் மூவாயிரம் ஏக்கர் நிலத்தில் விவசாயம் செய்து வந்த விவசாயிகளின் கதி என்ன என்று கேட்க விரும்புகிறேன்? ஆகவே, உண்மையான முறையில் நீங்கள் உணவு உற்பத்தியிலும் நெல் உற்பத்தியிலும் அக்கறை கொண்டுள்ளவர்களாக இருந்தால் வாணாற்றுப்பகுதியில் வேளாண்மை செய்து வந்த விவசாயிகளுக்கு அவர்களது ஐந்து பல நோக்குக் கூட்டுறவுச் சங்கங்கள் மூலமாகவும் கடன் உதவி அளிக்க முன்வர வேண்டுமென்று நான் கேட்டுக்கொள்ளுகிறேன். இப்பகுதி மக்கள் தமக்குக் கடன் வசதிகள் மறுக்கப்பட்டுள்ளது குறித்து அதிருப்தி அடைந்துள்ளனர். உண்மையில் அவர்கள்தாம் உண்மையான விவசாயிகள். அவர்களுக்குக் கடன் உதவியை அரசாங்கம் அளிக்க வேண்டுமென்பதை இங்கு வற்புறுத்தாமல் இருக்க என்னால் முடியாது.

மல்லிகைத்தீவு, மூதூர், பாலக்கடிச்சேனை போன்ற கிராமங்களில் வாழ்கின்ற காணியற்ற ஏழை விவசாயிகள் கொட்டியார்பற்று ஓட்டமடம் என்ற பகுதியில் 1,500 ஏக்கர் காணியில் குடியேறி கடந்த பதினைந்து இருபது ஆண்டுகளாக விவசாயம் செய்து கொண்டு வந்தார்கள். அவர்களுக்கும் இன்னும் அனுமதிப் பத்திரங்கள் வழங்கப்படவில்லை. அவர்களுக்குக் கடன் உதவிகளும் வழங்கப்படவில்லை. அப்பகுதி மக்களுக்கு அரசாங்கம் கடன் உதவி அளிக்க வேண்டும். பொதுவாக நான் கூறுவது என்னவென்றால் அத்துமீறி விவசாயத்தில் ஈடுபட்டுக் கொண்டிருப்பவர்களுக்கு அந்தப் பூமியைக் கொடுக்க வேண்டுமென்ற ஒரு நியதி உண்மையில் இருக்குமாக இருந்தால் இலங்கையிலே இன்று அத்துமீறிக் குடியேறி விவசாயத்திலும் உணவு உற்பத்தியிலும் ஈடுபட்டுக் கொண்டிருப்பவர்களுக்கு அரசாங்கம் கடன் உதவி அளிக்கவும் வேண்டுமென்பதுதான்.

மூதூர் தொகுதியில் பயிர் இன்சூரன்ஸ் திட்டத்தை நீங்கள் செயற்படுத்த வேண்டும். விமாத் திட்டத்தை செயல்படுத்துவதன் மூலமாகத்தான் விவசாயிகளுக்கு ஊக்கமும் உணர்ச்சியும் ஏற்பட்டு விவசாயத்திலே அக்கறை கொண்டு அதிகப் படியாக ஈடுபட்டு நெற்சாகுபடியிலே அக்கறை காட்டுவார்கள் என்று நான் இங்கு கூறுமல் இருக்க முடியாது. குறிப்பாக அவதானிக்கும் பொழுது, கிழக்கு மாகாணம் நெற்களஞ்சியமாக இருக்கிறது. கிழக்கு மாகாணத்தில் போதிய நீர்ப்பாசன வசதிகளற்ற இடங்களிலே நீர்ப்பாசன வசதியும், சிறு குளங்கள் இருக்கின்ற பகுதிகளில் பெரும் பெரும் திருத்தங்களையும் நீங்கள் செய்து கொடுப்பீர்களானால் கிழக்கு மாகாணம் நெற்களஞ்சியமாக மாத்திரமல்லாது ஈழத்திலே ஏனைய மாகாணங்களிலேயிருக்கின்ற அரிசித் தட்டுப்பாட்டையும் நிவிர்த்தி செய்யக்கூடிய ஒரு மாபெரும் மாகாணமாகவும் அமையுமென்பதில் சந்தேகமில்லை.

மகாவலி கங்கையை வடக்கே திருப்ப வேண்டுமென்று தமிழரசுக் கட்சியினரும் தமிழ்க் காங்கிரஸ் கட்சியினரும் ஏகோபித்துக் குரல் எழுப்புகின்றார்கள். ஆனால் இந்த மகாவலி கங்கையைத் திருப்ப வேண்டுமென்று கூறுகின்ற தமிழரசுக் கட்சியினரும் தமிழ்க் காங்கிரஸ் கட்சியினரும், தமிழ் பேசும் மக்களுக்காகக் காவடி எடுக்கின்ற கூட்டத்தினரும் தினேரி கண்டல்காட்டுப் பகுதியில் ஏறத்தாழ 15,000, 20,000 ஏக்கர் காணி நிலங்கள் நீர்ப்பாசன வசதியற்றுக்கிடக்கின்றனவே, காலடியில் கிடக்கின்ற அந்நிலத்துக்கும் நீர்ப்பாசன வசதியளிக்கு முகமாக மகாவலி கங்கையைக் கந்தளாய்க் குளத்துக்கும் திருப்பவேண்டு மென்று ஒரு வார்த்தையாவது பேசியிருக்க வேண்டும். ஆனால் அவர்கள் அப்படிப் பேசவில்லை. இதைத்தான் நான் கூறவிரும்புகிறேனேயொழிய, மகாவலிகங்கையை வடக்கேதிருப்ப வேண்டுமென்பதை நான் ஆட்சேபிக்கவில்லை. ஆகையினால் மகாவலிகங்கையைக் காலடியிலேயிருக்கின்ற கந்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.]

தளாய்க் குளத்துக்குத் திருப்ப முடியுமாக இருந்தால், தினேரி கண்டல்காட்டுப்பகுதியில் நீர்ப்பாசன வசதியற்றுக் கிடக்கின்ற ஏராளமான நிலங்களுக்கு நீர்ப்பாசன வசதியளிக்க முடியுமென்று நான் இங்கே வலியுறுத்தாமலிருக்க முடியாது.

எனது தொகுதியிலே முக்கியமாக இரு பெரும் குடியேற்றத் திட்டங்கள் இருக்கின்றன. ஒன்று கந்தளாய்க் குடியேற்றத்திட்டம். மற்றது அல்லைக் குடியேற்றத் திட்டம். அல்லைக் குடியேற்றத்திட்டத்திலே இருக்கின்ற மக்களுக்கு குடிதண்ணீர்த் தட்டுப்பாடு இல்லை. ஆனால் கந்தளாய்க் குடியேற்றத் திட்டத்திலே வாழுகின்ற மக்களுக்கு குடிதண்ணீர் தட்டுப்பாடு இருக்கிறது. அவர்களுக்கு குடிதண்ணீர் வசதிகள் தொடர்ந்தும் இல்லாமலேயிருக்கின்றது. அரசாங்கம் "பைப் மூலமாக உங்களுக்குத் தண்ணீர் தருவோம்" என்று பலமுறை கூறிக்கொண்டு வந்தது. இதுகாலவரை அது கொடுக்கப்படவில்லை.

**ධර්මලින්ගම් මයා.**
*(திரு. தர்மலிங்கம்)*
(Mr. Dharmalingam)
எந்த அரசாங்கம்?

**ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.**
*(ஜனாப் ஏ. எல். அப்துல் மஜீது)*
(Mr. A. L. Abdul Majeed)
உங்களுடைய அரசாங்கம்.

**ධර්මලින්ගම් මයා.**
*(திரு. தர்மலிங்கம்)*
(Mr. Dharmalingam)
நீங்கள் இந்தப் பக்கத்துக்கு வாருங்கள்.

**ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.**
*(ஜனாப் ஏ. எல். அப்துல் மஜீது)*
(Mr. A. L. Abdul Majeed)
நான் உங்கள் பக்கத்துக்கு வர வேண்டிய அவசியமில்லை. நீங்கள் அந்தப் பக்கத்திலேயிருந்தும் எவ்வளவு தூரம் இந்நாட்டிலே வாழுகின்ற தமிழ் பேசும் மக்களுக்கு வாய்ப்புகள் ஏற்பட்டிருக்கின்றன என்பதை எண்ணும்போதுதான் எனக்குக் கவலையாக இருக்கிறது. நீங்கள் அப்பக்கத்திலே போயிருக்கின்ற காரணமென்னவென்றால் இந்நாட்டிலே வாழுகின்ற தமிழ் பேசும் மக்களை ஏமாற்றுவதற்காக; அவர்களை இருட்டடிப்புச் செய்வதற்காக. அவர்களுடைய வாக்குரிமையைப் பெற்றுக்கொண்டு பாராளுமன்றத்துக்கு வந்து ஏகாதிபத்தியக் கொள்கையைப் பின்பற்றுகின்ற யூ. என். பீ. யுடன் சேர்ந்த காரணத்தால் தமிழ் பேசும் மக்களுடைய உரிமைகளைப் பெற்றுக்கொடுத்து விட்டோம் என்ற களிப்போடு இருக்க வேண்டாம்.

உல்லாசப் பிரயாணம் சம்பந்தமாகச் சில கருத்துக்களைக் குறிப்பிடவிரும்புகிறேன். உல்லாசப் பிரயாணம் மிக முக்கியமான ஒன்றுதான். அதன் மூலமாக அதிகப்படியான பணம் நம் நாட்டுக்கு வரலாம். ஆனால், அந்த உல்லாசப் பிரயாணத்திட்டத்தை சாதி, மத பேதமற்ற முறையிலும் வேண்டிய பலாபலன்களைப் பெறக்கூடிய அளவிலும் செயற்படுத்த வேண்டுமென்று கேட்டுக் கொள்ளுகிறேன். என்னுடைய தொகுதி—எனது நண்பர் கௌரவ மட்டக்களப்பு முதல் அங்கத்தவருக்குத் தெரியும்—இயற்கை வளம் நிறைந்த ஒரு தொகுதியாகும். ஒரு பக்கத்திலே மகாவலி கங்கை ஊற்றெடுத்து ஓடுகிறது. இன்னொரு பக்கத்திலே இந்துசமுத்திரம் இருக்கிறது. எங்களுடைய மாகாணத்திலே தான் பாடும் மீன் கூட இருக்கிறது. ஆகையால் அந்தப் பகுதியை உல்லாசப் பிரயாணத்துக்கு ஏற்ற முறையிலே திருத்த வேண்டுமென்று நான் கருதுகிறேன். எனது தொகுதியிலே சேருவாவிலை என்னும் இடத்தில் புனித பௌத்த கோயில் ஒன்றிருக்கின்றது. ஆண்டு தோறும் பல்லாயிரக்கணக்கான பௌத்த பக்தர்கள் அங்கே காவடியெடுத்துச் செல்கின்றார்கள். ஆனால், இந்த பௌத்த சிங்களத் தோழர்கள் திருகோணமலையிலிருந்து கடல் மார்க்கமாக ஒன்பது மைல் "லோஞ்சில்" பிரயாணம் செய்து அந்த இடத்திற்குச் செல்லவேண்டியிருக்கின்றது. இது பயங்கரமான பிரயாணமாகவும் இருந்துகொண்டிருக்கின்றது. சேருவாவிலைப் பகுதிக்கு மிக இலேசான முறையிலே ரெயில்வே ஸ்ரேஷன் அமைக்க முடியும். அல்லை—கந்தளாய் வீதி இப்பொழுது முடிவடைந்துவிட்டது. கந்தளாய்ப் பகுதியிலிருந்து சேருவாவிலைக்குப் புகையிரத மார்க்கம் அமைக்கப்பட்டால் இப் பக்தர்கள் மாத்திரமல்ல, அதனால் எல்லோரும் பயனடைவார்கள் என்று கூற விரும்புகிறேன். [குறுக்கீடு] கௌரவ நீர்கொழும்புப் பாராளுமன்ற அங்கத்தவர் என்னிடம் தமி

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

மில் கேள்விகள் கேட்பதையிட்டு மகிழ்ச்சி யடைகிறேன். ஒன்பது ஆண்டு காலமாக சொன்னதன் காரணமாகத்தான் அல்லே-கந் தளாய் விதி முடிவடைந்தது. அதை முடித் தது ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சி அரசாங்க மாகும். நான் கேட்பது என்னவென்ருல் கந் தளாய்ப் புகையிரத நிலையத்திலிருந்து— [குறுக்கிடு]

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Please address the Chair and ignore the interruptions of the hon. Member for Negombo.

**ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.**
*(ஜனப் ஏ. எல். அப்துல் மஜீது)*
(Mr. A. L. Abdul Majeed)

ஆகையால் அந்த சேருவாவிலேப் பகுதியில் புகையிரத நிலேயம் திறக்கப்படல் வேண்டும். உபசபாநாயகர் அவர்களே, திருகோண மலேத் துறைமுகத்தை உடனடியாக அரசாங் கம் தேசியமயமாக்கவேண்டும். ஏனென்ருல் இதுகாலவரைக்கும் திருகோணமலேத் துறை முகத்தைத் தேசியமயமாக்கவேண்டாமென்று கேட்டுக்கொண்டவர்கள் தமிழரசுக் கட்சி யினர். [குறுக்கிடு]

The hon. Member for Agalawatta (Dr. Colvin R. de Silva) may express his personal opinion, but it is not the policy of the S. L. F. P.

ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சி எப்பொழுதும் அந்தத் துறைமுகத்தைத் தேசியமயமாக்க வேண்டுமென்று கூறிக்கொண்டிருக்கின்றது. திருகோணமலேத் துறைமுகத்தைத் தேசிய மயமாக்குவார்கள் என்று தமிழரசுக் கட்சி யினர் பயந்துகொண்டிருந்தார்கள். அதைத் தேசியமயமாக்கிஞல் அதிகமாகச் சிங்களத் தொழிலாளர்கள் வந்துவிடுவார்கள் என்று அவர்கள் பயந்தார்கள். நான் கூறுகிறேன், தேசியமயம் என்பது சிங்கள மயமல்ல. தேசிய மயம் எல்லா மக்களுக்கும் பொதுவான, பொருத்தமான ஒரு சோசலிஸ கொள்கை யாகும்.

திருகோணமலேத் துறைமுகம் தேசியமய மாக்கப்படாததன் காரணமாக அதிகப்படி யாகக் கப்பல் அங்கு செல்வதில்லே. அதனுல் தொழிலாளர்கள் மத்தியில் வேலேயில்லாத் திண்டாட்டம் ஏற்பட்டுக்கொண்டு வருகின் றது; பஞ்சம் ஏற்பட்டுக்கொண்டு வருகின் றது. தனிப்பட்ட கம்பெனிகளின் வேலேகள் கூட அரசாங்கத்துக்குப் பொருத்தமானதாக இல்லே. இந்த நேரத்தில் திருகோணமலேத் துறைமுகத்தை அவசியம் தேசியமயமாக்க வேண்டுமென்று வற்புறுத்துகிறேன். இதனுல் அதிகப்படியான பணம் அரசாங்கத்துக்கு வந்து சேரும்.

கல்வியைப் பற்றி ஒருசில வார்த்தைகள் கூருமல் இருக்க முடியாது. கல்வியமைச்சர் அவர்கள் தமிழரசுக் கட்சியின் கையில்தான் இருந்துகொண்டிருக்கிருர்.

The Hon. Minister of Education is waiting for the Federal Party to agree so that he can send Sinhala teachers to Muslim schools in the North and East.

ஒரே குரலாக நாங்கள் கல்வியமைச்சர் அவர்களிடம் சிங்கள ஆசிரியர்கள் வேண்டு மென்று கேட்கிறேம். ஏனென்ருல் எங்கள் பகுதியிலே மக்கள் சிங்கள மொழியைப் படிக்க விரும்புகின்ருர்கள். நாங்கள் சிங்கள மொழியைப் படிக்கவேண்டுமென்று எப் பொழுதோ கூறிவிட்டோம். தமிழரசுக் கட்சி யினர் இப்பொழுதுதான் தனிச் சிங்கள மசோதாவை ஏற்றுக் கொண்டிருக்கிருர்கள் என்று கருதுகிறேன்.

**ධර්මලින්ගම් මයා.**
*(திரு. தர்மலிங்கம்)*
(Mr. Dharmalingam)

Subject to certain conditions.

**ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.**
*(ஜனப் ஏ. எல். அப்துல் மஜீது)*
(Mr. A. L. Abdul Majeed)

What are your conditions ?

**ධර්මලින්ගම් මයා.**
*(திரு. தர்மலிங்கம்)*
(Mr. Dharmalingam)

Regulations.

**ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.**
*(ஜனப் ஏ. எல். அப்துல் மஜீது)*
(Mr. A. L. Abdul Majeed)

You have passed your regulations now. So why are you objecting to

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.]

Sinhala teachers being sent to Muslim Schools? What is your difficulty now?

**නියෝජ්‍ය කථානායකතුමා**
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

If both Members like, they can go outside the Chamber, have their arguments and then come back.

**ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.**
(ஜனப் ஏ. எல். அப்துல் மஜீது)
(Mr. A. L. Abdul Majeed)

கௌரவ உப சபாநாயகரவர்களே, எனது தொகுதியிலுள்ள அதிகப்படியான தமிழ்ப் பாடசாலைகள் சிங்கள ஆசிரியர்களைக் கேட்கின்றன, சிங்களம் படிப்பதற்காக.

**ධර්මලිංගම් මයා.**
(திரு. தர்மலிங்கம்)
(Mr. Dharmalingam)

அப்படியும் வாய்க்கவில்லை.

**ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.**
(ஜனப் ஏ. எல். அப்துல் மஜீது)
(Mr. A. L. Abdul Majeed)

வாய்க்காமலில்லை. உங்களைப் போல, கொழும்பு மாநகரில் இருக்கிற தமிழரசுப் பெரியார்கள் எல்லோரும் இன்று இரகசியமாகச் சிங்களம் படிக்கிறார்கள். உங்களுடைய சிரேஷ்ட தலைவர் நாகநாதனுடைய மகள் கெய்ரோ நகரத்திலே இருந்துகொண்டு சிங்களத்திலே 'மினிற்' பண்ணுகிறார். சாதாரண பாமர மக்கள்தான் சிங்களம் படிக்கக் கூடாது.

**ධර්මලිංගම් මයා.**
(திரு. தர்மலிங்கம்)
(Mr. Dharmalingam)

உங்களுடைய தலைவியினுடைய மகள்?

**ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.**
(ஜனப் ஏ. எல். அப்துல் மஜீது)
(Mr. A. L. Abdul Majeed)

ஆம். படிக்கட்டும். படிக்க அனுப்பியிருக்கிறோம். நன்றாக விரிவான முறையில் படித்துக் கொண்டு வரட்டும். விரிவாகப் படிக்கட்டும். [இடையீடு]

You have accepted that Sinhala should be the Official Language. Why should you object to Sinhala teachers being sent to the North and East? [இடையீடு] In my electorate a number of Tamil schools are demanding Sinhala teachers. Why cannot the Hon. Minister of Education send Sinhala teachers to those schools?

அடுத்தபடியாக தேசிய ஒற்றுமை பற்றிப் பேச விரும்புகிறேன். இன்று தமிழரசுக் கட்சியை இந்த அரசாங்கம் தன்னுடன் வைத்துக் கொண்டு எப்படித் தேசிய ஒற்றுமையைப் பற்றிப் பேச முடியும் என்று கேட்க ஆசைப்படுகிறேன்? How can you speak of national unity when the Federal Party is opposed to Sinhala teachers being sent to the North and East? [இடையீடு] You have accepted Sinhala only as the Official Language. That was the very reason why they introduced legislation for the reasonable use of Tamil. Where is the national unity you speak of? The hon. First Member for Batticaloa (Mr. Rajadurai) will agree with me that there are a number of Tamil schools that are demanding Sinhala teachers.

இந்த நாட்டில் வாழ்கிற, சிங்களம் படிக்கிற, படிக்க விரும்புகிற மக்கள் சார்பில் நான் கல்வி அமைச்சரவர்களிடம் கேட்டேன் எங்களுக்காகத் தனிச் சிங்களப் பயிற்சிக் கலாசாலை வேண்டும் என்று. பதில் இல்லை. இந்த நிலையிலேதான் தனிச் சிங்கள மசோதா இந்த நாட்டில் செயல்பட்டுக் கொண்டிருக்கிறது. என்னுடைய தாய் மொழி தமிழ்.

**ධර්මලිංගම් මයා.**
(திரு. தர்மலிங்கம்)
(Mr. Dharmalingam)

உண்மையாகவா?

**ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.**
(ஜனப் ஏ. எல். அப்துல் மஜீது)
(Mr. A. L. Abdul Majeed)

உங்களைவிட தமிழபிமானம் உள்ளவன் நான். இதில் எந்தவிதமான சந்தேகமுமில்லை. எனது தாய்மொழி தமிழ். அதனாலேதான் தமிழில் இங்கு பேசுகிறேன். எல்லோருக்கும் தாய்மொழி என்று ஒன்று இருக்கிறது.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

" அன்ன நடை நடக்கப் போன காகங்களைப் போன்று " உங்களுடைய சிரேஷ்ட தலைவர் நாகநாதன் இங்கு வந்து பறங்கி மொழியில் பேசுகிறார். அப்படிப் பட்டவன் அல்ல நான். நான் எங்கிருந்தாலும் எனது தனித்துவத்தை ஒருபோதும் இழக்கமாட்டேன் என்பதை மகிழ்ச்சியுடன் தெரிவித்துக்கொள்ள ஆசைப்படுகிறேன்.

வியாபாரத்தை எடுத்துக் கொள்ளும் பொழுது, உப சபாநாயகரவர்களே, இந்த நாட்டில் முஸ்லிம் பொட்டனி வியாபாரிகள் பலர் இருக்கிறார்கள். கௌரவ வேருவலை அங்கத்தவருக்குத் தெரியும், அவருடைய தொகுதியில் ஏராளமானவர்கள் வர்த்தகம் இழந்து, வியாபாரம் இழந்து கொண்டிருக்கிறார்கள் என்பது. அவர், இந்தப் பாராளுமன்றத்திலே அவர்களுடைய சார்பில் ஒரு வார்த்தை கூடப் பேசவில்லை. ஏன் நான் இதைக் கூறுகிறேன் என்றால் [இடையீடு] அப்படிப் பேசியிருந்தால் நன்றி. இன்று வியாபாரிகள் மிகவும் கஷ்டப்பட்டுக் கொண்டிருக்கிறார்கள். முஸ்லிம்கள் இதனால் அதிகப்படியாகப் பாதிக்கப்பட்டிருக்கிறார்கள் என்பதை என்னால் சொல்லாமலிருக்க முடியாது.

உப சபாநாயகரவர்களே, இந்த வரவு செலவுத் திட்டத்திலே காட்டப்பட்ட சில கருத்துக்களை அவதானிக்கும்பொழுது நான் மிகவும் மகிழ்ச்சியடைகிறேன். ஏனெனில் இந்த நாட்டிலே பொருளாதார சுதந்திரத்தைக் காண வேண்டும். பொருளாதார சுதந்திரத்தை அடைவதற்கு இந்த நாட்டிலேயுள்ள வேலையில்லாத் திண்டாட்டத்தை நீக்க வேண்டும், அறியாமையைப் போக்கவேண்டுமென்ற அபிப்பிராயத்தை கௌரவ நிதி அமைச்சர் அழகாகத் தமது உரையில் தெரிவித்துள்ளார். ஆனால், வேலையில்லாத் திண்டாட்டத்தை எப்படி நீக்குவது, அறியாமையை எப்படிப் போக்குவது என்ற கேள்வியைக் கேட்கும்பொழுது எனக்கு மகாத்மா காந்தி அவர்களுடைய ஞாபகம் வருகிறது. மகாத்மா காந்தி அவர்கள் இந்தியாவில் கூறினார்கள் voluntary charity பற்றி. Voluntary charity என்றால் பணம் படைத்தவர்கள் தங்களுடைய பணத்தைத் தியாகத் தன்மையோடு வறுமையிலும் அறியாமையிலும் கஷ்டப்படும் மக்களுக்குக் கொடுப்பது. இம் முறை இலங்கையிலே பின்பற்றப்படுமாக இருந்தால், நான் நினைக்கிறேன், அரசாங்கத்திற்கு எவ்வித செலவும் இல்லாத முறையில் இந்த நாட்டிலேயுள்ள வேலையில்லாத் திண்டாட்டத்தை நீக்கமுடியும், போக்க முடியுமென்று. இதேபோல்தான் அல்ஜீரியாவிலும் ஈராக்கிலும் ஐக்கிய அரபுக்குடியரசு நாடுகளிலும் சக்காத்தின் அடிப்படையில் அழகான ஒரு திட்டத்தைப் பின்பற்றுகிறார்கள். அதாவது, பணம்படைத்தவர்கள் தங்களுடைய பணத்தை வீண்விரயம் செய்யாமல் கஷ்டப்படும் மக்களுக்காக வேண்டி ஒவ்வொருவரும் ஒவ்வொரு மாதமும் ஆயிரம் ரூபாவை கொடுக்கிறார்கள். இப்படி ஆயிரம் பேர் ஒவ்வொருவரும் ஆயிரம் ரூபாவைக் கொடுத்தால் அது பத்து இலட்ச ரூபாவாகச் சேர்ந்து விடுகிறது. இந்தப் பணத்தைக் கொண்டு பின் தங்கிய கிராமங்களில் வேலையில்லாத் திண்டாட்டத்தைப் போக்கும் நோக்கமாக பெரும் பெரும் தொழிற்சாலைகளைத் திறக்கிறார்கள். ஒவ்வொரு கிராமத்திலும் ஒவ்வொரு மாதமும் புதிது புதிதாகத் தொழிற்சாலைகள் திறக்கப்பட்டால் அக்கிராம மக்களில் முன்நூறு நாநூறு பேருக்கு வேலை வசதிகள் கிடைக்கின்றன. ஓரளவு வேலையில்லாத் திண்டாட்டத்தைப் போக்கக்கூடிய முறையில் இந்த முறை அமைகிறது. இந்த முறையை இந்த நாட்டிலே வாழ்கின்ற மக்கள் பின்பற்ற வேண்டுமென்று நான் கருதுகிறேன்.

உப சபாநாயகர் அவர்களே, பணம்படைத்தவர்கள் அனுவசியமான முறையிலே 'ஆஷா கோஷத்துக்காக' வேண்டி பெரும் பெரும் களியாட்ட விழாக்களில் ஆயிரம், ஆயிரம் ரூபாக்களை வீண்விரயம் செய்கிறார்கள். இதைத்தவிர்த்து இந்த நாட்டு மக்களுடைய நன்மையைக் கருதி பணம் படைத்தவர்கள் ஒன்று சேர்ந்து ஆக்கவேலைகளை ஆரம்பிக்க வேண்டும். இந்த நாட்டிலே பணம் படைத்தவர்கள் நிறைய இருக்கிறார்கள். அவர்களில் ஆயிரம்பேர் ஒன்று சேர்ந்தால் பத்து இலட்ச ரூபாவைத் திரட்டி பின் தங்கிய மக்களுக்காக இந்த மாதம் ஒரு தொழிற்சாலையை ஒரு இடத்தில் திறந்தால் அடுத்த மாதம் இன்னொரு இடத்தில் அதேபோல மற்றொரு தொழிற்சாலையை நிறுவமுடியும்.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ධර්මලින්ගම් මයා.
*(திரு. தர்மலிங்கம்)*
(Mr. Dharmalingam)
*இதை உங்களுடைய இஸ்லாமிய சோசலிச முன்னணி (I. S. F.) செய்யலாம்.*

ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.
*(ஜனப் ஏ. எல். அப்துல் மஜீது)*
(Mr. A. L. Abdul Majeed)
*இதைத் திட்டவட்டமாக இந்த நாட்டில் இஸ்லாமிய சோசலிச முன்னணி (I. S. F.) செய்யத்தான் போகிறது. அது எதிர் காலத்தில் இத்தகைய திட்டங்களில் ஈடுபடாமல் இருக்கப்போவது இல்லை. ஆனால் ஆட்சியில் இருப்பவர்களுக்குத்தான் நான் இதைக் கூறுகிறேன். ஆட்சியில் இருப்பவர்களுக்கு மாத்திரமன்றி இலங்கையில் இருக்கும் பணம் படைத்தவர்களுக்கும் இதை நான் கூறுகிறேன்.*

එම්. අබ්දුල් බකීර් මාකර් මයා. (බේරුවල)
*(ஜனப் எம். அப்துல் பாக்கீர் மாக்கார்—வேருவலை)*
(Mr. M. Abdul Bakeer Markar—Beruwala)
*இதை நீங்கள் முதலில் செய்து காட்டுங்கள்.*

ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.
*(ஜனப் ஏ. எல். அப்துல் மஜீது)*
(Mr. A. L. Abdul Majeed)
*ஆம். அதை நாங்கள் செய்து காட்டுவோம். உதாரணமாக இந்த நாட்டு முஸ்லிம்களை நாங்கள் எடுத்துக் கொள்வோம். வேறு யாரையும் எடுக்க வேண்டிய அவசியமில்லை. எனது நண்பர் வேருவலை அங்கத்தவர் அவர்களுக்குக் கூறுகிறேன், இந்த நாட்டிலே ஏழு, எட்டு இலட்சம் முஸ்லிம்கள் வாழ்ந்து கொண்டிருக்கிறார்கள்; இவர்கள் மத்தியில் பணம் படைத்தவர்கள் ஆயிரம் பேரைச் சுலபமாகச் சேர்க்க முடியும். இப்படிப் பணம் படைத்தவர்கள் ஆயிரம்பேர் ஒன்று சேர்ந்து மாதம் ஒன்றுக வருடத்திற்குப் பன்னிரண்டு தொழிற்சாலைகளை பின்தங்கிய முஸ்லிம் கிராமங்களில் நிறுவினால் திட்டவட்டமாக நாம் வேலையில்லாத் திண்டாட்டத்தை அரசாங்க உதவியின்றித் தீர்க்க முடியும். இந்தக் கொள்கையைத்தான் இந்த நாட்டிலே இஸ்லாமிய சோசலிச முன்னணி பிரசாரம் செய்கிறது. என்னவென்று நான் கூறுவதென்னவென்றால், இக்கொள்கையை நீங்களும் பின்பற்றுங்கள். இந் நாட்டிலேயுள்ள எல்லா இனத்தவர்களும் இதனைப் பின்பற்றுவார்களென்றால், திட்டவட்டமாக நம் நாட்டிலே வேலையில்லாத் திண்டாட்டத்தை நீக்க முடியுமென்பதில் சந்தேகமில்லை.*

*நான் இன்னுமொரு முக்கியமான விடயத்தைக் கூறுமல் இருக்க முடியாது. நிதி அமைச்சரவர்களுடைய நிதி நிலை அறிக்கை நாட்டுக்குச் சுபிட்சத்தையளிக்க வேண்டுமாகவிருந்தால் இந்நாட்டிலே தேசிய ஒற்றுமையைச் சிறப்பாக வளர்த்தெடுக்க வேண்டும்.*

එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මයා. (මීගමුව)
*(திரு. என். டென்சில் பெர்னண்டோ—நீர்கொழும்பு)*
(Mr. N. Denzil Fernando—Negombo)
*முன் வாங்கிலேயிருப்பவர்களைக் கேளுங்கள்.*

ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.
*(ஜனப் ஏ. எல். அப்துல் மஜீது)*
(Mr. A. L. Abdul Majeed)
*எங்களுடைய முன் வாங்கிலேயிருப்பவர்கள் ஒருகாலமும் தேசிய ஒற்றுமைக்கு விரோதிகளல்ல.* They are not against national unity ; you are the people who are against national unity. Now, of course, my hon. Friends say that they are for national unity. I ask you, then why are you, after having accepted Sinhala only, not studying Sinhala ? Why can you not study it even now ?

නියෝජ්‍ය කථානායකතුමා
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)
Is the hon. Member for Negombo also a Member of the Federal Party ?

ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.
*(ஜனப் ஏ. எல். அப்துல் மஜீது)*
(Mr. A. L. Abdul Majeed)
Those on our front benches are not against national unity ; you are the people who are against it.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

The hon. Member should not give ear to these interruptions.

**ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.**
*(ஜனாப் ஏ. எல். அப்துல் மஜீது)*
(Mr. A. L. Abdul Majeed)

They are intelligent interruptions. I am always glad to be interrupted by the hon. Member for Uduvil.

உப சபாநாயகரவர்களே, தேசிய ஒற்றுமை இந்நாட்டிலே வளரவேண்டும். ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சியைப் பொறுத்த அளவிலே நான் கூறுகிறேன், நாங்கள் ஒருபொழுதும் தமிழ் மக்களுக்கு விரோதமானவர்கள் அல்ல. You are now oppressing and suppressing the minority Tamils. Why are you doing that ? We are not doing it. இந்நாட்டிலேயுள்ள சிறுபான்மைத் தமிழ் மக்களுக்காக முதன்முதலில் குரல் எழுப்பியவர் காலஞ்சென்ற திரு. பண்டாரநாயக்க அவர்கள்தான் என்பதை நான் சொல்லிக் கொள்ள விரும்புகிறேன். தேசிய ஒற்றுமையை நாங்கள் முழுமனதோடு விரும்புகிறோம்.

It was the late Mr. S. W. R. D. Bandaranaike who fought for the minority Tamils and not you. You cannot deny that fact. உண்மையாக நான் கூறுகிறேன், எங்கள் நாடு அழகான ஒரு தீவு. உலகத்திலேயுள்ள எல்லா மக்களையும் கவரக்கூடிய ஒரு நாடு. இந்நாட்டிலே வாழுகின்ற மூன்று பெரிய இனங்கள், சிங்களவர், தமிழர், முஸ்லிம்கள், எல்லோரும் சகோதரர்கள் போன்று வாழ வேண்டுமென்ற எண்ணமும் அபிலாசையும் எங்களுக்கு இருக்கிறது. இதனை நான் சொல்லாமல் இருக்க முடியாது. நாம் தமிழ் மக்களின் விரோதிகள் அல்ல. தமிழ் மொழிக்கும் நாம் விரோதிகளல்ல. உங்கள் மத்தியிலே இருக்கின்ற ஒருசில வகுப்புவாதிகளைப்போல எங்கள் மத்தியிலும் ஒருசில வகுப்புவாதிகள் இருக்கத்தான் செய்வார்கள். ஆனால், அவ் வகுப்புவாதிகளைக் கொண்டு நாம் இந்த நாட்டிலே உள்ள தேசிய ஒற்றுமைக்குப் பங்கம் விளைவிக்க முடியாது. அரசியல் வாதிகளாக மட்டும் இருந்தால் போதாது. தேசிய வாதிகளாகமாறி, நாட்டின் சுபிட்சத்துக்காக, நல்வாழ்வுக்காக நாம் ஒவ்வொருவரும் பாடு பட்டு உழைத்தால்தான், இந்த நாட்டிலே பொருளாதார சுதந்திரத்தைப் பெற்று மக்கள் சுபிட்சமாக வாழமுடியுமென்று கூறி விடைபெறுகிறேன்.

අ. භා. 12.1

**ජෝර්ජ් අබයගුණසේකර මයා.** (හඟුරන්කෙත)
*(திரு. ஜோர்ஜ் அபயகுணசேக்கர—ஹங்குராங்கெத்த)*
(Mr. George Abeyagoonasekera—Hanguranketa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බොහෝ වේලාවක් විවේචනයට ලක්ව තිබෙන මේ අයවැය ලේඛනය පිළිබඳව වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්නට මා තමුන්නාන්සේගේ අවසරය ඉල්ලා සිටිනවා. අද අප රටේ පවතින ආර්ථික තත්ත්වය පිළිබඳව පමණක් නොව අප වැනි ප්‍රජාතන්ත්‍රවාදී ජාතියක් විසින් පිළිපැදිය යුතු ස්වදේශීය සහ විදේශීය වගකීම් සහ අප විසින් අනුගමනය කළ යුතු යම් යම් සම්ප්‍රදායයන් පිළිබඳවද සුපරීක්ෂාකාරීව ස්වකීය අවධානය යොමු කරවා නව ආදායම් වර්ෂය වෙනුවෙන් මේ ගරු සභාවට ඉදිරිපත් කර තිබෙන මෙම අයවැය ලේඛනය පිළිබඳව මුළු ඇමති මණ්ඩලයට, විශේෂයෙන් ගරු මුදල් ඇමතිතුමාට, මෙම අවස්ථාවේ දී අපගේ ප්‍රශංසාව හිමි වෙනවා. වර්ෂයක් පාසා විවිධ සමාජ සේවා කටයුතු සඳහා යෙදවිය යුතුව පවතින පුනරාවර්තන වියදම් වලට අමතරව මේවර රාජාසන කථාවෙන් ප්‍රකාශිත වූ ජාතික සංවර්ධන යෝජනා හැකි තරම් දුරට සපුරාලීමේ මූලික පරමාර්ථය පදනම් කරගෙන සකස් කර ඇති මෙම අයවැය ලේඛනය ඉතාමත්ව කාලෝචිතයි කියා අපට වර්ණනා කළ හැකිව තිබෙනවා. කෘෂිකාර්මික අතින් පමණක් නොව කාර්මික අතින් පවා ඇරඹෙන සෑම කටයුත්තකම අභිවෘද්ධිය පතා, ඒවාට කිසිම ආබාධයක් අවහිරයක් ඇති නොවන පරිද්දෙන්, පොදු රටවැසියාගේ ආදායම් බදු ගෙවන ජනතාවගේත් තත්ත්වය පිළිබඳව සිතා බලා, තවදුරටත් ඔවුන් නොපෙළා නොතළා, ඔවුන් සමග කෝපයට පත් නොවී, ඔවුන්ගේම අභිවෘද්ධිය සපුරාලීමේ පරමාර්ථයෙහි පිහිටා සකස් කර තිබෙන මෙම අයවැය ලේඛනය වර්තමාන යුගයේ හැටියට ඉතාමත්ම සාධා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අබයගුණසේකර මයා.]

රණ වූ අයවැය ලේඛනය කැයි ප්‍රකාශ කළ හැකිව තිබෙනවා. එම නිසා මෙවැනි අයවැය වට්ටෝරුවක් ඉදිරිපත් කරන්නට පුළුවන්කම තිබෙන්නේ නියම බුද්ධියක් තිබෙන වන්නිනායක වැනි ගමරාළ කෙනෙකුට පමණ කැයි නොකියාම බැහැ.

මේ වර අයවැය ලේඛනය ඉදිරිපත් කරන ලද දිනයේ ගරු මුදල් ඇමතිතුමාගේ හිස්ව තිබූ ආසනය නැරඹූ නියෝජ්‍ය කථානායකතුමා එතුමාගේ පැමිණීම ප්‍රමාද වීම නිසා මේ ජවනිකාව වේදිකාගත කරන්නට අවශ්‍ය ප්‍රධාන නළුවා වන ගරු මුදල් ඇමති කුමාරයා නැත්තේ මන්ද කියා විමසන අවස්ථාවේදීම—මනමාලයා නැති මගුල් ගෙදර කුමක්ද කියා විපරම් කර බලන අවස්ථාවේදීම—කවදත් සුපුරු සිනහ මුහුණින් අයවැය යෝජනා අන්තර්ගත පෙට්ටිය අතට ගෙන එතුමා මෙම සභා ගර්භයට පැමිණියා. එවේලේ, මේවර මහජනතාව අතර නොසන්සුන්භාවයක් හා ජාතික රජය කෙරෙහි අප්‍රසාදයක් පහළ වන අන්දමේ යෝජනා ඇතුළත පෙට්ටියක්, එහෙම නැතිනම් බොහෝ දෙනා විනෝදයක් සේ සලකන වැඩ වර්ජන ව්‍යාපාර යනාදිය අරඹන්නට හැකි අන්දමේ යෝජනා ඇතුළත් පෙට්ටියක් අතින් රැගෙන එතුමා පැමිණෙන්නට ඇතැයි මෙහි සිටි ඇතැම් දෙනා කල්පනා කරන්නට ඇති. මේ අරගෙන එන පෙට්ටියත් එදා ඈත අතීතයේදී ග්‍රීක් මිථ්‍යා කථාවල අන්තර්ගත පරිදි බොහෝ කරදර හිරිහැර "ට්‍රබල්" ආදිය ඇතුළත් වූ පැන්ඩෝරාගේ පෙට්ටිය වැනි එකක් වන්නට ඇත කියා බලාපොරොත්තු වන්නට ඇති. එහෙත් ගරු මුදල් ඇමතිතුමාගේ අයවැය කථාවෙන් පසුව ඒ බලාපොරොත්තු සියල්ලක්ම සුන් වූ බව අපට පෙනී ගියා. එක මන්ත්‍රීවරයෙක් මේ අයවැය ලේඛනය හිස් උණ බම්බුවකට සමාන කළා. තවත් ගරු මන්ත්‍රීවරයෙක් මෙවර රාජාසන කථාව ඇතෙක් ගිලි දිවුල් ගෙඩියකට සමාන කළා. එහෙත් මේ අයවැය ලේඛනයයි රාජාසන කථාවයි කියවා බැලූ කෙනෙකුගෙන් විමසූ විට මට ඒ තැනැත්තා කීවේ සමහරවිට එම ගරු මන්ත්‍රීවරුන්ගේ පෙනීමේ දෝෂයක් නිසා එසේ කියන්නට ඇති, අපට පෙනෙන හැටියට නම් මේ අයවැය ලේඛනය හිස් උණ බම්බුවක් නොව රසවත් උක් දණ්ඩක්ය; මෙවර රාජාසන කථාවත් ඇතකු ගිලි හිස් දිවුල් ගෙඩියක් නොව අද මල්වානේ හැම තැනකම වලුබරව එල්ලෙන පැණි රඹුටන් ගෙඩියක්ය කියලයි. රාජාසන කථාව මෙන්ම මේ අයවැය ලේඛනයත් හිස් එකක් හැටි සලකන්න පුළුවන් කමක් නැහැ. රුපියල් 196 කෝටි 90 ලක්ෂයක් බර මේ අයවැය ලේඛනය හිස් එකක් හැටියට කවදාවත් කල්පනා කරන්නට බැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අයවැය ලේඛනයෙහි අන්තර්ගත කරුණු රාශියක් පිළිබඳව කථා කරන්නට කාලය නැති වුණත් කරුණු කීපයක් පිළිබඳව පමණක් මගේ අදහස් මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නට මා බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම මේ අයවැය ලේඛනයෙන් යෝජිත විදේශ ආයෝජන ගැන අප සන්තෝෂ විය යුතුයි. මේ රටේ නිෂ්පාදනය කරන්නට පුළුවන් මේ රටේ ප්‍රයෝජනය සඳහා කරන නිෂ්පාදන මෙන්ම මේ රටින් අපනයනය කරන්නට පුළුවන් ද්‍රව්‍ය නිෂ්පාදනයත් සඳහා අවස්ථාවක් නැත්නම් භාග්‍යයක් අපට විදේශ ආයෝජන මගින් ලබා ගන්නට පුළුවන් වෙනවා. මෙවැනි ආයතන නැත්නම් මධ්‍යස්ථාන ඇති කිරීමෙන් මතු කී ප්‍රයෝජනා ලැබෙන අතරම ඒ මගින් සෑහෙන ප්‍රමාණයකට රක්ෂා ලබා ගැනීමටත් පුළුවන් වෙනවා. එමෙන්ම මේ යෝජිත මධ්‍යස්ථාන නැත්නම් යෝජිත ආයතන කොළඹ වැනි නගරබද ප්‍රදේශවලට පමණක් සීමා නොකර ගම්බද ප්‍රදේශවලත් මේ ආයතන පිහිටුවීමට අදහස් කරනවා නම් ඒ මගින් විශාල ප්‍රයෝජනයක් ලබන්නට පුළුවන් වන බව මේ ජාතික රජයට මතක් කරන්නට කැමතියි. රැකීරක්ෂා හිඟය නගරබදට පමණක් සීමා වූ එකක් නොවෙයි. පිටිසර ප්‍රදේශවලත් මේ රැකීරක්ෂා හිඟය තිබෙනවා. කාර්මික මධ්‍යස්ථාන ගම්බද ප්‍රදේශවල ඇති කිරීමෙන් දැනට පවතින නගරයට ඇදී ඒම බොහෝ දුරට වලක්වා ඒ අය ගම්බදව රැකියාවල යෙදවීමට හැකි වෙනවා. රජය මගින් ආරම්භ කර ඇති නොයෙකුත් මණ්ඩල හා නොයෙකුත් ආයතනවල රක්ෂා දීමේදී පිටිසරබද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පළාත් වල රැකිරක්ෂා නැති තරුණ තරුණියන්ට තැන ලැබී තිබෙන්නේ බොහොම අඩුවෙන්. මේ වරප්‍රසාද ඔවුන්ට ලබා දීමට කටයුතු කිරීම අපේ යුතුකමක්ව තිබෙනවා. රජයේ ආධාර ඇතිව පවත්වාගෙන යන සංයුක්ත මණ්ඩලවල ප්‍රධානීන් වශයෙන් කටයුතු කරන බොහෝ දෙනකු අද එක්තරා විධියක ඒකාධිපති කමක් ලැබූවන් වශයෙන් සිතාගෙන ආඥාදායක ස්වරූපයකින් කටයුතු කරන බව අපට දැනගන්නට ලැබී තිබෙනවා. "අප කවදාවත් වැරදි නොකරන අය" ය යනුවෙනුයි ඔවුන් අදහස් කරන්නේ. "රජින වරදක් නොකරයි" යනුවෙන් එංගලන්තයේ ඉංග්‍රීසි නීතියේ තිබෙන සම්ප්‍රදායානුකූල පිළිගැනීම, ප්‍රඥප්තිය, අප කවුරුනුත් දන්නවා. එවැනි වරප්‍රසාදයක් මේ සංයුක්ත මණ්ඩලවල නිලධාරීන්ටත් තිබෙනවායයි ඔවුන්ගෙන් බොහෝ දෙනකු අදහස් කරනවා. එවැනි අදහස් ඇති නිලධාරීන් නිසා සමහර සංයුක්ත මණ්ඩල ආදී ආයතනවල මතු වී තිබෙන ප්‍රහේලිකා, ප්‍රශ්න, ගැන අපගේ කල්පනාව යොමු විය යුතුයි. එවැනි ආයතනවල කටයුතු කොතෙක් දුරට සාර්ථක වී තිබේද, අනාගතයේදී තව කොපමණ දුරට සාර්ථක කර ගන්නට පුළුවන්ද, එසේ සාර්ථක කර ගන්නට බැරි නම් ඊට හේතු මොනවාද, යනාදී කරුණු නිතර නිතර පරීක්ෂා කර බලා ඒවා විධිමත් කිරීම රජය සතු වැඩක්. විශෙෂයෙන්ම ජීවිත රක්ෂණ සංස්ථාව, ලංකා ගමනාගමන මණ්ඩලය වැනි ආයතන ජාතික සේවාවක් සැලසීමට රජය විසින් ඇති කරන ලද ඒවා නිසා ඒ ගැන නිතර පරීක්ෂා කර බැලීම රජයේ යුතුකමක්.

මෙම අයවැය ලේඛනයෙහි විශේෂ ස්ථානයක් දී තිබෙන්නේ කෘෂිකර්මාන්තයේ දියුණුවටයි. ඒ සම්බන්ධව නොයෙක් විධියේ විවේචන මෙහිදී ඇති වුණා. කෘෂිකර්මාන්තයට මුඛ්‍යස්ථානය ලැබී තිබෙන කොට්ඨාශයක් නියෝජනය කරන මන්ත්‍රීවරයකු වශයෙන් මට කියන්නට තිබෙන්නේ, මෙම අයවැය වච්ටෝරුවෙහි දැක්වෙන පරිදි ක්‍රියාත්මක කරන්නට බලාපොරොත්තු වන ගොවි ණය ක්‍රමය ගැන ඉක්මනින් කටයුතු කළ යුතු බවයි. අද තිබෙනවාට වඩා, ණය ගැනීමේ පහසුකම් ගොවි ජනතාවට ලබා දිය යුතුමයි. පොලිය අඩු කළ යුතු අතර ණය ලබා ගන්නා ගොවීන් විසින් අනුගමනය කළ යුතු නීති හැකි තරම් ලිහිල් කළ යුතුයි.

ගොවියාගේ ප්‍රයෝජනය සඳහා තවත් අත්‍යවශ්‍යම දෙයක් නම් රසායනික පෝර වර්ග ලබා දීමයි. ගොවි කාරක මණ්ඩල මඟිනුත් සමුපකාර සමිති මඟිනුත් අද දවසේ මෙම පෝර වර්ග බෙදා දෙන පිළිවෙළ එතරම් සතුටුදායක නැති බව කියන්නට පුළුවන්කම තිබෙනවා. ඇත්ත වශයෙන්ම අපගේ පරමාර්ථය හැකි තරම් භෝග වර්ග වගා කිරීම වැඩි දියුණු කිරීම නම්, හැකි තරම් අස්වැන්න වැඩි කර ගැනීම නම් ඒ පරමාර්ථය ඉටු කර ගැනීම සඳහා හැකි තරම් වැඩියෙන් පෝර වර්ග ගොවියාට ලබා දීමට වැඩ පිළිවෙළ යෙදිය යුතුයි. මොන අන්දමට යෙදුවත් පොළොවට වැටෙන පොහොරවලින් භූමිය සශ්‍රික වන නිසා සමුපකාර ආයතන මගින් පමණක් නොව පෞද්ගලික කඩකාරයින් මඟිනුත් හැකි තරම් වැඩි වැඩියෙන් පෝර ගොවි ජනතාවට ලබා දීම කළ යුතුමයි. රජය විසින් ගොවියාට ආධාර දීමේ ක්‍රම හැකි තරම් වැඩි කළ යුත්තේ, අපේ සටන ආහාරයෙන් බතින් රට ස්වයංපෝෂිත කිරීම සඳහා වන නිසායි. ගොවීන්ට ගොවි උපකරණ සපයා දීම, බීජ වර්ග සපයා දීම, කෘෂිකර්මය පිළිබඳව පර්යේෂණ පවත්වමින් කෘෂිකර්ම ව්‍යාප්ති සේවය පුළුල් කිරීම, ආදී සේවාවන් ගැන මා සන්තෝෂ වෙනවා. ඒ අතරතුරම කළ යුතුව තිබෙන වැදගත් සේවයක් නම් ගොවීන්ට වුවමනා කරන ජලය ලබා දීමයි—වාරිමාර්ග පහසුකම් ඇති කිරීමයි. වාරිමාර්ග පහසුකම් සැලසීම මීට වඩා සීඝ්‍රයෙන් නොකළොත් ගරු අග්‍රාමාත්‍යතුමා බලාපොරොත්තු වන ස්වයංපෝෂණය ලබා ගැනීමට පුළුවන් වන්නේ නැහැ.

දැනට ගොවි හමුදා කඳවුරු වියළි ප්‍රදේශවල පදිංචි කරවාගෙන යනවා. එයින් විශාල සේවයක් සිදු වන බව ඇත්තක් නමුත්, වෙනම කඳවුරු පවත්වන්නේ නැතිව ඔවුන් ඔවුන්ගේ ගම් ප්‍රදේශවලම පදිංචි කරවා සුළු වාරි මාර්ග පහසුකම් ආදිය ඔවුන්ට සලසා දී ඉඩම් සංවර්ධන කටයුතුවල යොදවනවා නම් ගොවි හමුදා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අබයගුණසේකර මයා.]
වෙන් බලාපොරොත්තු වන ජාතික දියුණුව මස්තකප්‍රාප්ත කර ගන්නට පුළුවන් වෙනවා ඇති.

එක් ගරු මන්ත්‍රීතුමකු කථා කරගෙන යද්දී ප්‍රකාශ කළා, එතුමා ඓතිහාසික කොට්ඨාශයකින් පැමිණි කෙනකුය කියා. එසේ නම් මා ද ඉතාමත් වැදගත් ඉතාමත් පැරණි ඓතිහාසික කොට්ඨාශයක් නියෝජනය කරන බව කියන්න කැමතියි. හඟුරන්කෙත කොට්ඨාශය කොපමණ හොඳ ප්‍රදේශයක්ද කිවහොත් මේ ලංකාවේ නිෂ්පාදනය වන වියෙන් ඉතාමත්ම රසවත් සහල් ලබා ගැනීමට පුළුවන් වී ඇත්තේ හඟුරන්කෙත ප්‍රදේශයෙන් පමණක් බව මා ප්‍රකාශ කරන්න කැමතියි. ඒ වාගේම ඉතාමත් රසවත් එළවළු ලැබෙන්නෙත් ඒ ප්‍රදේශයෙන්මයි. එමෙන්ම මා සිගරැට් සුරුට්ටු පාවිච්චි කරන්නකු නොවුණත් තමුන්නාන්සේලා බොහෝ දෙනකු පාවිච්චි කරන සිගරැට් සුරුට්ටු සඳහා ඉතාමත් හොඳ දුම්කොළ නිෂ්පාදනය වන්නෙත් හඟුරන්කෙත ප්‍රදේශයේයි.

එපමණක් නොව, නියෝජ්‍ය කථානායකතුමනි, මේ රට පාලනයෙහි ආදි කර්තෘ වශයෙන් සැලකෙන පණ්ඩුකාභය රජතුමාට පාලි බිසව ලැබීමේ ඓතිහාසික සිද්ධිය සිදු වී තිබෙන්නෙත් හඟුරන්කෙත ප්‍රදේශයේදීයි. ඒ කුමරිය කෙතේ වැඩ කරන සිය පියාට දිවා ආහාරය ගෙන යන වෙලාවේ පණ්ඩුකාභය කුමරු ඇයගෙන් බත් ටිකක් ඉල්ලුයෙන් පතකට පත් පතක් දෙන අවස්ථාවේදී ඒ පත ස්වර්ණ පත්‍රයක් බවට පරිවර්තනය වූ නිසා 'ස්වර්ණපාලි' නම ලබා කුමාරයාත් සමග විවාහ වී මේ රටේ දීර්ඝ කාලයක් රජ කරමින් කෘෂිකර්ම අංශයෙන් සහ රාජ්‍ය පාලනය අතින් නොයෙකුත් වැඩ කරමින් පණ්ඩුකාභය රජතුමා ගැවසුණේත් හඟුරන්කෙත ඓතිහාසික ප්‍රදේශයේ බව මා තමුන්නාන්සේලාට මතක් කරන්න කැමතියි.

මා විශෙෂයෙන් මෙහිදී මතක් කළ යුතුව තිබෙන්නේ වාරි මාර්ග පහසුකම් නොහොත් ජල පහසුකම් තව දුරටත් අපේ ප්‍රදේශයට අවශ්‍ය බවයි. ඒ වගේම අපට තවත් ඉඩම් ලැබෙනවා නම් මීට වඩා සාර්ථක ලෙස මේ රටේ ස්වයංපෝෂණයට උදව් දෙන්නට පුළුවන් බව මා ප්‍රකාශ කරන්න කැමතියි. ඒ නිසා මා ආණ්ඩුවට යෝජනා කරන්න කැමතියි. වගා නොකළ බොහෝ ඉඩම් තිබෙන නිසා ඒ ඉඩම් කුමන ක්‍රමයකින් හෝ රජය යටතට පවරා ගෙන ඒ මගින් ඉඩම් නැති මහජනතාවට පවරා දී, කටයුතු කරන්නය කියා. එසේ කරන්නේ නම් අප බලාපොරොත්තු වන කාල සීමාවලදී රට ස්වයංපෝෂිත කිරීමට පුළුවන් වෙනවා ඇති.

දුම්කොළ සඳහා විශෙෂ බද්ද වැඩි කිරීම ගැන අප සන්තෝෂ විය යුතුයි. මා විශෙෂයෙන් සඳහන් කරන්න කැමතියි, දුම්කොළ නිෂ්පාදනය කරන ගොවියාට නම් තවමත් සැලකිය යුතු ලාභයක් ලැබී නැති බව. දුම්කොළ ගිනි උදුන් හිමියන්ට ලැබෙන වාසියේ ප්‍රමාණයෙන් කොටසක් දුම්කොළ නිෂ්පාදනය කරන ගොවියාට ලැබිය යුතුයි. තවත් කාරණයක් නම් දැනට පාවිච්චි කරන සිගරැට්වල දිගින් නූලක් පමණ අඩු කර ඒවා නිෂ්පාදනය කරනවා නම් සිගරැට් මිල කිසිසේත්ම වැඩි කිරීමට වුවමනා නැති බවයි. අපේ රට ආහාරයෙන් ස්වයංපෝෂිත කිරීමට වැඩ කරගෙන යන අවස්ථාවේදී —මා හිතන්නේ හාල් අතින් සෑහෙන දුරට ස්වයංපෝෂිත වී තිබෙනවා. —අපේ විදේශ විනිමය යොදා අප රටට අපනයනය කරන ආහාර ද්‍රව්‍ය රහසින්, හොර බඩු වශයෙන්, ඉන්දියාව වැනි රටවලට ඇදී යාම වැළැක්විය යුතුයි. මේ කාරණා ගැන නොයෙක් විධියෙ විවේචන, පුවත්පත් මගිනුත් වෙන මාර්ගවලිනුත් අපට දැනගන්න අහන්න ලැබෙනවා. මා කල්පනා කරන අන්දමට අපේ රටේ වාසය කරන සෑම දෙනකුගේම සහයෝගය ලැබෙනවා නම් මෙය වැළැක්විය හැකියි. එමෙන්ම බොහෝ දුරට විනෝදය පිණිස, ක්‍රිකට් පාපන්දු ආදී ක්‍රීඩාවන් සඳහා කාලය යොදන පෙළපාළි—පැරේඩ්—ආදියට සීමාවී සිටින, අපේ පාබල නාවික හා ගුවන් හමුදාවන් අප රටේ ආරක්ෂාව පිණිස, සංවර්ධනය පිණිස, යොදවනවා නම් එය වඩාත් හොඳ බව මේ අවස්ථාවේදී මතක් කර දෙනවා. ඒ අන්දමට අයථා ආගමනයන්ගේ පැමිනීම අයථා ක්‍රමයට මේ රටට එන්නාවූ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජන ගහනය නැවැත්වීමට පමණක් නොව, තරුණ තරුණියන්, ළමා ළපැටින් රක්ෂා වෙහි යොදවා ඇති කඳවුරු වැටලීමටත්, ඒවා ගැන සොයා බැලීමටත් අපේ යුද බල සේනාවන් යොදවනවා නම් එය ඉතාමත් හොඳ බව අප කල්පනා කරනවා.

රජයේ සේවකයින්ට, වැඩි පඩි දීමෙන්, යම් යම් වරප්‍රසාද දීමෙන් රජය යම් යහ පතක් කළා නම් ඒ අයගෙන් වන සේවය ගැනත් සොයා බැලිය යුතුයි. මාත් රජයේ සේවකයකු වශයෙන් අවුරුදු ගණනාවක් සේවය කළා. මා රජයේ නිල කටයුතු කරන කාලයේදී මේ තරම් සේනාවක් රජයේ නිලධාරීන් වශයෙන් සිටියෙ නැහැ. නගරයෙ කෙසේ වුණත් අද ගම්බද ප්‍රදේ ශයකවත් පාරෙ යන්න බැහැ, නිලධාරි යෙක් ඔපිසර කෙනෙක්, කොහෙන් හරි ඇගේ හැපෙන්නෙ නැතුව. විශාල පිරිසක් නිලධාරීන් වශයෙන් සිටිනවා. කන්තෝරු වල අද මෙන් විශාල පිරිසක් එදා සිටියේ නැහැ. අද තත්ත්වය සම්පූර්ණයෙන්ම වෙනස්. රජයේ ආධාර ලබමින් සේවය කරන මෙතරම් විශාල පිරිසකගෙන් බලා පොරොත්තු වන සේවය නියම අන්දමින් ඉටු වෙනවාද කියා සොයා බලා කටයුතු කරන්න ඕනෑ. මා කලින් කීවා වාගේ විශෙ ෂයෙන්ම රජයේ කාර්යාලවල රජයේ කට යුතු හරියාකාර කෙරෙනවාද කියා සොයා බැලීම පිණිස ක්‍රමවත් වැඩ පිළිවෙළක් සම්පාදනය කරන්න ඕනෑ. මා කල්පනා කරනවා, ආරොග්‍ය ශාලාවල, බන්ධනාගාර වල වැඩ හරියාකාර කෙරෙනවාද කියා බලන්න නිල නොලත් පිරිසක් පත් කර ඇති බව. ඒ අන්දමට රජයේ කාර්යාල වල, සංයුක්ත මණ්ඩලවල වැඩ හරියාකාර කෙරෙනවාද කියා බලන්න නිල නොලත් නියෝජිත පිරිස් පත් කරනවා නම්, ස්වේච්ඡා සේවකයින් වශයෙන් පිරිසක් යොදන්න පුළුවන් නම්, එයින් සැහෙන ප්‍රයෝජනයක් ලබාගන්න පුළුවන් බව මගේ අදහසයි.

අයවැය ලේඛනය සම්බන්ධයෙන් විරුද්ධ පැත්තෙන් ඉදිරිපත් කළ සෑම තර්කයකටම පිළිතුරු දෙන්න මේ සීමිත කාලය තුළදී පුළුවන්කමක් නැහැ. මට අහන්න ලැබුණා, විරුද්ධ පක්ෂයෙ ඇතැම් මන්ත්‍රීවරුන් කියන්න ඇහුණා

බව, කර්මාන්තයක් වශයෙන් අප බොහෝ දුරට කල්පනා කර ඇත්තෙ උප්පත්ති පාලනය ගැන පමණක්ය කියා. මම හිතන අන්දමට ඒකත් ඉතා වැදගත් ප්‍රශ්න යක්. රජය පුරෝගාමීව කටයුතු නොක ළත් මේ රටේ සුභ සිද්ධිය, මේ රටේ ආර්ථික හා සමාජික අභිවෘද්ධිය ප්‍රාර්ථනය කරන යම් දේශප්‍රේමී කොටසක් සිටිනවා නම් පෞද්ගලික වශයෙන් හෝ කල්පනා කර බලන්න ඕනෑ, මේවා සම්බන්ධයෙනුත් කුමක් කරන්න ඕනෑද කියා. යම් විධිය කින් මිළඟ සංගණනය ඇති වුණොත්, මේ රටේ ජනගහනය කොපමණද කියා ගණන් ගන්න අවස්ථාවක් ලැබුණොත්, මා හිතන අන්දමට සීඝ්‍ර ලෙස ජනගහනය වර්ධනය වී තිබෙනවා පමණක් නොවෙයි, ස්ත්‍රී පුරුෂ දෙපක්ෂය ගෙන බැලුවොත් පුරුෂ යින්ට වඩා ස්ත්‍රීන්ගේ සංඛ්‍යාව වැඩි වී තිබෙන බවත් පෙනී යනවාට අනුමානයක් නැහැ. යම් විධියකින් එබඳු තත්ත්වයක් ඇති වුණොත් ඒකම ඇති අපට මේ උත් පත්ති පාලනය ගැන කල්පනා කරන්න. එසේ නොකළොත් සමහර විට ඒ කාලය වන විට දැනට තිබෙන සමාජ නීති වෙනස් කර, ඊජිප්තුව, අරාබිය ආදි රටවල මෙන් බහු භාර්යා සම්පත මේ රටේත් නීතිගත කරන්නට සිදු වෙනවා. ඊයේ පෙරේදා ලුනාව කියන ප්‍රදේශයේ සිදු වුණාය කියන කරුණු අනුව කල්පනා කර බලන විට, එසේ බහු භාර්යා සේවනය සඳහා යම් යම් නීති රීති ලංකාවේත් ඇති කරන්නට සිදු වේයැයි මා හිතනවා. එක පුරුෂයකුට භාර්යාවන් දෙ දෙනකු නැත්නම් තුන් දෙනකු තබා ගන් නට පුළුවන්කමක් ලැබෙන්නටත් ඉඩ තිබෙනවා. සමහර විට මේ ශත වර්ෂය—20 වැනි ශත වර්ෂය—අවසාන වන්නට මත් තෙන් ඒ විධියේ සමාජ නීති රීති සම්පා දනය කරන්නටත් සිදු වේවි. එහෙත් නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාටත් මටත් නම් ඒ නීතිවලින් ප්‍රයෝජනයක් ගැනීමේ වරප්‍රසාදය ලැබේයැයි මා නම් හිතන්නේ නැහැ. ඒ කෙසේ වෙතත් අද අධ්‍යාපනය සම්බන්ධයෙන් ගැහැණු-පිරිමි වශයෙන් වෙන වෙනම පාඨශාලා තිබෙන් නා වාගේ ඒ කාලය වන විට ස්ත්‍රීන් හා පුරුෂයන් සඳහා වෙන වෙනම විශ්ව විද්‍යාල හා වෙනත් ආයතනත් පවත්වන් නට පුළුවන්. සමහර විට පිරිමින්ට වෙනම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අබයගුණසේකර මයා.]

පාර්ලිමේන්තුවකුත්, ගැහැණුන්ට තවත් පාර්ලිමේන්තුවකුත් ඇති කරන්නටත් බැරි නැහැ.

මගේ කථාව වැඩිදුර දීර්ඝ කිරීම අවශ්‍ය යැයි මා කියන්නේ නැහැ. එහෙත් අද සාමාන්‍ය මහජනතාවට රජයේ කාර්යාලවලින් ලැබෙන සැලකිල්ල ගැන නම් අපට කොහෙත්ම සන්තෝෂ වන්නට පුළුවන්කමක් නැති බව මා නැවතත් මේ ගරු සභාවට මතක් කරනවා. මේ සම්බන්ධයෙන් පසුගිය වර්ෂයේ අයවැය විවාදයේදී මා යෝජනා කළ විධියට, යම් යම් වැදගත් කාරණා හා නොයෙකුත් ප්‍රශ්න සම්බන්ධයෙන් දුර බැහැර ගම්වල සිට නගරබද රජයේ කාර්යාලවලට පැමිණෙන අසරණ මිනිසුන්ගේ යහපත පිණිස, ඔවුන්ගේ ගමන සඵල වුනාද නැද්ද කියා සොයා බැලීමට, පැරණි කාලයේ මෙන් දුක්ගන්නා රාළලා වශයෙන් කොටසක් පත් කරන හැටියට ගරු මුදල් ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. ඔටත් නොයෙක් කාරණා සම්බන්ධයෙන් රජයේ කාර්යාලවලට යන්නට සිදු වුණත්, අප බලාපොරොත්තු වන විධියට බොහෝ රජයේ සේවකයන්ගෙන් ඒ කටයුතු ඉෂ්ට නොවීම නිසයි, මා මෙසේ කියන්නේ.

අද මේ රටට අවශ්‍යව ඇති එකම දේ නම්, මෙරට ආහාරයෙන් ස්වයංපෝෂණය කිරීමයි. අපට ආහාර, ඇඳුම්-පැළඳුම්, ආවරණ ආදිය අත්‍යාවශ්‍යයි. එහෙත් ඒවායින් මුඛ්‍ය ස්ථානයක් ගන්නේ ආහාරයයි. ඒ ආහාරය අතින් මේ රට ස්වයංපෝෂණය කිරීම සඳහා අපේ අගමැතිතුමා පුරෝගාමීව කටයුතු කරන මේ අවස්ථාවේදී, උභය පාර්ශ්වයේම මන්ත්‍රීවරුන්ගේ සහාය ඒ සඳහා වුවමනා කරනවා. විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන්ගේ "කටින් බතල කොළ සිටුවන" විධියේ ප්‍රතිපත්තියකින් නම් කවදාවත් අපට මේ රට ස්වයංපෝෂිත කරන්නට පුළුවන්කම ලැබෙන්නේ නැහැ. මෙය ජාතික ප්‍රශ්නයක් වශයෙන් සලකා අප කවුරුනුත් කටයුතු කරන්නට ඕනෑ. දේශපාලන වශයෙන් අප අතර කුමන විධියේ ප්‍රභේද තිබුණත්, අපේ රට ඉතාමත් වාසනාවන්ත රටක්. අපට ඉතා හොඳ අග්‍රාණ්ඩුකාරතුමකු සිටිනවා. ඉතාමත් සාධාරණ විධියට කටයුතු කරන, ජාතික සමඟියක් ඇති කරන්නට වෙහෙසෙන අග්‍රාමාත්‍යතුමකු අපට සිටිනවා. ඒ වාගේම, තමුන්නාන්සේ වැනි හොඳ නියෝජ්‍ය කථානායකතුමකුත්, එවැනිම කථානායකතුමකුත් ඉන්නවා. එසේම, හොඳට වැඩුණු, හොඳ ගති ගුණ තිබෙන විරුද්ධ පාර්ශ්වයේ නායිකාවකුත් ඉන්නවා. ඒ නිසා මේ රටේ සමඟිය, සංවර්ධනය ඉතා ඉක්මනින් ඇති කර ගන්නට පුළුවන් වේයැයි මා හිතනවා.

මගේ කථාව අවසාන කරන්නට ප්‍රථම තවත් දෙයක් ගැන සඳහන් කළ යුතුව තිබෙනවා. රෙදි-පිළි සම්බන්ධයෙන් වෙනම අමාත්‍යාංශයක් ඇති කළ යුතුයැයි මේ ගරු සභාවේ කියැවුණා. මේ රටේ මිනිසුන්ගේ ප්‍රයෝජනය සඳහා අත්‍යාවශ්‍ය, ඒ වාගේම ඒ බව ගරු මන්ත්‍රීවරුන් විසින් ප්‍රකාශ කළ, තමුන්නාන්සේලාට හොඳ අවබෝධයක් තිබෙන තවත් කාරණා රාශියක් තිබෙනවා. රෙදි-පිළි සම්බන්ධයෙන් වෙනම අමාත්‍යාංශයක් ඇති කරනවා නම්, ඒ හැම දේකටමත් වෙන වෙනම අමාත්‍යාංශ ඇති කරන්නට සිදු වෙනවා. එහෙත් එසේ කරන්නට පුළුවන්කමක් නැහැ. එහෙත් පේස කර්මාන්තය සම්බන්ධයෙන් විශේෂ සැලකිල්ලක් දක්වා කටයුතු කරගෙන යන මේ අවස්ථාවේදී මා මතක් කරන්ට කැමතියි, අපට අත්‍යාවශ්‍ය රෙදි පිළි තොගය නිපදවනවාත් සමගම අපට කවදත් ඇඳ පැළඳ හුරු පුරුදු වස්ත්‍ර නිෂ්පාදනය කිරීමට පිටරටින් හෝ විශේෂඥයින් ගෙන්වාගෙන ඔවුන්ගේ උපදෙස් ලබාගෙන කටයුතු කිරීම අවශ්‍ය බව. එසේ නැතිව, හාල් හිඟය නිසා හාල් සලාකය අඩුකර බෙදා හැරීමට පියවර ගත්තාත්, ඇඳුම් පැළඳුම් සම්බන්ධයෙන් නම් එවැනි කපන කොටන වැඩ පිළිවෙළක් ඇති කරන්නට පුළුවන් යයි මා හිතන්නෙ නැහැ. කොළඹ ප්‍රදේශයේ "මිනිස්කර්ට්" කියා ප්‍රසිද්ධියක් ලබා තිබෙන කොට ගවුම් ඇන්දවීමේ වැඩ පිළිවෙළක් යෙදුවොත් නම් හුඟක් දුරට අපිට රෙදි පිළි ආනයනය සීමා කරන්ට පුළුවන් වෙයි. මම හිතන්නෙ නැහැ, ගම්බද ගොවි ජනතාවට "මිනි සරොං" එකවත් නොදී "මිනිස්කර්ට්" වලින් පමණක් මේ ප්‍රශ්නය විසඳන්ට පුළුවන් වෙයි කියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සාමාන්‍යයෙන් විනෝදයට අපි මේවා කිව්වත්, ජීවන වියදම් වැඩි වෙන්නෙ ඇයි කියන ප්‍රශ්නය ගැන අපි කල්පනාකාරීව කටයුතු කරන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් නිකම්ම රජයට දෝෂාරෝපනය කිරීම එතරම් සාධාරණ නැහැ.

අපට විශේෂයෙන්ම අවශ්‍ය දෙයක් වන හාල් මේ රටේම නිෂ්පාදනය කර ගන්ට හැකියාවක් තිබෙනව. ගොවීන්ගේ අවශ්‍යතා ගැන අපි අප්‍රමාදව ක්‍රියා කරනවා නම් ඒ වී හිඟය, බත් හිඟය, හාල් හිඟය නැති කර ගන්ට පුළුවන්. මේ පසුගිය දා පේරාදෙණියේ කෘෂිකර්ම පර්යේෂණ යතනය විවෘත කරමින් ගරු අග්‍රාමාත්‍ය තුමා කිව්ව, "එදා මේ රටෙන් හාල් පිටරට ගෙන ගියා නම්, අපනයනය කළා නම්, මේ අද ගන්න පියවර, සංවර්ධන ක්‍රම සාර්ථක ලෙස ක්‍රියාවේ යෙදුවොත් අද අපට හාල් එවන රටවල වැසියන්ගේ පරිහරණය සඳහා ඒ රටවලට හාල් අපනයනය කරන්ට නුදුරු අනාගතයේදී අපට හැකියාව ලැබෙයි" කියා.

මිරිස් නැහැ, රතු ලූනු හිඟයි, පරිප්පු හිඟයි කියන ප්‍රශ්න විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් කිප දෙනෙක්ම ඉදිරිපත් කළා. අද වුණත් මේ රට රතු ලූනුවලින් ස්වයංපෝෂිත බව මා කියනව. රතු ලූනු නිපදවන ගම්මුන් ඒවා කොළ සමග එළ වළු වශයෙන් විකුණනව. ඔවුන් මේවා අල වශයෙන් විකුණන්ට ලැහැස්ති නොවෙන්නෙ ඇයි? මෙහි තිබෙන රහස නම් එළවළු වට රතුලූනු කොළ සමග විකිණීමෙන් ගොවියාට විශාල ලාභයක් ලැබීමයි. එම නිසා උපරිම වශයෙන් රතු ලූනු අල රාත් තලක මිළ සත 50 ක් වත් කළොත්, අද යාපනය ප්‍රදේශයෙන් රතු ලූනු ලංකාවට අවශ්‍ය ප්‍රමාණයෙන් සියයට 70 ක් ලැබෙනව නම්, ඉතුරු සියයට 30 මම හඟුරන් කෙත කොඨාශයෙන් මේ රටට ලබා දෙන්න පොරොන්දු වෙනව. ඒ වගේම මේ රටේ ඕනෑ තරම් මිරිස් උපදිනව. එහෙත් මේ මිරිස් වියළීමේ ක්‍රමයක් හරි හැටියට සකස් කර නොමැති නිසයි, මිරිස් හිඟකමේ ප්‍රශ්නයක් ඇති වී තිබෙන්නෙ. මේ ආදී කරුණු ගැන සොයා බලා කටයුතු කිරීම පරීක්ෂණාගාර භාරව කටයුතු කරන විශේෂඥයින් සතු වගකීමක්. ඇමතිතුමාගේ උපදෙස් අනුව ක්‍රියා කිරීම නිලධාරීන් සතු වගකීමක්.

අවසාන වශයෙන්, මා මෙතෙක් වේලා ඉදිරිපත් කළ කරුණු ගරු මුදල් ඇමතිතුමාගේ විශේෂ සැලකිල්ලට භාජන වේ විය කියා මා කල්පනා කරනවා. මගේ කථාව සාවධානව අසාගෙන සිටි ඔබතුමාට ස්තුති කරන අතරම රෝගීව විශේෂ ප්‍රතිකාර ලබා ගැනීමට පිටරට ගොස් සිටින අපේ ගරු කථානායකතුමාට ඒ කරදර වලින් මිදී වැඩි කල් නොගොස්ම නැවතත් මේ ගරු සභාවට පැමිණ කටයුතු කරන්නට අවස්ථාව ලැබේවායි කියාත් මා ප්‍රාර්ථනා කරනවා.

අ. භා. 12.36

**ටී. බී. සුබසිංහ මයා. (කටුගම්පොළ)**
*(திரு. ரீ. பி. சுபசிங்க—கட்டுகம்பொள)*
(Mr. T. B. Subasinghe—Katugampola)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට ප්‍රථමයෙන් කථා කළ හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමා කිව්වා අද අපේ රටට දුක් ගන්නා රාළ කෙනෙකු පත් කිරීම ඉතාම අවශ්‍ය දෙයක්ය කියා. මට පෙනෙන හැටියට නම් තමුන්නාන්සේ පමණ දුක් ගන්නා රාළ කෙනෙකු තවත් මේ රටේ නැහැ. දිනකට පැය නවය දහය බැගින් දින ගණනාවක් තිස්සේ මන්ත්‍රීවරුන් එක්සිය පණස් දෙනෙකු කියන දේවල් වලට බොහොම ඉවසිල්ලෙන් හරියට නිර්මාණය කළ රූපයක් සේ හිඳගෙන තමුන්නන්සේ ඇහුම්කන් දීම ගැන අප කවුරුත් තමුන්නාන්සේට කෘතඥ වෙනවා.

අප කථා පවත්වන විට අවශ්‍ය දේවල් වාගේම අවශ්‍ය නැති දේවලුත් කිය වෙනවා. එහෙත් අපේ කථාවල මොන අඩු පාඩුවක් තිබුණත්, සමහර වීට ඇහුම්කන් දීගෙන සිටීමට කම්මැළි ගතියක් ඇති වුණත් මේ සභා ගර්භය තුළදී සියළුම ගරු මන්ත්‍රීවරුන් කරන කථාවල වැදගත් කමක් තිබෙනවාය කියා මා විශ්වාස කර නවා. මෙවැනි විවාදයකදී නොයෙකුත් අංශ වලින් නොයෙකුත් අංග සහිත කථා පැවැත්වෙනවා. සමහර ගරු මන්ත්‍රීවරුන් න්‍යාය ධර්ම උඩ, ආර්ථික න්‍යාය ධර්ම උඩ, තමා කථා පවත්වනවා. සමහර ගරු මන්ත්‍රී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුබසිංහ මයා.]
වරුන් තමන්ගේ ගම් ප්‍රදේශවල තමන් ආශ්‍රය කරන ජනතාවට තිබෙන කරදර දුක්ගැනවිලි ආදිය සම්බන්ධ කර කථා පවත්වනවා. මේ ආදී වශයෙන් පවත්වන කථා සියල්ලම එකට සම්බන්ධ කර අපේ කල්පනාවට භාජන කිරීම ඉතාම අවශ්‍ය කාරණයක්ය කියා මා විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අයවැය ලේඛනය දෙස බලන විට අපට එක් කාරණයක් පැහැදිලිව පෙනී යනවා. 1965 වර්ෂයේ පිහිටුවා ගත්තාවූ මේ ආණ්ඩුව වෙනුවෙන් තුන් වන වතාවට අයවැය ලේඛනය ඉදිරිපත් කරන්නට පැමිණෙන විට ගරු මුදල් ඇමතිතුමාට සත්‍යය කුමක්ද, නියම තත්ත්වය කුමක්ද, කියා එදට වැඩියෙන් අවබෝධයක් ඇති වී තිබෙන බව අපට පෙනෙනවා. පළමුවන අයවැය ලේඛනය ඉදිරිපත් කරන අවස්ථාවේදී ගරු මුදල් ඇමතිතුමා අනාගතය ගැන ලොකු විශ්වාසයකින් තමන් කරන්නට යන වැඩ ගැනත්, ඒ වාගේම තමන් ප්‍රශ්න විසඳන්නට යන ආකාරය ගැනත් බොහොම උනන්දුවකින් උද්‍යෝගයකින් කථා කළා. මට මතකයි ඒ දිනවල ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් අපට කට අරින්නටවත් ඉඩක් දුන්නෙ නැහැ. සිය එම ප්‍රශ්නවලට විසඳුම් එතුමන්ලා අතේ තිබෙනවාය යන විශ්වාසය උඩ එදා අපට කට අරින්නවත් ඉඩක් දුන්නේ නැහැ. එදා තිබුණු තත්ත්වය ගැනත්, මේ රටට මුහුණපාන්නට සිදුවී තිබෙන ආර්ථික දුෂ්කරතා ගැනත් සම්පූර්ණයෙන්ම පසුගිය ආණ්ඩුවට දෝෂාරෝපණය කළා. එහෙත් අද, 1967 ඉදිරිපත් කරන ලද මේ තුන් වන අයවැය ලේඛනයෙන් මට පෙනෙන හැටියට ගරු මුදල් ඇමතිතුමා පළමු වතාවට වඩා මධ්‍යස්ථව, සත්‍යය අනුව, රටේ තිබෙන ආර්ථික තත්ත්වය පැහැදිලි කර දී තිබෙනවා. මේ කාලසීමාව තුළ එක්තරා ප්‍රමාණයක වෙනසක් එතුමාගේ සිත තුළ ඇති වී තිබෙන බව එයින් අපට පැහැදිලි වෙනවා.

පළමුවැනි අයවැය ලේඛනය ඉදිරිපත් කළ අවස්ථාවේදී පෙනෙන්නට තිබුණු සෑම වරදකටම ඊට පෙර තිබුණු ආණ්ඩුවට දොස් නැගූ අතර දෙවැනි අයවැය ලේඛනය ඉදිරිපත් කළ අවස්ථාවේ තිබුණු වැරදි ගැන දේශගුණයට දොස් නැගූ බවත්, මේ වර ඉදිරිපත් කළ තුන්වැනි අයවැය ලේඛනයේදී තමන්ට පාලනය කර ගන්නට බැරි—දමනය කර ගන්නට බැරි—විදේශ රටවල ඇති වූ හේතූන් ඉදිරිපත් කරමින් අද ඒවාට දොස් නඟන බවත් අපට පෙනී යනවා. අපට දමනය කර ගන්නට බැරි හේතූන් තිබෙන බව මාත් පිළිගන්නවා. ආර්ථික තත්ත්වය ගැන කල්පනා කර බලන විට එදත් අදත් කවදත් අපට පාලනය කර ගන්නට බැරි, දමනය කර ගන්නට බැරි සමහර හේතූන් තිබෙන බව පිළිගන්නට ඕනෑ. ඒ කොයි හැටි වෙතත්, රටක පාලනය භාරගත් පිරිසක්, රටේ ආර්ථික තත්ත්වය ගැන වග කියන්නට බැඳී සිටින පිරිසක්, වරින්වර තමන්ට මුහුණ පාන්නට සිදු වන නොයෙක් මාදිලියේ ගැටළු ප්‍රශ්න දෙස බලා, තමන්ට පාලනය කර ගන්නට බැරි —තමන්ට දමනය කර ගන්නට බැරි— තමන්ට "කන්ට්‍රෝල්" කර ගන්නට බැරි, හේතු නිසා මේ මේ දේවල් මේ මේ ආකාරයට දුර්වලව හෝ ප්‍රබලව සිද්ධ වී තිබෙනවායයි දුක්මුසු ලීලාවෙන් සිටීම සුදුසු නැහැ. එහෙත් අද අපට පෙනෙන හැටියට නම් අද තිබෙන ආණ්ඩුව එවැනි සවභාවයක් පෙන්වනවා. ආණ්ඩුවට අද එවැනි සවභාවයක් පෙන්වන්නට හේතු වී තිබෙන්නේ එතුමන්ලා කලින් බලා පොරොත්තු වුණු යම් යම් දේවල් ඉෂ්ට නොවීමයි.

මහා මැතිවරණය පවත්වන ලද 1965 අවුරුද්දට පෙරාතුවත්, එම අවුරුද්දේ මහජනයා ඉදිරිපිටට ගිය වේලාවේත්, ඊට පසු බලය ලබාගෙන මේ රටේ ආණ්ඩුවක් පිහිටුවා ගත් අවස්ථාවේත් මේ ආණ්ඩුව අපට නිතර නිතරම කියා සිටියේ අපේ ආර්ථික අවදානම් තත්ත්වයෙන් ගොඩ එන්නට අපට විදේශාධාර ලැබෙනවාය යන්නයි. බලය ලබාගෙන දැන් අවුරුදු දෙකහමාරක් තරම ගත වී තිබෙනවා. ගත වූ ඒ කාල සීමාව ඇතුළත එතුමන්ලා අත් හදා බලා තිබෙන හැටියටත්, ලැබී තිබෙන පරිත්‍යාගවලිනුත්, ආධාරවලිනුත් එතුමන්ලාටම පෙනී ගොස් තිබෙන්නේ මේ රටේ හොඳ ආර්ථික තත්ත්වයක් ඇති කර ගැනීමට නම් කිසිම දවසක විදේශ ආධාර දිගාම බලාගෙන සිටීම නුවණට හුරු නැති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බවයි. විදේශාධාර දෙසම බලා සිටීමෙන් කවදාවත් අපට අපේ ආර්ථිකය ගොඩ නංවාලන්නට බැරිය යන්න දැන් එතුමන්ලාටම පෙනී ගොස් තිබෙනවා. අඩු ගණනේ, එය එසේ බව, එතුමන්ලාගෙන් කොටසකටවත් පිළිගන්නට සිද්ධ වී තිබෙන බව අපට පැහැදිලිවම පෙනෙනවා.

1965 අයවැය විවාදයට සහභාගි වුණු, මා ඉදිරිපිට ආසනවල සිටින ගරු මන්ත්‍රීන් කළ කථාවලින්, ඒ දවස්වල එතුමන්ලාගේ බලාපොරොත්තුව වී තිබුණේ කුමක් දැයි පැහැදිලි ලෙස මට පෙනී ගියා. විදේශාධාරවලින් අපේ ඕනෑඑපාකම් ඉෂ්ට කිරීමට කිසිම සැකයක් නැතිව පුළුවන් වනු ඇතැයි ඒ උදවිය කල්පනා කළා. මට එය මතකයි. එහෙත් ගත වූ අවුරුදු තුන ඇතුළත ඒ විදේශාධාර ලබා ගන්නට උත්සාහ කරන ලද්දේ නම් ඒ උත්සාහය සාර්ථක වීම සඳහා කරුණු කිහිපයක් සිදු විය යුතුව තිබුණු බව ගරු මුදල් ඇමතිතුමාට පෙනෙන්නට ඇති. අපට ආධාර දෙන්නට පෙර කරුණු රැසක් ගැන ඒ රටවල් විපරම් කරන බව පිළිගන්නට ඕනෑ. අප ගෙනයන ප්‍රතිපත්තිය කුමක් දැයි දැන ගැනීම එයින් එකක්. එය ඒ අයට ඉතා වැදගත් දෙයක්. අභ්‍යන්තරව සහ පිටස්තරව අප අනුගමනය කරන ප්‍රතිපත්තිය කුමක්දැයි අපට ආධාර දෙන රටවල් සොයා ගන්නවා. අනෙක, විදේශ ආධාර දෙන රටවල ආර්ථික තත්ත්වයයි. මේ කරුණු දෙක ඉතාමත් වැදගත්. මේ කරුණු දෙක උඩ කල්පනා කර බැලුවාම, අප ගෙන යන ප්‍රතිපත්තිය—අභ්‍යන්තර වශයෙන් මෙන්ම විදේශීය වශයෙනුත්—ඒ ඒ උදවියට වුවමනා කරන අතට නම්මා ගන්නේ නැතිව බැහැ. අනෙක, ඒ රටවලටත් ඉතාමත් බැරෑරුම් ආර්ථික ප්‍රශ්නවලට මුහුණ පාන්නට සිද්ධ වෙලා තියෙනවා. ඒ නිසා පසුගිය අවුරුදු තුන තුළ මේ ආණ්ඩුව බලාපොරොත්තු වුණු තරම් විදේශ ආධාර ලැබී නැත්නම් ඒ ගැන අප පුදුම වන්නේ නැහැ. ඒ ගැන පුදුම වන්නට අපට කිසිම හේතුවක් නැහැ. එහෙත් අපට පෙනෙන හැටියට නම්, අපේ රට සම්පූර්ණයෙන්ම විදේශ ධනයට යට වන ආකාරයට, අපේ ස්වාධීනත්වයට පවා කැළලක් ඇති වන ආකාරයට, විදේශාධාර බලාපොරොත්තුවෙන් අපේ ප්‍රතිපත්ති ඕනෑ හැටියකට වෙනස් කළ යුතුයයි කියන එක්තරා කොටසක් ඇත් නම් ආණ්ඩුව ඇතුළේ ඉන්නවායයි හිතා ගන්නට තරම් ලකුණු තිබෙනවා. තවත් කොටසක් ආණ්ඩුව ඇතුළේ ඉන්නවා. "අපි විදේශ ආධාර ලබා ගනිමු; එහෙත් අපේ රටේ සහ අපේ ජාතියේ ස්වාධීනත්වය කෙසේ හෝ ආරක්ෂා කර ගැනීමට උත්සාහ කරමු," යන්නයි ඒ අයගේ ප්‍රතිපත්තිය තේරුම් ගැනීමට පුළුවන් ලකුණක් හැටියට ඒ අය කියන්නේ.

සමහරුන් International Development Association වැනි සමිති සමාගම්වලින් ණයට මුදල් ලබාගෙන වැඩ කරගෙන යාමේ බලාපොරොත්තුවෙන් අපේ අභ්‍යන්තර ආර්ථික ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන් වෙනස් කරන්නට තැත් කරන බව අපට පෙනෙනවා. මා හිතන පිළිවෙළට ගාල්ලේ තනන්නට යන ධීවර වරාය සම්බන්ධයෙන් එවැනි තත්ත්වයක් ඇති වුණා. වුනා බෝට්ටු මාර්ගයෙන් ගැඹුරු මුහුදේ මසුන් මැරීම සඳහා ගාල්ලට එවැනි ධීවර වරායක් අවශ්‍ය නැත, ජපානය දකුණු කොරියාව වැනි රටවල් ඉන්දියන් සාගරයේ එවැනි මසුන් මැරීම් කරනවාය කියා සමහරුන් විසින් තර්ක කරන්නට යෙදුණා. ඒ අදහස වෙනස් කර ප්‍රංශ විශේෂඥයන් මාර්ගයෙන් අද ගාල්ලේ ධීවර වරායේ වැඩ කටයුතු කරගෙන යාම ගැන මා ඉතාමත්ම සන්තෝෂයි. මේ විධියේ භේද මේ අය අතර තියෙනවා. අප ගොවි කර්මාන්තය සම්බන්ධවම අපේ උනන්දුව තදින් දක්වන අතර, දැනට ආණ්ඩුව මගින් කරන්නට පටන් ගෙන තිබෙන කර්මාන්ත පමණක් ආණ්ඩුව මගින් ගෙන යා යුතුය, අළුතෙන් කර්මාන්ත ආරම්භ කිරීම විදේශිකයන් සමග එකතු වී කිරීමට පෞද්ගලික ධනපති කොටස්වලට පැවරිය යුතුය කියන කොටසක් සිටිනවා. කර්මාන්ත ඇමතිතුමා මෙයින් මොන ප්‍රතිපත්තියක් පිළිගන්නවාද කියා මා දන්නෙ නැහැ. කෙසේ වෙතත් අය වැය ලේඛනය දෙස බලන විට නම්, ආණ්ඩුවේ යෝජනා දෙස බලන විට නම්, අපට පෙනෙන්නෙ නැහැ, ආණ්ඩුව විසින් කරගෙන යන කර්මාන්ත කොටස පළල් වන විධියේ ලකුණු තිබෙනවාය කියා. විදේශීන් සමග සම්බන්ධ වී කෙරෙන පෞද්ගලික කර්මාන්ත නම් පළල් කිරීමට සෑම වෑයමක්ම දරණ බව පෙනෙන්නට තිබෙනවා. මෙවැනි තත්ත්වයක් දිගටම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුබසිංහ මයා.]
ඇති වන්නට ගියොත්, විදේශීය ධනය දිගින් දිගටම මේ රටට ගලාගෙන ඇවිත් කාලයක් යන විට මේ රටේ ස්වාධීනත්ව යට තර්ජනයක් ඇති වන්නට ඉඩ නැද්ද? අප කොයි තරම් කොන්දේසි දැම්මත්, විදේශීය ධනපතීන් සහ ස්වදේශීය ධන පතීන් එකතු වී මේ රටේ පළල් විශයෙන් කර්මාන්ත ආරම්භ කරන විට වෙන රට වල සිදු වී තිබෙන්නා වාගේ, ඒ ධනපති කොටස් අතර සම්බන්ධත්වය තදින් තහ වුරු වෙලා, ඒ අයගේ අදහස් උදහස්වල එකගත්වයක් ඇති වෙලා, ඒ අයගේ දේශපාලන අදහස්වලත් එකගත්වයක් ඇතිවෙලා ඒවා එක පැත්තකටම බරවෙලා භයානක තත්ත්වයක් ඇති වන්නට ඉඩක් නැද්ද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමහරුන් කියනවා. හොංකොංවල වගේ, පෝටොරිකෝවල වගේ අපේ රටෙත් කර්මාන්තවලට සම්පූර්ණයෙන්ම දොර හැර තබන්නට ඕනෑය කියා; කර්මාන්ත වැඩි දියුණු වීමට ඉඩ හරින්න ඕනෑය කියා. මේ ප්‍රතිපත්තිය අප අනුගමනය කළොත්, අද අපේ ආර්ථික තත්ත්වය සම්බන්ධ යෙන් තියෙන විදේශීය බලපෑම් උඩට තවත් අළුත් බලපෑම් ඇති වුණොත් අනාගතයේදී අපේ ස්වාධිනත්වයට පහරක් වදිනවාට කිසිම සැකයක් නැහැ. මේ ගැන විරුද්ධ පාර්ශ්වයේ සිටින අපට විශාල භයක් තිබෙන බව මා ප්‍රකාශ කළ යුතුයි. අපට පෙනෙන හැටියට ආණ්ඩුවේ ආර්ථික විශේෂඥයන්ට පවා—උපදේශක යන්ට පවා—මේ ප්‍රශ්නය තවම හරියාකාර වැටහිලා නැහැ. වෙන රටවලට එල්ල වී තිබෙන තර්ජන අනාගතයේදී මේ රටටත් එල්ල වීමට ඉඩ තිබෙන බව ඒ අයට තවමත් වැටහිලා නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය අවුරුදු 3 තුළ මේ ආණ්ඩුව විසින් ආර්ථික ක්‍රමය දියුණු කිරීමට යොදා තිබෙන වැඩ පිළිවෙළවල් උඩ මේ ආණ්ඩුව විසින් යොදනු ලබන ප්‍රාග් ධනය වැඩි වීම ගැන මුදල් ඇමතිතුමා ඉතා සන්තෝශයෙන් අපට කියනවා. යොදවන ප්‍රාග් ධනය සෑම අයවැය ලේඛනයකින්ම වැඩි වී තිබෙන ආකාරය පෙන්වා දී තිබෙනවා. 1965-66 වර්ෂයේදී වියදම් කළ මුදල රුපියල් ලක්ෂ 5,290 යි. එහෙත් වෙන් කරන ලද මුදල නම් ඊට වැඩියි. 1966-67 වර්ෂයේදී වියදම් කළ මුදල රුපියල් ලක්ෂ 5,960 යි. 1967-68 වර්ෂයේදී යොදවන්නට බලා පොරොත්තු වන මුදල රුපියල් ලක්ෂ 6,660 යි. ඉලක්කම් දෙස බලන විට නම් මෙය විශාල ප්‍රමාණයක් හැටියට සලකන්නට පුළුවනි. අවුරුදු පතා මුදලේ වැඩි වීමක් තිබෙනවා. එහෙත් ඇත්ත වශයෙන්ම පසු ගිය කාලයේදී මෙයින් ලැබී තිබෙන ප්‍රයෝජන මොනවාද?

ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්තාවලින් සහ වෙන අනෙක් වාර්තාවලින් නම් අපට පෙනෙන්නේ අපේ ආර්ථිකයට ඒ තරම් වෙනසක් සිදු වී නැති බවයි. අවුරුද්දෙන් අවුරුද්ද ආණ්ඩුව යොදන ප්‍රාග්ධනය වැඩි වූ පමණින් අප රැවටෙන්නට හොඳ නැහැ. ආණ්ඩුව යොදන මුදල් වැඩි වූ තරමටම අපේ ආර්ථික ක්‍රමය පළල් වෙනවා යයි සිතා රැවටෙන්නට හොඳ නැහැ. අපේ ආර්ථික ක්‍රමය පළල් වන බව, දියුණු වන බව සිතා පුහු නිගමනවලට බැසීම නුවණට හුරු නැහැ. පසුගිය අවුරුදු විස්ස, විසිපහ තුළ අවුරුදු පතාම ආණ්ඩුව යෙදූ ප්‍රාග්ධනය වැඩි වී තිබෙනවා. ඒ වගේම නිෂ්පාදන භාණ්ඩ එක්තරා ප්‍රමාණයකට වැඩි වී තිබෙනවා. එහෙත් අපට අවශ්‍ය තරමට භාණ්ඩ නිෂ්පාදනය වැඩි කර ගැනීමේ වේගයක් ඇති කර ගන්නට පුළුවන් වී නැහැ. පසුගිය අවුරුද්දේ යෙදූ ප්‍රාග්ධනයට වැඩි ප්‍රමාණයක් මේ අවුරුද්දේ යොදවනවා යයි කියමින් අප සතුටු වන්නට පෙර අද පිටරටින් ගෙන්වන බඩුවල මිළ කෙතරම් නැඟ තිබෙනවාද, මේ රටේ ප්‍රාග්ධනය වශයෙන් යොදවන භාණ්ඩවල මිළ කොපමණ නැඟ තිබෙනවාදැයි අප කල්පනා කරන්නට ඕනෑ. ඇත්තෙන්ම ඒ භාණ්ඩවල මිළ කීප ගුණයකින් වැඩි වී තිබෙන බව අප පිළිගත යුතුයි.

තවත් කාරණා කීපයක්ම තිබෙනවා. අද අපේ දෙපාර්තමේන්තුවල පවත්නා දුර්වල කම් නිසා, අපේ පරිපාලන යන්ත්‍රයෙහි පවත්නා දුර්වලකම් නිසා අප කොපමණ කෝටි ප්‍රමාණයක ධනයක් යෙදවීමට වැඩ කටයුතු සැලැස්සුවත් වෙන් කරන ප්‍රමාණයෙන් කොටසකට වඩා යොද වන්නට බැරි වෙනවා. නිතරම "අන්ඩර් එක්ස්පෙන්ඩිචර්" ඇති වෙනවා. හොඳයි, යෙදූ වූ මුදල් ප්‍රමාණය හෝ නියම විධියට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යෙදැවී තිබේදැයි අප කල්පනා කරනවාද? අවුරුද්දකට රුපියල් කෝටි 59 ක් හෝ 60 ක් හෝ වියදම් කළ බවට ගණන් හිලව් පෙන්වන විට පරිපාලන යන්ත්‍රයෙහි තිබෙන දුර්වලකම් නිසා ඒ මුදලෙන් සියයට කීයක් අපතේ යන්නට ඇද්දැයි අප කල්පනා කර බලනවාද? පරිපාලන යන්ත්‍රයෙහි දුර්වලකම් රාශියක් තිබෙනවා. පිටරටින් බඩු ගෙන්වන විට වැඩි මිළක් ගෙවන්නට සිදු වෙනවා. සමහර විට අපේ නිලධාරීන් සමඟ තිබෙන සම්බන්ධතා උඩ පිටරටින් ගෙන්වන බඩු සඳහා ඕනෑවට වැඩි මිළක් ගෙවන්නට සිදු වෙනවා. ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවට සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ආණ්ඩුවෙන් වෙන් කරනු ලබන මුදල්වලින් සැලකිය යුතු කොටසක් අනියම් පිළිවෙළට පුද්ගලයන්ගේ සාක්කුවලට යනවා නේදැයි අප කල්පනා කර බලනවාද? මේවා සුළු දේවල් නොවෙයි. [බාධා කිරීමක්] මීගමුවේ ගරු මන්ත්‍රීතුමාට තව හුඟක් කරුණු ඉගෙන ගන්නට තිබෙනවා. ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේත්, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේත් කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් ඒ කොන්ත්‍රාත්කාරයන් ගණන් හිලව් ඉදිරිපත් කරන්නේ අනියම් මාර්ගවලින් යම් යම් උදවියට ගෙවන්නට තිබෙන ගාස්තුද ඇතුළත් කොට නොවේදැයි තව ටික කලක් සිටින විට මීගමුවේ ගරු මන්ත්‍රීතුමාට පවා හොඳට දැන ගන්නට ලැබේවි. යම් යම් පුද්ගලයන් මේ රටේ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සමහර ඉංජිනේරුවන්ට, සමහර ඕවර්සියර්වරුන්ට, තව තවත් අයට මාස්පතා මුදල් ගෙවන්නේ ඒ පුද්ගලයන්ට අවාසියක් සැලසෙන නිසාද? වාසියක් නැත්නම් ඒ විධියට මුදල් ගෙවන්නේ මොකටද? කරුණාකර කාලයක් ඔය විධියට සිට දෙපාර්තමේන්තුවල කෙරෙන වැඩ ගැන ටිකක් සෝදිසි කර බලන ලෙස මා ඒ ගරු මන්ත්‍රීතුමාට මතක් කරනවා. අර අවුරුද්දේ මෙපමණ මුදල් ගණනක් යෙදූ බව, මීට පෙර අවුරුද්දේ මෙපමණ මුදල් ගණනක් යෙදූ බව හා මේ අවුරුද්දේ මෙපමණ යොදන්නට යන බව ඉලක්කම්වලින් කොපමණ පෙන්නුවත් ඒ යෝජනා කළ හා යෝජනා කරන ප්‍රමාණය නොයෙදවෙන බව අප දන්නවා. එසේ හෙයින්, යොදවන ධනය අවුරුදු පතා වැඩි කළත් ඒ යොදවන ධනයෙන් අපේ ආර්ථිකයෙහි සැලකියයුතු වෙනසක් ඇති වෙතැයි විශ්වාස කරන්නට අපට පුළුවන්කමක් නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Order, please!

The Sitting is suspended for half an hour.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින් අ. භා. 2 ට නැවත පවත්වන ලදී.**

அதன்படி அமர்வு பி. ப. 2 மணிவரை இடைநிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று.

*Sitting accordingly suspended till 2 P.M. and then resumed.*

**සුබසිංහ මයා.**
*(திரு. சுபசிங்க)*
(Mr. Subasinghe)

Mr. Deputy Speaker, before lunch I was referring to the magnitude of capital expenditure that is progressively being undertaken by this Government. I referred to this particularly because there is an attempt on the part of the Government, and by the propagandists of the Government, to give the impression to the country that the rising magnitude of capital expenditure undertaken by the Government is going to make a very substantial difference, and that the people can expect great things in the future. That is why I pointed out that in referring to these figures we got to bear in mind a number of factors which seem to be only too often forgotten.

Firstly, there is the tremendous increase in prices of imported capital goods and in local costs that has been a feature over the years. Secondly, under the contract system, for long years it has been the accepted practice—however much we may try to check it—partly because of certain false standards we have accepted and partly deliberately to inflate the costs. A system of inflating costs in the making up of estimates has become a

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුබසිංහ මයා.]

common practice. Thirdly, no Government has yet been able to eliminate the corruption that has crept into, particularly, the spending departments, the construction departments.

Therefore, if we want to get the best value for each rupee that we spend, whether it be in capital expenditure or otherwise, there should be a thorough transformation of the administrative apparatus. And unless there is a possibility of harnessing the best enthusiasm of the people in the work of government, all these figures mean nothing and the return for the money we invest will continue to remain small. You should go through the figures over the years, not only during the period of this Government but even in the time of previous governments.

In Ceylon the input-output ratio, or what I might in simple terms describe as the return for our money, has been very low. I think the major reason for these low returns is the fact that co-ordination between departments, the attitude and the response of the people in the administration, have not been geared to the real needs of economic development in this country. That is one of the biggest tasks we have to face. Therefore I venture to say that, no matter how optimistic the Hon. Minister of Finance may sound to be regarding the magnitude of capital expenditure, every year that passes we will see that the results are not worth the effort we have put in. The Finance Minister in his Budget speech says :

"Mr. Deputy Speaker, there is no doubt that the urgent task before this country and before any government in this country is to increase the pace of economic development, so that it may keep ahead of the rate of increase of population. There is unemployed manpower on the one hand and unexploited resources on the other, indicating the need and scope for greater development activity. The pace of economic development depends largely on the rate of investment."—[OFFICIAL REPORT, 25th July 1967; Vol. 73, c. 64.]

Mr. Deputy Speaker, substantially this is correct. Of course I do not agree with the view that the aim of economic development by bringing human and natural resources together is just to keep ahead of the growth of population. I think our aim or our purpose or our objectives in economic development should be much wider. It is not only to keep ahead of the rate of growth of the population. If that be the only purpose, the only aim, then our economy would be merely a subsistence economy. We on this side of the House think that economic development means much more than that. It means an ever rising standard of living for the people in the material sense ; it also means the cultural and spiritual development of the people. Therefore, the rate of economic growth that we have to attain must be something very much higher than what we have been able to attain up to date.

I quite agree with the Hon. Minister of Finance when he says that there has to be a correct combination between the natural resources available to us and the manpower resources. But I should like to ask the Hon. Minister—after all, he acts in an advisory capacity in all matters concerning economy in respect of the functions of all departments—in combining these resources, in the manner in which this Government has conducted itself since it came to power, in harnessing the manpower resources of this country to production and to the contribution to further development of wealth, can we by any stretch of imagination say that it has been done either rationally, fairly or correctly ?

Many hon. Members of this House have spoken about the irregular and irrational manner in which manpower resources have been utilized. You say that you want to improve the efficiency of your corporations. You say that you want to improve the quality of your administration. You say that you want to get the best out of your institutions in the matter of economic development. But the manner in

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

which you recruit officers to your departments, the manner in which you victimize people although they are extremely able workers, the manner in which nepotism is practised by your Government leaves much to be desired. It is not only we who are pointing this out; even Members on your side are saying the same thing. Your newspapers are also saying it.

Take, for instance, the recent news about the resignation of the Chairman of the Insurance Corporation. The same thing happens in many other places. If the Hon. Minister of Finance is really interested in harnessing the manpower and material resources in the most rational, efficient and economic manner and is serious about economic development, he cannot allow this kind of thing to happen. But, unfortunately, that is the kind of thing that seems to be on the ascendancy, while efficiency, fairplay and justice are brushed aside. How can any government claim to be serious about economic development whilst allowing that kind of irregular conduct to prevail in their departments and institutions?

Mr. Deputy Speaker, the other day, in the course of the Debate on the Throne Speech, I raised a certain point. The present Government is laying great emphasis on food production. I am not for a moment saying that that is wrong. I only hope that the attention they pay to agricultural development will be a balanced one in relation to industrial and other spheres. In the course of the Debate on the Throne Speech, I wanted to know from the Prime Minister whether he really believes that by 1970 this country will be self-sufficient. The Hon. Prime Minister denied that he ever said that, and so did the Minister of Agriculture and Food. Now, surely, the Prime Minister cannot say one thing in this House and another thing elsewhere? The other day, addressing some youth league or election workers in the Bandaragama constituency he had said, that by 1970 we expect to be self-sufficient in rice.

**ඩී. බී. වෙලගෙදර මයා. (ජනසතු සේවා ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. டீ. பீ. வெலகெதர—தேசிய மய சேவை அமைச்சரின் பாராளுமன்றக் காரிய தரிசி)*

(Mr. D. B. Welagedera—Parliamentary Secretary to the Minister of Nationalized Services)

We hope to be.

**සුබසිංහ මයා.**

*(திரு. சுபசிங்க)*

(Mr. Subasinghe)

All right, I will come to that. The other day, in Peradeniya, the Prime Minister had even gone to the extent of suggesting that in a few years we will be in a position to make use of rice as a foreign exchange earner. Excellent, if you can do it in a matter of a few years. Excellent, if you can do it even in a decade. We are entirely with you if you can.

I remember the Prime Minister making a speech on the occasion of the opening of that new hotel in Hikkaduwa a few months ago. He said that one day tourism will take the place, as a foreign exchange earner, of tea. I want to know whether the Prime Minister makes these statements with a due sense of responsibility. If we look at the agricultural plans of this Government, do we see any element which makes us accept his view that in a matter of a few years, three years, this country can be self-sufficient in rice? What is the element in their programme, what is the factor that gives us confidence?—[*Interruption*]. Reading his speeches, it appears to me that the only thing that they depend on for making this country self-sufficient in rice in a matter of three years, is this so-called miracle paddy, H4. H4 seems to be the only factor that gives them hope because it is supposed to have a high yield. Now, the Hon. Minister of Land says that there is another variety that gives a still higher yield, IRR8. They are depending entirely on this miracle seed paddy to make this country self-sufficient in rice.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුබසිංහ මයා.]

Ever since 1931, since the introduction of the Donorghmore Constitution the responsibility for the development of agriculture has been in our hands. Actually, the predecessors of the very people who are determining policy today were responsible. Ever since 1931, if you tot up the capital investment in agriculture in this country over the years, you will see that it amounts to a few thousand million rupees. I have not been able to work it out. In fact, it should offer a good field of study for an economist.

We have expended so much on the development of agriculture. I am not condemning it. Some magnificent works of irrigation have been accomplished during these years. Large acreages of land have been brought under the plough. A large number of families have been settled on those new lands, and lands that were once malaria-stricken have today become quite healthy areas. I grant that. There has also been a certain addition to output of agricultural production. That is also granted. But one simple question I would pose before those who are responsible for this policy is: Considering the amount of investment, can we on this side of the House, or you, in fairness to the people of this country, be satisfied with the returns we have got ? Once again I repeat, that is an extremely rich field for research that could be undertaken by an economist. I hope that will be undertaken by one of our research scholars in the university.

My impression from the experience gathered over the years is that after nearly 36 years of effort we have only turned the half-way corner. That being so, and your policies and your plans today not being fundamentally different to those you have been adopting during the past 36 years, what is the guarantee, or with what confidence do you say, that in a matter of three years this country will become either self-sufficient or nearly self-sufficient in rice ? That is the question I am posing. All that I can see is your miracle rice plus the appointment of additional Government Agents to the provincial kachcheris. I shall explain this fully. Please do not for a moment think that we are against any endeavour that you may make to achieve self-sufficiency in food or increase the yield of paddy. If you can find a miracle seed paddy do get it and use it before you make a statement or promise the people that you will be able to make this country self-sufficient by 1970 and that by next year you will be able to restore the cut in the rice ration, and give that one measure in country rice. I think we have every reason to ask you, please show us how you are going to do it ?

One of the new elements in the programme of food production is of course the alienation of crown land, the virgin land in Mahiyangana and certain other areas, to capitalist companies and individuals. I am not going to deal with that matter now for I have already dealt with it before, but I am sure that the other speakers who will follow me will deal with it.

The biggest acreage under rice cultivation in this country is made up of smallholdings. There are two types of smallholdings, one in the colonization schemes and the other in the *purana* villages like ours. In the colonization schemes what is the situation today ? I am not going into the haphazard manner in which the cultivators are selected. In fact, we have already received complaints from various quarters in the Uda Walawe. For instance the Hon. Minister of Land, Irrigation and Power is packing that place with people from a certain area. These complaints are coming to us but I am not going into them. We have been very unselective in the selection of allottees. That is one matter. Secondly, in regard to the lands in those areas they were really intended to be alienated by the Crown to tenants, where the State maintains perpetual ownership and the cultivator is treated only as a tenant in

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

perpetuity. In actual practice what happens? From the point of view of the Land Development Ordinance that relationship is there, but because of various situations, various reasons, sometimes maybe due to the inefficiency of the allottee, or to the growing indebtedness of the allottee or due to utter neglect, these lands under the colonization schemes are for all intents and purposes mortgaged to the big *mudalalis* in the towns. In some cases the allottee has become the share-cropper. I am sure that many of the Members of Parliament who come from these areas will bear me out.

Under these circumstances, how can you expect the cultivator to take to modern and efficient methods of cultivation? Corruption has crept in, irregular transfer of lands takes place in these schemes sometimes with the connivance of responsible officers. In this unsatisfactory state of affairs, in spite of the fact that the Government may be prepared to give more loans, provide more tractors and provide better seed paddy until that social and economic foundation is completely reformed, thoroughly altered and changed, the return from better fertilizer, better seed paddy and more tractors will be the minimum. You will not be able to get the maximum. When you think in terms of new agricultural plans for quick self-sufficiency, these are some of the major factors that need consideration. The social and economic foundations of these schemes have to be gone into. I would request the Hon. Minister of Land, Irrigation and Power to appoint a commission, in the same way that commissions are being appointed in other fields, to go into the whole question of the land alienation policy and the colonization schemes in this country. If you want to get the best out of the land, these colonization schemes have to be reorganized completely. It is not for me to suggest how. It is a matter that experts will have to go into. This is a matter that has to be considered fully.

**ගරු සී. පී. ද සිල්වා**
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

We appointed one in Gal Oya under Mr. Farmer.

**සුබසිංහ මයා.**
(திரு. சுபசிங்க)
(Mr. Subasinghe)

I want you to probe every colonization scheme because it is a major factor in the development of agriculture in our country.

In regard to the *purana* villages, see what is happening in the North-Western Province. It is true that kachcheris have been provided with more officers; it is true that you are sending down instructions from here that you are in consultation with the kachcheri officers and the kachcheri officers are in consultation with the D. R. Os. They have regular conferences, meetings, and so on. They tot up the acreages and say, " In the coming year we will be producing so much paddy ". Those statistics are there.

Speaking of statistics, let me tell you something that happened within my personal knowledge. In a certain area, a responsible official of the Co-operative Department was instructed by the Ministry of Agriculture and Food, which is in charge of co-operatives, to prepare himself to provide the financial facilities to the co-operative societies to buy up the produce of an additional 400 acres of chillies. These instructions were sent. The man, a very conscientious officer, being rather sceptical about the information the Ministry had received, himself made it a point to go round the district to ascertain whether the acreage given was accurate. He went and questioned the people in these villages. To his utter surprise he found that the cultivators had not cultivatd new land to any considerable extent beyond what they had cultivated the previous year. But the report to the people at the top was that there were 400 acres of additional land. The production would have been tremendous!

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා (අගලවත්ත)
(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா—அகலவத்த)
(Dr. Colvin R. de Silva—Agalawatta)

The yields will also be reported in due course.

සුබසිංහ මයා.
(திரு. சுபசிங்க)
(Mr. Subasinghe)

Why does this happen? Inexperienced field officers, very indifferent to their work, sometimes not even knowing the area in which they are working, get on to their bicycles with some paper write down some figures from imagination, add them up, and send them. And you build your plans and hold out promises to the people for the future on the basis of those figures. I am not saying that that is the general rule, but what I do maintain is that the correct machinery has still not been set up in this country to link administration with the people who are actually in the fields cultivating. You have failed in that.

ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.
(திரு. டென்சில் பெர்னாண்டோ)
(Mr. Denzil Fernando)

You had also not done that for nine years.

සුබසිංහ මයා.
(திரு. சுபசிங்க)
(Mr. Subasinghe)

That is all you have to say. You are the people who promised us panaceas. You promised to make this country a heaven on earth.

ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.
(திரு. டென்சில் பெர்னாண்டோ)
(Mr. Denzil Fernando)

We will do it.

සුබසිංහ මයා.
(திரு. சுபசிங்க)
(Mr. Subasinghe)

I wish you were capable of providing a few more *catamarans* for your fisher-folk in Negombo. Since this Government came into power, you have restricted credit for the purchase of outboard motors to your fishermen. Those engines for which the fishermen have failed to pay even one month's instalment are being seized today. During the last Government that never happened. You had better correct these things before you speak about agriculture here.

Mr. Deputy Speaker, there is the real problem now in our villages. It is true that out of necessity there has been an attempt by our cultivators to cultivate two seasons. But, if the Hon. Prime Minister dares to say that the Yala season of 1967 is going to produce the biggest yield in this country ever, he is making a mistake, because I know that the entire N. C. P. lands are dry today. In the North-Western Province the Yala crop is already a failure.—[*Interruption*]. I know, Mr. Deputy Speaker, in the Polgahawela area the land is fertile and there is no water problem there. There is a perennial water supply there. I challenge, when the harvest is collected—[*Interruption*]—Sir, what can I do with this man?

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Ignore him.

සුබසිංහ මයා.
(திரு. சுபசிங்க)
(Mr. Subasinghe)

Mr. Deputy Speaker, when the harvest is collected we can argue about the figures.

Today, in spite of cultivation committees and in spite of the promises of assistance, I do not see any extraordinary enthusiasm amongst the cultivators. You may say that we are prejudiced, but for the last two months or so I have been going to different parts of the country trying to find out the true position. I certainly would like the people to be

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

more enthusiastic. The question is whether all the measures taken and all the promises that have been given, have in any way brought about any extraordinary enthusiasm for the people to get down to the field and cultivate.

In many areas, the real problem is that the holding is so small that it is not economic to cultivate, with the result that the cultivator cannot take to cultivation as a full-time occupation or gainful occupation. The man has to work in the adjoining estate or the adjoining fibre mill or the desiccated coconut mill whereby at the end of the week he can get a wage, with the result that the man cannot devote all his attention to agriculture as a full-time occupation because his income is inadequate.

The other point is that these lands are fragments and are uneconomic to cultivate. There are disputes regarding title ; undivided shares provide no security ; as a result of disputed ownership many acres remain uncultivated. There are various other problems like that, of a social and economic character, which this Government, and I would say other governments have not touched.

Here are the people who have been in charge of this business for so many years since 1956. What has my Friend, the Hon. Minister of Land, Irrigation and Power, done to correct these shortcomings in the villages ? Unless you provide the cultivator with an economic holding in the *purana* villages, unless you give security of title, no matter how much money and no matter how much fertilizer you may pump into it, you will not get the best results. These are the elementary things you must attend to first.

Now, Mr. Deputy Speaker, I must say something about credit facilities. You have now introduced this scheme to extend credit from the bank through co-operative societies to the farmer. Can this be done ? I know, in our own area, after giving due notice and after asking the cultivators who desire these loans, at the end of two weeks we found only 100 applicants. Why ? It is not because the people are not in need of credit but because they dare not take these loans at this exorbitant rate of interest of 12 per cent., specially with the uncertainty of the weather and the uncertainty of harvests they dare not enter into agreements to pay back a loan at 12 per cent.

මෙහිදී මා " මේ ගරු සභාවේ හිත් " යනුවෙන් කීවත්, එය මට වුණු වැරදීමක් විය හැකියි. මෙම ගරු සභාව තුළ ගරු මන්ත්‍රීවරුන් දෙතුන් දෙනකුට වඩා නොසිටි අවස්ථාවකදී මෙම සභා ගර්භය තුළ බෙහෙවින් පැවති හිස් බව පෙන්වා දෙමින් පසු ගිය දවසක තමුන්නාන්සේටම එක්තරා ප්‍රකාශයක් කරන්නට සිදු වුණු බව මා මෙහි නොසිටියත් පුවත්පත්වලින් මට දැනගන්නට ලැබුණා. ඇත්ත තමයි. යම් කෙනකු කිසියම් වාදයකට විවාදයකට සහ භාගි වීමේදී හිස් බංකු පුටුවලට කථා කරන්නට සිදු වීම ඔහුගේ හිත අධෛර්යමත් වීමට හේතුවක් වෙනවා. මෙවැනි වැදගත් විවාදයක් සිදු වන මේ අවස්ථාවේදී ආණ්ඩු පක්ෂයේම ගරු මන්ත්‍රීවරුන් සභා ගර්භය තුළට ඒ විධියට නැවිත් සිටින්නේ, මෙම රටේ අනාගත ඉරණම තීන්දු වන්නේ මෙම සභාව තුළ නොවන බව ඔවුන් විසින්ම පිළිගන්නා නිසායයි මා විශ්වාස කරනවා. මෙහිදී අප විසින් කළ යුතුව තිබෙන එකම කටයුත්ත, කර්තව්‍යය, වන්නේ මේ වේදිකාව පාවිච්චි කරමින්, මේ රටේ අනාගත ඉරණම පිළිබඳව ස්ථිර තීන්දුවක් වැඩි කල් යන්නට පෙර ඇති කර ගැනීම සඳහා මහජනතාවට තේරෙන භාෂාවෙන්, ඔවුන්ට ඇඟෙන විධියට කා වදින විධියට කරුණු ඉදිරිපත් කොට ඔවුන්ගේ එම තීන්දුව දීම සඳහා මාර්ගය හැදීමයි. එම නිසා අනෙක් මන්ත්‍රීවරුන් මෙම සභාව තුළට පැමිණ සිටීම හෝ නොසිටීම හෝ ගැන මට නම් කිසිම අධෛර්යයක් ඇති වන්නේ නැහැ. මා මේ කියන්නේ ඇත්තයි. මා මෙහිදී කථා කරන්නේ වටේ තිබෙන ගැලරියට නොවෙයි. මා කථා කරන්නේ, මේ සභාවෙන් පිට සිට අප මේ සභාවට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා]

එවූ අපේ ඡන්දදායකයින්ට සහ මේ රටේ අනාගතය භාර, ඡන්දය ඇති නැති සියලුම මහජනතාවටයි.

ලංකාවේ කෘෂිකර්ම ප්‍රශ්නය වශයෙන් අප සාකච්ඡාවට ගන්නා වූ මේ කාරණය චාම්, සුළුපටු, ලේසිපහසු එකක් නොවන බවයි මා කල්පනා කරන්නේ. මෙහි තිබෙන ප්‍රශ්නය නිකම්ම මේ ආණ්ඩුව අද කෘෂිකාර්මික නිෂ්පාදනයට විශේෂ උනන්දුවක් උත්සාහයක් යොදනවාය, දරනවාය, යන කාරණය පමණක් නොවෙයි. මගේ විශ්වාසයේ හැටියට මේ රටේ පැවති සෑම ආණ්ඩුවක්ම ඒ ආණ්ඩුවලට තේරෙන විධියට, දැනෙන විධියට, පුළුවන් විධියට, සිය ශක්තිය සහ උනන්දුව යොදා මෑත අවුරුදුවලදී මේ රටේ කෘෂිකර්ම කටයුතු උදෙසා ක්‍රියාකොට තිබෙනවා. ඒ අය කොතෙක් උත්සාහ දැරුවත් හැමෝම කථා කරන වී ගොවිතැන පිළිබඳව වුවත් අනිකුත් වගාවන් පිළිබඳව වුවත් අප සිටින්නේ කිනම් තත්ත්වයකද කියා මා ප්‍රශ්න කරනවා. අද දවසේ පවා අප රටේ ජනතාව පාවිච්චියට ගන්නා සහල් ප්‍රමාණයෙන් බාගයකට ටිකක් අඩු ප්‍රමාණයක් තවමත් පිටරටින් ගෙන්වීමට සිදු වී තිබෙන බව පෙනෙනවා.

ලංකාවේ කෘෂිකර්ම ප්‍රශ්නය, වී ගොවිතැන පිළිබඳ ප්‍රශ්නය, කෑම ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේ ප්‍රශ්නයක් හැටියටම රටට පෙන්වීමට තැත් කිරීම විශාල හානියකැයි මා කල්පනා කරනවා. අපට කෑම තිබෙන්නට ඕනෑය කියන කතාව ඇත්තයි. එහෙත් කෑම තිබීමෙන් පමණක් රටක ජනතාවකට තෘප්තිමත් වන්නට බැහැ. විශේෂයෙන් අපේ රටට එය එසේ වෙනවා. ඒ මන්ද, ඊට වඩා ඉහළ මට්ටමකින් අපේ රටේ ජීවන තත්ත්වය පවත්වාගෙන යාමට පුළුවන් වී තිබෙන බව ඉතිහාසයෙන් පෙනෙනවා. මේ රටේ වී ගොවිතැන දියුණු කිරීමේ නාමයෙන්, මේ රටේ සහල් යනාදී කෑම ද්‍රව්‍ය සුලබ කොට ආහාරයෙන් රට ස්වයංපෝෂිත කිරීමේ නාමයෙන්, ඓතිහාසික වශයෙන් අප ලබා ගත්තාවූ, දරා ගත්තාවූ අපේ ජීවන තත්ත්වය ඒ මට්ටමෙන් පහළට දමන්නට ඉඩ දිය නොහැකියි. විරුද්ධ පාර්ශ්වයේ අප නිතර නිතර ඔය ප්‍රශ්නය පිළිබඳව සිත් යොමු කරන්නේ එම නිසයි. ජීවන තත්ත්වයෙන් අප යම්කිසි තැනකට පැමිණ සිටිනවාද එතැනින් ඉහළට නැගීගෙන යාමට තරම් වැඩ පිළිවෙළවල් අපට තිබෙනවාය කියා මා විශ්වාස කරනවා. එම ස්ථානයෙන් පහළට බැහැගෙන ගොස් නැවත වරක් අපට මත්තට රුකුලක් ලැබේවිදෝ කියන සැකය පිට වැඩ පිළිවෙළ සකස් නොකරන්න අප කල්පනා කළ යුතුයි.

මෙම ප්‍රශ්නයට තවත් ප්‍රශ්න ගොනු වෙනවා. කෘෂිකර්ම දියුණුව පිළිබඳ ප්‍රශ්නයට කාර්මික දියුණුව පිළිබඳ ප්‍රශ්නයත් සම්බන්ධ වෙනවාය, ගැට ගැසෙනවාය, යනුවෙන් මා ප්‍රකාශ කරනවාට මෙම සභාව පුදුමයට පත් නොවිය යුතුයි. එකකට එකක් පරස්පර විරෝධී හැටියට සලකා මේ ප්‍රශ්න දෙක පිළිබඳව කටයුතු කිරීම හරි නැහැ. එසේ සිතාගෙන එකක් අතපසු කරමින් අනික් එකට පමණක් සිත යොමු කරමින් ක්‍රියා කොට මෙම වැඩ පිළිවෙළ සාර්ථක කර ගන්නට හැකි වේයැයි සිතතොත් එය සම්පූර්ණයෙන්ම වැරදි දෙයක් බව මා ලුහුඬින් මතක් කරනවා. අද පවතින තත්ත්වය තුළ වී ගොවිතැනෙහි දියුණුව ගැන වුවත් නිකම්ම උත්සාහයක යෙදීම ප්‍රමාණවත් වන්නේ නැහැ. අපේ රටේ යම්කිසි ඉඩම් ක්‍රමයක් පවතිනවා. කෘෂිකම් දියුණුව උදෙසා නිසි වැඩ පිළිවෙළවල් සකස් කරනවා නම් දැනට පවත්නාවූ ඉඩම් ක්‍රමය අපේ වී ගොවිතැන දියුණු කිරීමටවත් ප්‍රමාණවත් වන රාමුවක් තුළ පවතිනවාදැයි අප විසින් සොයා බැලිය යුතුයි. ඉඩම් සංවර්ධන ඇමතිතුමා ප්‍රකාශ කළා, ඉතා පුදුම අන්දමේ වචන දෙකක්. "අනෙක් ඇමතිවරුන් සමග එක කැබිනට්ටුවේ වාඩි වෙලා ඉන්න කෙනෙක් වුණාට මොකද මට තිබෙන කර්තව්‍යය නම් නිසි ඉඩම් සකස් කර දීමත් වතුර ටික හරියට පාලනය කර දීමත් විදුලි බලය ලබා දීමත් ය; කර්මාන්ත වෙනුවෙනුත් කෘෂිකර්මය වෙනුවෙනුත් ඒවා කෙසේ පාවිච්චියට ගනු ලබනවාද කියන එකෙන් මට වැඩකත් නොවේය, මා ඒ ගැන දන්නෙත් නැත" යනාදී ආකාරයටයි, එතුමා පකාශ කළේ. අන්තිම වචන ටික අහලා මට බය හිතුණා. "දන්නේ නැත" කියන එකයි, ඒ කතාව. මේවා මොනවා සඳහා ලෑස්ති කරනවාද කියා නොදන්නා ඇමතිවරයකු අනින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සිදු විය හැකි දේ කුමක්ද? එවැනි කෙනෙක් රටට එක් දෙයක් වුවමනා කරද්දී වුවමනා නැති වෙනත් දෙයකට මෙම වැඩ පිළිවෙළවල් එල්ල කරමින් ක්‍රියා කරන්ට පටන් ගන්නවා. එසේ කළ විට අප හැමෝම අනාත භාවයට වැටෙනවා නේද කියා මා ප්‍රශ්න කරනවා. තමන්ගේ හිතේ තිබෙන ඇත්ත තත්ත්වය කීම ඒ ඇමතිතුමාගේ ගතියක්. එයින් ආණ්ඩුවට සිදුවන වරද මේකයි: එතුමා තමන්ගේ හිතේ තිබෙන ඇත්ත කිව්වාම ආණ්ඩුවේ මුළු ප්‍රතිපත්තියටම එයින් විශාල පහරක් වදිනවා; ඒ ගැන මා කෘතඥ වෙනවා.

කෘෂිකාර්මික දියුණුවේ ප්‍රශ්නයට තවත් ප්‍රශ්න කීපයක් බලපානවා. එයින් අදහස් කළේ ලෝක වෙළඳපොලේ ප්‍රශ්න යයි කියා පුළුල් ලෙස කියන්නට පුළුවන්. මා මේ කථා කරන්නේ අපේ කෘෂිකර්මය පැත්තෙන් නිෂ්පාදනය කරන ද්‍රව්‍යයන් විකිණීමට වෙළඳපොල තිබීම ගැන පමණක් නොවෙයි. අද මා බරවෙන්නට යන්නේ ඒ පැත්තට නොවෙයි. මා මතක් කරන්නට අදහස් කරන්නේ මේකයි. කෘෂිකර්මය පැත්තෙන් දියුණුවක් ඇතිකර ගම්බද ජනතාවගේ ආදායම වැඩි කිරීමට ඇත්තටම බලාපොරොත්තු වෙනවා නම් ඒ අනුව ආදායම වැඩිවේගෙන එන ගම්බද ජනතාවට අවශ්‍ය අතිකුත් කෘෂිකාර්මික උපකරණ මෙන්ම, පාරිභෝගිකයින් හැටියට ඔවුන්ට මනුෂ්‍යයන් වශයෙන් වුවමනා කරන වෙනත් කාර්මික භාණ්ඩත් ලබාදීමට ක්‍රම යොදන්නේ නැත්නම් අර දියුණුව අනික් අතට හැරෙනවා. මා මේ සඳහන් කරන කරුණ නොයෙක් රටවල අත්හදා බැලීම්වලින් ඔප්පු වූ දෙයක්ය කියා තව ටිකකින් මතක් කිරීමට අදහස් කරනවා. රටේ ගම්බද ජනතාවට අවශ්‍ය භාණ්ඩ සැපයීම රටේ කාර්මික පැත්තෙන් ඉටු කරන්නේ නැත්නම් ගම්බද ජනතාව කෘෂිකර්මය පැත්තෙන්ම සිය නිෂ්පාදනයන් දියුණු කර ගෙන ඒම ඇණහිටවනවා. ඒ තත්ත්වය අනික් අතට හැරෙනවා.

මේ නිසා අපට සාකච්ඡා කරන්නට තිබෙන්නේ ට්‍රැක්ටර් කීයක් ගෙනාවද, "යුක්ලිඩ්" කීයක් අනුරාධපුරයේ සිට උඩවලවෙට යැව්වාද, කියන කාරණා ගැන නොවෙයි. යුක්ලිඩ් 3 ක් අනුරාධපුරයේ සිට උඩ වලවෙට යවන්නය කියා ටැලිෆෝන් එකෙන් ඕඩර් කළාලු. එහෙත් එම ඇමතිතුමා විසින්ම හිඟුරක්ගොඩ නැත්නේ නෙළුව කියන ගමේ තේ වත්තක වැඩ කළ කම්කරුවන් තුන්දෙනෙක් ආණ්ඩුවට විරුද්ධව වචනයක් පාවිච්චි කළාය කියා හිඟුරක්ගොඩ මන්ත්‍රීතුමා කළ පැමිණිල්ලක් උඩ වියළි කලාපයට යවා තිබෙන බව අද උදේ "ඇත්ත" පත්තරේ ටැලිග්‍රෑම්වල පිටපත් සහිතව මුද්‍රණය කර ප්‍රසිද්ධ කර තිබුණා. උඩ වලවේ හදන්ට යුක්ලිඩ් යවනවා. ඒවා දක්කන්නට ඕනෑ කරන මිනිස්සු වියළි කලාපයට යවනවා වේලෙන්නට. මෙය මේ ආණ්ඩුවේ ක්‍රියා කලාපයේ සාරාංශය ගැබ් වී තිබෙන සිද්ධීන් දෙකක්ය කියා මා විශ්වාස කරනවා. එය අමතර කථාවක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මුලින්ම මතක් කරන්නට යන්නේ මේ ආණ්ඩුවේ කෘෂිකාර්මික වැඩ පිළිවෙළ ගැනයි. මා කථා කරන්නේ නිකම්ම පවු විධියට ගොවිතැන ගැන හෝ කෑම ද්‍රව්‍ය නිෂ්පාදනය ගැන හෝ නොවන බව සිහි තබාගන්නා ලෙස මා මේ ගරුසභාවට මතක් කරනවා. මා කථාකරන්නට යන්නේ අපේ ආණ්ඩුවේත් රටේත් කෘෂිකාර්මික වැඩ පිළිවෙළ හා ඒවායේ ප්‍රතිපත්ති ගැනයි. මා දෙවනුව කියන්නට බලාපොරොත්තු වන දෙයකුත් මතක් කරන්නම්, එසේ කියන්නට හේතුව පෙන්වන්නට. කෘෂිකර්මය ගැන කථා කරන විට අපට මොහොතකටවත් අමතක කරන්නට බැහැ කෘෂිකර්මයට වී ගොවිතැන, මිරිස් නිෂ්පාදනය, ලූනු, අල ආදිය නිෂ්පාදනය කිරීම හෝ නොකිරීම මෙන්ම තේ, රබර් හා පොල් ප්‍රශ්නයත් ඒ වගේම අයිති බව. ඒ අතරම ආණ්ඩුව ගෙන යන වැඩ පිළිවෙළ කෙසේ සංසන්දනය කර තිබෙනවාද කියන ප්‍රශ්නය ගැන දෙවනුවට හිත් යොමු කර වීමට මා අදහස් කරනවා.

රජයේ කෘෂිකාර්මික වැඩ පිළිවෙළ මොකක්ද, එහි දර්ශනය කුමක්ද, මොන ප්‍රතිපත්තියක් උඩ සකස් කර තිබෙනවාද, යන ප්‍රශ්න ගැන අප කල්පනා කර බලනවා නම්, මුලින්ම ආණ්ඩුව ඉෂ්ට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරන්න යනවාය කියන කරුණු දෙකක් ගැන සිහිපත් කරන්න ඕනෑ. ආණ්ඩුව පළමුවෙන්ම කියා සිටිනවා, මේ කාලයේ ආණ්ඩුවේ අරමුණ හාල් සහ මිරිස්, ලූනු ආදී ද්‍රව්‍ය නිෂ්පාදනය කරමින් ඒ අතින් රට ස්වයංපෝෂිත කිරීමය කියා. ඒ කට යුත්ත, ඒ ප්‍රයත්නය, ඉටු කර ගැනීම පිණිස වෙනත් නොයෙක් දේවල් පරිත්‍යාග කිරීමට සූදානම් වියයුතු බව ආණ්ඩුව සඟවන්නෙ නැහැ.

ආණ්ඩුවෙ දෙවන කියමන, ආණ්ඩුව වෙනුවෙන් නිතර කථා කරන උඩුප්පිඩ්ඩි මන්ත්‍රීතුමා (එම්. සිවසිතම්පරම් මයා.) කිවාක් මෙන්, කර්මාන්තවලට මේ රටේ අනාගතයත් නැත, කර්මාන්තමය රටක් වශයෙන් අපට අනාගතයක් නැත, කියන අදහසයි. මෙම වචන ගැන අපේ ඇමති වරුන් පිකක් ප්‍රවේශම් වෙන්න ඕනෑ. උඩුප්පිඩ්ඩි මන්ත්‍රීතුමා ඒ අදහස පැහැදිලි ලෙසම කියනවා.

තව දුරටත් ඒ මන්ත්‍රීතුමා කීවා, මේ රටට විදේශවලින් පැමිණි සියලුම විශෙෂඥයින් සකස් කර ඉදිරිපත් කළ වාර්තා කියවා තිබෙනවාය, ඒ අනුව අපේ ආර්ථික සංවර්ධනය සඳහා තුන් විධියක ප්‍රතිපත්ති ඉදිරිපත් කර තිබෙනවාය, ඒ අදහස් මේ ආණ්ඩුව පැහැදිලි ලෙසම පිළිගන්නවාය කියා. එපමණක් නොවෙයි, මේ රට කර්මාන්තමය කිරීමට, මෙහි නිපදවන ද්‍රව්‍ය අලෙවි කර ගැනීමට ප්‍රමාණවත් වෙළඳ පොලක් නැත, මෙරටින් ද්‍රව්‍ය පිටරට යැවීමට, අපේ ද්‍රව්‍ය ජාත්‍යන්තර වෙළඳපොලේදී විකුණා අපේ කර්මාන්ත දියුණු කර ගැනීමට කිසිම ඉඩක් නැත, යන කියමන එතුමා පිළිගෙන තිබෙන බව ප්‍රකාශ කළා. මෙය හිතට ගත යුතු කාරණයක්. මෙයින් ඔප්පු වන්නේ මොකක්ද? මෙයින්, ආණ්ඩුව බසින නිගමනය කුමක්ද? ආණ්ඩුවේ අදහස අනුව මේ රට කෘෂිකාර්මික රටක්; කෘෂිකාර්මික වශයෙන්ම පමණක් අප දියුණු කරනවා මිස කාර්මික රටක් හැටියට දියුණු කිරීම අමතක කරන්න ඕනෑය කියන නිගමනයටයි බැස තිබෙන්නෙ. ඔය ප්‍රතිපත්තියට මගේ ඇති විරුද්ධ කම, කරුණු සහිතව පැහැදිලි කිරීමට, ඔප්පු කිරීමට, බලාපොරොත්තු වන බව මා කෙළින්ම කියන්න කැමතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
**(Mr. Deputy Speaker)**

Order, please!

The Sitting is suspended for half-an-hour.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් සිටුවන ලදින් අ. භා. 4.30 ට නැවත පවත්වන ලදී.**

*அதன்படி அமர்வு பி. ப. 4.30 மணிவரை இடை நிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று.*

*Sitting accordingly suspended till 4.30 P.M. and then resumed.*

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
**(Dr. Colvin R. de Silva)**

නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුව යම්කිසි අරමුණු කරා ගමන් කරනවායැයි මා විස්තර කළා වාගේම; මා මීළඟට ඉදිරිපත් කරන්නට යන්නේ, ආණ්ඩුව ඒ අරමුණු දෙක ඉටු කිරීම පිණිස පාවිච්චි කරන්නට භාරගෙන තිබෙන, ප්‍රකාශ කර තිබෙන මාර්ග නැත්නම් ක්‍රම 4 යි.

පළමුවැනි ක්‍රමය: ආණ්ඩුව විසින් ආණ්ඩුවේ මුළු උත්සාහය, ශක්තිය, කාලය වී ගොවිතැන සහ මිරිස්, ලූනු ආදි වුවමනා අනෙකුත් කෑම ද්‍රව්‍ය නිෂ්පාදනය වැඩි කිරීම පිණිස යොදනු ලබනවා. මා දත් පිකකට ඉහත තේ බොන වේලාවේදී මුල්කිරිගල ගරු මන්ත්‍රීතුමා (ජෝර්ජ් රාජපක්ෂ මයා.) සමඟ කථා කරමින් සිටින අවස්ථාවේදී එතුමා මට කියා සිටියා, "අද ඒ පළාතේ කච්චේරිවල සිටින්නා වූ සියලුම නිලධාරීන්ගේ මුළු කාලයම මේ කටයුත්තට යෙදීම හේතු කොට ගෙන අනෙකුත් සියලුම වැඩ දැන් අතපසු වී තිබෙනවා" ය කියා.

ආණ්ඩුව විසින් පාවිච්චි කරන දෙවැනි ක්‍රමය මෙයයි: එය නම් කොයි ආණ්ඩුවක් වුණත් පාවිච්චි කළ යුතුයි. එහෙත් එය මා විශේෂයෙන් මතක් කරන්නට කැමතියි. පෝර වැඩියෙන් පාවිච්චි කිරීම, ඉන්සරට වැඩිය හොඳට වගා කිරීමේ ක්‍රම පාවිච්චි කිරීම, දුළුවත් පුළුවන් තැන්වල යන්ත්‍ර සූත්‍ර වැඩි වැඩියෙන් පාවිච්චි කිරීම. ඉංග්‍රීසියෙන් කියනවා නම් "ටෙක්නිකල්" ක්‍රම වැඩි වර්ධනය කිරීම නැත්නම් දියුණු කිරීම. ඒ දෙවැනි ක්‍රමයයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තුන් වැනි ක්‍රමය: එනම්, ආණ්ඩුව විසින් විශේෂයෙන් අද පාවිච්චි කරන්නා වූ ක්‍රමය. ආණ්ඩුව උත්සාහ කරනවා; විශාල මුදල් ඇති අය මේ වී ගොවිතැනට සහ එවැනි වෙනත් නිෂ්පාදනවලට අද්දා ගන්නට නැත්නම් ළඟා කරවා ගන්නට, ඔවුන්ගේ විශාල මුදල් ඒ කටයුතුවලට යෙදීම පිණිස. මේ ගැන දෙවනුව වචන යක් දෙකක් කියන්නට මා අදහස් කර නවා. ධනේශ්වරයන් වී ගොවිතැනට හැර වීමට ආණ්ඩුව ක්‍රම පාවිච්චි කරනවා. අප සාමාන්‍යයෙන් මේ ගැන දන්නවා. මා ඒ ගැන විස්තරයක් කරන්නට වුවමනා නැහැ. ආණ්ඩුව ධනේශ්වරයන්ට ඉඩම් දෙනවා. ගිය අවුරුද්දේ 188 දෙනකුට ඉඩම් අක්කර 57,000 ක් දුන් බව අපට කියා තිබෙනවා. වෙන අයට නොදෙන ආකාරයට ඔවුන්ට විදේශ විනිමය දෙනවා, ඔවුන්ට වුවමනාය කියන උපකරණ මේ රටට ගෙන්වාගැනීම පිණිස. ඔවුන් නො යෙක් විධියේ අයබදුවලින් නිදහස් කර මින්, ඔවුන්ට අයබදුවලින් නිදහස් විශාල මුදලක් අයිති කර දෙනවා. එවැනි නො යෙක් විධියේ උදව්පදව් කිරීමෙන් ඒ ධනය අද්දා ගන්නට, ඒ අය වී ගොවි තැනට ඇද ගන්නට උත්සාහ කරනවා.

හතර වැනි ක්‍රමය, මේකයි: මා දන්නා තරමින් මෙය මෙතෙක් කල් මේ ගරු සභාවේ කවුරුන්වත් ඉදිරිපත් නොකළ දෙයක්. ආණ්ඩුව, මේ හතර වැනි ක්‍රමය පාවිච්චි කරන්නේ ජාත්‍යන්තර බැංකුවේ උපදෙස් උඩයැයි මා විශ්වාස කරනවා. ඒ ක්‍රමය නම් මේ රට තුළ නිෂ්පාදනය කරන හාල්, කෑම ද්‍රව්‍ය ආදි ඔය සේරම ද්‍රව්‍යයන් ගේ, බඩු බාහිරාදියේ මිළ අධික ලෙස වැඩි කිරීමයි. ඒක යන්නෙ එක්තරා ශාස්ත්‍රානු කූල මතයක් අනුව ධනේශ්වර වාදයටයි. එනම්, ඕනෑම බඩුවක; ද්‍රව්‍යයක මිළ අධික ලෙස වැඩි කළ විට ඒ ද්‍රව්‍යය නිෂ්පාදනය කිරීමෙන් වැඩි ලාභයක් ලබා ගන්ට පුළුවන්ග කියන චේතනාවෙන් යම්කිසි ධනේශ්වර කොටසක් ඒ ද්‍රව්‍යය නිෂ්පාද නයට හැරෙනවාය කියන ප්‍රතිපත්තිය උඩයි. ආණ්ඩුව ක්‍රියාත්මක කරන ප්‍රධානම ක්‍රමය ඒකයි. සලාක හාල්වලින් සේරු වක් කැපීමේ අත්ත, ආර්ථය, අදහස සහ අරමුණ එයයි. එය කොතරම් දුරට ඉෂ්ට වී තිබෙනවාදැයි කියතොත්, ඊයේ පත්‍රයේ පළ වී තිබෙන ෆේඩරල් පක්ෂයේ සිටින එකම ඇමතිතුමාගේ කථාවකිනුත් පැහැදිලි ලෙස අවබෝධ වෙනව, එක සේරු වක් නොමිළයේ දෙමින් අනික් සේරුව කැපීමෙන් ආණ්ඩුව ලබා ගත් ලාභය අර සේරුවක් නොමිළයේ දෙන වියදම ඇරී මෙන් පසුත් වැඳගත් මුදලක් ඉතිරි කර ගැනීම බව. ඒක කාටවත් සඟවන්නට බැරි දෙයක්. පළාත් පාලන කටයුතු භාර ෆේඩරල් පක්ෂයේ ඇමතිතුමා; ඒ කියන්නෙ, මේ ආණ්ඩුවේ ප්‍රධාන පක්ෂ දෙකෙන්—මා එහෙම කිව්වම අපේ ද්‍රවිඩ සංගමයේ නායකතුමාගෙන් සමාව ඉල්ල නව—දෙවෙනි පක්ෂයේ නායකයකු විසින් පෙරේදා රැස්වීමකදී කරන ලද ප්‍රකාශයක් හැටියට ඊයේ පත්‍රයේ සඳහන් වුණා, "බලන්න, මේ ආණ්ඩුවේ දක්ෂ කම. නේ වලින් අපට ගිය අවුරුද්දේ ලැබුණු විදේශ විනිමය රුපියල් කෝටි 20 කින් බැස ගිය අවස්ථාවෙදි හාල් සලාකය කැපීමෙන් ඒ කෝටි 20 විදේශ විනිමය ලබා ගත්තා" කියා. රටට එහෙම කිව්වම මට නම් ඇති.

ඩී. ෂෙල්ටන් ජයසිංහ මයා. (කර්මාන්ත හා ධීවර ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)
*(திரு. டீ. ஷெல்ற்றன் ஜயசிங்க—கைத் தொழில், கடற்றொழில் அமைச்சரின் பாராளு மன்றக் காரியதரிசி)*
(Mr. D. Shelton Jayasinghe—Parliamentary Secretary to the Minister of Industries and Fisheries)

කවුද, එහෙම කිව්වෙ?

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

ගරු තිරුචෙල්වම්; පළාත් පාලන ඇමතිතුමා. ඒක ඉංග්‍රීසියෙන් කිව්වද, දෙමළෙන් කිව්වදැයි මා දන්නෙ නැහැ. කොයි භාෂාවෙන් කිව්වත් ඇත්තක් කිව්ව. ආණ්ඩුවටත් ලොකු අවහිරයක්, අවුලක් ඇති වන ඇත්තක් කිව්ව. ලෝක යේ හාල් නැත; මෙසේ කරන්ට සිදු වුණේ ඕනෑයක් තිබෙන නිසාය, කියමින් ඇත්ත වශයෙන් කරන්ට උත්සාහ කළේ මොකක්ද? සඟවන්ට හැදුවට ඉදල හිටල කවුරු හරි ඇමතිවරයෙක් ඇත්ත ප්‍රකාශ කරනවා. අපි ඒක අල්ල ගෙන රටට පෙන්වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුව විසින් මේ නිෂ්පාදන කටයුත්ත සඳහා පාවිච්චි කරන මාර්ග 4 න් 3 ක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා]

ගැන විශේෂයෙන් කල්පනා කර බැලුවොත්, එක්සත් ජාතික පක්ෂය විසින් සදහටම පිළිගෙන ක්‍රියාත්මක කරන්ට උත්සාහ කළ වැඩ පිළිවෙළවල් 4 ම ඉතා වැදගත් විධියට ප්‍රතිපත්ති නොපිටට පෙරළෙන විධියට සකස් කරගෙන තිබෙන බව ඔප්පු වන බව පෙන්වා දෙන්ටයි මම ඊළඟට අදහස් කරන්නෙ. ඒ පාවිච්චි කරන ක්‍රම හතරෙන් තුනක් ගැන පමණක් කල්පනා කරන්ටයි මා කිව්වෙ. මා දෙවනුව මතක් කළ කාරණය ගැන මේ ආණ්ඩුවට විශේෂයක් තිබෙනවාය කියා මා සිතන්නේ නැහැ. රටේ කෘෂිකර්මය දියුණු කරන්නට, වී ගොවිතැන දියුණු කරන්නට, වැඩ කරන ක්‍රම හා කාර්මික උපකරණ යෙදීම තව තවත් දියුණු කරන්නට සෑම ආණ්ඩුවක්ම උත්සාහ කළ යුතුයි. සෑම ආණ්ඩුවක්ම එසේ උත්සාහ කර තිබෙන බව අපට ඉදිරිපත් කර තිබෙන නොයෙකුත් සංඛ්‍යා ලේඛනවලින් පෙනෙනවා. එම නිසා එක අතකින් හැර ඒ ගැන මේ ආණ්ඩුවට විශේෂයක් තිබෙනවාය කියා කියන්නට බැහැ. මේ ආණ්ඩුවේ මුළු උත්සාහයම ඒ එක කටයුත්තකට යෙදීමටයි බලාපොරොත්තු වෙන්නෙ. එමනිසා තමයි වී ගොවිතැන පිළිබඳ සියලුම ප්‍රශ්න විසදන්නට දැන් අප මාර්ගයක් සොයා ගෙන තිබෙනවාය කියා ඉඩම් සංවර්ධන ඇමතිතුමා අපට කිව්වෙ. අකුරු තුනකින් හඳුන්වන වී වර්ගයක් ගැන එතුමා කිව්වා. මට පුරුදු අයි. ආර්. සී. යන අකුරු තුන පමණයි. අයි. ආර්. ආර්. ද මොනවාදෝ අකුරු තුනකින් එන වී වර්ගයක් සොයා ගෙන තිබෙනවාය කියා එතුමා කිව්වා. නමුත් අයි. ආර්. සී. වලට හුරුයි.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

අයි. ආර්. ආර්. 8.

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

අයි. ආර්. ආර්. 8 නමින් වී වර්ගයක් සොයා ගෙන තිබෙනවාය, එය විදේශයකින් මේ රටට ගෙනැවිත් තිබෙනවාය, ඒ ගැන විශේෂයෙන් වැඩ කර, පරීක්ෂා කර තිබෙනවාය, අවුරුද්දක් තුළම ඒ ගැන වැඩ කර තිබෙනවාය, ඒ වී වර්ගය වැපුරූ හැටියේම වී ගොවිතැන පිළිබඳව අපේ මේ සියලුම ප්‍රශ්න විසදෙනවාය, අපට වුවමනා ප්‍රමාණයටත් වැඩියෙන් වී නිෂ්පාදනය කර වැඩි හරිය පිටරට යවා මුදල් සොයා ගන්ටත් පුළුවන්කම ලැබේවිය ආදී වශයෙන් එතුමා සඳහන් කළා. මට තිබෙන කනගාටුව මේකයි. නොයෙක් අවස්ථාවල මා මේ පාර්ලිමේන්තුවට පැමිණ තිබෙනවා. මා මේ ස්ථානයට පත් වී එනවා; මා මේ ස්ථානයෙන් යනවා. එය එක්තරා පුරුද්දක් වශයෙනුත් පිළිඅරගෙන තිබෙනවා. එහෙත් කොයි අවස්ථාවකදී මා ආවත් ඒ සෑම අවස්ථාවකදීම ඉඩම් සංවර්ධන ඇමති වශයෙන් සිටින්නෙ එක පුද්ගලයාමයි. ඒ පුද්ගලයා හැම අවුරුද්දකම කිව්වෙ කලින් වූ දෙයින් මම හුඟක් ඉගෙන ගෙන තිබෙනවාය, දැන් අළුත් එකක් සොයා ගෙන තිබෙනවාය, ළඟදී සියලුම ප්‍රශ්න විසදෙනවාය යන්නයි. ඊළඟ අවුරුද්දෙ කියන්නෙත් ඒකමයි. පසුගිය කාලෙ කළ දේවල් වැරදිය, ඒවායින් පාඩමක් ඉගෙන ගත්තාය, දැන් තවත් එකක් සොයා ගෙන තිබෙනවාය කියනවා. දැන් කියනවා අයි. ආර්. ආර්. 8 නම් අළුත් වී වර්ගයක් සොයා ගෙන තිබෙනවාය කියා. ලබන අවුරුද්දෙ ඒක අයි. ආර්. සී. වෙයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

He has not learnt from his uncle yet!

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

He seems to think that a ministership is intended to be a study course for self-development. I cannot help it.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

I am sorry I interrupted you.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**

*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*

(Dr. Colvin R. de Silva)

No, Sir. A speaker sometimes welcomes an interruption as an occasion to take the breath he has lost.

කාර්මික අංශයෙන් වඩ වඩා හොඳ ක්‍රම පාවිච්චි කිරීම ගැන මා කිසි දෙයක් කියන්නේ නැහැ. ඒක කාගෙනුත් කෙරෙන්නට ඕනෑ දෙයක්. ඒකෙ අළුත් දෙයක් නැහැ. එහෙත් ආණ්ඩුව පාවිච්චි කරනවාය කියන අනික් ක්‍රම ගැන කරුණු පෙන්වා දෙන්නට මා භාර ගත්තා. එක්සත් ජාතික පක්ෂය විසින් ස්ථිර වශයෙන්ම පිළිගත්තාය කී, ස්ථිර වශයෙන්ම ක්‍රියාවේ යොදනවාය කී වැදගත් ප්‍රතිපත්ති කීපයක් අද ඉවත දමා මේ පැත්තේ ප්‍රතිපත්ති කීපයක් අනුගමනය කරන්නට පටන් ගෙන තිබෙනවා. ඒක තමයි පළමුවැනි වැදගත් වෙනස්වීම. පැරණි ප්‍රතිපත්තිවලින් පළමුවන වරට වෙන් වී තිබෙනවා. එක්සත් ජාතික පක්ෂය විසින් පිළිපැදිය යුතු කෘෂිකර්ම ප්‍රතිපත්තිය මුලින්ම සකස් කර පිළිගැන්නුවේ වෙන කවුරුවත් නොවෙයි, වර්තමාන අගමැතිතුමාගේ පියාණන් වන ඩී. එස්. සේනානායක අගමැතිතුමායි. ඔහුගේ ඉඩම් ප්‍රතිපත්තිය, ඉඩම් සංවර්ධන ප්‍රතිපත්තිය, ඒ අනුව ඇති වන කෘෂිකර්ම ප්‍රතිපත්තිය, විශේෂයෙන් වී ගොවිතැන පිළිබඳ ප්‍රතිපත්තිය වශයෙන් තිබුණේ කුමක් ද? පුංචි ඉඩම් කැබලිකාරයා මගින් රටේ වී ගොවිතැන දියුණු කිරීමයි ඔහුගේ ප්‍රතිපත්තිය වී තිබුණේ. 1947 සිට 1952 දක්වා පැවැති ඒ කාලයේදී තිබුණු පළමුවැනි පාර්ලිමේන්තුවේදී, එවකට අගමැති ධුරයේ සිටි ඩී. එස්. සේනානායක මැතිතුමාත්, වර්තමානයේ අගමැති ධුරයේ සිටින ඩඩ්ලි සේනානායක මැතිතුමාත්, අද රාජ්‍ය ඇමති වශයෙන් ඉන්න ජේ. ආර්. ජයවර්ධන මැතිතුමාත් ඇතුළු ඔය සියලු දෙනාම සමග—මෙහිදී නම් වශයෙන් සඳහන් කිරීම ගැන මා කමා කරන්න—නොයෙක් අවස්ථාවලදී මේ ගරු සභාවේදීත් ඒ ප්‍රතිපත්තිය ගැන වාද විවාද කරන්නටත් නොයෙකුත් තර්ක ඉදිරිපත් කරන්නටත්, තීරණවලට බහින්නටත් මට සිද්ධ වුණා.

එදා මා ඉදිරිපත් කළ තර්කයේ සාරාංශය ලුහුඬින් කියතොත් කියන්නට තිබෙන්නේ මෙයයි: එදා තිබුණු එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවට තමන්ගේ ඉඩම් සංවර්ධන ප්‍රතිපත්තිය රඳා පැවැත්තේ කෘෂිකර්මයේ දියුණුව උඩ ද, එසේ නැත්නම් රටේ අනුක්‍රමයෙන් ශීඝ්‍රව වැඩි වේගන එන රක්ෂා විරහිතභාවය අඩු කිරීම උඩද යන කරුණු සම්බන්ධයෙන් හිත හදා ගන්නට බැරිවෙලා තිබෙනවා යයි මා එදා කියා සිටියා. රක්ෂා රහිත අයට රක්ෂා දෙනවා වෙනුවට ඉඩම් කැබලි දී ඔවුන් ඉඩම්කාරයන් කිරීමට හිතනවා නම් දැන් ඉඩම් කැබැල්ල පොඩි වන ප්‍රමාණයට වැඩි වැඩියෙන් දූප්පත් කමින් පෙළෙන පවුල් තව තවත් දුප්පත්කමින් පෙළීමට ඉඩ හැරීමක් සිදු වෙනවා නොවෙයි ද? එහෙත් කෘෂිකර්මයේ දියුණුව ගැන බලනවා නම් පවුලකට දිය යුතු ඉඩම් ප්‍රමාණය මෙතෙකැයි තීන්දු කළ යුත්තේ වෙනත් ප්‍රතිපත්තියක් අනුවයි. ඒ කියන්නේ, වී ගොවිතැනේ සංවර්ධනයට ප්‍රමාණවත් වන්නේ කොපමණ විශාල ඉඩම් කැබැල්ලක් දැයි නිගමනය කර එවැනි ඉඩම් කැබැල්ලක පවුලක් පදිංචි කළ යුතුය යනුවෙන් ඇති ප්‍රතිපත්තියක් අනුවයි. ඒ ගැන අදහස් ප්‍රකාශ කරන්නට දැන් මා බලාපොරොත්තු වන්නේ නැහැ. අද මා වෙනත් ප්‍රශ්නයකටයි මුහුණ පාන්නට යන්නේ.

කොපමණ ලොකු හෝ පුංචි හෝ ඉඩම් කැබැල්ලකද එදා ඩී. එස්. සේනානායක මැතිතුමා පවුලක් පදිංචි කරවීමට තීරණය කළේ, ඒ මැතිතුමාගේ ප්‍රතිපත්තිය අනුව? එය කුමක් වුවත් පුංචි මිනිහාට පුංචි ඉඩම්කාරයකු වශයෙන් වී ගොවිතැන දියුණු කිරීමට ක්‍රමයක් වුණා. එම ප්‍රතිපත්තියයි එතුමා අනුගමනය කළේ. අද තිබෙන මේ ආණ්ඩුව අන්න ඒ ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන් අත්හැරගෙන යන බවයි මා කියා සිටින්නේ.

අපේ කවුරුනුත් ප්‍රිය කරන—මා එය කිසිම අකැමැත්තක් නැතිව කියන වචනයක්—කවුරුත් පෞද්ගලිකව ප්‍රිය කරන,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මුදල් ඇමතිතුමාගේ මුදල් ක්‍රමයට නම් කවුරුත් වුවත් ප්‍රිය කරතැයි මා කියන්නේ නැහැ. මට එසේ කියන්නට බැහැ. අයවැය කථාවේදී එතුමා අපට මතක් කළේ ගිය අවුරුද්දේදී අක්කර 57,000ක් තෝරා 188 දෙනකුට දුන් බවයි. ගරු අග්‍රාමාත්‍යතුමා රාජාසන කථාව පිළිබඳ විවාදයේදී ප්‍රකාශ කළේ කුමක් ද? මහියංගන පළාතේ මුසාජී කොම්පැණිය විසින් ලබා ගන්නා ලද ඉඩම් ප්‍රමාණය—එය අක්කර පන්සියයක් ද, දාහක් ද යන්න මට මතක නැහැ—වගා කෙරෙන ආකාරය තමන්ම ගොස් සියැසින්ම බලා එය කොයි තරම් හොඳට කෙරෙනවා දැයි තමන්ම දැනගත් බවයි එතුමා කියා සිටියේ. එහෙත් මෙතැන කරන්නට හදන්නේ කුමක් ද? පුංචි ගොවියන් වෙනුවට විශාල ඉඩම් යායවල් ගොවිතැන් කරන විශාල ධනපති ඉඩම් අයිතිකාරයන් කොටසක් ඇති කිරීමයි ඩී. එස්. සේනානායක අගමැතිතුමා තේ, රබර්, පොල් යන අංශවලින් ඇති වී සිටි මහා වතුකාරයන් කොයි තරම් පිළිගත්තත්, තමාත් ඒ අයගෙන් කෙනෙක් වී සිටියත්, වී ගොවිතැන් කිරීම පිළිබඳ තමාගේ මූලික ප්‍රතිපත්තිය මේ විධියට අත් හරිමින්, තමාගේ ප්‍රතිපත්තිය කණපිට හරවන අන්දමේ ප්‍රතිපත්තියක් දැන් මේ ආණ්ඩුව ක්‍රියාවේ යොදවන බව දැන ගත්තොත් ඔහු අද වළලනු ලැබ සිටින වළේම කරකැවිකැවී අඬනවාට සැකයක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මේ පළමුවෙන් කියන්නේ මෙහි හරි වැරැද්ද ගැන නොවෙයි. මගේ වේලාව ටිකක් වැඩි වුණේ වී නමුත් මෙහි හරි වැරැද්ද ගැන කථා කරන්නට ගරු නියෝජ්‍ය කථානායකතුමාගෙන් වැඩිපුර වේලාවක් ඉල්ලන්නට මා බලාපොරොත්තු වෙනවා. වචනයෙන් දෙකෙන් කියන්නට මේ කාරණාව වැදගත් වැඩියි. මා දැනට පෙන්වන්නට උත්සාහ කරන්නේ මෙපමණයි. මේක තමයි, මේ ආණ්ඩුව විශේෂයෙන් වී ගොවිතැන පිළිබඳව තමන්ගේ පුරුදු ප්‍රතිපත්තිවලට සම්පූර්ණයෙන්ම පයින් ගැසීමේ පළමු වැනි පැත්ත. ඊ ළඟට දෙවැනි එක ගැන බලමු. වී ගොවිතැන ගැන පමණක් නොව මුළු කෘෂිකර්මය ගැන වුණත් පළමු ප්‍රතිපත්තිය වැදගත් විධියට වෙනස් කර තිබෙන බවයි, මා පෙන්වන්නට උත්සාහ කරන්නේ. අපේ රටේ කෘෂිකර්මය පිළිබඳ ප්‍රශ්නය වී ගොවිතැන සහ අනිකුත් කෑම ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේ ප්‍රශ්නයට පමණක් සීමා වන විධියට කථා කිරීමේ ගතියක් මේ ගරු සභාවේ දී—මේ විවාදයේදී—නිතර නිතර ඇති වී තිබෙනවා. මේ ගැන මේ විධියට සාකච්ඡා කරන විට අපේ මුදල් ඇමතිතුමාටත් ටිකක් ගැස්සෙන්නට සිදු වී ඇති.

ලංකාවේ වී ගොවිතැනට යොදන ඉඩම් අක්කර 15,00,000 ක් පමණ තිබෙන බව ඇත්තයි. එහෙත් ඒ සමගම පොල් අක්කර 12,00,000 ක් තිබෙනවා. තේ අක්කර 6,00,000 ක් තිබෙනවා. රබර් අක්කර —හරියටම ඉලක්කම්වලින් කියනවා නම් —6,69,000 ක් තිබෙනවා. පහසුවට හිතා ගන්නට පුළුවන් රබර් අක්කර 7,00,000 ට කිට්ටු ගණනක් තිබෙනවා කියා. අප මේ හතර පැත්තටම හිත යොමු කරන්නේ නැතිව එක පැත්තකට පමණක් හිත යොමු කර අපේ කෘෂිකර්ම වැඩ පිළිවෙළ හරි ගස්සනවා නම් කෘෂිකර්ම ප්‍රතිපත්තියේම අප නොමග යනවා. එහෙත් ඒ තත්ත්වය ඇති වන බව පැහැදිලියි. ලංකාවේ තේ කර්මාන්තය 19 වැනි ශත වර්ෂයේ අපේ කෝපි කර්මාන්තය ගිය පාර දිගේ දැන් ගමන් කරනවාය කියා අගමැතිතුමාම මෑත දී කී අවස්ථා තිබෙනවා. කෝපි වගේ තේත් ඉවරලු. ආණ්ඩුව පමණක් නො

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වෙයි, ආණ්ඩුව පිටුපසින් සිටින ප්‍රධාන පෙළේ කෘෂිකාර්මික ධනපතීන්ගේ සංවිධාන වන වැවිලිකාර සංගම්වල සභාපතිවරුන් මෙසේ කථා කර තිබෙනවා. තේ ප්‍රශ්නය ගැන අපේ ඔළුව පාවිච්චි කරන්න ඕනෑය කියා එක ප්‍රාදේශීය වැවිලිකාර සංගමයක සභාපති කෙනකු කියා තිබෙන බව ඊයේ පෙරේදා පත්‍රයක පළ වී තිබුණා. තිබෙන අක්කර ප්‍රමාණයෙන් තුනෙන් එකක් පාවිච්චි කරමින් තේ නිෂ්පාදනය කොට රැකෙන්නට අද සිදු වී ඇති බවද ඉතිරි තුනෙන් දෙකට මොනවා කරන්නට ඇයි කල්පනා කරමින් සිටින බවද එතුමා කියා තිබෙනවා. කොටින්ම ඒ මහතා කියා ඇත්තේ වෙන වැවිල්ලක් ගැන සොයන්නට ඕනෑ බවයි. මොන වැවිල්ලක්ද? තණකොළ වැවීමයි. මොන හරකුන්ට කන්නද? තේ කර්මාන්තය නැති වී යන බව හිත යට තබාගෙන "වී ගොවිතැනින් හම්බ කර දෙන්නම්. තේ කර්මාන්තයෙන් ලැබුණු නියම ආදායම සංචාරකයින්ගෙන් හම්බ කර දෙන්නම්" යනුවෙන් ඒ අය දැන් කියනවා නම් එය භයානක දෙයක්.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
ඒකටත් දහ අවුරුද්දක් යනවා.

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)
ඒක කිරීමටත් දහ අවුරුද්දක් යනවා යයි කියන බව අපේ යටියන්තොට ගරු මන්ත්‍රීතුමා මට මතක් කළා. අවුරුදු දහයක් යන විට කී දෙනකුට පණ තිබේදැයි පොතක් නොකියවා බලමින් සිටින රාජ්‍ය ඇමතිතුමාගෙන් මා අහනවා. ඒ වන විට කී දෙනකුට පණ තිබේදැයි අප දන්නේ කොහොමද? මෙහිදී තවත් කාරණයක් මතක් කරන්නට ඕනෑ. තේ පොල් රබර් යන වැවිලි තුන සංවර්ධනය කර තිබෙන්නේ වෙනත් විධියකට නේද? වී ගොවිතැන හා සසඳන විට ඒ වැවිලි සංවර්ධනය කර තිබෙන්නේ වෙනත් ක්‍රමයකටයි. ඒවා සංවර්ධනය කර තිබෙන්නේ වතු යාය ක්‍රමයටයි. එහි විශේෂ ලක්ෂණ හතරක් තිබෙනවා: (1) විශාල අක්කර ගණනක් තිබීම, (2) ලොකුවට විශාල ලෙස මුදල් යොදා තිබීම, (3) විශාල වශයෙන් කම්කරු පිරිස් ඒකරාශි කර තිබීම හා (4) විශාල ලෙස නිෂ්පාදනය කිරීම යන ලක්ෂණ හතරයි. ආහාර නිෂ්පාදනය සඳහා අක්කර 57,000 ක් කොම්පැනිකාරයන්ට දී තිබෙන්නේ 'ප්ලාන්ටේෂන්" ක්‍රමයට හෙවත් වතු යාය ක්‍රමයට වගා කරගෙන යෑමටයි. ඒ විධියට වගා කරන ඔවුන් තේ පොල් රබර් වලින් වෙනදා ඔවුන්ට ලැබුණු ආදායම මේ ගොවිතැන්වලින් ලැබෙතැයි සිතාගෙන ඇති.

මෙහි සමාජයීය හා ආර්ථික ප්‍රශ්න ගැන මම දෙවනුව වචනයක් කියන්නම්. මා දැනට පෙන්වා දෙන්නේ මූලික වෙනස්කම ගැනයි. ඒ මා කී කරුණුවල තුන් වන කාරණය ගනිමු. එදා එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව පිළිගත්තා වූ ඉඩම් අයිති වීමේ ක්‍රමය මේ අලුත් ක්‍රමයෙන් වෙනස් කර තිබෙනවා. පුංචි මිනිහාට පුංචි ඉඩම් දී ඒ පුංචි ඉඩම් ආරක්ෂා කිරීමට 1937 අවුරුද්ද තරමේදී ඩී. එස්. සේනානායක මහතා විසින් ගෙන එන ලද නීති හා ප්‍රතිපත්ති වෙනුවට දැන් ක්‍රියාවේ යොදවන්නේ විශාල ධනපතියන්ට විශාල වශයෙන් ඉඩම් දෙමින් ඒවායේ වගා කිරීම සඳහා මුදල් උපකරණ හා තෑගි දීමයි. තෑගි දෙනවා යයි මා කියන්නේ ඇයි?


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා]

අය බදුවලින් නිදහස් කිරීම තෑගි දීමක්. වී ගොවිතැන සම්බන්ධයෙන්ද අර දේපල ක්‍රමය ඇති කරන්නටයි, මේ ආණ්ඩුව ක්‍රියා කරන්නේ. මෙහි ප්‍රතිඵල මම තව මොහොතකින් මතක් කරන්නම්.

හතරවන වෙනස් කිරීම කුමක්ද? මෙම කාරණය හොඳින් තම සිත්වල ධාරණය කර ගන්නටය කියා රටේ ජනතාවගෙන් මා ඉල්ලනවා. මෙතෙක් කලක් මේ රටේ පැවති සෑම ආණ්ඩුවක් විසින්ම ඉටු කළ යුතු දෙයක් වශයෙන් පිළිගන්නා ලද ප්‍රතිපත්තියක් වූයේ ජීවන අංකය හැකි තරම් පහළින් තබා ගැනීමයි. සෑම ආණ්ඩුවකම ප්‍රධාන අරමුණ වශයෙන් එය පිළිගනු ලැබූ බව අප දන්නවා. වී ගොවිතැන් කිරීමේ සහ වෙන වෙනත් ආහාර ද්‍රව්‍ය වගා කිරීමේ මුවාවෙන් මෙම රජය විසින් ඒ අරමුණ අතහැර දමා තිබෙනවා. ජීවන අංකය අධික ලෙස වැඩි කිරීමේ ප්‍රතිපත්තියක් දැන් මේ අය අනුගමනය කරන වගක් පෙනෙනවා. මා එය ටිකක් විස්තර කර දෙන්නට කැමතියි. පිටරටවලින් ගෙන්වන යමක් එසේ ගෙන්වීම තහනම් කළොත් එය මේ රටේ වැවෙනවා ඇතැයි ඉඩම් ඇමතිතුමා කීවා. ඒ ප්‍රතිපත්තිය උඩ තමයි, පිටරටවලින් අර්තාපල් ගෙන්වන්න එපායැයි ප්‍රකාශ කර තිබෙන්නේ. දැන් අර්තාපල්වල මිල නම් හොඳට වැඩිගෙන එනවා. රාත්තලක් රුපියල් 1.20 යි. හොඳට වැවුණොත් අක්කරයකින් රුපියල් 10,000 ක් ලාබ තිබෙනවාලු. අර්තාපල් රාත්තලක් රුපියල් 1.20 ගණනේ විකිණීමේ වැඩ පිළිවෙළ යටතේ අක්කරයකින් 10,000 ක් හම්බ කරන්න යම්කිසි පුද්ගලයකුට බැරිය කියනවා නම් ඒ පුද්ගලයා එම අර්තාපල් ඉඩමේම වළලා දමන්නට එපිනවානෙ. අපි මේක හොඳින් හිතට ගනිමු. ජීවන අංකය අඩු කිරීම, පාලනය කිරීම, ආරක්ෂා කිරීම හා සීමා කිරීම පිළිබඳ ප්‍රතිපත්තිය දැන් මේ රජය අතහැර දමා තිබෙනවා. ඇත්ත තමයි, මිල පාලන ක්‍රමයක් තිබෙනවාලු. එලරික් අබේගුණවර්ධන පොලිස්පතිතුමා යටතේ නොයෙකුත් තැන්වලට පැන පැන නොයෙකුත් විධියේ බිස්නස් අල්ලන පිරිසක් මෑතදී එක්තරා රෙස්ට් හවුස් එකක බොහොම දියුණු බිස්නස් එකක් අල්ලා තිබෙනවා. මා දන්නේ නැහැ, අපේ රාජ්‍ය ඇමතිතුමාගේ ටුවරිස්ට් බිස්නස් එක දියුණු කිරීමට අවශ්‍ය වන බිස්නස් එකක්ද කියා, ලුනාව රෙස්ට් හවුස් එකේ දැන්මම පටන් ගෙන තිබෙන්නේ.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
(திரு. டி சொய்சா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)
වැඩ හුරුව.

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)
ඒක අමතර කතාවක්.

නොයෙකුත් ද්‍රව්‍ය නිෂ්පාදනය ඇති කිරීම පිණිස ඒ ඒ ද්‍රව්‍යවල මිල අධික ලෙස වැඩි කිරීම අවශ්‍යය කියා මේ ආණ්ඩුව ඕනෑකමින්ම පිළිගෙන තිබෙන බව මා සඳහන් කරනවා.

ඔය අන්දමින් එක්සත් ජාතික පක්ෂයේ ආරම්භක ප්‍රධානීන් විසින් මේ රට ඉදිරියට ගෙනැවිත් තිබුණු මූලික ප්‍රතිපත්ති හතරක්ම මෙම ආණ්ඩුව විසින් අතහැර දමා සිය කැමැත්තෙන් මහා ධනපතීන්ගේ ඒජන්තවරුන් ලෙස වැඩ කරනවාය කියන එකයි, හත් හවුල නමින් පෙනී සිට මේ මුළු රටේම ධනපති පන්තිය එක් රොක් කරන මෙම ආණ්ඩුවට විරුද්ධව මා කරන මූලික චෝදනාව. මෙම අළුත් ප්‍රතිපත්ති හතර උඩ සකස් කර තිබෙන වැඩ පිළිවෙළේ ප්‍රතිඵල මොනවාද යන්න හැකි තරම් ඉක්මණින් මෙම සභාව ඉදිරිපිට තබන්නට මා උත්සාහ කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අපි මුලින්ම ගනිමු, ලොකු ඉඩම් යායවල වී ගොවිතැන් කිරීමේ ප්‍රතිපත්තිය. මේ අන්දමට විශාල ලෙස ධනය යොදා විශාල ඉඩම් යාය ක්‍රම අනුව නවීන ක්‍රමානුකූලව නිපදවීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමෙන් වන්නේ මොකක්ද? සමාජවාදී රටක් හෝ වේවා ධනේශ්වර රටක් හෝ වේවා විශාල ඉඩම් යාය ක්‍රමවලින් කෘෂිකාර්මික නිෂ්පාදනය ඇති කිරීමෙන් සිදු වන්නේ නිෂ්පාදනය වැඩි වන අතරම, එසේ වැඩි වන නිෂ්පාදනය අඩු වන මිනිස් ශ්‍රමයෙන් සිදුවීමයි කියන එක අපි මතක තබා ගන්නට ඕනෑ. නිෂ්පාදනය වැඩි වන ප්‍රමාණය අනුව නිෂ්පාදනයට වුවමනා කරන මිනිසුන් සංඛ්‍යාව වැඩි වෙනවා නොව එසේ නිෂ්පාදනය වැඩි වන්න වන්න වුවමනා වන සේවකයින්, කම්කරුවන්, වැඩකරුවන්, මෙහෙකරුවන් ගණන පහළ බහිනවා ; නැත්නම් අඩු වෙනවා. වෙන කොයි රටක් ගැනවත් බලන්නට වුවමනාවක් නැහැ. අපි අමෙරිකාව ගැන බලමු.

මේ කරුණ මේ ගරු සභාවේදී මා කලිනුත් මතක් කර තිබෙනවා. අමෙරිකාවේ අවුරුද්දෙන් අවුරුද්දට වැඩිවීගෙන යන ජනතාවට වුවමනා කරන කෑම ගැන බලමු. ඒ කියන්නේ කෘෂිකර්මයෙන් නිෂ්පාදනය කරන ද්‍රව්‍යයන්. ඒ නිෂ්පාදනය එන්න එන්නම අඩු පිරිසක් විසිනුයි කරන්නේ. එයින් සිදු වන්නේ කුමක්ද? අමෙරිකාවේ කෘෂිකර්මයේ යෙදී සිටින්නේ අමෙරිකාවේ ජනතාවගෙන් සියයට 9 යි කියා යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) මට මතක් කරනවා. එහෙත් ඒ පිරිස මුළු අමෙරිකාවටමත් කන්න දෙනවා. නියඟය නිසා ආහාර හිඟයකට පත්වුණු ඉන්දියාවටත් කන්න දෙනවා. අපේ රටට පිටිත් එවනවා. මුළු ලෝකයටම වුවත් එක්තරා ප්‍රමාණයකට කෑම දෙන්නට තරම් ශක්තියක් අමෙරිකාවේ තිබෙනවා. එහෙත් බලාගෙන සිටියදීම ගම්බද ජනතාව කෘෂිකර්මයෙන් වෙන්වෙලා. එහෙත් අමෙරිකාවේ නම් එසේ කෘෂිකර්මයෙන් වෙන් වූ අය නගරයට ගොස් ඒවායේ තිබෙන විශාල කර්මාන්තශාලාවල රක්ෂාව ලබා ගන්නවා. මා එන්නේ ඒ ප්‍රශ්නයටයි. කෘෂිකර්මාන්ත දියුණුවේත් කර්මාන්ත දියුණුවේත් යන දෙක අතර ඇති සම්බන්ධය පැහැදිලි කිරීමටයි මා සූදනම් වන්නේ. ඔය එක පැත්තකින්.

මේ රටේ ඊට වඩා වස දෙයක් වෙන්න යනවා. මෙතෙක් කල් අපේ රටේ සිටි වී ගොවිතැන් කරන ගොවීන්ගෙන් සියයට 99 ක් පුංචි අය. ලංකාවේ වී නිෂ්පාදනයේ යෙදී සිටින අයගෙන් සියයට 60 ක් හෝ 65 ක් අක්කරයකට අඩු ප්‍රමාණයක් වගා කරන අය බව ආණ්ඩුවේ සංඛ්‍යා ලේඛනවලින් පෙනෙනවා. ගොවිපොලවල් අක්කර 12,00,000 ක් තිබෙනවා. අපේ ඉඩම් සංවර්ධන ඇමතිතුමා විසින් ආණ්ඩුවේ කැලෑවලින් අල්ලා ගන්නට ඉඩ දී තිබෙන අක්කර බාගයේ ගොවිපොලවල් මා ගණන් ගන්නේ නැහැ. විශාල ඉඩම් යායවල් ගොවිතැන් කරන කොම්පැනිකාරයෝ ඔවුන්ගේ ඒ බඩු විකිණීමේ ක්‍රමයක් යොදාගෙන යන මේ අවස්ථාවේ දී ආණ්ඩුව බලාපොරොත්තු වන විධියට ඒවායේ නිෂ්පාදනය දවසින් දවස වැඩි වී ඒවායේ මිල බහිනවා නම් ලංකාවේ හැම තැනකම සිටින අර පුංචි ගොවිරාළලාට සිදු වන්නේ මොකක්ද? ඔවුන්ට තමන්ගේ ඉඩම් ටිකත් නැති වෙනවා. කව්ද ගසා කන්නේ? ගමේ මුදලාලි නැත්නම් ගමට යාව සිටින කොම්පැනිකාරයායි. මේ ඉඩම් ප්‍රතිපත්තිය අනුව අපේ රටේ පුංචි ගොවියෝ සිය ඉඩම් වලින් පැන්නී ගොස් මේ රටේ දවසින් දවසට වැඩි වන අර රක්ෂා සොයන සංඛ්‍යාවට එකතු වෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක සුළු ප්‍රශ්නයක්ද? ආණ්ඩුවේම කැබිනට් කමිටුවක් විසින් මේ රැකී රක්ෂා ප්‍රශ්නය ගැන ඉදිරිපත් කළ වාර්තාවකින් උපුටාගත් කොටසක් මීට සුමාන 4 කට පමණ ඉහත "ඩේලි නිවුස්" පත්‍රයේ පළ වී තිබුණා. අද ලංකාවේ රැකී රක්ෂා නැති අයගේ සංඛ්‍යාව 5 ලක්ෂයක් බවත් 1970 වන විට ඒ ගණන 10 ලක්ෂය දක්වා නගින බවත් එම වාර්තාවෙහි කියා තිබෙනවා. සෙන්ට්‍රල් බෑන්ක් එක කැබිනට් කොමිටියට ඒ විධියට වාර්තා කර තිබෙන බවයි එම වාර්තාවෙන් කියැවෙන්නේ. වෙන රටවල කැබිණට් කොමිටියක් ඔය විධියේ වාර්තාවක් පිට කළා නම් එදම ඒ රටේ මිනිසුන් එම ආණ්ඩුව කනෙන් අල්ලා එළියට තල්ලු කර දමනවා. එහෙත් අපේ රටේ ආණ්ඩුව "මෙහෙම කළාට අපට වැදපල්ලා" යි මහ ජනයාට කියනවා. මේ කාරණය මා ඉදිරිපත් කරන්නේ තර්කයක් වශයෙන් නොව වැදගත් කරුණක් පැහැදිලි කිරීම එයි.

මෙතෙක් කල් ඉඩම් පොඩ්ඩක වැඩ කර ගෙන ආ ගම්බද සුළු ගොවි ජනතාවට මොකක්ද මේ කරන්නට යන්නේ? එක් අතකින් පොඩි ඉඩම් කරුවා ලොකු ඉඩම් හිමියාට ගිල්ලනවා. අනෙක් පැත්තෙන් ඉඩම් සංවර්ධනය භාර ඇමතිතුමා කියනවා, ඉඩම් අක්කරය, භාගය මේ විධියට පැහැර ගැනීම සිදුවේගෙන ගියොත් එය නීතිගත කරන්නට එතුමා සූදානම් බව. එකක් උදුරා ගන්නට මෙහෙන් අනුබල දෙන ගමන් අනෙක් පැත්තෙන් ලොකු මිනිහට කියනවා ඒකත් ගිල ගනින් කියා. මේක අලුත් ක්‍රමයක් වුවත් අභ්‍යන්තරව පරස්පර විරෝධී ක්‍රම දෙකක්. මා මෙයින් පැහැදිලි කරන්ට උත්සාහ ගන්නේ මේ කාරණයයි: මේ ආණ්ඩුව බලාපොරොත්තු වන පිළිවෙළට කෘෂිකර්මය දියුණු කරන්නට නම් අනෙක් පැත්තෙන් කර්මාන්ත දියුණුවක් අවශ්‍ය බව දැන් පැහැදිලි නේද ගරු නියෝජ්‍ය කථානායකතුමනි? මා කලින් කී විධියට ඒ කුඩා ඉඩම්වලින් වීසි වී රක්ෂා නැති වන පිරිසට රක්ෂා සැපයීමට මේ ප්‍රතිපත්තිය අනුව කෘෂිකර්මයෙන්ම පමණක් මාර්ගයක් නැති බවත් මාර්ගය ඇත්තේ කර්මාන්ත දියුණු කිරීමෙන් පමණක් බවත් දැන් තමුන්නාන්සේට පෙනෙනවා ඇති. මේ සඳහා වෙනත් ක්‍රම තිබෙනවා. එහෙත් එය පිළිගන්නා ලෙස මේ ආණ්ඩුවට කියන්නට අපට පුළුවන්කමක් නැහැ. ඒ සමාජවාදී ක්‍රමයයි. පොඩි ඉඩම් කාරයින්ට විශාල වතු යායවලින් වාසි හා වරප්‍රසාද ලබා ගත හැකි මාර්ග ඇති වන්නේ වී ගොවිතැනත් ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනයත් සමුපකාර ක්‍රමය අනුව දියුණු කිරීමෙනුයි. ඒ කට යුත්ත මේ ආණ්ඩුවට බාර දෙන්නට අප ලෑස්ති නැහැ. එය අපට අයිති වැඩක්. මේ ආණ්ඩුව ඒ ප්‍රතිපත්තිය පිළිගන්නේ නැහැ. කවදා හෝ එය අපෙන් ඉෂ්ට වනවා ඇති. තමුන්නාන්සේලා ඊට අකමැති නම් ඒ ගැන අපට කරන්නට දෙයක් නැහැ. කැමති නම්, අප ඒ වැඩේ කළ දවසට ඊට ආවඩන්න.

දැන් ඉතින් අප මේ ප්‍රශ්නයේ තවත් පැත්තක් දෙස බලමු. එය, සාමාන්‍යයෙන් මේ සභාවේත් රටේත් මතක් නොකෙරෙන දෙයක්. වී ගොවිතැනින් වේවා, වෙනත් කවරම කෘෂිකර්මාන්තයකින් වේවා ගම්බද ජනතාව ඔවුන්ගේ ආදායම වැඩි කර ගන්නේ කුමකටද? ඔවුන්ගේ ජීවන තත්ත්වය නඟාසිටුවා ගන්නටයි. එය ඉෂ්ට කර ගැනීමේ අර්ථය කුමක්ද? ඔවුන්ට අවශ්‍ය විවිධ බඩු භාණ්ඩ ලබා ගැනීමයි. ගම්බද ජනතාවගේ කෘෂිකර්මාන්ත කටයුතු දියුණු වී ඔවුන්ගේ ආදායම වැඩි වන විට ඔවුන්ගේ කටයුතු සඳහා,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කර්මාන්ත ශාලාවලින් පිට කෙරෙන නොයෙක් විධියේ කාර්මික බඩු භාණ්ඩ ඔවුන්ට වුවමනා වෙනවා. මේ කාරණයට දැන් තමුන්නාන්සේලාගේ සිත් යොමු කිරීම වැදගත් වෙනවා. කෘෂිකර්මාන්තය දියුණු වීමෙන් ගම්බද ජනතාවගේ ආදායම් තත්ත්වය ඉහළ යන විට ඒ ප්‍රමාණයට ඔවුන්ට වුවමනා කරන නිසි බඩු භාණ්ඩ කර්මාන්ත පැත්තෙන් ලැබෙන්නේ නැත්නම් එයින් ඔවුන් අධෛර්යමත් වීම හේතු කොට ගෙන අර නැගිගෙන ආ කෘෂිකර්මාන්ත දියුණුව ඇනහිටින්නට බලන බව නොයෙක් රටවල ඉතිහාසයෙනුත් අත්දැකීම්වලිනුත් පැහැදිලි වී තිබෙනවා. ඒ නිසා එක පැත්තකින් රටේ කර්මාන්ත දියුණුවක් ඇති කරන අතරම අනික් පැත්තෙන් කෘෂිකර්මය දියුණු කිරීමත් අවශ්‍යයි.

ඊ ළඟට අපේ ආර්ථික ක්‍රමයේ වෙන පැත්තකින් මෙයට මුහුණ පාන හැටි බලමු. ආණ්ඩුව පැත්තෙන් කියන්න පුළුවන්—කිව්වොත් අකල්පනාකාරී කියමනක්—කෘෂිකර්මය අතින් ජනතාවගේ ආදායම වැඩි වුණ විට කාර්මික භාණ්ඩ පිට රටින් ගෙන්වාගන්නට අපට පුළුවන් නොවේද කියා. එහෙත් ඒකෙන් ගැළවෙන්න නොවේද මේ කර්මාන්තය නිෂ්පාදනය ආරම්භ කෙළේ. එපමණක් නොවෙයි, ඒ සඳහා විදේශ විනිමය නැති බව නොවේද සැමදාම කියන්නේ. නැති විදේශ විනිමයකින් බඩු ගෙන්වා දෙන්නේ කොහොමද?

තේ මිලත් බසිනවාලු. රබර් මිලත් බසිනවාලු. අද මේ රටේ පොල් වගාව ගැන මා වාර්තාවලින් කියවා තිබෙනවා, මේ රටේ වැඩි වේගෙන යන ජනගහනයට අනුව වුවමනා කරන පොල් ප්‍රමාණය ගැන ගණන් බලන විට තව අවුරුදු 10ක් 20ක් ඇතුළත අපේ රටින් පිට රටට පොල් යවන්න බැරි තත්ත්වයක් උදා වෙනවාය කියා. මේවා අප දන්නා වූ දේවල්. එසේ නම් අප කොතෙක් දුර යන්නද?

නියෝජ්‍ය කථානායකතුමනි, මා උත්සාහ කෙළේ මෙන්න මේ කරුණු ටික පෙන්වා දෙන්නටයි. වී ගොවිතැන දෙසටවත් කෘෂිකර්මාන්තය දෙසටවත් ප්‍රධාන ලෙස තමන්ගේ වැඩ පිළිවෙළ සීමා කරන ආණ්ඩුවකින් අන්තිමයේදී කෘෂිකර්ම දියුණුවක් ඇති වන්නේ නැති බවයි. එවැනි කෘෂිකාර්මික දියුණුවක් ලබා ගැනීමට නම් ඒ සමගම කර්මාන්ත දියුණුව ඇති කිරීම අවශ්‍යයි. මේ දෙක එකක් අනෙකට බලපානවා. ජාත්‍යන්තර බැංකුවලින් කොපමණ උපදෙස් දුන්නත්, හික්ස් මහත්මයා මෙහාට ඇවිත් අපට වෙනින් බණක් කිව්වත්, ඔය ධර්මය නම් වෙනස් කරන්න පුළුවන් සමතෙක් තවම ලෝකයේ ඉපදී නැහැ. ඒකයි මෙහි සත්‍යය.

මීළඟට කර්මාන්ත අංශය සම්බන්ධයෙන් අපේ රටේ සිදු වේගෙන යන තත්වය ගැන මගේ කටින් නොව හොඳ කටකින් කියා ඇති දෙයක් කියවා මගේ කථාව අවසන් කිරීමට මා බලාපොරොත්තු වෙනවා. අපේ කෘෂිකර්ම ඇමතිවරයා සැමදාම තම කථාව පටන්ගන්නේ අඟවල් කාරණය ඉදිරිපත් කළ අහවල් මන්ත්‍රීවරයා දැන් මෙහි නැත යනාදී වශයෙනි කියමිනුයි. ඒ නිසා මේ කොටස මා කියවන්න බලාපොරොත්තු වේන්නෙත් අපේ කෘෂිකර්ම ඇමතිතුමා මෙතැන නැති බව මතක් කරමිනුයි.

මේ සභාවේදීම මටත් අනික් මන්ත්‍රීවරුන්ටත් ඒ වාගේම සෙනෙට් මන්ත්‍රීවරුන්ටත් "Industrial Ceylon—Journal of the Ceylon National Chamber of Industries" නමැති සඟරාවක් ලැබුණා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මෙහි බොහෝම වැදගත් කතීඃ වාක්‍යයක් තිබෙනවා. "Export promotion an urgent need"—"පිට රටට බඩු යැවීම වැඩි කිරීම හදිසි අවශ්‍යතාවක්" යනුවෙන් මෙහි 121 වෙනි පිටුවේ කතීඃ වාක්‍යයේ අවසාන වාක්‍යයට පෙර තිබෙන වගන්තියේ බොහෝම වැදගත් කියමනක් තිබෙනවා. මේ කථා කරන්නේ මේ රටේ කර්මාන්ත දියුණුවට හා පිට රට බඩු යැවීම වැඩි කිරීමට ඇති අවශ්‍යතාව ගැනයි. "Import substitution" කියා මෙහි සඳහන්කර තිබෙනවා. "Import substitution" කියන්නේ පිටරටින් ගෙන්වන බඩු මේ රටේ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත ක්‍රමයක් ඇති කිරීමේ වැඩ පිළිවෙළයි. මට සමාවන්න, සිංහලෙන් දීර්ඝ වාක්‍යයක් කියන්නෙ නැතුව, "ඉම්පෝර්ට් සබ්ස්ටිටියුෂන්" කියන ඉංග්‍රීසි වචනයම මා පාවිච්චි කරනවා. මේ පොතේ මෙනන් මේ අන් දමට, "ඉම්පෝර්ට් සබ්ස්ටිටියුෂන්" ගැන කියා තිබෙනවා :

"The same objective can also to some extent be achieved by import substitution. The Government has not yet followed vigorously a policy of import substitution. In our country, the import traders are a powerful force."

හොඳින් හිතට ගන්න. අප රටට පිට රටින් බඩු ගෙන්වන වෙළෙන්දන් බොහොම බලසම්පන්න කොටසක්. ඒක ඇත්ත.

**රාජා කුලතිලක මයා.** (තෙල්දෙණිය)
*(திரு. ராஜ குலத்திலக்க—தெல்தெனிய)*
(Mr. Raja Kulatillake—Teldeniya)

බලවේගයක් !

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

බලවේගයක් තමයි. බලසම්පන්න බලවේගයක්යයි කියන්න බැරිකම නිසයි මා එහෙම කිව්වෙ. තවදුරටත් මෙන්න මෙහෙම කියනවා :

"Whenever a Government follows a gradual policy of import substitution, these traders raise a hue and cry."

ආණ්ඩුව විසින් කිසියම් අවස්ථාවක මෙම "ඉම්පෝර්ට් සබ්ස්ටිටියුෂන්" කියන ක්‍රියා පිළිවෙළ ක්‍රමානුකූලව ක්‍රියාවෙ යොදන්න ඉදිරිපත් වෙනවාද, මෙම ආනයන වෙළෙඳුන් පිරිස විශාල උද්ඝෝෂණයක් කරනවා.

"They create scarcities in the local market and the Government is compelled to revise its policy."

මම ඒ වාක්‍යය නැවත වරක් කියවන් නම්.

"They create scarcities in the local market."

මේ ධනපති ආනයන වෙළෙන්දන් විසින් වුවමනාවෙන්ම බඩු හිඟයක් අපේ රටේ ඇති කරනවා, ආණ්ඩුවට කරන බලපෑමක් වශයෙන්, "ඉම්පෝර්ට් සබ්ස්ටිටියුෂන්" ක්‍රියා පිළිවෙළ අත් හරින්නට.

"Firm action by the Government is required in this matter."

තද ක්‍රියාවක් කරන්න ඕනැලු ආණ්ඩුවෙන්.

"The trading elements must be clearly told that the economic development of the country cannot be sacrificed to safeguard their individual profits."

මෙම ආනයන වෙළෙන්දන්ට පැහැදිලි ලෙස පෙන්වා දිය යුතුයි, වෙළෙඳුන්ගේ පෞද්ගලික ලාභ අපේක්ෂාවන් රැක දීමෙන් රටේ අයිතිවාසිකම්, ආර්ථික දියුණුව අත්හරින්නට බැරිය කියන කාරණය. ඇත්ත තමයි. ඒ මිනිසුන් එසේ කියන්නේ ඒ මිනිසුන්ගෙ පෞද්ගලික ලාභය ආරක්ෂා කර ගන්නටයි. කොහොම වුණත් ඉඳ හිට මෙහෙම දේවල් කියනවා. අර කියමනක් තිබෙනව, හොරු දෙගොල්ලක් රණ්ඩුවට වැටුණාම අවංක මිනිසුන්ගෙ තත්ත්වය හැඩ ගැසෙනවාය කියා. මේ සිද්ධියත් ඊට සමානයි. කර්මාන්ත ඇමතිතුමා මේ ගරු සභාවෙ නැති නිසා අපේ උප ඇමති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තුමාගෙ මාර්ගයෙන් මතක් කරනවා, මෙතැන ඇත්තවශයෙන්ම තිබෙන ප්‍රතිපත්තිය ගැන.

අපේ රටේ ආර්ථික ක්‍රමයෙහි දියුණුව, අනිකුත් සමාජයීය දියුණුව සම්පූර්ණයෙන්ම වාගේ රඳා පවතින්නෙ, මා සඳහන් කළ මෙවැනි දේවල් මතයි. එසේ නම් ආර්ථික ක්‍රමයේ සෑම පැත්තක්ම එකිනෙකට බලපාන නිසා, එකිනෙකට සංසන්දනය කරමින් දියුණුවක් ඇති වන සැලැස්මක් අනුව වැඩ කටයුතු ගෙන යන්න ඕනෑ. ආර්ථික සැලැසුම් ගැන මොන විධියෙන් කථා කළත්, සැලැස්මේ නියම ප්‍රශ්නයට මෙතෙක් ළඟා වී නැහැ. එවැනි දෙයක් මේ ආණ්ඩුවේ තිබෙන බව අපට නොපෙනෙන නිසයි මෙම ආර්ථික තත්ත්වයෙන් අපට ගැළවෙන්න බැරි යයි මා ප්‍රකාශ කළේ.

තව එක් වැදගත් කාරණයක් ගැන සඳහන් කරන්න කැමතියි. මෑතක පළ වුණු ප්‍රවෘත්ති පත්‍රවල දකින්නට ලැබුණා, අද මුහුණ පා ඇති තත්ත්වයෙන් ගැළවෙන්න ආණ්ඩුව තවත් විධියක් සොයන්න යන බව. එනම්, පොදු වෙළෙඳ පොළකට සම්බන්ධවීමයි. අග්නිදිග ආසියාතික රටවල් පහකින් යුක්ත පොදු වෙළඳ පොළකට බැඳෙන්න යනවා. ඒ ගැන තවදුරටත් කියවා බැලුවාම එකපාරටම පෙනී යනව, චීන විරෝධී, ඇමෙරිකන් පන්දම් කාර යින්ගෙ රටවල් පහක් එකතු වී සෑදුණු මණ්ඩලයකට අපේ රටත් ඇතුළත් වෙන්න ඉල්ලුම් කර තිබෙන බව. ඒක බොහොම සාධාරණයි. තමන්ගේ නියම විදේශ ප්‍රතිපත්තිය ලෝකයට පෙනෙන ආකාරයෙන් කටයුත්තකට ඉදිරිපත් වීම සාධාරණයි, හරියි. එහෙත් ඒ ගැන වචන යක් දෙකක් කියා මගේ කථාව ඉවර කරන් නම්.

අග්නිදිග ආසියාවේ වේවා, පෙරදිග ආසියාවේ වේවා, ආසියාවේම වේවා ආර්ථික දියුණුවක් ගැන චීනය පිට කර—වෙන් කර—කල්පනා කරන්නට බැරි බව අප මතක තබා ගන්නට ඕනෑ. ඒ විතරක් නොවෙයි. තවත් එකක් කියන්නම්. මොනවාද, මේ රටවල් ? පිලිපයිනය, තායිලන්තය—තවත් ටිකක් යනකොට දකුණු වියට්නාමයත් ඒවි—මැලේසියාව වැනි රටවල් සමඟද, අප පෑහෙන්නට යන්නේ ? පිලිපයිනය අප වාගේම පොල් නිෂ්පාදනය කර පිටරට යවා රැකෙන රටක්. මැලේසියාව අප වාගේම රබර් නිෂ්පාදනය කර පිටරට යවා රැකෙන රටක්. ඉන්දුනීසියාව අප වාගේම ඉස්සර තේ පිටරට යවා රැකුණ රටක්. මෙවැනි රටවල් තම තමන් අතරේ වෙළෙඳපොළක් ඇති කර දියුණු කර ගන්නවාට වඩා, ඒ රටවල් හතර පහ එකතු වී යුරෝපා, අමෙරිකන් ආදි සූරා කන කාර්මික රටවලට විරුද්ධව, අප හදන අමු සහ මූලික ද්‍රව්‍ය මීට වඩා හොඳ මිළකට විකුණා ගැනීමට වැඩ පිළිවෙළක් හැදීම නේද අවශ්‍ය ? එවැන්නක් කරන්නට අමෙරිකා සෙවණේ තිබෙන "කොමන් මාකට්" එකෙන් ඉඩ ලැබේයැයි කවුරුන් වත් හිතනවා නම්, ඔහු ලෝකය ගැන දන්නා කෙනකු නොවෙයි.

නියෝජ්‍ය කථානායකතුමනි, තමුන් නාන්සේ මට මෙපමණ වේලාවක්—වැඩි වේලාවක්—දුන්නාට මගේ ස්තුතිය අවංකව පුද කරනවා. මේ ආණ්ඩුවේ වැඩ පිළිවෙළට අප විරුද්ධ වන්නේ නිකම් අත නින් මෙතැනින් තිබෙන පොඩි පළුද්දක් නිසා නොවෙ, මුළු වැඩ පිළිවෙළම මූලිකවම වැරදි නිසා බව ඔප්පු කරන්නට මා උත්සාහ කළ අතර, එය තරමක් දුරටවත් පැහැදිලි වුණායැයි විශ්වාස කරමින්, ප්‍රාර්ථනා කරමින් මගේ කථාව මෙයින් අවසාන කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 5.28

ශ්‍රීමත් රැසික් ෆරීඩ් (පත් කරන ලද මන්ත්‍රී—කාරක සභා නියෝජ්‍ය සභාපති)
*(ஸ்ரீமான் ருஸிக் பரீத்—நியமன அங்கத்தவர்—குழுக்களின் உப அக்கிராசனர்)*
(Sir Razik Fareed—Appointed Member —Deputy Chairman of Committees)

Mr. Deputy-Speaker, I must congratulate the Hon. Minister of Finance on presenting a Budget which I should like to call "a not hurting anyone Budget". Unlike some previous Finance Ministers who presented only one or two Budgets, he has survived to present his third Budget.

A great deal of praise is due to the Hon. Prime Minister on his foresight in meeting the *goviyas* personally and instilling into their minds the advantages of the "Grow More Food Campaign". He has also made them understand that the future of this country rests in the hands of our *govi-rajas*.

The unsatisfactory prices obtained for our produce, namely, tea and coconut specially, makes us think that we have to look for further fields anew. As the previous speaker said, the coconut industry has got to be carefully watched because there is a disease that is prevalent in certain parts of the Island. That dreadful disease starts on the leaves and, if not checked by the diseased leaves being chopped off, it practically kills the tree. Moreover, most of our trees are past 70 and 80 years of age; we have not taken the precaution of under-planting.

I feel that a long-term perspective is urgently needed. As a matter of fact, I feel the time has come when we shall have to get back to coffee. Two or two and a half years ago I grew some coffee plants and within about two and a half years I was able to see results, which were good, even though I planted them in the Kurunegala District.

The Hon. Minister of Agriculture and Food really deserves more than a meed of praise. His energetic Parliamentary Secretary, who is a man of wide experience where agriculture is concerned, is really a very great asset to the country. I remember the assistance he rendered me personally. I started a cattle farm following his instruction, and lol and behold ! within three months the three cows that I bought gave me such profit that I was able to buy three more cows, and thanks to this energetic Parliamentary Secretary, the number of cows I have today, bought by the sale of milk, is about twenty. I am speaking of my personal experience to point out that if one-third of the Members of this House start dairy farming they can give up their seats in Parliament where they get an allowance of Rs. 600 to Rs. 700, because dairy farming is very profitable. Those who really want to work for the people of this country, even though they have dairy farms, can enter Parliament. In the matter of the purchase of cows, I would strongly urge them to go in for Jersey and Ayreshire cows because they give more milk than any other breed of cows. In this connection I would ask the Government to see that adequate supplies of cattle food and poultry food at reasonable prices are provided to the cattle farmers and poultry farmers so that they will be able to run these farms profitably. As you are aware, Sir, a number of people who started poultry farming in your area had to give it up because of the high price that they had to pay for poultry food.

I think the Hon. Minister of State deserves the heartiest congratulations of the traders and business men—particularly of the Ceylonese businessmen who practically went to the wall for want of financial assistance—on what he has done for them. They should be beholden to this worthy Minister.

The only thing I should like to ask the Hon. Minister of State is to see that he takes steps to break up the monopoly enjoyed today even by Ceylonese interests in the trade and provide quotas to the new comers.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Another matter that I should like to mention is the state of the beedi industry. I understand that we have taken steps to produce a certain amount of beedi leaf in this country, but I think we import most of our requirements in beedi leaf from India. An endeavour must be made to produce all the beedi leaf we need in Ceylon. The Hon. Minister of Home Affairs has been helping the very poor new-comers into this business and he has won their grateful thanks.

I welcome the relief given to the Government servants, but I am eagerly looking forward to the grant of some relief to the other sector as well.

In regard to the Ministry of Health, I find that the Ayurveda system of medicine is being helped to a very great extent, and I am very happy about it. But, although Ayurveda means Ayurveda, Sidda and Unani systems of medicine, the Unani system of medicine has been very badly neglected. I say this because even in the Speech from the Throne this system of medicine is not mentioned ; only the Ayurveda and Sidda systems are mentioned. I do hope that the Hon. Minister who is a friend of mine, will pay heed to what I have now said and do some useful service to the Unani section of Ayurveda as well.

I find that the Ministry of Education has not paid any head whatsoever to the request for a Muslim University. We presented to the Hon. Minister a memorial signed by a number of Muslim Members of Parliament, asking for a Muslim University. Unfortunately, not a word has been said about it in this Debate. Nor is there any indication that there is going to be a junior Muslim University in any of the Moor areas.

The Budget speech of the Hon. Minister of Finance contains this statement :

> " Steps have also been taken to establish five junior university colleges at Dehiwala, Galle, Kegalla, Kuliyapitiya and Palaly . . " [OFFICIAL REPORT, 25 July, 1967 ; Vol. 73, c. 47.]

Why have you not thought of establishing a junior university in the Eastern Province, or in Beruwala where Moors preponderate and Unani is practised to a very great extent ?

At one time a particular Muslim reader was very much in use in the 400-odd Government Muslim schools. This reader was printed and distributed by the Moors' Islamic Cultural Home. Now that the Government has taken over the printing of textbooks for schools, this particular reader has been completely overlooked and the result is that there is no proper Muslim reader for the 400-odd Government Muslim schools in the Island. I do hope that the Hon. Minister of Education will take cognizance of what I have stated here.

I will be failing in my duty if I do not mention the subject of orchids. They are a potential dollar earner, and I feel that the Government should give every encouragement to orchid growers and culturists to export orchids.

I would also stress that where animals are concerned, fresh and better strains are needed. I would ask the Minister of Finance to allow the duty-free import of thoroughbred animals—cattle, horses, dogs, and poultry.

With regard to the Middle East, let the Government declare that all support given to our Arab brethren will qualify for tax relief. This will enable us Ceylonese to offer our whole-hearted support to the Arabs in their just struggle against foreign domination. That would be more meaningful than empty words.

I read in this morning's " Sun " that a Reverend Thero was in favour of the legalization of bookmakers. I



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ශ්‍රීමත් රසීක් ෆරීඩ්]

am a Muslim, and Islam forbids gambling as indeed other religions do. But any help that a religious body or community or denomination can give to the Government must always be forthcoming. I remember, the hon. Member for Yatiyantota (Dr. N. M. Perera) when he was Minister of Finance said that if bookmakers are legalized the Government would get Rs. 60 million by way of tax. That is not a small amount. Instead of going begging for aid we can get some money by legalizing the bookmakers. Although a Muslim, I have no objection to the legalizing of the bookmakers because it would be for the benefit of Mother Lanka.

I am glad that the Minister of Labour is present. It is said that 65,000 to 75,000 persons were employed by the bookmakers all over the Island. I hope that he will not bring these people under the Labour Ordinance as that would result in their getting a wage of Rs. 2.50 or so a day. Let the bookmakers pay the usual amounts they have been paying these youngsters.

I was very sorry to have received a copy of a letter from the All-Ceylon Buddhist Congress Headquarters in these terms :

"We note that Catholic organizations are purchasing land on a large scale in Buddhist villages and establishing Catholic colonies in their midst. This situation has already taken place in four villages and we understand that this is to happen elsewhere as well. We have no legal means of coping with this policy of the Catholic Church. Moreover we are desirous that nothing should happen to affect our friendly and peaceful relations with all religious denominations in this country. However, the policy mentioned above is causing us anxiety."

I personally feel that this is a step in the wrong direction. This is independent Lanka. I am not a Catholic, but still I, as a Ceylonese, feel that it is a wrong step to take. Why cannot anybody buy, in independent Lanka, any blocks of land he needs if he has the money ? I do hope the Government will see to it that no steps are taken in the direction of preventing anybody, whether he be a Catholic, a Muslim, a Buddhist, or a Hindu, from buying land, provided he is a Ceylonese. Let any Ceylonese buy land anywhere he likes. This is Free Lanka.

For more than twenty years I have stood for Sinhala as the official language. I have one reason, and one reason alone, and that is, that there will be unity. Against great odds, four Sinhalese gentlemen and I, the only minority man, stood for Sinhala. And to receive letters such as this is most heart-rending.

I am looking forward to the day when the Sinhalese, the Tamils, the Moors, the Malays and the Burghers, the five communities that go to form the Ceylonese nation, will be known as Ceylonese and nothing else. No denominational differences, such as Muslim, Buddhist Hindu or Christian, should stand in the way of our getting together as a Ceylonese nation. I do hope the day is not far off when we shall all be known as Ceylonese. When we leave Ceylon and go abroad we are not known as Sinhalese Buddhists or Sinhalese Christians. We are all known as Ceylonese. Let us also live here peacefully as Ceylonese.

අ. භා. 5.50

**පී. බී. ජී. කළුගල්ල මයා.** (කෑගල්ල)
*(திரு. பீ. பி. ஜீ. கலுகல்ல—கேகாலை)*
(Mr. P. B. G. Kalugalla—Kegalla)

පත් කරන ලද මන්ත්‍රී ශ්‍රීමත් රසීක් ෆරීඩ් මැතිතුමාගේ කථාවෙන් අපට වැටහී ගියේ මුස්ලිම් ජනතාව වෙනුවෙන් මෙපමණ කාලයක් ඉදිරිපත් කරන ලද ඉල්ලීම් මේ ආණ්ඩුවේ යම් යම් ඇමතිවරුන්ගෙන් ඉටු වී නැති බවයි. එතුමාගේ කථාව සම්බන්ධයෙන් මා වෙන යම් දෙයක් කියන්ට යන්නෙ නැහැ. අපි රට පාලනය කළ කාලසීමාව තුළදී මේ රටේ මුස්ලිම් ජනතාවට, අධ්‍යාපන අංශයෙන් මෙන්ම සංස්කෘතික අංශයෙනුත් කර තිබෙන සේවාව එතුමා පමණක් නොව හැම මුස්ලිම් මන්ත්‍රීවරයකුම දන්නවා ඇති.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් ඇමතිතුමකුගේ අයවැය කථාවකින් මේ රටේ ජනතාව බලාපොරොත්තු වන කරුණු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කීපයක් තිබෙනවා. පළමුවෙන්ම රටේ ජනතාව බලාපොරොත්තු වෙනව, ජීවන වියදම ; මනුෂ්‍යයෙකුට එදිනෙදා දැරීමට සිදුවන වියදම අඩු වෙයි කියා. ඒ වගේම තමන්ට වුවමනා කරන ආහාර ද්‍රව්‍ය ටික අඩු මිළකට ලබා ගන්ට පුළුවන් වෙයි කියා බලාපොරොත්තු වෙනවා. ඒ වගේම රැකී රක්ෂා නොමැතිව ගෙවල්වල නිදැල්ලේ සිටින උදවිය අපට රැකී රක්ෂා ලැබෙයි කියා බලාපොරොත්තු වෙනවා. එපමණක් නොවෙයි, රටේ ආර්ථික තත්ත්වය ගැන දැනුමක් තිබෙන උදවිය බලාපොරොත්තු වෙනව, රටේ ආර්ථික තත්ත්වය දියුණු කිරීම සඳහා යම් යම් හොඳ වැඩපිළිවෙළ වල් මේ ආණ්ඩුව විසින් ඉදිරිපත් කරාවිය කියා. රටේ ජනතාව තමුන්නාන්සේ ඇතුළු දෙමව්පියන් හැම කෙනෙක්ම අන්තිමට බලාපොරොත්තු වෙනව, තිස් ලක්ෂයක් පමණ වන අපේ ඉගෙන ගන්න ශිෂ්‍ය ශිෂ්‍යාවන් පිරිස වෙනුවෙන් හොඳ අනාගත වැඩපිළිවෙළක් රජය මගින් ඇති කරයි කියා. මා ඒ සඳහන් කළ කරුණු 6 න් එකකටවත් නියම සැලැස්මක්, නියම වැඩ පිළිවෙළක් මේ අයවැය ලේඛනයෙන් සලසා නැති බව මුදල් ඇමතිතුමාගේ ඒ සංවේග ජනක කථාවෙන්ම රටට වැටහී ගියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ මේ කථාව මා විශේෂයෙන් වැය කරන්නේ ඉගෙන ගන්න පිරිස වෙනුවෙන් හා මේ රටේ රැකිරක්ෂා නොමැතිව සිටින 10 ලක්ෂයක් වන පිරිස වෙනුවෙනුයි. අපේ ගරු අගමැතිතුමාත්, මුදල් ඇමතිතුමාත්, අනිකුත් ඇමතිවරුත් නොයෙක් අවස්ථා වල කියා තිබෙනවා, අපේ ආණ්ඩුවේ සම්පූර්ණ ශ්‍රමය යොදල අපට වුවමනා කරන සහල් ලංකාවේම නිපදවා ගන්ට පුළුවන් තත්ත්වයට අපේ කෘෂිකර්මය දියුණු කරනවා කියා. එහෙත් කෘෂිකර්මය ගැන කථා කරමින් මගේ කථාව දීර්ඝ කරන්නට මා අදහස් කරන්නේ නැහැ. කෙසේ වෙතත් යහපත් ආර්ථික පදනමක් ඇතිව යම් ආණ්ඩුවක් වැඩ කරන්නට උත්සාහ කරනවා නම්, බලාපොරොත්තු වෙනවා නම්, ඒ ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලය රටටත්, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ටත්, විරුද්ධ පක්ෂයෙ මන්ත්‍රීවරුන්ටත් ආදර්ශයක් වන අන්දමින් වැඩ කළ යුතුයි. මමත් හය මාසයක පමණ කාලයක් තිස්සේ ඔය මුදල් ඇමතිතුමා දරණ ධුරයේ හිටියා. ඒ අවදියේදීත් අද වාගේම විදේශීය වත්කම් අඩු වී තිබුණා. එදා මා මුදල් අමාත්‍ය ධුරය භාර ගන්නා අවස්ථාවේ දී මේ රටේ විදේශ වත්කම් 39 කෝටිය දක්වා අඩු වී තිබුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊට කලින් දොම්පේ ගරු මන්ත්‍රීතුමා (එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) අයවැය ලේඛනයක් ඉදිරිපත් කළා. ඒ අයවැය ලේඛනයෙන් හය මාසයකට පමණක් හාල් හුණ්ඩු දෙකක් කැපිය යුතුය කියා යෝජනාවක් ඉදිරිපත් කළා. එසේ හාල් හුණ්ඩු දෙකක් කැපිය යුත්තේ අපට වුවමනා කරන පිටි, අල, පරිප්පු, මිරිස්, ආදී සියලුම ආහාර ද්‍රව්‍ය සුලභ කර, රටේ සංවර්ධනයටත්, අනෙකුත් අමාත්‍යාංශවලටත් වුවමනා කරන මුදල් වෙන් කළාට පසුවය කියා එදා ඒ මුදල් ඇමතිතුමා කියා සිටියා එහෙත් ආණ්ඩු පක්ෂයේම ඇතැම් ගරු මන්ත්‍රීවරුන් එය පිළිගත්තේ නැහැ. ඊට පසු අපේ සභානායකතුමා, ගරු සී. පී. ද සිල්වා ඇමතිතුමා මුදල් අමාත්‍යධුරය භාර ගත්තා. එහෙත් මාස දෙකකදී එතුමා කාටත් නොකියාම අස්වීම බාර දුන්නා.

ඊට පසු 1963 නොවැම්බර් 8 වැනිදා මා මුදල් අමාත්‍ය ධුරය භාර ගත්තා. ඒ අවස්ථාවේදී අද මුදල් අමාත්‍යතුමාට උපදෙස් දෙන තරුණ නිලධාරීන් කීප දෙනෙකු මා භාණ්ඩාගාරයට ගත්තා. ඒ වාගේම එදා රටේ පැවති මුදල් තත්ත්වය පිළිබඳව මා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයකුත් කළා. එදා බලයේ තිබුණේ තනිකර ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවක්. මුදල් ඇමති වශයෙන් එදා මා කිව්වේ කුමක්ද? ශ්‍රී ලංකා නිදහස් පක්ෂය යම්තාක් කල් මේ මේ රට ආණ්ඩු කරනවාද ඒ තාක් කල් රට වැසියාට දෙන සහල් සේරු දෙකෙන් එක ඇටයක්වත් කපන්නේ නැත කියා මා ප්‍රකාශ කළා. එපමණක් නොවෙයි. රජයේ සේවකයන්ට කිසිම බරක් පටවන්නේත් නැත කියා මා ප්‍රකාශ කළා. ඒ වාගේම සංවර්ධන වැඩවලට ඉල්ලන හැටියට මුදල් දෙන බවත් මා ප්‍රකාශ කළා. ඒ සමගම,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රටේ මුදල් අමාරු තත්ත්වයක් තිබෙන බවත්, එම නිසා රටේ මහජනතාවගේ සම්පූර්ණ සහයෝගය පමණක් නොවෙයි පරිත්‍යාගත් වුවමනාය කියා මා එදා ඉල්ලීමකුත් කළා. ඒ ඉල්ලීම කරන්නට ප්‍රථමයෙන් අප කළේ කුමක්ද? පළමුවෙන්ම මා කළේ මෙයයි. එතෙක් මා දරමින් සිටි ඇමති ධුරයට අතිරේකව මුදල් ඇමති ධුරය උසුලද්දී මට ඒ වෙනුවෙන් වැඩිපුර ලබා ගන්නට පුළුවන්කම තිබුණු රුපියල් පන්සියයේ මාසික දීමනාව, ඒ ධුරය දරූ මාස හය තුළම ගත්තේ නැහැ. හය මාසයට නියමිත දීමනාව වන රුපියල් තුන්දාහම ගත්තේ නැහැ. ඒ රුපියල් තුන්දාහ මට එපා යයි මා කිව්වා. එය එසේ නොවේදැයි කරුණා කර ගරු මුදල් ඇමතිතුමා සොයා බලන්න. රටේ ජනතාව ඒ විධියට පරිත්‍යාග කරනවා නම් ඇමතිවරයකු හැටියට—ප්‍රවාහණ, රජයේ වැඩ සහ තැපැල් ඇමතිවරයා හැටියට—සිටිද්දී ඊට අමතරව මුදල් ඇමතිකම වෙනුවෙන් ලබා ගැනීමට හැකිව තිබුණු රුපියල් පන්සියයේ දීමනාව මා ලබා ගත්තේ නැහැ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන (රාජ්‍ය ඇමති සහ අග්‍රාමාත්‍යතුමාගේත් ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේත් පාර්ලිමේන්තු ලේකම්)**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன—இராஜாங்க அமைச்சரும் பிரதம அமைச்சரதும் பாதுகாப்பு வெளிவிவகார அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசியும்)*
(The Hon. J. R. Jayewardene—Minister of State and Parliamentary Secretary to the Prime Minister and Minister of Defence & External Affairs)

ගන්නට බැහැ.

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)

ගන්නට බැරිදැයි භාණ්ඩාගාරයෙන් අසා බලන්න. ඇමතිවරයකුට ලැබෙන රුපියල් පන්සියයේ දීමනාව ගන්නට බැරිදැයි අසා බලන්න. මා එය ගත්තාදැයි විමසන්න.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

අපිත් ගන්නේ නැහැ.

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)

ඇමතිවරයකුට ලැබෙන රුපියල් දෙදහ ගන්නවා නේද?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

ඔව්.

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)

රුපියල් පන්සියය බැගින් ලැබෙන දීමනාව මට ලබාගන්නට ඉඩ තිබුණු නමුත් මා එය ලබාගත්තේ නැහැ. භාණ්ඩාගාරයෙන් අහන්න, මට ලැබෙන්නට තිබුණු රුපියල් තුන්දාහම මට වුවමනා කරන්නේ නැතැයි මා නොකිව්වාදැයි, කියා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

රුපියල් තුන්දාහක් ලැබෙන්නේ අගමැතිතුමාට නොවෙයිද?

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)

අගමැතිතුමාට රුපියල් තුන්දාහක් ලැබෙනවා තමයි. එහෙත් මා කියා සිටියේ ඒ ගැන නොවෙයි. මුදල් ඇමතිවරයා හැටියට ගන්නට මට පුළුවන්කම තිබුණු "එලවන්ස්" හෙවත් දීමනාව වන රුපියල් පන්සියය මා නොගත් බවයි මා කිව්වේ. එපමණක් නොව ගමන් ගාස්තු වශයෙනුත් මා ශතයක්වත් ගත්තේ නැහැ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

අපිත් ගන්නේ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)
මගේ මෝටර් රථයෙනුයි මා නිල ගමන් ගියේ. එය රජයේ කාර් එකක් නොවෙයි. එසේ තිබියදීත්, පෙට්රල් දමාගෙනයි මා මේ කාල සීමාව තුළ ගමන් ගියේ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
අපිත් එහෙමයි යන්නේ.

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)
රජයේ කාර්වලයි තමුන්නාන්සේලා නිල ගමන් යන්නේ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
ඒක නොවෙයි, පෙට්රල් දමාගෙනයි යන්නේ, කියලයි කිව්වෙ.

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)
පෙට්රල් නොදමා වෙන මොනවා දමාගෙනද යන්නේ? මා ප්‍රකාශ කළේ මේ ආණ්ඩුවේ ඇමතිතුමන්ලා රජයේ කාර්වල යන බවයි. මා ගියේ මගේ කාර් රථයෙනුයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
කපිතාන්.

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)
කපිතාන් එක තමයි. ඒ කපිතාන් එක මගෙයි. 1960 දීයි, මා ඒ කපිතාන් රථය ගත්තේ. ආණ්ඩුවේ මුදල්වලින් නොවෙයි, මගේම සල්ලි ගෙවලයි මා ඒ රථය ගත්තේ. ඔය ආණ්ඩුවේ ඇමතිතුමන්ලා වාගේ මා ආණ්ඩුවේ බෙන්ස් කාර්— ලොකු කාර්—පාවිච්චි කළේ නැහැ. ඔය ආණ්ඩුවේ ඇමති මණ්ඩලයේ සිටින්නන් එදා අපට දොස් කිව්වේ අපේ ආණ්ඩුවේ ඇමතිවරුන් බෙන්ස් කාර් අරන් සවාරි යනවාය කියමිනුයි. එහෙත් දැන් ඔය ආණ්ඩුවේ හැම ඇමතිවරයෙක්ම වාගේ යන්නේ ලොකු බෙන්ස් කාර් රථවලයි. ආණ්ඩුවේ ඇමතිවරුන් යන්නේ රජයේ කාර්වලයි. ඒ වාගේම පෞද්ගලික දේවල ටත් රජයේ රථවාහන පාවිච්චි කරනවාය යනුවෙන් චෝදනාවක් තිබෙනවාලු. අතුරු මැතිවරණ වලදීත් පාවිච්චි කළේ රජයේ රථවාහනලු. එහෙම නොවෙයිද?

මේ ආණ්ඩුවේ ඇමතිවරුන් දහහත් දෙනෙක් ඉන්නවා. එයින් ගණනාවක්ම පින්පඩි ගන්නා ඇමතිවරුන් හැටියට හඳුන්වන්නට පුළුවනි. ඇතැම් ඇමතිවරුන් කරන්නේ රජයේ දෙපාර්තමේන්තු එකක් දෙකක් භාරව සිටීම පමණයි. දෙපාර්තමේන්තුවක් දෙකක් භාර කිසිම ඇමතිවරයෙක් සම්පූර්ණ ශ්‍රමය යොදා වැඩ කරන්නේ නැහැ. වැඩ කරන්නේ කීප දෙනෙක් පමණයි. අද මේ කුඩා දිවයිනේ කැබිනට් මණ්ඩලයට ඇමතිවරුන් 17 දෙනෙක් ඉන්නවා.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)
ඒ ගණන තවත් වැඩි කරන්නටයි යන්නේ.

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)
ඇමතිවරුන් දහ දෙනකුට වඩා වුවමනා කරන්නේ නැහැ. ඇමති ධුරය දරණ කාල සීමාව තුළ මාසයකට රුපියල් දෙදාහක් දෙනවා. අමාත්‍යාංශයක් පාලනය කරන්නටත් තව විශාල මුදලක් යනවා නොවෙයිද? 1962 නොවැම්බර් මාසයේ සිට 1963 ජූනි මාසය දක්වා ප්‍රවාහණ, රජයේ වැඩ සහ තැපැල් ඇමතිවරයා වශයෙනුත්, මුදල් ඇමතිවරයා වශයෙනුත් මා වැඩ කළා. ඒ අනුව බලන විට ප්‍රවාහණ රජයේ වැඩ, තැපැල් සහ මුදල් යන ඇමතිවරුන් හතර දෙනකු කරන වැඩ මා එදා තනියම කළා. එහෙත් එක් ඇමතිවරයකු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කළුගල්ල මයා.]

ගන්නා පඩිය පමණයි මා එදා ගත්තේ. මා කියන්නේ වෙන මොකක්වත් නොව, ඇමතිවරුන් රටට ආදර්ශයක් දිය යුතු බවයි. ඇමතිවරුන් නොයෙක් කැබිනට් සන්දේශ ඉදිරිපත් කරනවා. අද එකමුතු කමක් නැහැ. අද දුම්රිය සේවය භාර එක ඇමතිවරයකුටයි; බස් රථ සේවය භාර වෙන ඇමතිවරයකුටයි. අද දුම්රිය සේව යත්, බස් රිය සේවයත් තරඟ බිමට බැස තිබෙනවා. අද දුම්රිය සේවයේ ආදායම අවුරුද්දකට රුපියල් 10,31,00,000 ක් පමණ වෙනවා. වියදම රුපියල් 15,58,00, 000 ක් පමණ වෙනවා. අද දුම්රිය සේව යෙන් සියයට 30 ක් පමණයි, මඟීන් ගෙන යාමට පාවිච්චි වන්නේ. අනික් සිය යට 70 පාවිච්චි වන්නේ නැහැ. එහෙත් අවුරුද්දකට රුපියල් 15,58,00,000 ක් පමණ වියදම් වෙනවා. අද බස්රිය සේව යත්, දුම්රිය සේවයත් තරඟ බිමට බැස තිබෙනවා. මේ අංශ දෙකම එක ඇමති තුමකු යටතේ තිබිය යුතුයි. ඒ අතරම දුම්රිය සේවය සඳහා මේ තරම් විශාල විය දමක් කරන නිසා පිටරටින් ගෙන්වන බස් රථ සංඛ්‍යාව හැකි තරම් අඩු කර ලාභ ලැබෙන වැඩ පිළිවෙළක් ඇති කළ යුතුයි.

ගුවන් සේවය පිළිබඳ ඇමති ධුරයක් මා දැරූ නිසා ඒ ගැනත් වචන ස්වල්ප යක් කියන්නට සතුටුයි. එදා ප්‍රවාහණ ඇමති හැටියට මා 1962 දෙසැම්බර් මාසයේ දී කැබිනට් මණ්ඩලයට සන්දේශයක් ඉදිරිපත් කළා, එද ධාවනය කළ ඩැකෝටා ගුවන් යානා දෙක මගීන් ගෙන යාමට නුසුදුසු නිසා අළුත් ගුවන් යානා දෙකක් ගත යුතුය කියා. වාසනාවකට හෝ අවාසනාවකට හෝ 1962 නොවැම්බර් මාසයේ දී මුදල් ඇමති ධුරය මට ලැබුණු නිසා, මා විසින් ඉදිරිපත් කර තිබුණු ඒ කැබිනට් සන්දේශය 1963 ජනවාරි මාසයේ දී මුදල් ඇමති හැටියට මා ඉදිරිපිටට ආවා. සිවිල් ගුවන් සේවාවේ නිලධාරි මහත්වරුනුත්, භාණ්ඩාගාරයේ නිලධාරි මහත්වරුනුත් ගෙන්වා මා ඒ ගැන සාකච්ඡාවක් ඇති කළා. ඒ සාකච්ඡාවේ ප්‍රතිඵලය වුණේ කුමක්ද ? ඒ ලියුම් කියුම් ගෙන්වා බලන ලෙස මා මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. එදා සිවිල් ගුවන් සේවාවේ නිල ධාරිනුත්, භාණ්ඩාගාරයේ නිලධාරිනුත් කියා සිටියේ දේශීය ගුවන් සේවාව පවත්වාගෙන යන්නේ ඉතාමත්ම පාඩු විඳගෙන බවයි. දේශීය ගුවන් සේවය ප්‍රයෝජනයට ගන්නේ උතුරු නැගෙනහිර පළාත්වලට යන රජයේ ද්‍රවිඩ නිලධාරි මහත්වරුන් පමණක් බව එදා මට දැන ගන්නට ලැබුණා. මදුරාසියට යාමට ඇති ගුවන් සේවාවත් පාඩු සහිතව පවත්වාගෙන යන බව එදා පිළිගත්තා. ඒ බව පිළිගත්තායින් පසු ප්‍රවාහණ, රජයේ වැඩ හා තැපැල් ඇමති විසින් ඉදිරිපත් කර තිබෙන සන්දේශය මුදල් ඇමති හැටියට මා ප්‍රතික්ෂේප කරනවාය කියා කලින් මා ඉදිරිපත් කළ සන්දේශය මාම ප්‍රතික්ෂේප කළා. එසේ ප්‍රතික්ෂේප කෙළේ ගුවන් සේවාව පාඩු පිට පවත්වාගෙන යන බව එදා මට හොඳින්ම වැටහුණු නිසයි. ඇව්රෝ ගුවන් යානා ගැනීමට අප විරුද්ධ වුණා. එසේම නොයෙක් විධියේ ගුවන් යානා ගැනීමට එදා අපේ සම්පූර්ණ විරුද්ධත්වය දැක් වුවා. ඒ ලියුම් කියුම් මුදල් ඇමතිතුමාගේ කාර්යාලයේම තියෙන්නට පුළුවන්. අද මේ ආණ්ඩුව රු. 2,50,00,000 ක් වියදම් කර බැංකොක් යාමට ට්‍රිඩෙන්ට් නමැති ගුවන් යානාවක් ගන්නට යනවා. ආර්ථික අතින් රට පිරිහී තිබෙන මේ අවස්ථාවේදී නොයෙකුත් පෞද්ගලික කොම්පැනිවලට කොමිස් ලබා ගන්නට හැකි වන පරිද් දෙන් අපේ විදේශ වත්කම් පාවිච්චි කරන්නට ඉඩ දෙමින් කුමන වර්ගයේ ගුවන් යානා හෝ ගන්නවාට පෞද්ගලික වශයෙන් මා විරුද්ධයි. එසේ හෙයින් ගරු මුදල් ඇමතිතුමා ගුවන් සේවාවේ නිලධාරීන් කැඳවා නැවත වරක් මේ පිළිබඳව සාකච්ඡාවක් පවත්වා බලන්න. අලුතෙන් ගුවන් යානා මිළදී ගැනීමෙන් යම් වාසියක් ප්‍රයෝජනයක් ඇති වෙනවා නම් ඒ ගැන අපට කියන්න. 1963 ජනවාරි මාසයේදී ඔය නිලධාරීන් හැම දෙනාම කියා සිටියේ ගුවන් සේවාවලින් මේ රටට පාඩු බවයි. එසේ හෙයින් අලු තෙන් ගුවන් යානා මිළදී ගැනීමට යාම ගැන අපේ විරුද්ධතාව ගරු මුදල් ඇමති තුමාට ප්‍රකාශ කරන්නට ඕනෑ. නියම සැලැස්මක් නැතිව, රටට ආදරයක් නැතිව මෙම කැබිනට් මණ්ඩලය වැඩ කරන බව මෙම කරුණුවලින් අපට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පේනවා. මෙවැනි කැබිනට් මණ්ඩලය කින් මෙම රට සංවර්ධනය වෙතැයි අපට විශ්වාස කරන්නට බැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මුලින් කීවා වගේ අධ්‍යාපන ප්‍රශ්නය හා රැකිරක්ෂා ප්‍රශ්නය සම්බන්ධයෙන් මා වැඩිපුර කථා කරන්නට බලාපොරොත්තු වෙනවා. මෙම රජය බලයට පත් වී අවුරුදු දෙකහමාරක් ගත වී ඇතත් තවම නියම අධ්‍යාපන ප්‍රතිපත්තියක් නියම අධ්‍යාපන සැලැස්මක් ඉදිරිපත් කරන්නට මෙම රජයට පුළුවන් වී නැහැ. එසේ වුවද ආණ්ඩු පැත්තේ මැති ඇමතිවරුන් නොයෙක් විට පැරණි අධ්‍යාපන ක්‍රමයට දොස් කියනවා. අද රැකිරක්ෂා ප්‍රශ්නය උග්‍ර වී තිබෙන්නේ පැරණි අධ්‍යාපන ක්‍රමයේ වරද නිසා යයි ඒ අය කියනවා. මෙහි තේරී පත්ව අවුත් සිටින සියලුම ගරු මන්ත්‍රීවරුන් ලබාගෙන ඇත්තේ ඒ තිබුණු අධ්‍යාපනයයි. එහි කිසිම වරදක් නැහැ. අද මේ ආණ්ඩුව නම් වැඩ කර ගෙන යන්නේ ලෝක බැංකුවේ කීම අනුවයි. අධ්‍යාපනය සමාජ සේවාවක් හැටියට ඒ උදවිය කල්පනා කරනවා. රටේ ආර්ථික දියුණුව සඳහා අධ්‍යාපන යෙන් ඒ තරම් ප්‍රයෝජනයක් නො ලැබෙන බවට ඒ අය තුළ හැඟීමක් තිබෙ නවා. එසේ හෙයින් අධ්‍යාපනය සීමා කිරීමේ වැඩ පිළිවෙලක් ඇති කරගෙන යනවා. අපේ නව අධ්‍යාපන ඇමතිතුමා ගේ ප්‍රතිපත්තිය ඒකයි. එහෙත් අපේ පාලනය පවතිද්දී පැල්පතේ ජීවත් වන ඉතාමත්ම දිළිඳු පවුලේ දරුවාට පවා උසස්ම අධ්‍යාපනය ලබා ගන්නට පුළුවන් වුණා. 1956 සිට 1965 මාර්තු මාසය දක්වා වූ කාලය තුළ මේ රටේ මහා විද්‍යාල 1,250ක් අප ඇති කෙළේ සාධාරණ අධ්‍යාපන පහසුකම් සැලසීම සඳහායි. [බාධා කිරීමක්] මහා විද්‍යාල 1,250ක් ඇති කොට ශිෂ්‍යාවන් 15,000 ක් විශ්ව විද්‍යාල තුනට ඇතුළත් කළා. අද විශ්ව විද්‍යාල තුනේ ඉගෙන ගන්නා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගෙන් සියයට 75 ක් දෙනාගේ මව්පියන්ට මාසයකට ලැබෙන ආදායම රුපියල් 100 කට අඩුයි. අද විශ්ව විද්‍යාල තුනේ ඉගෙන ගන්නා 12,000ක් පමණ ශිෂ්‍යයන් ලබන්නේ මාසයකට රුපියල් 100 කට අඩු වත්කමක් තිබෙන දෙමව්පියන්ගේ දරුවන්—විශ්ව විද්‍යාල වලට ඇතුල් වී සිටින්නේ බණ්ඩාරනායක ප්‍රතිපත්ති උඩ ක්‍රියා කළ නිසයි. නමුත් අද ඇති වීගෙන යන තත්ත්වය කුමක්ද? මා අධ්‍යාපන ඇමති ධුරය දරන කාලයේ විශ්ව විද්‍යාලවල ඉගෙන ගන්නා ශිෂ්‍ය ශිෂ්‍යාවන් උපාධි ලබා පිට වන්නට ප්‍රථම අනුගමනය කළ ක්‍රියා මාර්ගයක් තිබුණු බව හැමදෙනාගේම දැන ගැනීම සඳහා කිව යුතුයි. එසේ උපාධි ලබා ගන්නා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට රක්ෂා වුවමනා කරනවාදැයි අසා ඒ අය විශ්ව විද්‍යාල යෙන් පිට වන්නට පෙර ලියමනක් යවන සිරිතක් තිබුණා. විෂයයන් දෙකක් තිබුණු හැම උපාධි අපේක්ෂකයකුටම උපාධිය ලැබෙන්නට පළමුව අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් පත්වීම් යැව්වා. ඒ ක්‍රමය 1965 මාර්තු වන තුරු අනුගමනය කළා. එම නිසා එම ශිෂ්‍ය ශිෂ්‍යාවන් විශ්ව විද්‍යාලයෙන් පිට වුණේ රැකියාවක් ඇතුවයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
ලංකාවෙද, ලංකාවෙන් පිටද?

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)
ලංකාවෙ තමයි. මා කරපු වැඩ ගැනයි, මේ කියන්නේ. අධ්‍යාපන ඇමතිතුමා ඇවිදින් එය නැතෙයි කියන්න පුළුවනි. ඒ ලියුම් විශ්ව විද්‍යාලවල තිබෙනවා. රෙජිස්ට්‍රාර්වරුන්ටයි, ඒවා යැව්වේ. විශ්ව විද්‍යාලයේ උපාධි විභාගය ගන්නා අපේක්ෂකයන්ට රක්ෂා වුවමනාද කියා වහාම දන්වන ලෙස අසා යැව්වා. උපාධි විභාගයේ අන්තිම විෂයයට උත්තර ලියා එම විශ්ව විද්‍යාලයෙන් ඔවුන් පිටවී ගියේ පාඨශාලාවක ගුරු පත්වීමක් ලබාගෙනයි. එදා මේ රටේ උසස් අධ්‍යාපනයක් ලැබූ උදවිය ගැන ඉතා කරුණාවෙන් සහ ආදරයෙන් අප වැඩ කළ බව එයින්ම පේනවා.

අපේ රටේ රැකිරක්ෂා හිඟය එදා මේ තරම් උග්‍ර වී තිබුණේ නැහැ. 1963 වන විට මුළු ලංකාවේම රක්ෂා නොමැති ජ්‍යෙෂ්ඨ සමතුන් සිටියේ 85,000 ක් පමණයි. එම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කළුගල්ල මයා.]

පිරිසගෙන් 10,000 කට ශිෂ්‍ය ගුරුවරුන් හැටියට පත්වීම් දෙන්නට අපට වුවමනා කළේ විශ්ව විද්‍යාලයෙන් පිට වන උදවියට මෙන්ම ජ්‍යෙෂ්ඨ විභාගයෙන් සමත් වන උදවියටත් යම්කිසි රැකියාවක් දිය යුතුය කියන ප්‍රතිපත්තිය පිළිගන්නා ලද නිසායි. ඒ හේතුකොටගෙන එදා උපාධිධාරීන්ට පමණක් නොව ජ්‍යෙෂ්ඨ සමතුන්ට පවා රැකියා දීමට අපට පුළුවන් වුණා. අළුත් රක්ෂා සඳහා මුදල් ඇමතිතුමාගේ අයවැය කථාවෙන්වත් අනිකුත් සංඛ්‍යා ලේඛන වලින්වත් ශතයක් හෝ වෙන්කර තිබෙන බවක් පෙනෙන්නට නැහැ. අළුතින් ගුරුවරුන් බඳවා ගන්න පවා අසන්නට එපාය කියා භාණ්ඩාගාරයෙන්ම දන්වා යවා තිබෙන බව පෙනෙනවා. අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ ගුරුවරුන් එක්ලක්ෂ පණස් දහසක් පමණ වැඩ කරනවා. විශ්‍රාම ලැබීම නිසාත් මිය යාම නිසාත් වසරකට 5,000 ක් පමණ දෙනා ඒ උදවියගෙන් ඉවත් වන බව පෙනෙනවා. එවැනි පුරප්පාඩු පිරවීම පවා මුදල් අමාත්‍යාංශයෙන් අහන්නේ නැතුව කරන්නට එපාය කියන චක්‍ර ලේඛනයක් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට ගොස් තිබෙනවා. එවැනි පුරප්පාඩු පවා පුරවන්නට තරම් තත්ත්වයක් නොමැති බව ඒ අනුව අපට කියන්නට පුළුවනි.

සෞඛ්‍ය ඇමතිතුමා කීවා වාගේ මේ රටට බොහොම වෛද්‍යවරුන් අවශ්‍යයි. අද මේ රටේ වෛද්‍යවරුන්ගේ විශාල හිඟයක් පවතිනවා. එම නිසා වෛද්‍ය විද්‍යාල දෙකෙන් පිට වන හැම වෛද්‍යවරයකුටමත් වෛද්‍යවරියකටමත් රජයේ රක්ෂාවක් දිය යුතුයි. මෙවර වෛද්‍ය අංශයට ඇතුළත් කර ගැනීමේ විභාගයෙන් ශිෂ්‍ය ශිෂ්‍යාවන් තෝරා ගැනීම සීමා කර තිබෙනවා. විෂයයන් 4 කින් සමත් වූ ශිෂ්‍ය ශිෂ්‍යාවන් හැම කෙනෙක්ම වෛද්‍ය අංශයට බඳවා ගන්නට බැරි යයි කියා තිබෙනවා; සීමා කර තිබෙනවා.

1964 දී වෛද්‍ය අංශයට ශිෂ්‍යයන් බඳවා ගැනීම සීමා කිරීමට විශ්ව විද්‍යාලයේ උප කුලපති ආටිගල මහතා මා සමග සාකච්ඡා කළා. ඒ අවස්ථාවේදී මා ඔහුට කීවේ මොකක්ද? අපේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය සීමා කිරීම නොවෙයි, පේරාදෙනියෙත් කොළඹත් දැනට වෛද්‍ය විද්‍යාල දෙකක් තිබෙනවා; ඒ නිසා වෛද්‍ය අංශයට දක්ෂ ශිෂ්‍යයින් දාහක් හෝ දෙදාහක් හෝ තුන් දාහක් හෝ සිටිනවා නම් ඒ හැම කෙනෙක්ම ඇතුළත් කර ගත යුතුයි කියා මා කීවා.

වෛද්‍ය අංශය සඳහා ඉගෙනගනු ලබන්නේ ඉතාම අමාරුවෙන්. අද ලෝකය දෙස බලන විට ඉතා හොඳ මොළ තිබෙන අය ලංකාවේ සිටින බව පෙනී යනවා. ලෝකයේ අනිකුත් වෛද්‍යවරුන් හා අපේ වෛද්‍යවරුන් සසඳා බලන විට අපේ වෛද්‍යවරුන් ඉතා උසස් තත්ත්වයක් දරන බව ගරු සෞඛ්‍ය ඇමතිතුමාත් පිළිගන්න කරුණක්. ඒ නිසා වෛද්‍ය අංශයට ඇතුළත් කර ගැනීම සීමා කරන්නට එපා. වෛද්‍ය විද්‍යාල දෙකක් නොවෙයි, ඕනෑ නම් යාපනයේත් ගාල්ලේත් කුරුණෑගලත් ආදී වශයෙන් තව 4ක් 5ක් ඇති කළත් වරදක් නැහැ. අවුරුදු 6 ක් වෛද්‍ය විද්‍යාලයේ ඉගෙනුම ලබා පිට වන වෛද්‍යවරුන්ට දෙන්නට ලංකාවේ රක්ෂා නැත්නම්, පෞද්ගලික අංශයේත් නැත්නම්, පිටරටවලට වෛද්‍යවරුන් සපයන්නට අපට පුළුවන් වෙනවා. මුළු අග්නිදිග ආසියාවටම වුවත් උගත් දොස්තරවරුන් සපයන්නට අපට පුළුවන්. ඒ මගින් විදේශ මුදල් ගෙන්වා ගන්නටත් අපට පුළුවන් වේවි. ඉගෙනීමේ දක්ෂතාව අපේ ශිෂ්‍යයන්ට තිබෙනවා නම් අපි එයින් ප්‍රයෝජන ගන්නට ඕනෑ. එම නිසා වෛද්‍ය අංශයට බඳවා ගැනීම සීමා කරන්නට එපා යයි මා කියනවා. තව වෛද්‍ය විද්‍යාල තුන හතරක් ඇති කළාට වරදක් නැහැ.

එපමණක් නොවේ. උසස් අධ්‍යාපනය කොයි අන්දමකින්වත් සීමා කරන්න එපා. යාපනය, ගාල්ල, ත්‍රිකුණාමලය ආදී ස්ථානවල තවත් විශ්ව විද්‍යාල ඇති කළාට අපෙන් වරදක් නැහැ. පසුගිය වාරයේ මේ රටේ දරු දැරියන් 2,50,000 ක් අධ්‍යාපන පොදු සහතික පත්‍ර විභාගය ගත්තා. විභාග දෙපාර්තමේන්තුව අද කර තිබෙන්නේ මොකක්ද? ඒ 2,50,000 න් උසස් අධ්‍යාපනයට සුදුසුයයි කියා තිබෙන්නේ 10,000 යි. 2,40,000 කට යනඑනමං නැහැ. ඒ අය එච්. එස්. සී. පන්තිවලට බාරගන්නේ නැහැ. ඔවුන්ට අද ගෙවලට වී සිටීමට සිදු වී තිබෙනවා. ඔය විධියට සීමා කරන විට අධ්‍යාපන දෙපාර්තමේන්තුවට නැත්නම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අධ්‍යාපන අමාත්‍යාංශයට අමුතුවෙන් ගොඩනැගිලි අනවශ්‍ය වෙනවා. 2,50,000න් 2,40,000 කට කියනවා "උඹලාට උසස් අධ්‍යාපනය කරන්නට දෙන්නේ නැහැ, උඹලාට රක්ෂා සපයන්නේ නැහැ, උඹලා ගෙදර හිටපන්" කියා. මේ ඇමතිවරුන් 17 දෙනාම කියා තිබෙන්නේ ඒකයි.

පසුගිය නොවැම්බර් මාසයේ 40,000 ක් විශ්ව විද්‍යාල ප්‍රවේශ විභාගය ගත්තා. විභාග දෙපාර්තමේන්තුව කියනවා එයින් 8,000 ක් සමර්ථයි කියා. එසේ සමත් වූ අයගෙන් තෝරා ගෙන තිබෙන්නේ 2,328 දෙනයි. ඒ ශිෂ්‍ය ශිෂ්‍යාවන් 40,000න් 8,000 ක් සමර්ථ වුණු බව විභාග දෙපාර්ත මේන්තුව කියා තිබෙනවා. එයින් තෝරා ගෙන තිබෙන්නේ 2,323 යි. ඔය විධියට විශ්ව විද්‍යාල ප්‍රවේශ විභාගය ගත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් ගෙන් 37,500ක් පමණ අතරමං වී අද ඉතාමත් ශෝකයෙන් ඔවුන්ගේ ගෙවලට වී සිටිනවා. මා විශෙෂයෙන්ම මේ ආණ්ඩුවෙන් ඉල්ලා සිටින්නේ නව විශ්ව විද්‍යාල දෙකක්වත් ඇති කොට, ප්‍රවේශ විභාගයෙන් සමත්වුණු ශිෂ්‍ය ශිෂ්‍යාවන් සියලුදෙනාම —8,000 ම— විශ්ව විද්‍යාල යට ඇතුළු කර ගන්නා ලෙසයි. මේ ජාතික ආණ්ඩුව අධ්‍යාපන ප්‍රශ්න විසඳන්නට යන්නේ මේ විධියටයි.

එදා අප ආධාර ලබන පාඨශාලා හැම එකක්ම රජයට ගත්තේ සියලුම ළමයින්ට පොදු අධ්‍යාපනයක් ලබා දීමේ ප්‍රතිපත්තිය අනුවයි. දැන් නැවත වරක් එම පාසල්වලට මුදල් අය කිරීමේ බලය දෙන්නට යන බවට කසුකුසුවක් තිබෙනවා. එය සත්‍ය යක්දැයි මා හරියටම දන්නේ නැහැ. අධ්‍යාපන ඇමතිතුමාගේ කථාවේදී ඒ පිළිබඳව පැහැදිලි ප්‍රකාශයක් එතුමා කරනු ඇතැයි අප බලාපොරොත්තු වෙනවා.

මේ රටේ 30 ලක්ෂයක් පමණ පාසල් යන දරු දැරියන්ගෙන් අසාධාරණ විධියට මුදල් උපයන්නේ නැතැයි අප එදා ගත් තීරණයක් අනුව පාසල් ශිෂ්‍යයින්ට වුවමනා කරන සෑම පොතක් පතක්ම රජයේ මුද්‍රණාලයයේ මුද්‍රණය කොට ඒවා අඩු මිලට ඔවුන්ට ලබා දීමට කටයුතු කළා. 1964 ජූලි මාසයේ 13 වැනිදා තීරණය කර ගත් ඒ වැඩ පිළිවෙළ අනුව 1964 දී පොත් 15 කුත් 1966 දී පොත් 61 කුත් 1967 දී 54 කුත් රජයෙන් මුද්‍රණය කරවන්නට කටයුතු කළා. ඒ වැඩ පිළිවෙල සම්පූර්ණ වුණා නම් පළමුවැනි පන්තියේ සිට ජ්‍යෙෂ්ඨ පන්තිය දක්වා වූ සෑම පොතක් ම ඉතා අඩු මිළට පාසල් ශිෂ්‍යයන්ට ලබා ගන්ට පුළුවන් වෙනවා. මේ වැඩ පිළිවෙළේ මුල් පියවර වශයෙන් අප එදා අතක් බර පොතක්, රු. 3.50 ක් පමණ වටිනා පොතක්, අපේ මහජනතාවගේ පොඩි පුතුන්ට දුවරුන්ට ශත 25 ගණනේ දුන්නා. ඊළඟට අප, ජ්‍යෙෂ්ඨ පන්තියට වුවමනා කරන සිංහල ව්‍යාකරණ පොතක් පළ කළා. එය කලින් තිබුණේ පොත් 3 ක් වශයෙනුයි. ඒ පොත් 3 ම මිලට ගන්නා කෙනකුට ඒ සඳහා රු. 10 ක් පමණ වියදම් කරන්නට සිදුවී තිබුණා. අප මේ පොත් 3 ම එකක් වශයෙන් රජයේ මුද්‍රණාලයෙහි මුද්‍රණය කොට පිටපතක් රු. 3.00 ගණනේ දුන්නා. එසේ කරන්නට අපට පුළුවන් වුණේ, රජයේ මුද්‍රණාලයෙහි වැඩ කළ සේවක මහත්වරුන් ශ්‍රමදාන ව්‍යාපාරයක් ආරම්භ කොට, වැඩිපුර කිසිම මුදලක් නොගෙන වැඩ කළ නිසායි. දුප්පත් දරු දැරියන්ට අඩු මිළට පොත් පත් සැපයීමේ මේ ව්‍යාපා රය සඳහා ශ්‍රමදානයෙන් වැඩ කිරීමට තරම් හැඟීමක් එම සේවක මහත්වරුන් තුළ ඇති වුණු නිසා ඒ කටයුත්ත පහසුවෙන් කර ගන්නට අපට පුළුවන් වුණා. දැන් ඒ වැඩ පිළිවෙළ නතර කර තිබෙන මේ ආණ්ඩුව පෞද්ගලික අංශය සමග එකතු වී, 30 ලක්ෂයක් පමණ පාසල් යන දරු දැරියන්ගෙන් අයුතු ලාභ ලබා ගන්නට පෞද්ගලික අංශයට ඉඩකඩ සලසා දීමට මේ ඇමතිවරුන් 17 දෙනාම තීරණය කර අවසානයි. ඔය විධියට දරුවකුගේ පොත කින් පෞද්ගලික ව්‍යාපාරිකයාට ලාභ ගන්න දෙනවා නම් ඒ මොන ආණ්ඩුවක්ද කියා මා මෙම ආණ්ඩුවෙන් අහන්න කැම තියි. මේ ආණ්ඩුව ගෙන යන අධ්‍යාපන වැඩ පිළිවෙළ ගැන අද හැම අංශවලින්ම විරුද්ධත්වය දක්වා තිබෙනවා. රජයේ උසස් නිලධාරීන් බොහෝ දෙනකු අස් වෙනවා. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සහ කාර ලේකම් කෙනකු අස් වී ඇමෙරිකාවට යන්නට බලාපොරොත්තු වෙනවා. අනුරාධ පුරේ දිසාපතිතුමා අස් වීමට ලියකියවිලි ඉදිරිපත් කර තිබෙනවා. කුරුණෑගල හිටපු මහින්ද විජේනායක දිසාපතිතුමා අස් වීමට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කළුගල්ල මයා.]
ලියකියවිලි ඉදිරිපත් කර තිබෙනවා. එදා සිටි ස්පෙල්ඩ්වින්ඩ් ඒජන්තතුමා අස් වීමට ලියකියවිලි ඉදිරිපත් කර තිබෙනවා. ඔය විධියට රජයේ උසස් නිලධාරීන් රජයට බැණ වදින්නේ නැතුව, මේ රජය ගෙන යන ප්‍රතිපත්තිවලට අප අකැමතිය, ඒ නිසා අප මෙයින් බේරෙන්න ඕනෑය කියන හැඟීම ඇතිව වෙන්න ඇති අද අස් වීමට සූදානම් වන්නේ.

අපේ අධ්‍යාපන ඇමතිතුමාත් උප ඇමතිතුමාත් මෙහි නොසිටීම ගැන මා කනගාටු වෙනවා. ඒ මොකද ? විශෙෂයෙන් එතුමා—අපේ අධ්‍යාපන ඇමතිතුමා—බැංකොක් ගියායින් පසු ඇමෙරිකාවේ ක්‍රමය අනුව කණිෂ්ඨ විශ්ව විද්‍යාල පහක් පිහිටුවීමට බලාපොරොත්තු වෙනවා. ඒ අනුව කෑගල්ලටත් එකක් තීරණය කර තිබෙනවා. මා ඉල්ලුවෙත් නැහැ. එහෙත් කරන්න යන්නේ මොකක්ද ? කෑගල්ලේ කාර්මික විද්‍යාලය වසා දමා කණිෂ්ඨ විශ්ව විද්‍යාලයක් පිහිටුවීමට යනවා නියෝජ්‍ය කථානායකතුමනි, කෑගල්ලේ තිබෙන කාර්මික විද්‍යාලය ඇදිගම, රඹුක්කන, ගලිගමුව, මාවනැල්ලේ ඒ වාගේම රුවන්වැල්ල ආදී ප්‍රදේශවලට සේවයක් කරනවා. අගමැතිකෙනෙක්, ඇමතිවරයෙක්, උප ඇමතිවරුන් තුන් දෙනෙක් නියෝජනය වන කොට්ඨාශ මධ්‍යයේයි කෑගල්ලේ කාර්මික විද්‍යාලය පිහිටා තිබෙන්නේ. ඒ ප්‍රදේශවල ජනතාවට යම් කිසි කාර්මික අධ්‍යාපනයක් ලබා ගෙන පෞද්ගලික අංශයේ රුපියල් 5ක් 10ක් පමණ දිනකට උපයමින් ජීවත් වන්න ඉඩ කඩ සැලසී තිබෙන්නේ මේ කාර්මික විද්‍යාලය නිසයි. මෝටර් කර්මාන්තය, ටෙලිපෝන් කර්මාන්තය, විදුලි කර්මාන්තය ආදී එදිනෙදා ජීවිතය ගෙන යාමට අවශ්‍ය නොයෙකුත් කර්මාන්ත ගැන අවබෝධයක් දී පෞද්ගලික අංශයේ සේවය කිරීමට ඉඩ සැලසීමටයි ඒ කාර්මික විද්‍යාලය පිහිටුවා තිබෙන්නේ. එහෙත් අපේ අධ්‍යාපන ඇමතිතුමා බැංකොක් ගියායින් පසු එම වැඩ පිළිවෙළ සම්පූර්ණයෙන් වෙනස් කර, වෙනත් කාර්මික විද්‍යාල පිහිටුවන්නේත් නැතිව, තිබෙන ඒවාත් වසා දමමින් ක්‍රියා කරන්නේ මේ රටේ ආර්ථික දියුණුව සැලසීමටද කියා මා ඇමතිවරුන්ගෙන් ප්‍රශ්න කරනවා.

කණිෂ්ඨ විශ්ව විද්‍යාලයකින් උගැන්වීමට බලාපොරොත්තු වන්නේ පුවත්පත් කලාව, භාෂා පරිවර්තනය, වාණිජ විද්‍යාව, පාලන ක්‍රම, පුස්තකාල තැබීම ආදිය ගැනයි. ඒවා ඉගෙන ගෙන ඒ ඔස්සේ රක්ෂා ලබා ගැනීමට ඉදිරියට ඉතාමත් අමාරු වෙනවා. ඒ නිසා කාර්මික විද්‍යාල වසා දමන්නේ නැතිව, කාර්මික අංශය දියුණු කිරීමට කියා කළ යුතුයි. විශෙෂයෙන් අපේ ඇමති මණ්ඩලය මේ ගැන නැවතත් කල්පනා කළ යුතුයි. අපේ අධ්‍යාපන ඇමතිතුමාගේ බැංකොක් ගමනින් පසු අපේ අධ්‍යාපනය අවුල් වියවුල් කර දැමීමට ඉඩ නොදී ඇමති මණ්ඩලය විසින් යම් කිසි තීරණයක් ගත යුතුයි. මෙය විශෙෂයෙන්ම ජනතාවට බල පාන දෙයක්. මගේ කොට්ඨාශයට—කෑගල්ලට—මා කණිෂ්ඨ විශ්ව විද්‍යාලයක් ඉල්ලුවේ නැහැ. මට එම කාර්මික විද්‍යාලය අවශ්‍යයි. මෙම කාර්මික විද්‍යාලය නිසා, අගමැතිතුමාගෙ කොට්ඨාශයෙ තරුණ උදවියට වුණත් පුහුණුවක් ලබා නොයෙක් නගරවලට ගොස් රක්ෂාවක් ලබාගන්න පහසුකම් තිබුණා. නමුත් දැන් එම කාර්මික විද්‍යාලය වසා දමන්න තීරණය කර තිබෙනවා. එම නිසා ඇමති මණ්ඩලය මේවා ගැන කල්පනා කර බැලිය යුතු බව මතක් කරනවා. දැනට ඇති කාර්මික විද්‍යාලය වසා දමා කනිෂ්ඨ විශ්ව විද්‍යාලයක් ඇති කරන්න වුවමනාවක් නැහැ. එය වෙනත් ප්‍රදේශයකට අරගෙන ගියාට මගේ විරුද්ධත්වයක් නැහැ, මෙම කාර්මික විද්‍යාලය තිබෙනවා නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ උසස් අධ්‍යාපනය ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට දී තිබෙන වරප්‍රසාද මේ ආණ්ඩුව බොහෝ දුරට අඩු කර තිබෙනවා. අධ්‍යාපනය ගැන වැටහීමක් ඇති අපේ මැති ඇමතිවරුන්ට කියනවා, විශ්ව විද්‍යාලය අධ්‍යාපනය ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට මෙතෙක් දී තිබුණු "බර්සරීස්" උසස් අධ්‍යාපන මණ්ඩලයෙන් නපා හැර ඇති බව. එම නිසා, විශ්ව විද්‍යාලයේ ඉගෙනීම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් විශාල ගණනකට ඉගෙනීම දිගටම කරගෙන යාමට නොහැකිව අස් වී යනවා: 1967

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජනවාරි 19 වනදා "ඔබ්සර්වර්" පත්‍රයේ පළ වී ඇති ප්‍රවෘත්තියක් මා පෙන්වන්නම්. එහි මෙසේ තිබෙනවා.

"Undergrad whose suicide was an eye-opener
They still talk about him at Peradeniya
Father dead Mother too poor to pay"

"ඔබ්සවර්" පත්‍රයේ ශීර්ෂ පාඨය වශයෙන් එසේ පළ කර තිබෙනවා. තව දුරටත් මෙසේ සඳහන් වෙනවා:

"At the Peradeniya University Campus they still talk of the helpless undergrad who committed suicide because he had no money to continue his education. To him life was always frustrating and bitter."

මොහු සුමනදාස නැමැති ශිෂ්‍යයෙක්—

"His bursary was Rs. 15 and that was cut and he was not given a second chance to continue his education. No one was prepared to give him that answer. He took the easy path out. He finished his life at the end of a rope."

මේ ශිෂ්‍යයාගේ පියා නැහැ. මවගෙ නම ලුසිහාමි. විශ්ව විද්‍යාලය අසලම ගල්වලක වැඩ කරනවා. දවසකට රුපියල් එකක වේතනයක් ලැබෙන්නෙ. අවසානයේදී අමාරුකම් නිසා මේ ශිෂ්‍යයා සියපණ හානි කර ගත්තා. මේ "ඔබ්සවර්" පත්‍රයෙ පළ වී ඇති ප්‍රවෘත්තියක්. තව දුරටත් එම පත්‍රය කියනව, ආණ්ඩුව විසින් මෙවැනි දුප්පත් ශිෂ්‍යයන් ගැන යම් වැඩ පිළිවෙළක් ඇති කළ යුතු බව. අද වන තුරුවත් කිසිම වැඩ පිළිවෙළක් යොදා නැහැ.

එපමණක් නොවෙයි, අධ්‍යාපන ඇමතිතුමා චක්‍ර ලේඛන මාර්ගයෙන් ශිෂ්‍යයින්ගෙන් නොයෙකුත් විධියෙ අයුතු වැඩ ගන්නවා. වර්ෂයකට ශිෂ්‍යයින් පාඨශාලාවට යන්නෙ දින 180 යි. අගමැතිවරයා හෝ ඇමතිවරයකු හෝ කොහේ හෝ යන විට, පාසැල වසා දමා ඒ ඇමතිවරයා හෝ අගමැතිතුමා යන රැස්වීමට යැවිය යුතුය කියා මුල් ගුරුවරයාට දන්වා තිබෙනවා. ඔය අන්දමට පාඨශාලා ශිෂ්‍ය ශිෂ්‍යාවන් අයුතු විධියෙ වැඩවලට යොදවනවා. රාජ්‍ය ඇමතිතුමාත් මේවා ගැන දන්නවා ඇති. මා කියන්නෙ, මේවා වැළැක්විය යුතු බවයි. එදා අපේ අගමැතිතුමා කැනඩාවට ගොස් ප්‍රදර්ශනයක් විවෘත කර එන අවස්ථාවේදී, කටුනායක ගුවන් තොටුපලේ සිට ආපසු කොළඹ බලා එන විට, එතුමා එන තුරු උදේ 8 සිට කොඩි රැගෙන විත් පාර දෙපැත්තේ සිටිය යුතු බවට අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් චක්‍ර ලේඛයක් යවා තිබෙනවා. එදා "ඔබ්සර්වර්", "ටයිම්ස්" පත්‍රවල පවා පළ වුණා, ඒ ළමයින්ගෙන් සමහරකු ක්ලාන්ත වී වැටුණාය කියා. ඔය විධියට වැඩ කිරීම ගැන අපේ රාජ්‍ය ඇමතිතුමා විරුද්ධ විය යුතුයි. ඒ ළමයින්ට ඉගෙන ගන්නට තිබෙන්නේ අවුරුද්දකට දවස් 180 යි. අද හැම පැයක්ම රටේ සංවර්ධනය සඳහා යොදවන්නට වුවමනා වී තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ චක්‍ර ලේඛයක් මඟින්, නොයෙක් තැන්වල පැවැත්වෙන මැති ඇමතිවරුන් සහභාගි වන රැස්වීම්වලට පාඨශාලා ශිෂ්‍ය-ශිෂ්‍යාවන් හා ගුරුවරුන් ගෙන්වා ගන්නවා. ඒවා නැවැත්විය යුතුයි. ලෝකයේ වෙන කොයිම රටකවත් එහෙම කරන්නේ නැහැ. පාසල් යන ළමයකුට එක දවසක් පාසල් යන්නට බැරි වුණොත්, ඒ පාඩුව ඒ දරුවාගේ ජීවිතාන්තය දක්වාම පිරිමසා ගන්නට බැරි වෙනවා. ගුරුවරයකු වශයෙන් සේවය කර තිබෙන නිසා වත්තේගම ගරු මන්ත්‍රීතුමාත් (වීරකෝන් මයා.) පිළිගන්නවා ඇති, ළමයකුට එක දවසක් පාසල් යන්නට බැරි වුණොත් ඒ පාඩුව ජීවිතාන්තය දක්වාම පිරිමසා ගන්නට බැරි බව. එම නිසා පාඨශාලා ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ගෙන් ඒ විධියට බලහත්කාරයෙන් වැඩ ගැනීම ගැන අප සම්පූර්ණයෙන්ම විරුද්ධයි.

ඒ විතරක් නොවෙයි. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ චක්‍ර ලේඛයක් අනුව හැම තුන් මාසයකටම දවස් 2 ක් "වැඩ හුරුව" කියා එකකට පාසල් ශිෂ්‍ය-ශිෂ්‍යාවන් නොයෙක් වතුවලට, නොයෙක් තැන්වලට එක්කාසු කරගෙන ගොස් බලහත්කාරයෙන් ඔවුන්ගෙන් වැඩ ගන්නවා. ඒ විධියට පාසල් යන ළමයින්ගෙන් වැඩ ගැනීමත් එක්තරා විධියක වහල් ක්‍රමයක්. හැම සතියකටම "පීරියඩ්" 5 ක් පාසල් වත්තට හෝ වෙනත් වත්තකට හෝ ළමයින් එක්කාසු කරගෙන ගොස් ඔවුන්ගෙන් වැඩ ගන්නවා. අද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කළුගල්ල මයා.]

පාඨශාලාවල අධ්‍යාපනයක් කෙරෙන්නේ නැහැ. එසේම අද පාසල්වල විනයක් ඇත්තේත් නැහැ. ඔය වැඩ හුරුව නිසා තමයි පත්‍රවල පළ වී තිබුණේ, ලූනාවේ නානායමේදී පාඨශාලා ශිෂ්‍යාවන්—බාලිකාවන්—විශාල සංඛ්‍යාවක් අත් අඩංගුවට ගත්තාය කියා. මේ විධියට අද පාඨශාලාවල විනය පිරිහී තිබෙනවා. අද "ටයිම්ස්" පත්‍රයේ පළ වී තිබෙනවා, ලූනාවේ නානායමේ සිටි ඒ පිරිසෙන් කොටසකගේ ඡායාරූපයක්—මා නම් එසේ ඡායාරූප යට ගත්තාට විරුද්ධයි.—එක ජාතියේ ගවුම් දෙකක් ඇඳගෙන සිටින අක්කයි, නංගියි වගේ දෙන්නකු මුහුණ වසාගෙන සිටින සැටි ඒ පත්‍රයේ පළ වී තිබෙනවා. පාඨශාලා ශිෂ්‍යාවන් ඇතුළු මෙවැනි ජෝඩු 18 ක් ලූනාවේ නානායමේ සිටියදී අල්ලා ගෙන තිබෙනවා.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்சா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

වැඩ හුරු වෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

ගම්පහ මන්ත්‍රීතුමා—[බාධා කිරීම්]

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)

ගම්පහ මන්ත්‍රීතුමා නොවෙයි. [බාධා කිරීම්] අද පත්‍රයක මෙසේ පළ වී තිබෙනවා :

"නානායමේ 'ජෝඩු' බේරා ගන්න මැති ඇමතිවරුන් දුවපනිනවා—හත් හවුල කඩයින්ට ඇප දෙයි."

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(திரு. ஷெல்ற்றன் ஜயசிங்க)*
(Mr. Shelton Jayasinghe)

කවුද, ඇප දුන්නේ ?

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

කවුදැයි අප දන්නවා.

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)

මා තවදුරටත් ඒ පත්‍රයෙන් කියවනවා :

"ලූනාවේ නානායමේ සිටියදී අත් අඩංගුවට ගන්නා ලද 'ජෝඩු' කිහිපයක් බේරා ගැනීම සඳහා දකුණු පළාතේ ඇමැතිවරයකු ඇතුළු ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් කිහිප දෙනකු විශාල පරිශ්‍රමයක් දැරූ බව දැන ගන්නට තිබේ.

දකුණු පළාතේ ඇමැතිවරයකු හා කිට්ටු සම්බන්ධකමක් පවත්වන දකුණු පළාතේ පාලන ආයතනයක මුස්ලිම් ජාතික දේශපාලනඥයකු සහ එම ඇමතිවරයාගේ හිතවතකු වශයෙන් ප්‍රසිද්ධ නිතරම පාගේ මැති සබේ කැරකෙන තවත් අයකු අත් අඩංගුවට ගන්නා ලද පිරිස අතර සිටීම නිසා, ඇමැතිවරයාටත් ආණ්ඩු පක්ෂයේ සෙසු මන්ත්‍රීවරුන්ටත් ක්‍රියාකාරී වීමට සිදු වී ඇත.

ඇමැතිවරයා ගල්කිස්සේ පොලිස් නිලධාරීන්ට කථා කොට ඔවුන් බේරා ගැනීම සඳහා පරිශ්‍රමයක් දරා ඇති අතර, උප ඇමැතිවරයකු සහ උත්තර මන්ත්‍රීවරයකුද ගල්කිස්ස පොලීසියට යවා ඇතැම් අය නිදහස් කර ගත් බව දැන ගන්නට තිබේ."

[බාධා කිරීම්] මා ඒ කීවේ "ඇත්ත" පත්‍රයෙන්. [බාධා කිරීම්] "ටයිම්ස්" පත්‍රයේත් තිබෙනවා.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்சா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

තමුන්නාන්සේලාගේ පත්‍රවල ඒවා දමන්නේ නැහැ.

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)

මා විශේෂයෙන් රාජ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, ලූනාවේ සිද්ධිය ගැන යම් ඇමතිවරයකු හෝ උප ඇමතිවරයකු හෝ සම්බන්ධ වී තිබෙනවා නම් වහාම සිය පදවියෙන් ඉල්ලා අස්වන්නයි ඉල්ලීමක් කරන හැටියට. අප විශේෂයෙන් රාජ්‍ය ඇමතිතුමාගෙන් මේ ඇමතිවරයාගේ සම්බන්ධය ගැන ප්‍රකාශයක් බලාපොරොත්තු වෙනවා. [බාධා කිරීම්].

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

මොනවාටද ?

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)

අල්ලා ගත් පිරිසගෙන් ඇතැම් කොටසක් බේරා ගැනීමට ඇමතිවරයකු සහ උප ඇමතිවරයකු පරිශ්‍රමයක් දරා තිබෙන බව මා කියවූ ප්‍රවෘත්තියෙන් එළි වී තිබෙනවා. ගාල්ලේ එක්සත් ජාතික පක්ෂයේ ප්‍රබල කෙනෙක් ලූනාවේ නානායමේ සිද්ධියට සම්බන්ධ වී තිබෙනවා. ඒ නැනැත්තා, අවුරුදු 14-15 තරමේ ශිෂ්‍යාවන් තුන් දෙනකු සමඟ නිර්වස්ත්‍රයෙන් සිටිද්දීයි, පොලීසිය පැන අල්ලාගෙන තිබෙන්නේ. ඒ බව හැම පත්‍රයකම වාගේ පළ වී තිබුණා.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

You cannot go into those details because there will be a case.

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)

අද පාඨශාලාවල කිසිම විනයක් ඇත්තේ නැහැ. අපේ කාලයේදී යම් විධියකින් මෙවැනි සිද්ධියක් වුණා නම්, අප මෙලහකටත් ඒ ගැන වැඩ කර අවසානයි. ඇමතිවරයකු මේ විධියේ වැඩක් කළාද නැද්ද කියා ප්‍රකාශ කළ යුතුයි. මම කල්පනා කරනවා නොකරන්ට ඇති කියා. එහෙත් නම් ගම් නොමැතිව ප්‍රවෘත්ති පත්‍රවල පළ කර තිබුණා, ඒ විධියේ උත්සාහයක් දැරුවා කියා. මා මේ රටේ ප්‍රවෘත්ති පත්‍ර සියල්ලෙන්ම ඉල්ලා සිටිනවා, ඒ අසරණ ගෑනු ළමයින්ගේ පින්තූර පත්‍රවල පළ නොකර ඒ අසුවුණු එක්සත් ජාතික පක්ෂයේ නායකයන්ගේත්, ඔවුන්ට ආධාර කරන්ට ගිය ඇමතිවරයාගේ හා පාර්ලිමේන්තු ලේකම්වරයාගේත්—මේ හැම දෙනාගේම—පින්තූර හෙට ප්‍රවෘත්ති පත්‍රවල මුල් පිටුවේම පළ කරන්ට කියා. යම් ඇමතිවරයෙක් හෝ පාර්ලිමේන්තු ලේකම්වරයෙක් හෝ ඔවුන් බේරා ගන්ට බලය යෙදුවා නම් හෙටම ඒ අයගේ පින්තූර සමග නම් පළ කරන ලෙස මේ රටේ තිස් ලක්ෂයක් පමණ වන පාසල් දරුවන් වෙනුවෙන් මේ රටේ ප්‍රවෘත්ති පත්‍ර සමාගම්වලින් මා ඉල්ලා සිටිනවා. මා දැන් පැයක් පමණ කථා කර තිබෙන නිසා මීට වඩා යමක් කියන්ට අදහස් කරන්නේ නැහැ.

මුදල් ඇමතිතුමාගේ අයවැය ලේඛනයෙන් රටේ ජනතාව බලාපොරොත්තු වුණා, රැකී රක්ෂා. ඒ වගේම ජීවන වියදම් අඩු වෙයි කියා බලාපොරොත්තු වුණා. දරුවන්ගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් යම් සපිර වැඩ පිළිවෙළක් ඇති වෙයි කියා බලාපොරොත්තු වුණා. ඒ වගේම ආර්ථික අතින් හොඳ පදනමක් දැමීමට යම් වැඩ පිළිවෙළක් ඉදිරිපත් වෙයි කියා බලාපොරොත්තු වුණා. ඒ එක බලාපොරොත්තුවක්වත් මේ අයවැය ලේඛනයෙන් ඉෂ්ට නොවූ නිසා මේ අවසථාවේදී විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරයකු වශයෙන් මා මේ රටේ දශ ලක්ෂයක් පමණ වන රැකී රක්ෂා නොමැති උදවියගෙනුත්, තිස් ලක්ෂයක් පමණ වන ඉගෙනුම ලබන දරුවන්ගෙනුත්, හාල් සේරුවකින් පමණක් අද ජීවත්වන දුප්පත් අහිංසක ජනතාවගෙනුත් ඉල්ලා සිටිනව, තව අවුරුදු එක හමාරක්, දෙකක් ඉවසා ඉන්න කියා. ඒ අතර කිසිම ප්‍රශ්නයක් නිරාකරණය කරන්ට බැරි වුණු නිසා ; එක ප්‍රශ්නයක් ගැනවත් නියම විධියේ වැඩ පිළිවෙළක් ගන්ට බැරි වුණු නිසා තමුන්නාන්සේලා තුළ රටට ආදරයක් තිබෙනවා නම් කැබිනට් මණ්ඩලයම ඉල්ලා අස්වෙලා නැවත වරක් මැතිවරණයක් පවත්වන ලෙස ඇමති මණ්ඩලයෙන් ඉල්ලමින් මගේ කථාව අවසාන කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 6.50

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

As I have to leave the Chair, will the Hon. Minister of State move that an hon. Member of this House to take the Chair.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

I move that the hon. Member for Uduppiddi (Mr. M. Sivasithamparam) do take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන් එම්. සිවසිතම්පරම් මයා. [උඩුප්පිඩි මන්ත්‍රී] මූලාසනාරූඪ විය.

*அதன்பிறகு, உப சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று நீங்கவே, திரு. எம். சிவசிதம்பரம் [உடுப்பிட்டி அங்கத்தவர்] அக்கிராசனத் தமர்த்தார்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. M. SIVASITHAMPARAM, [*Member for Udupiddi*] *took the Chair.*

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)*
(Mr. Shelton Jayasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අයවැය විවාදයේ මගේ කථාව කරන්ට ප්‍රථමයෙන් මා මතක් කරන්ට කැමතියි, මා විරුද්ධ පාර්ශ්වයේ සිටි කාලයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඇමතිවරයකු සමග ආශ්‍රය කළා නම් මට ඒ භාග්‍යය ලබා දුන්නෙ අපේ කෑගල්ලේ ගරු මන්ත්‍රීතුමා (කලුගල්ල මයා.) බව. සමහරවිට ඒ මන්ත්‍රීතුමා ගැන නොදන්න කෙනෙක් එතුමාගේ කථාවට අද ඇහුම්කන් දුන්නා නම් හෝ ප්‍රවෘත්ති පත්‍ර මාර්ගයෙන් එතුමාගේ කථාව කියෙව්ව නම් හෝ මා දන්න හඳුනන විධියට නොවෙයි, එතුමාව ඔහු හඳුනා ගන්නෙ. මම එතුමා දන්න හඳුනන හැටියට; සාක්ෂි සහිතව ඔප්පු කරන්ට පුළුවන් හැටියට වචන ස්වල්පයකින් ඒ වගේ වැරදි හැඟීමක් පළල් මහජනතාව තුළ ඇති වෙලා තිබෙනව නම් ඒක වහාම මකා දැමීම මගේ යුතුකමක්. එතුමා සමග මගේ කිසිම පුද්ගලික වාද භේදයක් හෝ වෛරයක් නැහැ; එතුමා මගේ හොඳ හිතවත් මිත්‍රයෙක්. එහෙත් එතුමා අසත්‍ය ප්‍රකාශ කරනවා නම් මහජන මන්ත්‍රීවරයකු හැටියට ඒ අසත්‍ය ප්‍රකාශ වලට පිළිතුරු දෙන්නට මට යුතුකමක් තිබෙනවා. හිටපු අමාත්‍යවරයකු වන කෑගල්ලේ ගරු මන්ත්‍රීතුමා මේ විධියට හැසිරීම ගැන—ශිෂ්ටාචාරකම ගැන, ශීලාචාරකම ගැන කථා කිරීම ගැන—මා ප්‍රථමයෙන්ම පුදුම වෙනවා.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்சா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

ඇයි ?

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)*
(Mr. Shelton Jayasinghe)

තමුන්නාන්සේ ගැනත් අහ ගන්නට එපා. අහගෙන සිටි තරමට හොඳයි. කට වහගෙන සිටි තරමට හොඳයි.

ගරු මන්ත්‍රීතුමනි, කෑගල්ල ප්‍රදේශයේම වූ සිද්ධීන් ගැන මා නොකීවාට මේ රටේ ජනතාව හොඳාකාරව දන්නවා. මා එපමණයි කියන්නෙ. කෑගල්ලේ ගරු මන්ත්‍රීතුමාට මා පෞද්ගලිකව චෝදනාවක් කරන්නේ නැහැ. එහෙත් ලූනාවේ ඇති වූ සිද්ධියට මේ ආණ්ඩුවේ මන්ත්‍රීවරයකුගේ හෝ පාර්ලිමේන්තු ලේකම්වරයකුගේ හෝ ඇමතිවරයකුගේ හෝ යම්කිසි සම්බන්ධකමක් තිබුණොත් ඒ මන්ත්‍රීතුමාට හෝ පාර්ලිමේන්තු ලේකම්තුමාට හෝ ඇමතිවරයාට විරුද්ධව වහාම ක්‍රියා කළ යුතුය කියා මමත් කෑගල්ලේ ගරු මන්ත්‍රීතුමා සමග එකඟවන්නේ වී නමුත් මෙවැනි සිද්ධියක් ගැන කථා කරන්නට අයිතිවාසිකමක් නැති කෙනෙකු විරුද්ධ පක්ෂයේ සිටිනවා නම් ඒ කෑගල්ලේ ගරු මන්ත්‍රීතුමාය කියා මා ප්‍රකාශ කරනවා. තමන්ගේ ඇසේ කිලිටු තියාගෙන අනුන්ට ඇඟිල්ල දික් කිරීම වැරදිය කියා මා කෑගල්ලේ ගරු මන්ත්‍රීතුමාට කියනවා. මෙවැනි මාර්ගවලින් දේශපාලන ප්‍රයෝජනයක් ලබා ගන්නට බලාපොරොත්තු වෙන්නට එපා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඊළඟට අපේ කැබිනට් මණ්ඩලය කාර් වල ගමන් කරනවාය, මේ විධියට වැටුප් ලබා ගන්නවාය, එහෙත් මම නිර්දෝෂයි, මා නම් මේ විධියට කටයුතු කළේ නැත, කියා කෑගල්ලේ ගරු මන්ත්‍රීතුමා කිය නවා. එතුමාට ලැබුණු රුපියල් 500 " එල වන්ස් " එකත් එතුමා දෙවරක් පරිත්‍යාග කළාය කියා කිව්වා. ගරු මන්ත්‍රීතුමනි, මේ ගරු සභාවේ මමත් සිටි අවස්ථාවක ඇසූ එක්තරා ප්‍රශ්නයකට එක්තරා පිළිතුරක් දුන්නා. ඒ පිළිතුර හැන්සාඩ් වාර්තා ගත වී තිබෙනවා. ඇසූ ප්‍රශ්නය යම් උප ඇමති වරයකුට ලැබුණු " එලවන්ස් " එක කුමක් ද යන්නයි. ඊට පිළිතුරු වශයෙන්, හිටපු උප ඇමතිවරයා මාසයකට රුපියල් 3,000 බැගින් ගත්තාය කියා එක්තරා හිටපු ඇමතිවරියක් මේ සභාවේදි කියන්නට යෙදුණ බව මා කෑගල්ලේ ගරු මන්ත්‍රී තුමාට මතක් කරන්නට සතුටුයි.

**කළුගල්ල මයා.**
*(திரு. கலுகல்ல)*
(Mr. Kalugalla)

සම්පූර්ණ අසත්‍යයක්. ඔය විධියෙ අසත්‍ය කියන්නට එපා. මා සාමාන්‍යයෙන් මන්ත්‍රීවරුන්ගේ කථාවලට බාධා කරන් නේ නැහැ. එහෙත් අසත්‍ය චෝදනා, පෞද්ගලික චෝදනා ඉදිරිපත් කළොත් මටත් අවස්ථාවක් ලැබිය යුතුයි—

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)*
(Mr. Shelton Jayasinghe)

ඒවාට පිළිතුරු දෙන්න. බොහොම හරි.

On the next occasion I shall read out from the HANSARD the relative question asked and answered.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
*(தலைமை தாங்கும் அங்கத்தவர் அவர்கள்)*
(Mr. Presiding Member)

For the moment you accept it ?

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)*
(Mr. Shelton Jayasinghe)

Yes.

ඊළඟට, මේ පාඨශාලාවලට යන ශිෂ්‍ය ශිෂ්‍යාවන් ගැන කෑගල්ලේ ගරු මන්ත්‍රී තුමා බොහොම වේගවත් දීර්ඝ කථාවක් කළා. මා වරක් සඳහන් කළ ආකාරයට එතුමා මා නොදන්නා පුද්ගලයකු නම්, මා ආශ්‍රය නොකළ පුද්ගලයකු නම්, එතුමා ගේ සහෝදර ගරු මන්ත්‍රීවරයකු හැටියට මා මේ ගරු සභාවේ නොසිටියා නම්, ඇත්තෙන්ම ඒ කළ කථාවට මා වැඳ නමස්කාර කරනවා. කෑගල්ලේ ගරු මන්ත්‍රීතුමා ගැන අප දන්නා කාරණයක් දෙකක් මේ අවස්ථාවේදී මතක් කළ යුතුව තිබෙනවා. මගේ වාසනාවකට දෝ එතුමා පසුගිය රජයේ මුදල් ඇමතිවරයකු වශයෙන් සිටියා. මේ ගරු සභාවේ ආණ්ඩු පක්ෂයේත් විරුද්ධ පක්ෂයේත් ගරු මන්ත්‍රීවරුන්ට එතුමා හුඟක් උදව් උපකාර කළා. එතුමාගෙන් අන්තිම උදව්ව ලබා ගත් විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරයා මමයි. 1965 අවසානයේදී එතුමා කපිතාන් එකෙන් මගේ ආසනයට ඇවිත් එක්තරා මහා විද්‍යාලයක් විවෘත කළා. සහෝදර මන්ත්‍රීවරයකු හැටියට මෙය පෞද්ගලික කාරණයක් ලෙස භාර නොගනු ඇතැයි මා විශ්වාස කරනවා. ඒ නිසා මෙය නිර්භයව ප්‍රකාශ කරනවා. එවකට බලාපොරොත්තු වූ මැතිවරණයේදී ප්‍රයෝජනයක් ගන්න බලාපොරොත්තුවෙන් වෙන්නට ඕනෑ ඒ මහා විද්‍යාලය විවෘත කළේ. මට විරුද්ධව ආ ලියෝ මහත්මයා ගෙන්වා ඒ මහත්ම යාගේ ඉල්ලීම අනුව ඒ මහා විද්‍යාලය විවෘත කරනවායයි පෙන්වන්නටයි හිටපු ගරු අධ්‍යාපන ඇමතිතුමා ක්‍රියා කළ බව පෙනී ගියේ.

ගරු අධ්‍යාපන ඇමතිතුමා වශයෙන් සිටි කාලයේදී එතුමා පත්වීම් හුඟක් දුන්නා. ශිෂ්‍ය ශිෂ්‍යාවන් විශ්ව විද්‍යාලයෙන් ආ වහාම ගුරුවරුන් ලෙස පත්වීම් දුන්නා. 1963 දී එතුමා කළ කථාවකට ඇහුම්කන් දුන් මට එතුමා මෙහිදී අද කළ කථාවෙන් දැන් තේරෙනවා ශ්‍රී ලංකා නිදහස් පක්ෂ යේ තරුණ හමුදාවේ නායකයා එදා කුමක් නිසා එසේ කරන්නට ඇද්ද යන කාරණය. මට කෑගල්ලේ ගරු මන්ත්‍රීතුමාගේ දක්ෂ කම දැන් තේරෙනවා. සුදු කළු හැටියට පෙන්වන්නටත්, කළු සුදු හැටියට පෙන් වන්නටත් ඇති දක්ෂකම පෙනෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සභාග ආණ්ඩුව පිහිටුවන්නට ඔන්න මෙන්න කියා තිබියදී කෑගල්ලේ ගරු මන්ත්‍රීතුමා 1963 දී එක්තරා කථාවක් කළා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සාකච්ඡාවකදී. එදා එතුමා කිව්වේ මොනවාද ? " අපි රක්ෂාවල් 25,000 ක් නොදී මැතිවරණයකට යන්නේ නැහැ " කිව්වා. 1963-64 ආදායම් වර්ෂය තුළ ඉල්ලුම්පත්‍ර කැඳවා ශිෂ්‍ය ගුරුවරුන් 10,000 කට මාසයකට රුපියල් සියය බැගින් පින්පඩි දීමෙන් ඒ පොරොන්දුව ඉෂ්ට කරන්නට කෑගල්ලේ ගරු මන්ත්‍රීතුමා බලාපොරොත්තු වුණා. එපමණක් නොවෙයි, මුල් පොරොන්දුව සම්පූර්ණයෙන්ම ඉටු කරනවාය කියා 1965 අවුරුද්දේදී තවත් වරක් ඉල්ලුම්පත්‍ර කැඳවා තවත් 15,000 කට රක්ෂාවල් දී රක්ෂා ප්‍රශ්නය විසඳු හැටියක් පෙන්වන්නට අදහස් කළා. ගුරු තනතුරු අපේක්ෂා කරන්නන්ගේ රැකී රක්ෂා ප්‍රශ්නය විසඳන්නට තැත් කිරීම ගැන අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ. එක් පක්ෂයක ඉන්න මං, මහජන මන්ත්‍රීවරයකු හැටියට වගකීමක් ඇතිව, සත්‍යය සත්‍යයක් හැටියටත් අසත්‍යය අසත්‍යයක් හැටියටත් පෙන්වා දිය යුතුව තිබෙන නිසා තමයි මේ වචන ටිකවත් මේ විධියට කථා කළේ.

අද දින සවස් භාගයේදී අපට අගලවත්තේ ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා) කළ කථාවකටත් ඇහුම්කන් දීමට අවස්ථාව ලැබුණා. මට අවස්ථාවක් ලැබුණා නම් මාත් කරන්නේ ඒ කථාවමයි. එතුමාගේ මොලය අද මොන විධියකට වැඩ කළාදැයි මා දන්නේ නැහැ. මෙවැනි කථා කරන්නට එතුමාට පුරුද්දක් තිබෙනවා. එතුමා අද එක්තරා විධියකට තමුන්නාන්සේලාට කථා කරනවා ; හෙට එතුමා මට හිනාවෙමින් කථා කරනවා. එතුමා කාලයක් මේ ගරු සභාවේදී එක්සත් ජාතික පක්ෂයත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් හෙළාදකිමින් කථා කළා. ඔය දෙගොල්ලන්ටම විරුද්ධව එතුමා කථා කළ අතර කොමියුනිස්ට් පක්ෂයටත් විරුද්ධව කථා කළා. කොමියුනිස්ට් පක්ෂයත් එතුමාට විරුද්ධව කථා කළා. කොමියුනිස්ට් පක්ෂය තමයි එතුමා හිරේ දමා සිටියදී කිව්වේ, හිරේ නොවෙයි මූ එල්ලුම් ගහට යවාපන්, කියා. එක් කාලයක එක්සත් ජාතික පක්ෂයටත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටත් විරුද්ධවයි එතුමා කථා කළේ.

**වෛද්‍යාචාර්ය එස්. ඒ වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)
කසිප්පුද ඔය කථා කරන්නේ ?

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)*
(Mr. Shelton Jayasinghe)
එක් කාලයක් ලංකා සමසමාජ පක්ෂයේ සිට එක්සත් ජාතික පක්ෂයට එකගව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට චෝදනා කළ අතර, තවත් කාලයක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට එකගව එක්සත් ජාතික පක්ෂයට චෝදනා කළා. අද කොමියුනිස්ට් පක්ෂයත් සමග එකතු වෙලා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් සමග එකතු වෙලා ජාතික රජයට විරුද්ධව කථා කරනවා. එතුමා මොන අවස්ථාවේදී මොනවා කථා කරනවාද කියා කියන්නට බැහැ. එතුමා කීවා, අද තමුන්නාන්සේලා කෘෂිකර්මය පමණයි දියුණු කරන්නේ, කෘෂිකර්මය දියුණු කිරීමෙන් එක අංශයකින් ස්වයංපෝෂිත වීම පමණයි, බලාපොරොත්තු වන්නට පුළුවන්, තමුන්නාන්සේලාගේ ඒ බලාපොරොත්තුවත් හරියයිද කියා මා දන්නෙ නැහැ, රැකීරක්ෂා ප්‍රශ්නයත් උග්‍ර වෙනවා, කර්මාන්ත අංශය ගැන තමුන්නාන්සේලාට කල්පනාවක් නැහැ, ඒ අංශය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දුර්වල වෙනවා කියා. කා වෙනුවෙන්ද එතුමා මේ කථා කළේ ? මා සිටියා නම් එතුමාගේ ස්ථානයේ ඒ කථාවමයි, මාත් කරන්නේ. එතුමා අල්ලපු ආසනයේ ඉඳ ගෙන අප වෙනුවෙන් කථා කරනවාය කියායි මා හිතුවේ. තමුන්නාන්සේලා කෘෂිකර්ම යට වියදම් කරනවා නම් ඒ වගේම කර්මාන්ත අංශයටත් වියදම් කරන්නට ඕනෑය කියා එතුමා කීවා. කර්මාන්ත අංශයට අප කොපමණ වැය කර තිබෙනවාද කියා මා පෙන්වා දෙන්නට ඕනෑ. ඒ සම්බන්ධයෙන් එපමණයි, මා කියන්නට යන්නේ. ඊට පසු විශේෂ කථාවක් කිරීමට මා බලාපොරොත්තු වෙනවා.

1956 දී රු. 1,06,88,000 ක් වියදම් කර තිබෙනවා, කර්මාන්ත සහ කාර්මික අංශයට. එතුමා කියනවා, ඒ විධියට වියදම් කරලා මදි, ඒ වගේ දස ගුණයක් වියදම් කරන්නට ඕනෑය කියා. කෘෂිකර්මය දියුණු කරනවා නම් කර්මාන්තත් දියුණු කළ යුතුය කියා එතුමා කීවා. එතුමාගේ අදහස ගැන මා සියයට සියයක් එකඟ වෙනවා. ඒ අදහස මාත් අනුමත කරනවා. ඒ නිසයි, මා කීවේ එතුමා මගේ අල්ලපු ආසනයේ සිටගෙන කථා කරනවායයි මා සිතුවාය කියා. 1956 දී කර්මාන්ත සහ කාර්මික අංශය සඳහා රු. 1,06,88,000 ක් වියදම් කර තිබෙන අතර 1966-67 වර්ෂයේදී ඒ අංශයට කීයක් වියදම් කර තිබෙනවාද ? රුපියල් දහ හත් කෝටි හාර ලක්ෂ ගණනක් වියදම් කර තිබෙනවා. එතුමා කීවේ 10 ගුණයකින් වැඩි කරන්නට ඕනෑය කියායි. අප 17 ගුණයකින් වැඩි කර වියදම් කර තිබෙනවා, කර්මාන්ත සහ කාර්මික අංශයට නියම තැන දීම පිණිස.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව අවසාන කරන්නට පෙර මා විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටින්නට කැමතියි, කරුණාකර අප සාකච්ඡා කරන දේ ගැන හිත යොමු කර කථා කරන්නටය කියා. ගරු මුදල් ඇමතිතුමා එතුමාගේ සහ ජාතික රජයේ ප්‍රතිපත්තිය කුමක්ද යන්න 1967 ජූලි මස 25 වැනි දින කළ ඒ වැදගත් අයවැය කථාවේදී පැහැදිලි වශයෙන් පෙන්වා දී තිබෙනවා. ගරු මුදල් ඇමතිතුමා ප්‍රතිපත්තිය පමණක් නොව ක්‍රියා පටිපාටියත් පෙන්වා දී තිබෙනවා. අප ප්‍රතිපත්ති ගැන ඕනෑ තරම් අසා තිබෙනවා. අද ජනතාව සැලකිල්ලක් දක්වන්නේ ප්‍රතිපත්තිවලට නොව ක්‍රියා පටිපාටියටයි. එහෙම නම් ගරු මුදල් ඇමතිතුමාගේ ක්‍රියා පටිපාටිය මොකක්ද ? එතුමා 1967-68 මුදල් වර්ෂයේදී සංවර්ධනය සඳහා රුපියල් කෝටි 78.3 ක් වෙන් කර තිබෙනවා. මෙතෙක් සිටි කිසිම මුදල් ඇමතිවරයකු කිසිම කාලයක මේ තරම් මුදලක් සංවර්ධනය සඳහා වෙන් කර නැහැ. ඒ වගේම මේ තරම් මුදලක් වෙන් කරන්නට මෙතෙක් සිටි කිසිම මුදල් ඇමතිවරයකු කිසිම කාලයක හිතෙන්වත් හිතන්නට නැහැ. සංවර්ධනය සඳහා මේ මුදල් ඇමතිතුමා වෙන් කර ඇති මේ මුදල පාවිච්චි කරන්නට යන්නේ කොහොමද ? කෘෂිකර්මය සඳහා රුපියල් කෝටි 28 යි. කාර්මික අංශයට රුපියල් කෝටි 18.5 යි. කර්මාන්ත හා ධීවර අංශයට රුපියල් කෝටි 20.6 යි. ඉතින් කවුද මේකට විරුද්ධ ? විරුද්ධ පාර්ශ්වයේ සිටින ඔය විශේෂඥයන්, නීතිඥයන් ඒ විධියේ බොළඳ කථා පැවැත්වීම කනගාටුදායකයි. මහජනයා මුළා කිරීම සඳහා, අප යන ගමන කඩාකප්පල් කිරීම සඳහා, ඒ විධියේ බොළඳ කථා පවත්වන බවයි, පෙනෙන්නට තිබෙන්නේ.

මා මීට වඩා දීර්ඝ වශයෙන් සිංහල භාෂාවෙන් කථා කරන්නට අදහස් කරන්නේ නැහැ. අපේ සහෝදර මන්ත්‍රීවරුන් දෙදෙනාගේ කථා දෙකට පිළිතුරු වශයෙනු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ෂෙල්ටන් ජයසිංහ මයා.]
යි, මා මේ වචන ස්වල්පය කථා කෙළේ. ඊළඟට මා මගේ නියම කථාව ඉංගිරිසි භාෂාවෙන් කරගෙන යන්නට බලා පොරොත්තු වෙනවා. එය ඉංග්‍රීසි භාෂාවෙන් කරගෙන යන්නට නොයෙකුත් හේතු තිබෙනවා. විදේශ වෙළෙඳ ව්‍යාපාර හා විදේශ රටවල් සමඟ සම්බන්ධතා තිබෙන නිසා ඉංගිරිසියෙන් කථා කිරීම වඩා සුදුසු යයි මා කල්පනා කරන හෙයින් මට ඒ සඳහා අවසර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

As you know, this Budget—if I may call it a Budget—is one of the most difficult financial instruments that the Finance Minister has been called upon to implement. I say this purposely because—you have been here for a number of hours and you yourself would have noticed it—it is difficult if not well nigh impossible for the Opposition to speak against this Budget. May I say this, Sir ? It is also a difficult task for me to speak in eloquent terms of the Hon. Minister's Budget. The reason is that this is a performance document, a promise of good performance particularly in the agricultural and industrial sectors, the implementation of which depends to a large extent on the methods or the modes of financing. As I remarked earlier I wish the Hon. Minister well. The allocations he has made and the appropriation for the financial year are, I think, fair and called for in the present context of things in the country.

Before I pass on to another subject I should like to remind the Hon. Minister of Finance that although—it was also stated by the Hon. Minister of Health—the deficit is almost Rs. 1,000 million yet there are no expansionary measures. The threat of inflation is not there. I would also remind the Hon. Minister of Finance that both he and I lived in the same hope in the Budget of 1966-67. However, reasons and measures beyond his control have necessitated him to raise Rs. 125 million on Treasury Bills. This, as you know, contributes to expansionary financing and inflation. The Finance Ministers of a couple of years ago thought nothing of floating Treasury Bills to the tune of Rs. 250 million. Well and good ! They got away with it. But I must warn the Hon. Minister of Finance, if possible, to avoid this practice.

Now referring to the financial measures, I have to speak strongly against the tax imposed on trade and industry. I appeal to the Hon. Minister of Finance to see whether he can make the necessary adjustments. We appealed to the Hon. Minister of State too and I now appeal to the Hon. Minister of Finance also. You have made a certain adjustment in the licence fee on import goods. You propose to raise the import licence fee from 1 per cent to 10 per cent. You have made concessions in regard to licences already issued, varying the rate of tax to be levied on the smallest quota to the highest quota.—[*Interruption*]. Thank you very much. We are grateful to you for taking prompt action. But what I want to bring to your notice is that my plea to you, to collect this 10 per cent at the point of delivery of commodities either to the industrialist or to the trader, has so far not been

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

successful. I presume it is because I have been lacking in eloquence, and I shall make a further appeal to you.

Your answer, Mr. Minister of Finance, is that you have made sufficient concessions. You say, " Milk food does not come under this licence fee, kerosene oil does not come under this licence fee, pharmaceuticals do not come under this licence fee, small agricultural implements do not come under this licence fee. Well, I have done the best I can. If I go any further my revenue proposals, my tax proposals, will become null and void." I do not seek to either nullify or make invalid your tax proposals. On the contrary, I believe that this is a tax that can be absorbed.

But the point I wish to make is this. When you levy a 10 per cent licence fee, you levy it on the holder of the licence approximately 4½ months prior to the receipt of the article. If a person gets an allocation of Rs. 100,000, you tax him Rs. 10,000, and he has to keep his money with you for 4½ months, in all probability paying a 7 per cent interest to the bank. I hope this 10 per cent tax you have imposed will be absorbed by the industrialist and the trader, or, even if it is passed on to the consumer, it will not amount to very much in the context of affairs. But I submit that you should not over-aggravate the situation when it can well be avoided. There is no purpose in your getting the industrialist or trader to pay an extra 7 per cent because that money does not accrue to you. It accrues to some bank or money-lender or financier. It is only an added burden.

Your next argument was that these were items that you could not treat as essentially essential, if I may put it that way. But I want to ask, what are the items that are now subject to this 10 per cent licence fee ? All building materials—can you call them by any means essentially not essential ? All electrical appliances, all manufacturing articles, are items that go into this category. I believe this argument should weigh heavily with you.

